41974198

# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

---

**2016දෙසැම්බර්14 වන බදාදා**
2016மார்கழி14புதன் கிழமை
Wednesday14th December 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුවමාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභාගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.04ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.04 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.04 a.m.*

**ගරු සභාපතිතුමා[සුනිල් විජේරත්න මහතා]මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

---

# සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දිනට නියමිත න්‍යාය පත්‍රයානුකූලව මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් හා සමූපකාර සේවක කොමිෂන් සභාව සම්බන්ධ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදයද, අනතුරුව සභාවේ එකඟතාවය විමසීමෙන් පසු ඡන්ද විමසීමේ අවස්ථාව මධ්‍යහ්න 12.00 ට සිදු කිරීමට නියමිත බව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් මම මේ අවස්ථාවේදී දැනුම් දීමක් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මට 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම ඉතා කෙටියෙන් කියන්නම්. ගරු සභාපතිතුමනි, අද මේ සභාවට පළමුවෙන්ම ආවේ මම. එතකොට ආරක්ෂක නිලධාරීන් මාව පරීක්ෂා කළා. ඒ පරීක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මේ පරීක්ෂා කිරීම, ඉතාම අසාමාන්‍ය පරීක්ෂාවක් කළා. මම දන්නේ නැහැ මගේ මුදල් පසුම්බිය අරගෙන මුදල් ඇදල පරීක්ෂා කරන්න තරම්, ඒ පසුම්බියේ පුංචි සාක්කු පරීක්ෂා කරන්න තරම් - මම උදෙන් එන නිසා වැඩියෙන් පරීක්ෂා කරන්න කියලා ඔබතුමා කියලා තියෙනවාද මම දන්නේ නැහැ. අපේ මේ කාර්ය මණ්ඩලයේ අය මගෙන් ඇහුවා, ඇයි? මන්ත්‍රීතුමා ඔබතුමාව මෙපමණ චෙක් කරන්නේ කියලා. ඒ නිසා මේ පරීක්ෂා කරන අයගේ සීමාව මොකක්ද කියලා මම දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මම හිතනවා ඒක වරප්‍රසාද කඩවීමක් කියලා. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන සොයලා බලන්නම්. අර පාර්ලිමේන්තුවේ වාගේ වෘෂණ කෝෂ ප්‍රශ්නයක් නොවෙයි නේද? එහෙම ප්‍රශ්නයක් නැහැ නේ? මම ඒ ගැන ඉක්මණින් සොයා බලන්නම්.

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
# පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATMENT - 2017
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට 2017 වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රදාන පිළිබඳව සලකා බැලීමට මෙම සභාව, පූර්ණ කාරක සභාවක් පත් කිරීමේ අවස්ථාව.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ශීර්ෂ අංක 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 121 - මෝටර් රථ ප්‍රවාහන**

| | | |
|---|---|---|
| | | **දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 122** | **-** | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 123** | **-** | **ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 124** | **-** | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 125** | **-** | **කර්මාන්ත දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 103** | **-** | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |
| **Head No 107** | | Ministry of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction,Estate Infrastructure facilities, Industries and Rural Development |
| **Head No 121** | | Department of Motor Transport |
| **Head No 122** | | Department of Co-operative Development |
| **Head No 123** | | Department of Registration of Business Names |
| **Head No 124** | | Department of Commissioner of Houses |
| **Head No 125** | | Department of Industries |
| **Head No 103** | | Co-operative Employee's Commission |

***ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (2016.12.09 - ප්‍රගතිය)***

*The question on the amendment that a token cut of Rs. 10.00 from each votes Nos. 107, 121, 122, 123, 124, 125 & 103 moved by Hon. Jagath Withana was proposed again. - (Continuation: 09.12.2016)*

[පූ.භා. 09.08]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අද දිනයේ මට කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. මා මුලින්ම කියන්න කැමැතියි.අපේ ගරු ඇමැතිතුමාගේ මේ ලස්සන පොත් පිංචේ එක තැනක පුංචි වාක්‍යයක් කියලා තිබෙනවා. ගරු ඇමැතිතුමාගේ පණිවුඩයේ. පිටු අංක තුනේ හතර වන ඡේදය. මොකක්ද කියන්නේ?

*"අප අමාත්‍යාංශයේ විෂයය පථය ඔස්සේ බස්නාහිර පළාත තුළ ඉතා පුළුල් කාර්ය භාරයක් ඉටු කිරීමේ හැකියාව තිබෙන බව මම විශ්වාස කරමි."*

මේකෙන් ගම්‍ය වන අර්ථය තමයි ගරු සභාපතිතුමනි, පුළුල් පරාසයක විහිදෙන වැඩ ප්‍රමාණයක් අපේ අමාත්‍යාංශයට කරන්න පුළුවන් බවයිහැබැයි, මේක කරන්නේ කවුද? මේක කරන්නේ මේ පළාත් සභාවේ ඉන්න මැති ඇමැතිවරු 104 දෙනා. හැබැයි, ඒක හරියට කරන්න සාධාරණ ලෙස ඔබතුමා සලකලා තිබෙනවාද නැද්ද කියන එකයි මම මේ කියන්න යන්නේ. පසුගිය අවුරුද්දේ වැය ශීර්ෂය වෙලාවේදී ඔබතුමා මෙන්න මෙහෙම කියනවා.

*"මගේ විෂයය පථය පුළුල්. පළමුව කථා කරන්නේ ධීවර ප්‍රජාව ගැන."*

සාධාරණයි නේ? ඔබතුමා මීගමුව ආශ්‍රිතව, කලපුව ආශ්‍රිතව, ධීවර ප්‍රජාව ආශ්‍රිතව, විශේෂයෙන් කතෝලික පල්ලිය ආශ්‍රිතව ඉන්න කෙනෙක්. ඒ නිසා ඔබතුමාට ධීවර විෂයය දීපු එක සාධාරණයි. ඔබතුමා කියනවා,

*"ධීවර ජනතාවගේ ප්‍රශ්න හඳුනා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස ඉටු කළ යුතුව ඇත."*

ඔබතුමා දැඩි විශ්වාසයකින් ඒක කියනවා. අනේ හැබැයි මාස හතයි ගියේ. ඔබතුමාට මොකද වෙන්නේ? ධීවර විෂයය ගැලවෙනවා. එතැනින් පේන්නේ, එක්කෝ ඔබතුමා දේශපාලනිකව කොන් වෙලා. එහෙම නැත්නම් ඔබතුමා අසාර්ථකයි. නැත්නම් ඔබතුමාව තමන්ගේ ඉත්තෙක් කර ගන්න දරන වෑයමක්. මේ කාරණා තුනෙන් එකක් වෙන්න ඕනෑ. දැන් මේ කාරණා තුනෙන් කොයි එකද කියන එක මම මේ කරුණු කියන කොට ඔබතුමාට පැහැදිලි වෙයි. හැබැයි, ඔබතුමා ගිහිල්ලා ජනාධිපතිතුමාට කිව්වා. මෙතුමා ගිහිල්ලා ජනාධිපතිතුමාට කිව්වා ඔබතුමා මගේ ධීවර විෂයය අයින් කළා නේද? ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? නැහැ, නැහැ. මම ඔබතුමාගේ ධීවර විෂයය අයින් කළේ

නැහැ. මම එහෙම කියලාත් නැහැ. එහෙම නියෝගයක් දීලාත් නැහැ. ඒක නිසා මම කිව්වා කියලා මීට පස්සේ ඉල්ලුවාට දෙන්න එපා කියලා කිව්වා. එහෙම කිව්වාද නැද්ද ඇමැතිතුමා? ජනාධිපතිතුමා එහෙම කිව්වා නේ? හැබැයි ඒක ගත්තා. ඉල්ලුවේ ධීවර නොවෙයි. ඉල්ලුවේ සමූපකාරය. සමූපකාරය ඉල්ලුවේ ඇයි? හිටපු සමූපකාර කොමසාරිස්තුමා ගියේ ඇයි? කාගේද මේ ලැදියාව තිබුණේ කියලා හොයලා බැලුවාම, ඔබතුමාගෙන් ගන්න ඕනැ වුණේ සමූපකාරය. හැබැයි, ඔබතුමා දෙන්න බැහැයි කියපු නිසා ධීවරවලින් ගියා. එහෙම නම් දැන් බලන්න මේ විධියට තමයි ඔබතුමාව සාක්කුවට දාගන්නේ. ඔන්න අහන්න වෙන විධිය.

මම මාර්ග සංවර්ධනයෙන් පටන් ගන්නම්. මේ වසරේ බස්නාහිර පළාතේ මාර්ග සඳහා කළ වියදම විශ්ලේෂණය කරලා බලන කොට මේ පළාත් සභාවත්, පළාත් සභාවේ මන්ත්‍රීවරුන් වන අපිත් කොහේද යන්නේ කියලා ගරු සභාපතිතුමනි, අපෙන්ම ප්‍රශ්න කරන්න වෙනවා. දැන් මගේ අතේ තිබෙනවා, ලලිත් වනිගරත්න ඇමැතිතුමා යටතේ තිබෙන මාර්ග අමාත්‍යාංශයෙන් දිස්ත්‍රික්ක තුනේ කරපු වැය කිරීම්. කොහොමද කරලා තිබෙන්නේ? කොළඹ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 32.86 යි. ව්‍යාපෘති 118 යි. කළුතර දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 16.67 යි. ව්‍යාපෘති 70 යි. ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 58.52 යි. ව්‍යාපෘති 126 යි. ගම්පහට 126 යි. මිලියන 58 යි. ලොකු ගණනක්. බැලුවාම 50% කටත් වැඩියි. දැන් අපි බැලුවොත් කොළඹ දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම මුදල් වෙන් වෙලා තිබෙන්නේ කොහේටද? මේකට මගෙත් එක්ක තරහා වෙන්න එපා. මේක තර්ක කරන්න බැහැ. මේක හොඳ විශ්ලේෂණයක් කියලා මම විශ්වාස කරනවා. කොහේටද වැඩියෙන් වෙන් වෙලා තිබෙන්නේ? පිළිවෙළට. කඩුවෙල, මහරගම, කැස්බෑව, හෝමාගම කියන ආසනවලටයි වෙන් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා එහෙම කලබල වෙන්න කාරියක් නැහැ. මොකද, එතුමාට එහෙම දීලා නැහැ. හැබැයි මේ ආසනවල ලැදියාවන් තිබෙන්නේ කාගේද? මෙන්න මේන ලැදියාවන් තිබෙන අය මම කියන්නම්. කවුද? ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය, කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි. මේ දෙන්නාගේ තමයි මේ ආසනවල වැඩිපුරම ලැදියාව තිබෙන්නේ.

දැන් අපි බලමු කළුතර දිස්ත්‍රික්කයට ගිහිල්ලා. පිළිවෙළින් ගත්තාම කොහොමද? දොඩංගොඩ, කළුතර, පානදුර, බේරුවල, අගලවත්ත. ලැදියාවන් කාගේද? ඇත්ත පිළිගන්න එපැයි. අධ්‍යාපන අමාත්‍ය රංජිත් සෝමවංශ, සෞඛ්‍ය අමාත්‍ය සුමිත් ලාල් මෙන්ඩිස් යන මහත්වරු. මම හිතන්නේ නැහැ ඔබතුමන්ලාට මහත්වරු කිව්වාට මහත් හොරු වෙයි කියලා. එහෙම නොවෙයි මේ කියන්නේ. හැබැයි ලැදියාව ඔබතුමන්ලාගේ. දැන් මම මේ ඔප්පු කරලා පෙන්වන්න හදන්න අන්න ඒකයි. ආ ... බේරුවලටත් දීලා තිබෙනවා. බේරුවල ලැදියාව කාගේද?

**ගරු සුමිත් ලාල් මැන්දිස්**(සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women’s Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම සඳහන් කරපු නිසා. ලැදියාව කියන්නේ මොකක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලැදියාව කියන්නේ ඔබතුමන්ලාගේ වැඩි ඉල්ලීම පිට මේ පාරවල් හදලා තිබෙන්නේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස්**-අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

මේක මේ අපි ඉල්ලපු ඒවා නොවෙයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ, නැහැ. ඔබතුමා මගේ කථාව කරන්න ඉඩ දෙන්න කෝ? ඔබතුමාගේ වෙලාවේදී ඔබතුමා කියන්න.

**ගරු සුමිත් ලාල් මැන්දිස්**-අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ඒ Project එක අදාළ ආයතන හදනවා. අදාළ ආයතන ඒ නිලධාරීන්ගේ උවමනාවට ඒවා කරන්නේ. අපි ඉල්ලපුවා නොවෙයි. එක ලියුමක්වත් නැහැ මෙතුමා ළඟ. එහෙම කියන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

**41954196**

මගේ කාලය නාස්ති කරන්න එපා ගරු ඇමැතිතුමා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්**-අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

අපට ලැදියාව තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ ලැදියාව තියෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම පෙන්වන්නම්. ලැදියාවන් තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නවා නේ?

**ගරු සුමිත් ලාල් මැන්දිස්**-අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ලැදියාව තියෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඔබතුමාගේ පළාතේ ඔබතුමාට ලැදියාව නැත්නම් කාටද තිබෙන්නේ?

**ගරු සුමිත් ලාල් මැන්දිස්**-අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ලැදියාව තිබුණාට මට ඕනෑ විදියට නොවෙයි. ඒක කරන්නේ නිලධාරීන්. නිලධාරීන් ඒ ලැයිස්තු හදන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට ලැදියාව නැත්නම් මටද තියෙන්නේ? ඒක නිසා ඒ කතන්දර කියන්න එන්න එපා. තව ලැදියාවන් මම ඔප්පු කරලා පෙන්වන්නම්. තව ලැදියාවන් ගැන ෆයිල් තියෙනවා. ඒ ටික මම වෙනත් දවසක අරගෙන එන්නම් ගරු ඇමැතිතුමා. හරි. එහෙම නම් ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මගේ කාලය බේරලා දෙන්න. ඒක නිසා දැන් මේ බේරුවල කාටද දීලා තිබෙන්නේ? බේරුවලට දීලා තිබෙන්නේ, මෙතුමාගේ අමාත්‍යාංශයේ අර පාරවල්වලට කෙළ හල හලා හිටපු, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිකමට කෙළ හල හලා හිටපු අම්ජාඩ්ට. අම්ජාඩ් විතරක් නොවෙයි. තව ඉන්නවා. කවුද? අර නැව් ගිලපු ඖෂධ ජාවාරම්කාරයින්ගේ ඕනෑකමටත් සල්ලි දීලා තිබෙනවා. හරිද? කවුද කියලා මේ අය දන්නවා. පොඩ්ඩක් හොඳට විශ්ලේෂණය කරලා බලන්න කෝ? දැන් බලන්න දොඩංගොඩට රුපියල් මිලියන 3.69 ක් දීලා. හැබැයි, මම විශ්වාස කරන්නේ නැහැ, සෙනල් වෙල්ගම මන්ත්‍රීතුමාට කියලා. සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා අද නැහැ. හිටියා නම් එතුමාගෙන් අහන්න තිබුණා, ඔබතුමාගේ ඉල්ලීමටද දුන්නේ කියලා. හැබැයි සෙනල් වෙල්ගම මන්ත්‍රීතුමා එදා අධ්‍යාපන වැය ශීර්ෂය වෙලාවේදී නැගිටලා ගියා. ඒ නැගිටලා ගිය එකෙන් මොකක්ද තේරෙන්නේ? ලැදියාව එතුමාගේ නොවෙයි කියලා. ඒ නිසා ගරු සභාපතිතුමා මහින් කියනවා. ගරු ඇමැතිතුමා ඔබතුමාට මේවා පාඩම්. දැන් බලන්න ගම්පහ දිස්ත්‍රික්කයට. ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලිය 58.52 ක් දීලා තිබෙනවා. වැඩිම කොහේටද? කටානට. රුපියල් මිලියන 18.9 ක්. රුපියල් මිලියන් 58.52 න් සියයට 35 ක්. ඉතා හොඳයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක එතුමාගේ ආසනයනේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. හැන්ද තියෙන කොට බෙදා ගන්නේ නැත්නම් වෙන මොනවාද කරන්නේ? හැන්ද තියෙන කොට බෙදා ගන්නවා. හරිද? තව කාරණයක් තිබෙනවා. අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා. තව කට්ටිය ඉන්නවා නේ? ආනන්ද ඉන්නවා. රාජිත ඉන්නවා. රජිත ඉන්නවා. ලලන්ත ඉන්නවා. රෝස් ඉන්නවා. හැබැයි ඒ අයගෙන් ඇහුවාම ඒගොල්ලෝ කියනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද ඒ කට්ටිය?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කටානේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුද රෝස් කියන්නේ? කවුද ලලන්ත කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

41974198

ඒ අය අපේ ගරු මන්ත්‍රීවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ ... මන්ත්‍රීතුමන්ලා. මන්ත්‍රීතුමන්ලා කියලා කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න. අපි ආදරයට කථා කරන්නේ මුල් නම කියලා නේ ගරු සභාපතිතුමනි. ආනන්ද මන්ත්‍රීතුමා, රාජිත මන්ත්‍රීතුමා, රජිත මන්ත්‍රීතුමා, ලලන්ත මන්ත්‍රීතුමා, රෝස් මන්ත්‍රීතුමිය. දැන් ඒ අයගෙන් මම ඇහුවා. ඔයගොල්ලන්ට මෙපමණ මිලියන ගණනක් දුන්නාට කමක් නැහැ. 18.9 ක්. ඔබතුමන්ලාට එහෙම නම් පාරවල් හදන්න - අනේ! අනේ! අපට දුන්නේ නැහැයි කියනවා. දැන් මේකයි කතරන්දරය. දැන් ජා-ඇළට, මහරට, දිවුලපිටියට,ගම්පහට, අත්තනගල්ලට, මීනුවන්ගොඩට දුන්නේ ඇයි? හිතවත් අය ඉන්නවා. උදව් කරපු අය ඉන්නවා. ඒගොල්ලන්නට දුන්නා. ඇයි මහරට? ලසන්තට දීලා තිබෙනවා,රුපියල් මිලියන 4.5 ක්. නැහැයි කියන්න එපා. ඒක නම් කමක් නැහැ. මීගමුවේ SSP අනුර අබේවික්‍රමට කීයක් දුන්නාද? රුපියල් මිලියන 5.7 ක්. ඔබතුමාට දුන්නාද කියන්න කෝ? නැහැ නේ? ඔබතුමා කියන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම දන්නේ නැහැ කාටද දුන්නේ කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආ ... රුපියල් මිලියන 5.7 ක් SSP අනුර අබේවික්‍රමට දුන්නා. මන්ත්‍රීවරුන්ට නැහැ. ඒක තමයි මම කියන්නේ. ඒ නිසා මේ ටික කාටද බෙදලා තිබෙන්නේ? බලාගෙන ගියාම ඔබතුමා බෙදලා තිබෙන්නේ ඔබතුමාටයි. ඔබතුමාට වැඩ කරපු හිතවත් අයටයි. මහ ආණ්ඩුවේ ඇමැතිවරුන්ටයි. පළාත් සභාවේ මහ ඇමැතිතුමා සහ ඇමැතිවරුන්ටයි විතරයි. අනේ බලාගෙන ගියාම අනෙක් මන්ත්‍රීවරුන්ට මොනවාද? ඔබතුමන්ලාට කිරි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ගම්පහට එහෙම ලැදියාවක් නැද්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමා ගැනත් මට හරි අනුකම්පා හිතෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි මම බැලුවේ. දැන් ඔබතුමා කියපු විධියට ඔක්කෝටම දීලා තියෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තව රස කථා ගොඩක් තිබෙනවා. හැබැයි, මෙහෙම තියෙනවා. ජනාධිපතිතුමා කිව්වා නම්, ඒත් දුන්නා. ඇයි චන්ද්‍රිකා මැතිනියට. ඒ නිසා ගරු සභාපතිතුමනි, දැන් මේ පාරවල් හැදීමේ තව පොඩ්ඩක් මම එහාට යන්නම් කෝ? කඩුවෙලටයි, මහරගමටයි ලක්ෂ 100 ක් දුන්නා. ලැදියාව කාගේද? මම කලින් ලැදියාව කිව්වා. මම දන්නවා ජගත් කුමාර මන්ත්‍රීතුමාගේවත්, අපේ උඩුගොඩ මන්ත්‍රීතුමාගේවත්, එහෙම නැත්නම් සරත් පතිරණ මන්ත්‍රීතුමා ඔබතුමාට දුන්නාද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නැහැ. මට හම්බ වුණේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ඔබතුමාන්ලා දන්නවා කාගේද මේ ලැදියාව කියලා. මහරගමට PDG වලින් සහ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් රුපියල් මිලියන 113 ක් වෙන් කළා. මහරගමට රුපියල් මිලියන 113 ක්. ඔබතුමා මහරගමට දුන්නු ගණන ඇරෙන්න PSDG වලින් තව රුපියල් මිලියන 20 ක් වෙන් කළා. එකෙන් රුපියල් මිලියන 9.5 ක් කැස්බෑවට. රුපියල් මිලියන 3 ක් රත්මලානට. රුපියල් මිලියන 4.5 ක් මොරටුවට.ඉතිරි රුපියල් මිලියන 3 නැවත මහරගමට දුන්නා. එතකොට මහරගමට වෙන් කරලා තිබුණු මුළු මුදල කීයද? රුපියල් මිලියන එකසිය තිස් ගණනක් දීලා තිබෙනවා. දැන් මේක තමයි ප්‍රශ්නය ගරු සභාපතිතුමනි. දැන් බලන්න අපේ උපාලි කොඩිකාර හිටපු ඇමැතිතුමා යෝජනා තුනක් දීලා තිබුණා. මොනවාද යෝජන තුන? තලපත්පිටිය

**41954196**

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

කනත්ත පාර, අනුර මාවත හා එගොඩවත්ත පාර. මේ සියල්ල නතර කළා. හැබැයි, මම දන්නේ නැහැ, ඒවා කටානට ගියාද? කාගේ හරි ඉල්ලීම පිට වෙන කොහේට හරි දැම්මාද කියලා. ඒ නිසා මෙහෙමයි මන්ත්‍රීවරුන්ට සැලකුවේ. මෙහෙම කරන්න එපා. අපි කියන්නේ ඒකයි. ඊළඟට PDG වලින් තව සල්ලි ගත්තා. රුපියල් මිලියන 125 ක්. මහරගමට රුපියල් මිලියන 113 ක් දාලා තිබෙනවා. කැස්බෑවට රුපියල් මිලියන 13 ක් දීලා තිබෙනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි මම දන්නේ නැහැ, සුනිල් ජයමිණි ගරු සභානායකතුමාගේ ඉල්ලීමද කියලා. ඔබතුමාට දීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ, ඔබතුමාට දෙන්න ඕනෑ. අපටත් දෙන්න ඕනෑ. ඒ නිසා දැන් මේක තමයි බරපතළම ප්‍රශ්නය. ඔබතුමා පාරවල් 10 ක් හැදෙව්වා. හරිද? ඔබතුමාගේ ඉල්ලීමට පාරවල් 10 ක් හදලා තිබෙනවා. ඒක වෙන කතන්දරයක්. පරිපූරකයෙන් ගත්තා තවත් රුපියල් මිලියන 275 ක්. පරිපූරකයෙන් රුපියල් මිලියන 275 ගන්න කොට මහ ඇමැතිතුමා කිව්වා, රුපියල් මිලියන 40 ක්හදන්න තිබෙන ගොඩනැගිලි ඉවර කරන්නයි, ඉතිරි රුපියල් මිලියන 235 ගන්නේ පාරවල් හදන්නයි කියලා. එතකොට ඒ රුපියල් මිලියන 235 ට මොකද වුණේ? ඒ රුපියල් මිලියන 235 ගත්තේ පාරවල් හදන්න කියලා. ඔබතුන්ලාට බෙදුවාද? අපට නම් හම්බ වුණේ නැහැ. මට හිතෙන්නේ, වෙන වෙන අය බෙදාගෙන තිබෙනවා.

ඒ නිසා මේ බලන්න. ඔබතුමාට පරිපූරකයෙන් රුපියල් මිලියන 30 ක් හම්බ වුණා. මම අගය කරනවා. රුපියල් මිලියන 30 න් නිවාස ආධාර දෙන්න කියලා ඔබතුමා සියලුම මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂයය ගණනේ වෙන් කළා. හරි නේ? බොහොම හොඳයි. තව රුපියල් මිලියන 3 ක් වෙන් කළා බස් ස්ටෑන්ඩ් හදන්න. බස් ස්ටෑන්ඩ් ගැන මම දන්නේ නැහැ. හැබැයි මම විශ්වාස කරනවා, නිවාස ආධාර ලක්ෂය නම් සියලු දෙනාට ලැබුණා කියලා. ඒ නිසා මේක බලන කොට ඊයේ අන්තර් ජාලයේ හරි රස කථාවක් තිබෙනවා. දැන් ඔබතුමා බෙදා ගැනීම හොඳයි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. දැන් බලන්න Negambo Today කියන Web Site එකේ මොකක්ද තියෙන්නේ? මෙන්න කතන්දරේ තියෙනවා. පාරවල් හදලා නැහැ. හැබැයි මෙතුමාගේ බෝඩ් ගහලා. මෙතුමා කියනවා, ඔව්. මම කටානට සල්ලි වෙන් කළා. මෙන්න මෙහෙම කියනවා. බස්නාහිර පළාත් අරමුදල්වලින් විශාල මුදල් ප්‍රමාණයක් කටාන ආසනයේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා තමන් වෙන් කරලා තිබෙනවා කියලා පිළිගත්තා. දෙසැම්බර් 31 වනකොට මේවා ඔක්කෝම ඉවර කරනවා. කමක් නැහැ. ඒවා හොඳයි. හැබැයි, මේකේ ඉන්නේ කවුද? විශේෂඥ වෛද්‍යා සූර්ශනී ප්‍රනාන්දුපුල්ලේ. කටානේ ඉන්න අපේ අනෙක් පළාත් සභා මන්ත්‍රීවරු කෝ?එක මන්ත්‍රීවරයෙක් නැහැ. මේ හදපු පාරවල් ටික ඔක්කෝම තියෙනවා. අපේ මන්ත්‍රීවරයෙකුට අයත් පාරක් තිබෙනවා. මධ්‍යස්ථ මතධාරියෙකුගෙන් අප කළ විමසීමකදී ඔහු කියා සිටියේ පළාත් සභාවේ මැති ඇමැතිවරුන් සහ මධ්‍යම රජයේ මැති ඇමැතිවරුන් වියදම් කරන්නේ, ජනතාවගේ බදු මුදල් බැවින්. ඒවා වියදම් කිරීමේදී අරපරිස්සමෙන් කටයුතු කළ යුතු බවත්, දේශපාලන වාසි ගැනීමට කටයුතු නොකර අනුමත ව්‍යාපෘති අවලංගු කර මුදල් යෙදීම් නොකර, එම ව්‍යාපෘති අවසන් කිරීමට යම් මුදලක අඩුපාඩුවක් ඇත්නම් එම මුදල් ලබා දීමටත් තවත් අතිරේක මුදලක් ඉතිරි වේ නම්, ඒවා නව ව්‍යාපෘති සඳහා යෙදවිය යුතු බවත්, ඒ මධ්‍යස්ථ මතධාරියා කිව්වා කියලා මේකේ තිබෙනවා ගරු සභාපතිතුමනි.

මේ දේශපාලන හේතු මත කරන දේවල්. ඒ නිසා මේවා කරන්න එපා. අපි හැමෝටම සාධරණ බෙදී යෑම. Fair distribution. මේක දේශපාලනයේ මූලික තර්කයක්. ඒ මූලික කාරණය වෙනස් කරලා කටයුතු කරන එක හරි බරපතළ අසාධාරණයක්. ඒ නිසා මේවායෙන් තව කාට හරි යනවාද? ගරු සභාපතිතුමනි, මේ දවස්වල මම පොඩි පොතකුත් කියවනවා. ඒකත් අතේ තියෙනවා.Corruptions. මේකේ එක තැනක තිබෙනවා හොරකම් කරන මිනිස්සු, දූෂණවලට සම්බන්ධ මිනිස්සු කොහොමද හැසිරෙන්නේ කියලා. මේවා සිද්ධ වෙනවා. මේවා වෙන්නේ නැහැයි කියන්න බැහැ. මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කොට අතරමැදියෝත් ඉන්නවා. කුණුවලට එක්කෙනෙක් ඉන්නවා. පාරවල් ගැන කථා කරන්න තව එක්කෙනෙක් ඉන්නවා. එයා තමයි නිලධාරීන් එක්ක සාකච්ඡා කරන්නේ. එයා නිලධාරියෙක් නොවෙයි. හැබැයි, මේ දේශපාලන ඕනෑකම් මත දාපු අය. ඒගොල්ලෝ තමයි කථා කරන්නේ මෙන්න මේ පාර හදන්න ඕනෑ. මෙහෙමයි. ඔයාට සල්ලි එනවා. අහවල් පාරට සල්ලි එන්නේ නැහැ. මෙන්න මේ අහවලා තමයි කරන්නේ. ඒවාට ඉඩ දෙන්න එපා ගරු ඇමැතිතුමනි.

41974198

ඒ නිසා ඒවාට විරුද්ධව අපි සටන් කරනවා කියන එක කියනවා. බලන්න කෝ ඔබතුමාගේ මූලා‍‍ ප්‍රගතිය.

ඔබතුමාට ගිය අවුරුද්දේ හම්බ වුණු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවලින් 50% කටත් වඩා අඩු කරලා. රුපියල් මිලියන 192 යි. මූලා‍ ප්‍රගතිය 29% යි. එහෙම තියෙද්දී,ඒ ටිකත් බෙදලා දෙන්නේ කොහොමද කියලා බලන්න කෝ? ඒ නිසා ගිය අවුරුද්දේ මම කරපු කථාව මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ඒ කථාවේදී මම ඔබතුමාට ප්‍රවාහන අධිකාරිය ගැන කිව්වා. ඔබතුමාට කිව්වා බැස්ටියන් මාවත පවරා ගන්න කියලා. ඔබතුමා තවම ඒක කළේ නැහැ. ඔබතුමා, ජනාධිපතිතුමා හම්බ වෙලාත් දැන් මාස 07 ක් වෙනවා. හැබැයි ජනාධිපතිතුමා ගන්න කිව්වා. ගත්තේ නැහැ. ගන්න දෙන්නේ නැහැ. කවුද නිමල් සිරිපාල ඇමැතිතුමාගේ මස්සිනා හේමචන්ද්‍ර කියන කෙනා. ඔබතුමා බයයි. ඒක නිසා ගරු සභාපතිතුමා මගින් ගරු ඇමැතිතුමාට කියන්නේ, අපෘෂ්ඨවංශිකයෙක් විධියට නොවෙයි. පෘෂ්ඨවංශිකයෙක් විධියට වැඩ කරන්න. ඔබතුමාට අයිති දේ ගන්න. එදා මම මේක ඔබතුමාට කියලා අවුරුද්දක් ගියා. මේ ගැන මම ඔබතුමාට කී සැරයක් කථා කළාද? ඔබතුමාට -

**ගරු රංජිත් සෝමවංශ**(අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa(Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ඒකේ තේරුම අපි දන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ජීව විද්‍යාව ඉගෙන ගත්තා ගරු ඇමැතිතුමා. ඔබතුමාත් විශ්ව විද්‍යාලයේ ගිය නිසා මම හිතනවා, ඒක දන්නවා ඇති කියලා. ඒක මම ගෞරවනීය විධියට කිව්වේ. මම ඔබතුමාට කිව්වා බැස්ටියන් මාවත ගන්න කියලා. මම හැමදාම Call කර කරා ඔබතුමාට කියනවා. හැබැයි, ඔබතුමන්ලා මේකට අවශ්‍ය නියමිත ක්‍රියා මාර්ගය ගත්තේ නැහැ. දැන් සභාපතිතුමාගෙන් ඇහුවාම කියනවා, නඩු මාර්ගයට යනවාලු. නඩු මාර්ගයට ගිහිල්ලා, කවදාද මේක විසඳගන්නේ? නඩු මාර්ගයට යනකොට තරහා වෙන්න එපා ඇමැතිතුමා. ඔබතුමාට ධීවර අමාත්‍යාංශය අහිමි වුණා වාගේ නඩු මාර්ගයට ගිහිල්ලා, තව අවුරුදු දෙකක් යනකොට ඔබතුමාට ඇමැතිකමත් අහිමි වෙනවා. මේක තමයි ඇත්ත. ඒ නිසා ඊට කලින් තමන්ගේ ඇමැති ධූර කාලය අඩුම ගණනේ ඵලදායී යමක්, දැනෙන යමක් තමන් මෙහෙයවන ආයතනවලට කළායි කියලා කියන්න පුළුවන් විධියට කටයුතු සලස්වන්න. ඒ නිසා ඔබතුමාගෙන් මම බලාපොරොත්තු වෙනවා, මේකට ඉක්මණින් විසඳුමක් කරා යයි කියලා. ජනාධිපතිතුමාගේ නියෝගවලටත් ඔබතුමා අවනත වෙන්නේ නැහැ.

ඊළඟට තව ප්‍රශ්නයක්. දැන් බලන්න ගිය අවුරුද්දේ ඔබතුමාට අපි විශ්වාසභංග යෝජනාවක් ගෙන ආවා. මොකක්ද? ඒ අම්ජාඩ් කියන මිනිහාත්, අයිවන් සනත් කියන මිනිහාත් දාන්න එපා කියලා. අයිවන් සනත් දැන් මොකද කරන්නේ? අයිවන් සනත් තමයි දැන් යූනියන් එක මෙහෙයවන්නේ. යූනියන් එක හරහා ඔබතුමාව මෙහෙයවනවා. දැන් ඔබතුමා බලන්න හරිද කියලා. ඔබතුමාගේ දූෂිත නිලධාරීන් දෙදෙනෙක් හිටියා. ඩබල් ගේමක් දීලා මගී ප්‍රවාහන අධිකාරියෙන් සල්ලි අරන්. මෙන්න පුවත්පත් වාර්තාව තිබෙනවා. කවුද මේ දෙන්නා. නිමල් කරුණාතිලක. මිනිහා නම් මැරිලා. ඒ නිසා මිනිහා ගැන කථාවක් නැහැ. හැබැයි තව ඉන්නවා. ජී. වන්නිආරච්චි. ගිය සුමානේ දවසක මම කථා කරලා සභාපතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. එතකොට සභාපතිතුමා කියනවා. මට වන්නිආරච්චිගෙන් උපදෙසක් ගන්න ඕනෑ කියලා. මේ වන්නිආරච්චි හොරා ගැන තමයි මේ කියන්නේ. මිනිහා දැන් කොහේද ඉන්නේ? මෙතුමාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ. ඇමැතිතුමා, මොකක්ද මේ කතන්දරේ? හොරෙක් යවලා, තව හොරෙක් දාගන්නවා. දැන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නේ ඔහු නොවෙයි. ජී. වන්නිආරච්චිගෙන් උපදෙස් ගන්න අපේ නුවන් වනිගරත්න සභාපතිතුමා තව ටික දවසකින් අයිවන් සනත් වාගේ මූවත් සභාපති කළොත් මොකද කරන්නේ? ඔබතුමා යූනියන්වලටත් භයයි. ඒ නිසා මේවා වෙන්න දෙන්න එපා. මේ මනුස්සයාට විරුද්ධව චෝදනා තිබෙනවා. මෙන්න චෝදනා පත්‍ර ටික. ඔබතුමා හිමින් සැරේ අධ්‍යක්ෂ මණ්ඩලයට දාගන්නවා. මොනවාද මේ? ඇයි මේ? ඔබතුමා යූනියන් එකට බයයි. යූනියන් එකේ එකෙක් මට කථා කරලා තර්ජනය කළා. මෙතුමා නියෝගයක් දුන්නා, පරීක්ෂණයක් කරන්න. කෝ පරීක්ෂණය? ඔබතුමාට පරම ශිවම් රාජ්ගෝපාල් පසුපතිටයි, අනුර අලස්ටයි Extension එකක් දෙන්න කිව්වා. සේවා දිගුවක්. අපි දන්නවා. පසුපති කියන්නේ, අපේ හිටපු මහ ඇමැතිතුමාගේ මස්සිනා. හැබැයි, මේ මිනිස්සු ජීවිත කාලයෙන් අවුරුදු 30 ක් 40 ක්

**41954196**

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

මේ වෙනුවෙන් කැප වුණු මිනිස්සු. විශ්‍රාම යන මනුස්සයෙකුගේ මානසික තත්ත්වය තේරුම් ගන්න. මාස තුනක් හයක් දික් කරන්න. හැබැයි, ඔබතුමා යූනියන්වලට බය වුණා. බය වෙලා දුන්නේ නැහැ. එහෙම නොදී මේ වාගේ හොරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට දාගත්තා. අරහෙම සේවයක් කරපු මිනිස්සුයි අධ්‍යක්ෂ මණ්ඩලයට දාගන්න ඕනෑ. හොඳ Track record එකක් තිබෙන, හොඳ ගෞරවනීය ඉතිහාසයක් තිබෙන මිනිස්සු. පසුපතිලා සහ අනුර අලස්ලා වාගේ.

මම තව දෙයක් ඔබතුමාට කියනවා. මේ වත්තේගෙදර ප්‍රශ්නය ගැන අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර ගරු මන්ත්‍රීවරු කථා කළා. ඒක ගැන මම දිගටම කථා කරන්නේ නැහැ. හැබැයි, ඒ මිනිස්සු මාවත් හම්බ වුණා. රුපියල් මිලියන 750 ක වංචාවක්. කෝටි 75 ක්. කොමසාරිස්තුමාගෙන් අහන අහන දවසට කොමසාරිස්තුමා කියනවා, කරනවා කරනවා කියලා. මොනවා කරනවාද දන්නේ නැහැ. දැන් මෙයින් එකෙක් රට පැනලා. නියෝගයක් දීලා තිබෙනවා. මම පෞද්ගලික ගිහිල්ලා ආගමන විගමන කොන්ට්‍රෝලර් ජෙනරාල් හම්බ වෙලා, පෞද්ගලික අධිකරණ නියෝගය අරගෙන ගිහිල්ලා මම කිව්වා, රණසිංහ මහත්මයා මේකේ එකෙක් පැනලා ගිහිල්ලා කියනවා. කරුණාකරලා මේක හොයලා බලලා, මේකට මොකක් හරි පියවරක් ගන්නය කියලා. මේවා කරන්න ඕනෑ අපි නොවෙයි. මේක මගේ ජොබ් එක නොවෙයි. එතැනින් මට ඡන්ද හම්බ වෙන්නේ නැහැ. නමුත් අපි ඒක කරන්නේ, ජනතාවගේ සල්ලි වෙනුවෙන්. අසාධාරණය වෙනුවෙන්. ඔබතුමන්ලා ඊට වැඩිය වැඩක් කරන්න ඕනෑ. හැබැයි, ඔබතුමන්ලා මේ වනතුරු කිසිම දෙයක් කරලා නැහැ. මේකේ දේශපාලන මැදිහත්වීම ඔබතුමා දන්නවා. ඡන්දයට සල්ලි දුන්නේ කාටද කියලා ඔබතුමා දන්නවා. ඇයි මේක යට ගහන්නේ කියලා ඔබතුමා දන්නවා. ඒ නිසා මේවා වෙන්න දෙන්න එපා. ඒ වාගේම කොටිකාවත්ත සණස. දැන් බලන්න තව කෝටි 19 ක බැංකු අයිරාවක් අරගෙන තිබෙනවා. ඔබතුමා දන්නවාද? මාසයකට රුපියල් ලක්ෂ 78 ක ගෙවීම් තිබෙනවා. කොටිකාවත්ත සණස බැංකුවේ. කොමසාරිස්වරයා හැමදාම කරනවා. හරි මන්ත්‍රීතුමා, අපි කරනවා. හැබැයි, අවසානයේ කරපු දෙයක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ ටිකේ පොතක් ලියන්න දේවල් තිබෙනවා. කිව්වාට සමාවෙන්න. මේවා සණස විධියට ගන්න එපා. මේවා ධන විධියට ගන්න.

ඊළඟට ත්‍රිවීල් අර්බුදය බලන්න. ඔබතුමාට කොපමණ කිව්වාද? ත්‍රිවීල් ප්‍රශ්නයක් ආවා. මුදල් එකතු කිරීම වැරැදියි. ඒ නිසා වහාම අනුමත නොකරපු ප්‍රඥප්තිය අරගෙන, අපෙනුත් උපදෙස් අරගෙන මේ ප්‍රඥප්තිය වහාම පළාත් සභාවට ගෙනැල්ලා අනුමත කරගෙන මේක නීතිගත කරන්න කියලා. නීතිමය තත්ත්වයට ගෙන එන්න කියලා. මේවා ඇදගෙන යන්න දෙන්න එපා. ඒකටත් දැන් මාස 08 ක් ගියා නේ? ඉතින් ඔබතුමන්ලා තවම ඒකට තීරණයක් ගත්තේ නැහැ නේ? අපි ඔබතුමන්ලාට උදව් කරනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒවායෙන් ප්‍රයෝජනය ගන්න. හැමදාම එන්න එන්න, කල් මර මරා මේ ආයතනය නිකන් නාස්ති වෙලා යන්න දෙන්න එපා. ඒ නිසා ඔබතුමාගේ ලැයිස්තුවක මම දැක්කා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක්, මම හිතන්නේ පාඩු ලබන සමුපකාර ගැන ඉල්ලා තිබුණා. බරපතළ අර්බුද තිබෙනවා. හැම තැනම මීයෝ. සමුපකාර කිහිපයක ඇරෙන්න හැම තැනම එහෙමයි. මම ඉන්න කොලොන්නාව විවිධ සේවා සමුපකාරය තිබෙනවා. ඔබතුමා හෙව්වත් නැතත් මම හොයනවා. ඔබතුමා දන්නවා. මම හොයනවා කියලා. ඒවායේ වංචාවන් වෙන්න අපි දෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේවා නිවැරැදි කරන්න. වෘත්තීය සමිතිවලට යට වෙන්න එපා. වෘත්තීය සමිතියට යට වෙලා මේ ආයතන විනාශ වෙන්න දෙන්න එපාය කියලා ඉල්ලන ගමන් මම ඔබතුමාට කියන්න කැමැතියි. කරුණාකරලා සාධරණ ලෙස මේ ලැබෙන ප්‍රතිපාදන බෙදී යෑමේ වැඩ පිළිවෙළක් හදන්න. අපි හැමෝටම සාධාරණය ඉෂ්ට වන විධියට වැඩ කරන්න. නිර්මාණශීලී මිනිස්සු එක්ක වැඩ කරන්න. කරුණාකරලා හොරු ටික අයින් කරන්න. ඒ නිසා මේක වෙන්න දෙන්න එපා කියලා ඉල්ලීමක් කරමින්, මම අර කලින් කිව්වා වාගේ හොඳ පෘෂ්ඨවංශිකයෙකු ලෙස ඊළඟ අයවැයට මුහුණ දෙන්න කියලා ඉල්ලීමක් කරමින්, ගරු සභාපතිතුමාට බෙහෙවින්ම ස්තුතියි. සුභ පතනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පෘෂ්ඨවංශිකයෙක් කියපු එක මටත් තේරුණේ නැහැ. ඇමැතිතුමාට වාගේ.

**41974198**

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉල්ලීමක් කරන්න අද නොපැමිණි මන්ත්‍රීවරුන්ට මේ කථාව හැන්සාඩ් වාර්තාවෙන් හරි කියවන්න කියලා. මේකේ වෙනත් කතන්දරයක් තිබෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.28]

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමාගේ සමහර කාරණාවලට මමත් එකඟ වෙනවා. හැබැයි ඉතින්,අපි අමාත්‍යාංශයට, ඇමැතිතුමාට, නිලධාරීන්ට කොපමණ කථා කළත්, අවසානයේ බෙදීමකින් තොරව ඡන්දය පාවිච්චි කරනවා. මොකද, අපි ඇමැතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා - ඇමැතිතුමා පත් වෙලා අවුරුද්දයි. හැබැයි, කලිනුත් ඇමැතිකමේ හිටියා. ඒ නිසා මේ කාලසීමාව තුළ ලොකු සේවයක් කරයි කියලා. ගරු සභාපතිතුමනි, දැන් මේ වනකොට පළාත් සභාව ඉස්සරහා හාර පන්සියයක් සෙනඟ එකතු වෙලා ඉන්නවා. හත් අටසීයක් පොලීසියෙන් ඉන්නවා. තව පොඩ්ඩකින් මම කියන්නේ. දැන් එනවා. ඇයි ඒ මිනිස්සු එන්නේ? තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අද සාකච්ඡා වන නිසා.

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එළියට ගියා.වත්තේගෙදර,කැස්බෑව, මහරගමකියන්නේ, අපි ජීවත් වන ප්‍රදේශ. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා අගලවත්තේ වුණාට එතුමාත් දන්නවා. මඟ පෙළපාලියක් එනවා කියලා එතුමා කියනවා. මිනිස්සු මොකටද මේ පෙළපාලි එන්නේ? ආසාවටද? නැහැ ගරු සභාපතිතුමනි. කෝටි 75 ක් අමු අමුවේ ගසා කාලා. ඒවාට ඒ මිනිස්සු සටන් කළා. පන්සල්වල හාමුරුවරු. කතෝලික පූජකතුමන්ලා. ගමේ මරණාධාර සමිති. ගරු සභාපතිතුමනි, ඒ මිනිස්සුන්ට කිසිම විසඳුමක් ලැබුණේ නැහැ. කෝටි 75 ක් වංචා කරලා. සමුපකාර දෙපාර්තමේන්තුවෙන් අය කරගෙන තිබෙන්නේ කීයද? ලක්ෂ 70 යි. කෝටි 75 කින් ලක්ෂ 70 ක් අය කර ගත්තාම, දෙපර්තමේන්තුව ලැජ්ජා වෙන්න ඕනෑ. කොමසාරිස්තුමා අලුත් කෙනෙක්. තමුන්නාන්සේ, මම,මේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා අවුරුදු 24 ක් මේ සභාවේ එක දිගටම ඉන්නවා. අපි දැකලා තිබෙනවා. කොමසාරිස්වරු ඕනෑතරම් ඔතැනට එනවා යනවා. අත පිහදාගෙන ඒ අය ගෙදර යනවා. දැන් මේ කෝටි 75 ක් වංචා කරලා, මේ දක්වා දෙපාර්තමේන්තුව අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද? අර මිනිස්සු දෙස් දෙවොල් තියනවා. පොල් ගහනවා. පළි ගහනවා. පල්ලියක්, කෝවිලක්, ගාණේ යනවා.

ගරු සභාපතිතුමනි, ඒ මිනිස්සුන්ට කිසිම විසඳුමක් ලබා දීලා නැහැ. මම දන්නේ නැහැ කොමසාරිස්තුමා ඉන්නවාද? නැද්ද? කියලාවත්. මේකට ඇවිල්ලා ඉන්නවාද? නැද්ද? කියලා මට නම් පේන්නේ නැහැ. හැබැයි, කිසි විසඳුමක් නැහැ. මේ සල්ලි අරගෙන වෙනත් ව්‍යාපාර ආරම්භ කරලා, වාහන සේල් දාලා, වාහන විකුණලා ඒවායෙන් සල්ලි අරගෙන, වෙන වෙන තැන්වල ඉඩම් අරගෙන, ඒගොල්ලෝ තමන්ගේ කාර්ය භාරය කර ගත්තා. අර මිනිස්සුන්ට වැඩිපුර පොළිය දෙනවා කියලා මිනිස්සු සල්ලි දැම්මාම පොළියත් නැහැ. සල්ලිත් නැහැ. අද වත්තේගෙදර සණස සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් මම එක දෙයයි ඉල්ලන්නේ. මම අද උදේ එනකොට, රේඩියෝ එකෙන් අහගෙන ආවා,13 ට එහාට ගිය බලතල උතුරු පළාත් සභාව ඉල්ලනවා කියලා. ඉඩම් හරි මොනවා හරි ඉල්ලනවා. මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. දෙපාර්තමේන්තුවට සණස පාලනය කරන්න බැරි නම් -සණස සමිති 1000 කට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. සමුපකාර ටික පාලනය කළාම ඇති. සමුපකාර ටික පාලනය කර ගන්නත් බැරි නම් තවත් මේ සණස වාගේ ආයතන මේ පළාත් සභාව තුළ තියාගෙන ඉන්න එපා. ඒවායේ කෝටි ගණනක් සල්ලි තිබෙනවා. ඒ නිසා ඒවා මධ්‍යම රජයට පවරන්න. එහෙම නැත්නම් ඔය කොමසාරිස්තුමා, නිලධාරීන් ඒවා හරියට පාලනය කරන්න ඕනෑ. පාලනය කරන්න බැරි නම්, ඒක වැරැදි නැහැ මන්ත්‍රීතුමා. කරන්න බැරි නම්.කෝටි ගණන් සල්ලි. මේවාට නීතිමය ක්‍රියා මාර්ගයක් ගන්නෙත් නැහැ. අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක්කෙනෙක් දැන් පැනලා ගිහිල්ලා.

ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා අර හැම කෙනාම FCID එකට යන්නේ. තමුන්නාන්සේටත් මන්ත්‍රීවරු හතර පස් දෙනෙක් අරගෙන FCID එකට යන්න

**41954196**

[ගරු සුනිල් ජයමිණී - සභානායකතුමා]

පුළුවන්. FCID එකට ගිහිල්ලා කියන්න. මෙතැන ලොකු වංචාවක් වෙලා තිබෙනවා. තමුන්නාන්සේ එතකොට බේරිලා නේ? දැන් තමුන්නාන්සේත් නිහඬව ඉන්නවා. සංගම් කියනවා, අරයාට උදව් කළා, මෙයාට උදව් කළා කියලා. අපට ඒක ගැටළුවක් නැහැ. මේක පළාත් සභාව තුළ සිද්ධ වුණු බරපතළ වංචාවක්. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතනයක්. ඒ නිසා වත්තේගෙදර සණස පිළිබඳව විධිමත් ක්‍රියා මාර්ගයක් ගන්න. නැත්නම් ඒ මිනිස්සු ඔයිට එහාට ගිය අරගලවලට යනවා. ඒකේ කැළල එන්නේ, පළාත් සභාවටයි. අද මෙතැන පිකටිං කරන්නේ ලලිත් වනිගරත්නට විරුද්ධව නොවෙයි. පළාත් සභාවට විරුද්ධවයි. ඒ නිසා ප්‍රධාන ඇමැතිතුමාට. ඇමැති මණ්ඩලයට. සභාපතිතුමාට. මන්ත්‍රී කණ්ඩායම ඔක්කෝටම මේක වදිනවා. මිනිස්සු කථා වෙන්නේ ඒක ගැනයි. ඒ නිසා මේ සම්බන්ධව විධිමත් ක්‍රියා මාර්ගයක් ගන්න කියන කාරුණික ඉල්ලීම මම කරනවා.

ගරු සභාපතිතුමනි, අනෙක් කාරණාව තමයි, මම දන්නේ නැහැ මොකක්ද කියලා. මේ පොත්පත්වල සටහන් වෙලා නැහැ. අපේ බස්නාහිර පළාත් සභාවේ සමූපකාර අමාත්‍යාංශයෙන් පාලනය වන, මම ඇමැතිවරයා හැටියට ඉන්න කාලයේ බොහොම හොඳට පාලනය කරපු පුත්තලම ලුණු සමාගම. අපේ මන්ත්‍රීතුමන්ලා දන්නවා. අධික ලාභයක් ලැබුවා. ඒක හොඳට පාලනය කළා. ඒක සමූපකාර සභාපතිවරු හරහා තමයි පාලනය කළේ. ගරු සභාපතිතුමා දන්නවා. එක්තරා කොමසාරිස්වරයෙක් ආවා. අපට ආරංචි විධියට, ඒ කොමසාරිස්තුමාගේ කාලයේ පුත්තලම ලුණු සමාගමේ කොටස් විශාල ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට වික්කා. රයිගම් ඔෆ් කින්ඩම් කියන ආයතනයට. මේ කොමසාරිස්තුමා ඇමැතිතුමා නොමඟ යවලා, මන්ත්‍රීවරු නොමඟ යවලා ඒකේ අයිතිය රයිගම් ඔෆ් කින්ඩම් සමාගමට භාර දුන්නා. කළමනාකාරීත්වය භාර දුන්නා. ඊට පස්සේ පළාත් සභාවෙන් කිසිම සොයා බැලීමක් නැහැ. මම හිටපු ඇමැතිවරුන්ටත් කිව්වා. මේකේ කොටස් ටික ආපහු අරගෙන, මේ ආයතනය පළාත් සභාව සතු ආයතනයක් කරන්න කියලා. අක්කර 600 ක ඉඩමක්. කලපුව අයිනේ. අනෙක් පැත්තෙන් හොඳ නිවාඩු නිකේතනයක්. ඒ සියල්ල ඒක ඇතුළේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ගරු ඇමැතිතුමා. ඔබතුමා අවධානය යොමු කරන්න. එතුමා වැදගත් ප්‍රකාශයක් කරන්නේ.

**ගරු සුනිල් ජයමිණී - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා ඒ වාගේ ආයතන. මීගමුවේ සභාපතිතුමා කාලයක් ඒකේ සභාපති තනතුර දැරුවා. එතුමන්ලා ඒක හොඳට පාලනය කළා. ඒ නිසා ගරු ඇමැතිතුමාට මම කියනවා. තමුන්නාන්සේ මේ මන්ත්‍රී කණ්ඩායමක් එක්ක ගිහිල්ලා හොයලා බලන්න. තමුන්නාන්සේගේ නිලධාරීන් එක්ක යන්න. ගිහිල්ලා හොයලා බලන්න. පුත්තලම ලුණු ලේවායට මොකද වුණේ? පළාත් සභාවේ තිබුණු කොටස්වලට මොකද වුණේ? දැන් තත්ත්වය මොකක්ද? දැන් ගරු ඇමැතිතුමා පිළිතුරු කථාවේදී පැහැදිලි කිරීමක් කළා නම් හොඳයි. ඒක ආරක්ෂා කර ගන්න, කටයුතු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා.

ඊළඟ කාරණාව තමයි ගරු සභාපතිතුමනි, මාර්ග සම්බන්ධව සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරපු කථාව. ඒ නිසා මාර්ග හැදෙනවා නම් හොඳයි. හැබැයි ඉතින් මාර්ග හැදිලා, පළාතේ මන්ත්‍රීවරයාගේ ෆොටෝ එකක් වදින්නේ නැත්නම්, ඉදිරියට ඒක වැරදි මාර්ගයක යනවා. මම ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. ඔය බොරලැස්ගමුව පැත්තට එනකොට, බලන්න. ඒ ගහලා තියෙන බෝඩ්වල කාගේ ෆෝටෝ එකද තියෙන්නේ කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලැදියාව අන්න ඒක.

**ගරු සුනිල් ජයමිණී - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, සමහර ඒවායේ මන්ත්‍රීවරයෙක්වත් නොවෙන අයගේ ෆොටෝ තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඒක වෙන්න බැහැ. එහෙම ගහන්න බැහැ නේ?

**ගරු සුනිල් ජයමිණී - සභා නායකතුමා**

Hon. Sunil Jayamini - Leader of the House

වෙන්න බැහැ නොවෙයි. වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කනගාටුයි. අපි සමගියෙන් ඉන්නවා. කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා, සිරිකමල් මන්ත්‍රීතුමා, විපක්ෂ නායකතුමා, සභාපතිතුමා අපි ඔක්කෝම බොහොම සමගියෙන් මේකේ ඉන්නේ. අපි දැන් මේ අයවැයේදී, සමහර අය කිව්වා. පොහොට්ටුව විරුද්ධ වෙනවා කියලා. පොහොට්ටුව විරුද්ධ වෙන්නේ නැහැ. පොහොට්ටුවත් මේකට සහයෝගය දෙනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මම කථා කරන්න කලින්, ගණන් හදලා පෙන්නුවා. පොහොට්ටුවෙන් තමයි වැඩිපුර ඉන්නේ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටුවේ කට්ටිය කවුද කියන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

පොහොට්ටුවේ කට්ටිය කවුද කියලා අපි වෙලාවක කියන්නම්. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා සද්භාවයෙන් උදව් කරනවා. හැබැයි ගරු සභාපතිතුමනි, මේ ඇමැතිතුමා විතරක් නොවෙයි, රංජිත් සෝමවංශ ඇමැතිතුමා බොහොම රිලැක්ස් එකේ ඉන්නවා. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශය සම්මත වුණා නේ? මම දැන් වාඩි වෙනකොට කිව්වා එහෙම හරි යන්නේ නැහැ. අපේ ඉල්ලීම් තිබෙනවා. ඒවා ඉටු වෙන්න ඕනෑ. අසාධාරණ ඉල්ලීම් නොවෙයි. ජනතාව වෙනුවෙන් ඉටු කරන්න ඕනෑ ඉල්ලීම් තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ, ඇමැති මණ්ඩලයම සාධාරණ වෙන්න කියන එකයි. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී තේරුණේ,මේකේ පක්ෂග්‍රාහී වෙනවා කථාවක් වාගේ තමයි ගියේ. ගම්පහ නැහැ කිව්වා. කැස්බෑවේ නැහැ කිව්වා. බියගම නැහැ කිව්වා. එහෙම වෙන්න බැහැ. මේක සාධාරණ වෙන්න ඕනෑ. එතකොට තමයි අපි තවත් තමුන්නාන්සේලාට උදව් කරන්නේ. අපි කඩාකප්පල් කරන්නේ නැහැ. අපි උදව් කරනවා. උදව් කරනවා නම් විශේෂයෙන්ම පාරවල් හදන කොට ඒක සාධාරණීකරණය වෙන්න ඕනෑ. මෙතුමන්ලා ගණන් හදලාකියනවා, පොහොට්ටුවෙන් මෙපමණයි. අරහෙන් මෙපමණයි කියලා. අවශ්‍ය නැහැ. අපි ඔක්කෝම එක කට්ටිය. ඒ නිසා දැන්මේ වෙලාවේ මතක් කරන්නේ ගරු සභාපතිතුමනි, ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා අවංක ඇමැතිවරයෙක්. එතුමා දක්ෂ ඇමැතිවරයෙක්. මට පේනවා. නිලධාරීන් එතුමාව යම් නොමග යැවීමක් කරනවා.

තව එක් කාරණයක් කියලා මම කථාව අවසන් කරනවා. ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මම දැක්කා, පසුගිය දිනවල බස් සංගමයේ සභාපති ගැමුණු විජේරත්න කියන කෙනා කියනවා.බස් 1000 ක් ලංකාවට ගේනවාලු. ඒ අය බස් 1000 ක් order කරලාලු තිබෙන්නේ. ඒ බස් 1000 පාරටත් දානවාලු. දාලා අලුතෙන් මංතීරුවකුත් හදනවාලු. ඒ මංතීරුවට කාටවත් ගොඩ වෙන්න දෙන්නෙත් නැහැලු. ඒගොල්ලෝ නම් කරන අයටලු බස් දෙන්නෙත්. එතකොට අපේ ඇමැතිවරයෙක් ඉන්නේ මොකටද? පළාත් සභාව් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් තිබෙන්නේ මොකටද? ඒ නිසා ගැමුණු විජේරත්නට ඕනෑ විධියට, මේක කරන්න දෙන්න එපා ඇමැතිතුමා. තමුන්නාන්සේ පායලී චම්පික රණවක ඇමතිතුමාත් එක්කකථා කරන්න පුළුවන් නේ?යහපාලනයේ කට්ටිය නේ ඔක්කෝම.ගිහිල්ලා හම්බ වෙලා කථා කරලා, මොකක්ද ඒ වැඩ පිළිවෙළ?මොකක්ද කරන්න හදන්නේ? කියලා බලන්න.

දැන් අලුත් බෝඩ් ගහලා තිබෙනවා. සෙත්සිරිපාය වටේම ගහලා. 2018 දී මෙහෙමයි, 2019 දී මෙහෙමයි, 2020 දී මෙහෙමයි කියලා ෆොටෝ එක ගහලා තිබෙනවා. අපි දැක්කාම බලනවා. නැවතිලා බලනවා. දැක්කාම බලන්න ලස්සනයි නේ? ඇමැතිතුමා අනාගතයට හොඳ ඉඩක් ලබා දෙනවා. හැබැයි ප්‍රවාහන ක්ෂේත්‍රයේ තමුන්නාන්සේටත් වැඩිය බලවතෙක් ඉන්නවා. එයාගේ ඇති බලයක් නැහැ. එයා මේ වනකොට නොණ්ඩි වෙලා, කොර වෙලා අවසානයි. හැබැයි එයා තමුන්නාන්සේත් අභිබවා කථා පවත්වනවා. ඒ නිසා එහෙම වෙන්න එපා කියන ඉල්ලීම කරමින් ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාට අපේ සහයෝගය ලබා දෙමින්, හොඳ වැඩ පිළිවෙළකට යන්න කියලා එතුමාට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, පළාත් සභාවට එන ස්ථානයේ දැන් මේ වනකොට පොලීසියෙන් පිරිලා ඉන්නවා. වාහනයක් නවත්ත ගන්න දෙන්නේ නැහැ. මම රියදුරු මහත්මයෙක් නැතුව ආවේ. වාහනය නවත්ත ගන්න දෙන්නේ නැහැ. කිලෝ මීටර් භාගයක් විතර එහායින්

**41954196**

[ගරු ජනක වැලිවත්ත]

වාහන නවත්වලා, පයින් එන්න වුණා, පළාත් සභාවට එන්න. පළාත් සභාවට විරුද්ධව මොකක් හරි උද්ඝෝෂණයක් එනවා නම්, පොලීසියට කියන්න දෙපැත්තෙන් පොඩ්ඩක් එහාට ගිහිල්ලා බැරියර් දාගන්න කියලා. මේ පළාත් සභාව ඉස්සරහා බැරියර් දාගෙන මන්ත්‍රීවරයෙකුටවත් පළාත් සභාවට එන්න විධියක් නැහැ. පළාත් සභාව ඉස්සරහා පොලීසියෙන් වාහනයක් නවත්තගන්න දෙන්නේ නැහැ. ඇතුළේ parking එකකුත් නැහැ. පහසුකම් නැහැ. ඔය තරම් පාලනය කරගන්න බයක් තිබෙනවා නම් කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දෙපැත්තට ගිහිල්ලා දෙපැත්තෙන් ආරක්ෂාව දාගන්න කියන්න කියලා. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරලා දෙන්න. වාහනයක් නවත්වන්න විධියක් නැහැ. පොලීසියෙන් වට කරගෙන ඉන්නවා. මන්ත්‍රීවරයෙකුට වෙලාවට පළාත් සභාවට එන්න විධියක් නැහැ. පළාත් සභාවේ අයවැය ඡන්දයක් යන්නේ. අනෙක් මන්ත්‍රීවරු විනාඩි 10 ක් 15 ක් තියලා ඡන්දය බලාගෙන එනකොට, වාහනය නවත්ත ගන්න දිහාක් නැතුව යයි. ඒ නිසා ඔබතුමා පොලීසියෙන් ඉල්ලීමක් කරන්න. බැරියර් දාලා මෙතැන ඉස්සරහාට මිනිස්සු ටික ගෙන්න ගන්න අවශ්‍ය නැහැ නේ? පොඩ්ඩක් බැරියර් ඈත් කරලා දාගන්න කියන්න. එම ඉල්ලීම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් ඒක දකිනවා. උද්ඝෝෂණය කරන්න දෙන්න ඕනෑ. ඒක ජනතාවගේ අයිතියක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

උද්ඝෝෂණයේ අයිතිය තිබෙනවා. පොලීසියට කියන්න කරදර කරන්න එපා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය තිබෙන්නේ, මේ ඉස්සරහා පිටම උද්ඝෝෂණය කිරීම.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

උද්ඝෝෂණය කළාට කමක් නැහැ. පොලීසිය එතැන අනවශ්‍ය මැදිහත්වීමක් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න**(ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne(Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, වත්තේගෙදර සණස සමිතිය ගැන දැන් කථා කළා. ඒ සම්බන්ධව දැනටමත් විශාල ක්‍රියා මාර්ග ප්‍රමාණයක් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒක පිළිතුරු කථාවේදී කරන්න. එතැනදී කරන්න. මම නම් දකින්නේ. ඔබතුමාට පුළුවන් නම් එතැනට ගිහිල්ලා, මොකක් හරි පොරොන්දුවක් දුන්නා නම්, ඒ අය යනවා. මේ ගැන මොකක් හරි සහතිකයක් නේ ඒ අය ඉල්ලීම් කරන්නේ. අයිතියක් නේ ඉල්ලන්නේ. නිලධාරියෙක් හරි කවුරු හරි වගකිව යුතු කෙනෙක් යන්න ඕනෑ. කවුරු හරි කථා කරලා, පුළුවන් නම් එතැනට ගිහිල්ලා කළත් කමක් නැහැ. එතකොට ප්‍රශ්නය ඉවරයි. උද්ඝෝෂණය කිරීමක් නැහැ. මගේ නිල කාමරය වුණත්, ලෑහැස්ති කරලා දෙන්නම්. තුන් හතර දෙනෙකුට උඩට එන්න කියලා ඔබතුමාත් ගිහිල්ලා, මොකක් හරි පොරොන්දුවක් දීලා ඒක අවසන් කරන්න. කොමසාරිස්තුමාත් ඉන්නවා. මගේ කාමරයේ ඉඩ ලබා දෙන්නම්. ඒ කට්ටිය කැඳවලා මොකක් හරි තීන්දුවක් දෙන්න. නැත්නම් ඒ මිනිස්සු බොරුවට කැකෝ ගහලා ඊළඟට බැරියර් පෙරලාගෙන ආවොත් ඒක අපට ප්‍රශ්නයක් නේ? ඇමැතිතුමා එහෙම කරන්න.

මීළඟට සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.44]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන එකම ඇමැතිවරයාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන සන්තෝෂයි. අර කථාවක් තිබෙනවා නේ කුඹියනේ තොපටත් රජෙක් ඉන්නේ කියලා. ඒ වාගේ අපට ඉන්න එකම ඇමැතිවරයා. ඉතින් මොන අඩුපාඩු තිබුණත්,ආරක්ෂා කරගන්න ඕනෑ. අපි දැක්කා, මේ

අමාත්‍යාංශය පසුගිය කාලයේ නිමල් ලාන්සා ඇමැතිතුමා යටතේ තිබුණේ. නීතිරීති කොයි පැත්තට නමලා, කඩලා කෙරුවත් කාර්යක්ෂමව විශාල සේවාවක් කෙරුවා. ඒ ගැන කියන්න ඕනෑ. හිටියා වුණත් නැති තැන වුණත්. මේ ඇමැතිතුමාටත් විශාල බාධාවන් රාශියක් තිබෙනවා. ඒවා බිඳ ගෙන - මේක තමයි මහජනතාවට දැනෙන්න යමක් කරන්න පුළුවන්, විෂය ක්ෂේත්‍ර විශාල ප්‍රමාණයක් තිබෙනඅමාත්‍යාංශය. සමූපකාරය තිබෙනවා. පළාත් මාර්ග තිබෙනවා. ප්‍රවාහනය තිබෙනවා. ඒ නිසා ඔබතුමා තමන්ගේ නිලධාරී කණ්ඩායම - ඔබතුමාගේ නමේ එක කොටසකුත් තිබෙනවා ලලිත් කයිතන් වනිගරත්න. කයිතන් මුනින්ද්‍රයා කියන්නේ, බොහොම බලසම්පන්න මුනින්ද්‍රයෙක්. අපේ ආගමේ විධියට. ඒ නිසා ඒ කඩුව හරියට අතට අරගන්න. හරියට කර ගත්තා නම් මම හිතන්නේ, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරපු විවේචනය ඒ තරම් දුරට එල්ල වෙන්නේ නැහැ.

මම ඔබතුමාට කියන්න ඕනෑ, අපේ ගරු සභාපතිතුමාත් ඉන්න පෙත්සම් කාරක සභාවට සමූපකාර විෂයය ගැන කථා කරන කොට කැලණියෙන් පෙත්සමක් ආවා. මම ඒක කියන්න ඕනෑ. මේ පෙත්සම් කාරක සභාවේ දෙන තීන්දු සමහර පළාත් පාලන ආයතනවත් තඹ සතේකට මායිම් කරන්නේ නැහැ. ඉස්සර සභාපතිවරු ඉන්න කාලයේ කෙරුවා. දැන් ඉන්න ලේකම්ලා කරන්නෙත් නැහැ. සමූපකාරයට දීපුවාම සමූපකාරවල ඉන්න සභාපතිවරු ශත පහකට මායිම් කරන්නේ නැහැ. අවුරුදු 40 ක් තිස්සේ, කැලණිය සිංහාරමුල්ලේ ඔය කියන සමූපකාර ගොඩනැගිල්ල ඒ කාලේ සද්භාවයෙන් දීලා තිබෙන්නේ. එපමණ ගාණක් ගන්නේ නැතුව. දැන් දීපු එක්කෙනාගේ මුණුබුරාට ගෙයක් හදාගන්න එතැන ස්ථානය ඉල්ලනවා. අපි ගිහිල්ලා ස්ථානීය පරීක්ෂණයක් කෙරුවා. දවසකට එක ගෑස් ටින් එකක් විකුණනවා. ඒක තමයි වෙළඳාම. මම මේ කියන්නේ ඇත්තද නැත්තද කියලා හොයලා බලන්න. එහෙම ගියාම කියනවා, අපි කුළිය ටිකක් වැඩි කරලා දෙන්නම් කියලා. කුළිය එකතු කළාම - ඒ ගොඩනැගිල්ල ආපහු ඒ අයට භාර දෙන්න කියලා පෙත්සම් කාරක සභාවේ දීපු තීන්දුවක්. දැන් ඊයේ පෙරෙයිදා සභාපතිතුමා ආයිත් කථා කරලා කියනවාලු ලක්ෂ 05 ක් දෙන්න. අපි ගොඩනැගිල්ල භාර දෙන්නම් කියලා. මේ අවුරුදු 40 ටම ඒ මිනිස්සුනට ලක්ෂ 05 ක් හම්බ වෙලා නැහැ. ඉතින් තමුන්නාන්සේ දෙන තීන්දු පිළිගන්නේත් නැත්නම්, කොමසාරිස්වරයා දෙන තීන්දු පිළිගන්නේත් නැත්නම්, කවුද? මේ සභාපතිවරු.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේත් ඉන්න පෙත්සම් කාරක සභාවේ තීන්දු මේ. ඉතින් ඒක නිසා මීට වඩා මේ අයව පාලනය කරගන්න තමුන්නාන්සේ ශක්තිමත් වෙන්න කියන ඉල්ලීම කරන්න කැමැතියි.

ඒ වගේම තමයි තමුන්නාන්සේගේ විෂයය ක්ෂේත්‍රයට තිබෙන පළාත් මාර්ග පිළිබඳව යමක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම මට මතකයි, අපේ ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත්, මමත් වත්තල ප්‍රාදේශීය සභාවේ ඉන්න කාලයේ පළාත් පාලන ආයතනවලින් ඉල්ලුවා, පළාත් සභාවට මාර්ග නම් කරලා දෙන්නය කියලා. එහෙම ඉල්ලුවේ ප්‍රධාන මාර්ග දෙකක් යා කරන පාරවල්. ඒ අනුව වැලිසර ෂෙල්ටන් ජයසිංහ කියන මාවත අපි දුන්නා. කොළඹ - මීගමුව පාරත්, රාගම පාරත් සම්බන්ධ වන පාර. ඇත්ත වශයෙන්ම ඒක හොඳට කාපට් කරලා හදලා තිබෙනවා. හැබැයි, දෙපැත්තේ කාණු ඉදි කරලා තවම ඒකේ වැඩ අවසන් කරලා නැහැ. ඒ ප්‍රධාන පාරවල් දෙකක් යා කරන පාර. මොකද, රාගම මාර්ගයත්, ඒ අවට කඳාන පාරටත් අර තිබෙන තදබදය අඩු කරන්න තිබෙන හොඳ විකල්ප මාර්ගයක් ඒක. රාගම රෝහලට යන්න. වැලිසර රෝහලට යන්න. ඒ නිසා ඒ දෙපැත්ත හදලා ඒ පාර අවසන් කරලා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්න වෙලාවේ මම මේක යෝජනාවක් විධියට කියන්න ඕනෑ. අලුතින් පාරක් භාර ගන්නවා නම් විශේෂයෙන්ම ආනියකන්ද පාර.මේක ප්‍රාදේශීය සභාවල් දෙකකට අයිතියි. මීගමුව පාරේ ඉඳලා ලින්ටන් ක්‍රීඩාංගණයට යනකල් අයිති, ජා-ඇළ ප්‍රාදේශීය සභාවට. එතැන ඉඳලා මීටර් 500 ක් වත්තල ප්‍රාදේශීය සභාවට. එතැන ඉඳලා නැවත පේරලන්ද පාරට වැටෙනකල් ජා-ඇළ ප්‍රාදේශීය සභාවට. මේකේ දෙපැත්තේ කිසි කෙනෙක් කරන්නේ නැහැ. පොඩි පොඩි පැලැස්තර දාගෙන යනවා. මේක ප්‍රධාන පාරක්. ඒක නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. 2017 වසරේ අපි දෙගොල්ලෝම එකතු වෙලා මේ පාර පළාත් සභාවට පවරා ගනිමු. දැන් ඉල්ලුම් කරන්න. ලක්ෂ 15 ක් 20 ක් විතර වියදම් කරලා වත්තල ප්‍රාදේශීය සභාවෙන් එක කොටසක් කොන්ක්‍රීට් කරගෙන යනවා. අපි දෙන්නාම වත්තල සහ ජා-ඇළ නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනා.

**41954196**

[ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආනියකන්ද පාර, කොළඹ - මීගමුව පාරත්, රාගම කඳාන පාරත් යා කරන ප්‍රධාන පාරක්. මේ පාර බස්නාහිර පළාත් සභාව පවරා ගන්නය කියන ඉල්ලීම තමුන්නාන්සේගෙන් කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම අපි දැක්කා, පසුගිය දවස්වල මේ රටේ බස්වල ප්‍රශ්නයක් තිබුණා. strike එකක් තිබුණා. පළාත් ප්‍රවාහනය පිළිබඳව කථා කරන කොට, මේ පළාතේ බස් දුවන්නේ නැතුව මේවා වර්ජනය කරන්න කටයුතු කෙරුවේ, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේම නිලධාරීන්. මම මේ ඇස් දෙකට දැකපු දෙයක්. මම තමුන්නාන්සේට දුරකථනයෙන් කථා කරලා කිව්වා. මේ බස් තියෙන අය. ඒගොල්ලන්ටත් බස් තිනෙවා. හැබැයි, මේ ආයතනයේ සේවකයෝ. විශේෂයෙන්ම රාගම, කොළඹ රූට් එකේ බස් දුවන්න එපාය කියලා ඔක්කෝම බස් ටික නතර කළා. මම ඒ වෙලාවේම ඔබතුමාට කථා කරලා කිව්වා. ඇයි?මේ නිලධාරීන් මේක කරන්නේ? නිලධාරීන්, ඒගොල්ලෝ බස් හිමියෝ. ඉතින් ඒක නිසා එහෙම අය පිළිබඳව හොයලා බලන්න. හොයලා බලලා ඒ අයව නිසි ස්ථානවලට ස්ථානගත කරන්න. නැත්නම් මේ වැඩේ කරන්න බැහැ. තමුන්නාන්සේට තිබෙන ප්‍රශ්නත් එක්ක. ඒ වාගේම සුනිල් ජයමිණි ගරු සභානායකතුමා, එතුමාගේ කථාව අවසන් කරන කොට හොඳ ඉල්ලීමක් කෙරුවා. මම හිතන්නේ මීට කලිනුත් මේ වැය ශීර්ෂ ගැන කථා කරද්දී කථා කරලා තිබෙනවා. ලුණු සමාගමේ ප්‍රශ්නය පිළිබඳව. මෙතැන ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාගෙන් කී දෙනෙක් මේ ප්‍රශ්නය ගැන දන්නවාද දන්නේ නැහැ. කවුද මේක දුන්නේ? කීයටද දුන්නේ? මොකක්ද මේකෙන් අපට තිබෙන ප්‍රතිලාභය? පැහැදිලිව කියන්න. කරුණාකරලා කියන්න. එහෙම නැත්නම් පරීක්ෂණයක් කරන්න. කොයි කාලයේද දුන්නේ? මොනවාද අපට දැන් තියෙන්නේ? මොනවාද ඉතුරු වෙලා තියෙන්නේ? දැන් ඇත්ත කිව්වා. පුත්තලමේ විශාල බංගලාවක් තිබුණා. මේවා අපේ සම්පත්.

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

තියෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තියෙනවා. මොනවාද අපට තිබෙන ප්‍රතිලාභ කියලා කියන්න. මම කියන්නේ නැහැ. පළාත් සභාව ව්‍යාපාර කරන්න ඕනෑ නැහැ. ඒක ඇත්ත. නමුත් පළාත් සභාවේ තිබුණු මේ සම්පත් කුණු කොල්ලයට දීලා ඉවර වෙලා,ඒ පිළිබඳව මේ සභාවට තිබුණු ආදායම අපි විසින් නැති කර ගන්නවා නම් ඒක මේ සභාව කර ගත් විශාල හානියක්. අපි තවමත් නහයෙන් අඬන්නේ මධ්‍යම රජයෙන් හම්බ වෙන මුදල කපනවා. අධ්‍යාපනයට දෙන මුදල කපනවා. ප්‍රවාහනයට දෙන මුදල කපනවා කියලා අපි ආඩපාලි කියනවා. ඇයි පළාත් සභාවේ තිබෙන දේවල්, පළාත් සභාවේ ආදායම, පළාත් සභාවේ තිබෙන අපේ උරුමය අපි ආරක්ෂා කරගන්නේ නැත්තේ ඇයි? ඒ නිසා ඒවා ගැන සොයා බලලා තමුන්නාන්සේ කටයුතු කරන්න.

ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, විශේෂයෙන්ම තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළ කාර්යක්ෂම ආයතන කිහිපයක් තිබෙනවා. ඒ කාර්යක්ෂම ආයතන තුන කඩා වැටෙන්න දෙන්න එපා. ප්‍රවාහනය, පළාත් මාර්ග. දැන් මම මේ සභාව පටන් ගන්න කලින්, ඔබතුමාගෙන් ඇහුවාම කිව්වා. මේ පළාත් මාර්ග ටික මම හරියට හදනවා කියලා. හැබැයි පසුගිය කාලයේ එහෙම පළාත් පාලන ආයතනවල මාර්ග කියලා ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඒවාට උදව් කළා. දැන් ප්‍රධාන ඇමැතිතුමා පළාත් පාලන ආයතන සතු මාර්ග භාර අරගෙන තිබෙන නිසා තමුන්නාන්සේ එතැනින් පොඩ්ඩක් ලෙස්සලා යන්න හදනවා. අපිත් කැමැතියි. ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කැමැතියි. වත්තලත්, ජා-ඇළ වාගේම තියෙනවාද? ගිහිල්ලා බලන්න. මම ඒ බෝඩ් ගහන එක ගැන කිව්වා. බෝඩ් ගහන්න ඕනෑ. වැඩ කරන මන්ත්‍රීවරු තමන්ගේ බෝඩ් එක ගහගත්තාට කමක් නැහැ. ඇත්තටම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගැන මම සන්තෝෂයි. ඒක කියන්න ඕනෑ. ජා-ඇළ පැත්තට ගිහිල්ලා බලන්න. නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය දන්නවා ඇති. නිවන්දම පැත්ත, යක්කඩුව පැත්තට ගියාම යන්න ආසයි. කාගෙන් හරි සල්ලි හොයලා ඒ පාරවල් ටික කාපට් කරලා තිබෙනවා. ඒ නිසා ඒ වරප්‍රසාදය අනෙක් අයටත් දෙන්න. මීගමුවට විතරක්, කටානට විතරක් කරන්න එපා. කටානේ ලොකු ලැයිස්තුවක් කිව්වා. අපි සන්තෝෂයි. (බාධා කිරීමක්) කටානේ මන්ත්‍රීවරයා පත් වුණාට පස්සේ කටානේ පාරවල් ටික හදන්නේ නැති වුණොත් ඒක අසාධාරණයි. ඒක කරන්න ඕනෑ. රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කැමැති වෙයි. මීගමුවේ තලාහේන පැත්තේ, පිටිපන පැත්තේ ධීවර ගම්මානවල තිබෙන පාරවල් ටික කොන්ක්‍රීට් වෙනවා නම්. කාපට් වෙනවා නම්. කවුද ඒකට අකැමැති. ඉතින් ඒක නිසා මේ බෙදීම කරන

කොට අර කියපු කථාවේ වරදක් නැහැ. ඇමැතිවරු, ධූරධාරීන් සහ හිතවත් අය ඒ විධියට කර ගෙන තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්- ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ධූරධාරීන්ටත් නැහැ.

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සමහර අයට. ඉතින් ඒක නිසා, ඒක සමසේ බෙදලා දෙන්න. තමුන්නාන්සේ එහෙම ඉල්ලීම්වලට කන් දෙන ඇමැතිවරයෙක්. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අපේ දේවස්ථානයක මංගල්‍යයක් මොනවා හරි හදිසියේ තිබුණාම, මේ වැඩේ කරලා දෙන්න කිව්වාම, ඔය පොඩ්ඩක් එහාට මෙහාට කරලා තමුන්නාන්සේ උදව් කරලා තිබෙනවා. නැහැයි කියන්නේ නැහැ. මොනවා වුණත් නිවාස ආධාර කියලා අපට රුපියල් ලක්ෂයක් දුන්නා. දීපු දේවල් ගැන ස්තූතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි අර බස් හෝල්ට් ගැන කිව්වා. අපෙන් ඉල්ලගෙන ගියා. ඒ බස් හෝල්ට් එක තවම හම්බ වුණේ නැහැ.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

Missing.

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

Missing.බස් හෝල්ට් එක හම්බ වුණේ නැහැ. මොනවාද වුණේ කියලාවත් දන්නේ නැහැ. ඉතින් එක නිසා මේ වැඩ කරද්දී තෝරාගත්තු කිහිප දෙනෙක්ට විතරක් නොවෙයි. හැමෝටම සම සේ, තමුන්ගේ උපදේශක කාරක සභාව නියෝජනය කරන අයට විශේෂ සැලකිල්ලක් කළාට කමක් නැහැ. අපට සමුපකාරය එපමණ දැනෙන්නේ නැහැ නේ? නමුත් පාර දැනෙනවා. ඒ නිසා අමාත්‍යාංශය හරහා දෙන කොට පළාත් සභා මාර්ගවලට මුදල් වෙන් කරනවා වාගේම මන්ත්‍රීවරුන්ටත් යම්කිසි මුදලක් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය හරහා අපට දුන්නොත් - අපට සමසේ ලැබෙන ලක්ෂ 24 ද, 25 ද, 30 ද, 35 ද කියලා දැන් අලුතෙන් තිබෙනවා. ඒක අපට තුලනය කර ගන්න පුළුවන්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

යහපාලනේ.

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

යහපාලනේ නේ? යහපාලනේ නිසා තමයි එතුමා ඇමැතිවරයෙක් හැටියට ඉන්නේ. ඉතින් අපට සන්තෝෂයි. අපේ දිස්ත්‍රික්කයේ ඉන්න එකම ඇමැතිවරයා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ කාලේත් එතුමා අමැතිවරයෙක්නේ?

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි. එතුමා ජ්‍යොෂ්ටයෙක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සෑහෙන කාලයක් වැඩ කරලා එතුමාට පළපුරුද්දක් තිබෙනවා. සමසේ සෑම මන්ත්‍රීවරයෙකුටම මේ දෙන වරප්‍රසාද තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් තමයි දැනෙන්න දෙන්න පුළුවන්. දැනෙන දෙයක් කරන්න පුළුවන්. මම දැක්කා. පසුගිය දවස්වල මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කුකුළු පැටව්ද, හරක් පැටව්ද, එළු පැටව්ද ගෙනැල්ලා බෙදනවා. අපෙන් ඇවිල්ලා අහනවා ඇයි? ඔයා කරන්නේ නැත්තේ කියලා. එයා ඉන්නේ වෙන උපදේශක කාරක සභාවක කියලා අපි පොඩ්ඩක් එහාට මෙහාට කර ගන්නවා. ඒක නිසා එහෙම සමසේ බෙදලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. දැන් ප්‍රධාන ඇමතිතුමාත් -

**ගරු ඉසුරු දේවප්‍රිය**(ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya(Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

මෙයා ගහන ගේම් මම දන්නවා. වෙලාවකට මෙරිල් අල්ල ගන්නවා. වෙලාවකට ජානක අල්ල ගන්නවා. හැබැයි, ඒ දෙන්නා ඇල්ලුවාට මාව අල්ලන්න බැහැ ඔබතුමාට.

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම ඔබතුමා ගැන සඳහන් කළේ, දැන් ඔබතුමාට පළාත් පාලන විෂයය තිබෙන නිසා. පළාත් පාලන පාරවල් ඔබතුමා භාර අරගෙන තිබෙන්නේ. එතුමාට හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා[සුනිල් විජේරත්න මහතා]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ]මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ කාලය හරියටම පිරිමහලා තමන්ගේ කථාව අවසන් කරන්න උත්සාහ කරන්න. නැත්නම් කාලයත් එක්ක පොඩි ගැටළුවකට පත් වෙනවා. මීළඟට ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.55]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර, වෙළඳ, නිවාස ඉදි කිරීම්, කර්මාන්ත, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ අයවැය විවාදයට එක් වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම මුලින්ම ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ පවතින අමාත්‍යාංශ අතර ජනතාවට සෘජු සම්බන්ධතාවයක් තිබෙන, ජනතාවට ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශ කිහිපයක්, අපේ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ පාලනය වෙනවා. ඒ නිසා තමයි මේ විවාදය ආරම්භ වුණු අවස්ථාවේ ඉඳලාම දිගින් දිගටම නොයෙක් ප්‍රශ්න, නොයෙක් චෝදනා එල්ල වෙන්න පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය, සමූපකාර අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය කියන්නේ ජනතාවගේ එදිනෙදා කටයුතුවලට සෘජුවම බලපාන අමාත්‍යාංශ වශයෙන් අපට හඳුනාගන්න පුළුවන්. ඒ නිසා මේ අමාත්‍යාංශවල වැඩ කෙරෙද්දී, ඔබතුමා ඉතාම හොඳින් වැඩ කරන්න උත්සාහ ගන්නවා. ඔබතුමා කාත් එක්කත් සුහදව වැඩ කරන්න උත්සාහ කරනවා. ඔබතුමා හැම අවස්ථාවකදීම කවුරු හෝ මන්ත්‍රීවරයෙක් කියන දෙයකට හෝ එහෙම නැත්නම් නියෝජිතයෙක් කියන දෙයකට ඇහුම්කන් දීලා, ඔබතුමාට කරන්න පුළුවන් හැම දේම කරන්න ඔබතුමා උත්සාහ කරනවා. නමුත් ඒක අපේ සමහර අය සමහර වෙලාවට වැරදි විදියට දැකලා ඔබතුමාටම චෝදනා කරනවා. ඔබතුමාට කඩුව අතට ගන්න එහෙම නැත්නම් ඔයිට වැඩිය මේවා වෙන්න නොයෙක් දේවල් කියන්න ගත්තා. නමුත් ඔබතුමා ගෙන යන ක්‍රමය තුළ, ඔබතුමා හැම වෙලාවේම හැම කෙනෙකුටම සාධාරණ ක්‍රමයක් කරන්න උත්සාහ කරනවා. නමුත් ඒවායේදී සමහර අය අයුතු ප්‍රයෝජන අරගෙන ඔබතුමාගේ නම සවුත්තු කරන කටයුත්තක් කරනවා.

හොඳම උදාහරණය හෝමාගම සමූපකාරය. සමූපකාර විෂයය යටතේ ගත්තාම හෝමාගම සමූපකාරය පාලනය වුණේ, අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ. අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වුණු හෝමාගම සමූපකාරය ඔබතුමාටත් නොකියා -හෝමාගම ආසනයේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරයා මම. අපේ විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාත් ඉඳිද්දී. ගාමිණී තිලකසිරි ඇමැතිතුමා නම් තුනක් දාලා. අධ්‍යක්ෂ මණ්ඩලයත්, මේකේ කොමසාරිස්තුමන්ලා ඉන්නවා නම්, නොමඟ යවලා. තුන් දෙනෙක්ව පත් කරලා මහජන ඡන්දයෙන් පාලනය කරගෙන ගිය සමූපකාරයේ බලය වෙනස් කර ගත්තා. ඒකේදී මම ඔබතුමාට දිගටම චෝදනා එල්ල කළා. ඒ අවස්ථාවේ ඔබතුමා මට කිව්වා, මම මේ කිසි දෙයක් දන්නේ නැහැ. තිලකසිරි ඇමැතිතුමා ඔබතුමාව නොමඟ ඇරියා කියලා. පළාත් සභාවේ එකට වාඩි වෙන, ඔබතුමන්ලාගේ කැබිනෙට්ටුවේ එක ඉන්න ඇමැතිවරු තමයි ඒ අයුතු ප්‍රයෝජන ගත්තේ. දැන් මෙතුමන්ලා කියපු කථාව, මට ඔබතුමාට එල්ල කරන්න පුළුවන්. නමුත් ඒ කථාව මම ඔබතුමාට එල්ල කරන්නේ නැත්තේ, මම පෞද්ගලිකව ඔබතුමා ගැන හොඳාකාරවම දන්නවා. ඔබතුමා වැඩ කරන්න හදනවා. සාධාරණව කරන්න උත්සාහ කරනවා. නමුත් අනික් අය අයුතු ප්‍රයෝජන ගන්න නිසා තමයි, ඒ චෝදනා ඔබතුමාට එල්ල කරන්න පුළුවන් වුණේ. අද මේ වනකොට අපේ හිටපු

අමාත්‍යවරයෙක් හෝමාගම සමූපකාරයේ නඩුවක් දාලා තිබුණා. දැන් ඒ නඩුව අයින් කරගෙන තිබෙනවා.

දැන් ඕනෑ නම් හෝමාගම සමූපකාරයට සාධාරණයක් කරනවා නම්, එක්කෝ මහ සභාව රැස් කරලා ඡන්දයක් අනුව නියෝජිතයෝ තියන්න. එහෙම නැත්නම් කාලය ඉවර නම් ඡන්දයක් තියන්න පුළුවන්. අපි සූදානම් ඒක කරන්න. ඇමැතිතුමාට කිව්වා කඩුව අතට ගන්න. වැඩ කරන්න කියලා. දැන් ලබන සතිය වනකොට හෝමාගම සමූපකාරයේ ඡන්දය තියන්න සූදානම් කරන්න. එහෙම නැත්නම් හෝමාගම මහ සභාව රැස් කරලා මහජන නියෝජිතයන් ස්වෙච්ඡාවෙන් පත් කරන්න සූදානම් කරන්න. පත් කරපු නියෝජිතයන්ගේ කාලය අවසන් කරන්න. ප්‍රජාතන්ත්‍රවාදීව ඒක කරන්න පුළුවන්,ගරු ඇමැතිතුමනි. හැබැයි, මේ ආණ්ඩුව පත් වුණු දවසේ ඉඳලා ඡන්ද අයිතිය අහෝසි කරලා තිබෙනවා. මේ ආණ්ඩුව ඡන්දවලට බයයි. මේ ආණ්ඩුව පළාත් පාලන ඡන්දය තියන්නේ නැහැ. සමහර විට ඒ ප්‍රයෝජනය අරගෙනමේ අවුරුදු දෙකක් තුළ ඡන්දය නොතිබ්බ ආණ්ඩුවේ ඒ ප්‍රයෝජනය අරගෙන තමුන්නාන්සේලාත් යහපාලන ආණ්ඩුවේ ඉන්න නිසා සමහර විට සමූපකාර ඡන්දය තියන්නභය වෙයිනැත්නම් අපි හෝමාගම සමූපකාර ඡන්දයට සූදානම්. එහෙම නැත්නම් මහ සභාව රැස කරන්න. මහජන ඡන්දයෙන් අවුරුදු තුනක් ගෙවුණු මහ සභාවක් තිබෙනවා. මහ සභාව රැස් කරන්න, නියෝජිතයෝ පත් කරන්න අවස්ථාව දෙන්න. ඒක ජනතාවගේ අයිතිවාසිකමක්.

මම සමූපකාර විෂයය ගැන එහෙම කියන්නේ. මොකද, වෙළඳ විෂයයත් එක්ක ගත්තාම සමූපකාර විෂයය කියන්නේ, ඉතාමත්ම වටිනා විෂයයක්. මොකද, ගරු සභාපතිතුමනි, අපේ සමූපකාර, වෙළඳ අමාත්‍යාංශයට ඉදිරියේදී වගකීම් ගණනාවක් එනවා. දැන් මේ වනකොට බඩු මිල පිළිබඳව රටේ ජනතාව ලොකු ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙන්නේ. අද රුපියල් 80 ක් 90 ක් නැතුව හාල් සේරුවක් ගන්න බැහැ. අද හාල් මිල සීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා. රටේ හැම තැනම නියඟ සහ ගංවතුර නිසා පසුගිය කාලයේ විනාශ වුණු කුඹුරු ගණනාවක් වපුරලා නැහැ. ඉදිරියේදී ලොකු අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේවාට සූදානම් වෙන්න, වෙළඳ අමාත්‍යාංශය ප්‍රාණවත් වෙන්න ඕනෑ. පසුගිය කාලයේ අපේ රජය මගින් ජනතාවට පොහොර සහනාධාරය ලබා දුන්නා. ඒ පොහොර සහනාධාරය අද නැහැ. ඒ පොහොර සහනාධාරය නැති නිසා ගොවියා අද කුඹුරට යන්නේ නැහැ. අද මිනිසාට වගා කරන විධියක් නැහැ. පොහොර කිලෝ එකක් අද රුපියල් 5000 යි. 6000 යි. ඉතා විශාල ගණන්වලින් පොහොරවල මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අද මේ රටේ ජනතාවට ආහාරවල ලොකු අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. කෝලිකුට්ටු කිලෝ එකක් ගත්තොත් රුපියල් 300 යි, 400 යි. මම ළඟදී කඩයකට ගිහිල්ලා කෝලිකුට්ටු ඇවරියක් ගත්තා. ලස්සනට තිබුණු නිසා කපන්න කියලා සල්ලි දෙන්න ගියාම කෝලිකුට්ටු ඇවරියේ මිල රුපියල් 550 යි. අනාමාළු කෙසෙල් ඇවරියක් ගන්න ගියා. කෙසෙල් ගෙඩි 10 යි ගත්තේ. රුපියල් 400 යි. අද දරුවෙකුට පිරිසිදු ආහාර වේලක් දෙන්න විධියක් නැහැ. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයට වඩා වෙළඳ අමාත්‍යාංශයටත් මේකේ වගකීමක් තිබෙනවා ගරු සභාපතිතුමනි. මේක පාලනය කරන්න, තරගයක් දෙන්න.

අද සතොස ආයතනය සම්පූර්ණයෙන් ඉවරයි. අද සතොස නැති නිසා, ඒකේ වගකීම එන්නේ පාරිභෝගිකයො වශයෙන් සමූපකාර අමාත්‍යාංශයට.සමූපකාර අමාත්‍යාංශයේ තමයි රජයේ පාලනයක් තිබෙන්නේ. අද සතොසට ගියොත් සතොසේ තිබෙන්නේ රාක්ක ටික විතරයි. මෙලෝ බඩුවක් නැහැ. පසුගිය දවස්වල සතොස දිගට හරහාට - බන්දුල ගුණවර්ධන ඇමතිතුමා, ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා ඉන්න කොට තරගයක් දෙන්න, හාල් මිල අඩු කරන්න, ඒ සඳහා සතොසවල් ඇරගෙන, ඇරගෙන ගියා. අද සතොසවල් නැහැ. සමූපකාරය විතරයි තිබෙන්නේ. මේ සමූපකාරයත් දේශපාලනයට නතු කරලා විනාශ කළොත්, ගමේ මිනිහාට එළියට බැහැලා බඩුවක් ගන්න,සාධාරණ තරගයක් දෙන්න තැනක් නැහැ. එහෙම නැත්නම් සුපිරි වෙළඳ සැල්වලට විතරයි ජනතාවට යන්න වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වෙළඳ අමාත්‍යාංශය ගැන විතරයි කියාගෙන යන්න හම්බ වුණේ. ඉතුරු ටික
[ගරු ජනක වැලිවත්ත]

**41954196**

කියන්න හම්බ වුණේ නැහැ. ප්‍රවාහන අමාත්‍යාංශය, ඒ වාගේම මාර්ග අමාත්‍යාංශය ගැන කියන්න ඕනෑ. ඔබතුමන්ලා විශාල මුදල් ප්‍රමාණයක් එවනවා. නමුත් ඒ මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් මදී. ඔබතුමා සාධාරණ විධියට අපේ ආසනවලට එවපු මුදල් අපට සාකච්ඡා කරලා ඒක යොදවන්න කිව්වා. ඒක යෙදෙව්වාට ගරු ඇමතිතුමනි, ලක්ෂ දෙතුන් සියයක මුදලක් හෝමාගම වාගේ ලොකු ආසනයක පාරවල්වල සංවර්ධන කටයුතු සඳහා මදී. සංවර්ධනය නොවුණු තවත් පළාත් මාර්ග ගණනාවක් තිබෙනවා. ඒ නිසා වැඩිපුර මුදල් ප්‍රමාණයක් ඒ ආසනවලට ලබා දෙන්න. අපේ ප්‍රධාන ඇමැතිතුමා මහරගම ආසනය පුරාම සංවර්ධනය කරගෙන යනවා. කාපට් අතුරාගෙන යනවා. ඉතින් ඒවා කරන කොට හෝමාගම ආසනයේ ජනතාව අහනවා, බස්නාහිර පළාත් සභාව තිබෙන්නේ මහරගමට විතරද කියලා. ඒ නිසා හෝමාගම ආසනයටත් ඒක ලබා දෙන්න ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියන ඉල්ලීම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යාංශය තුළ විශාල වැදගත්කමක් තිබෙනවා. මොකද, ජනතාව විශාල ගැටළු ගොඩකට මුහුණ දෙන්නේ, ප්‍රවාහනයෙන්. අද ජනතාවට එදිනෙදා සේවයට ඇතුල් වෙන්න තිබෙන ප්‍රවාහනය සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරලා - අපේ ප්‍රදේශවල ගත්තොත් හෝමාගම ප්‍රදේශය, පිටිපන ප්‍රදේශය සීඝ්‍රයෙන් දියුණු වෙලා. දවසකට ලක්ෂ ගණනක් ජනතාව මේ ප්‍රදේශයට එනවා. නමුත් බස් ප්‍රවාහන සේවය පිළිබඳව ගැටළුවක් තිබෙනවා. ඒවාත් සාකච්ඡා කරන්න කියලා ඉල්ලා සිටිනවා. කාලය අවසන් නිසා මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 10.02]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැය ශීර්ෂ අංක 107 යටතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම මෙම අමාත්‍යාංශය පිළිබඳව සලකා බැලීමේදී, ජනතාවට ඉතාමත් සමීපව කටයුතු කිරීමට පහසු අමාත්‍යාංශ අටක් අපේ අමාත්‍යවරයා යටතට පැවරී තිබුණත්, නිර්මාණශීලීව වැඩ කරන අමාත්‍යවරයෙකුට මේ තුළින් ජනතාවට ඉතාම සමීපව වැඩ කරන්න පුළුවන් අවස්ථාව ලැබෙන බව අපි දකිනවා. නමුත් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන කරුණු පිළිබඳව සැලකිලිමත් වීමේදී මා දකින්නේ විශේෂයෙන්ම වැඩිපුර විවේචන එල්ලවන අමාත්‍යාංශ ටිකක් තමයි අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාට පැවරිලා තිබෙන්නේ කියලා. නමුත් මේ විවේචන වැඩි වෙන්න මූලිකම හේතුව වශයෙන්, මෙපමණ අමාත්‍යාංශ අටක් තිබුණාට මෙවර අයවැය යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් වෙලා තිබෙන මුළු මුදල වශයෙන් අපට දකින්න ලැබෙන්නේ, රුපියල් මිලියන 400 ක් වැනි ඉතාමත් සොච්චම් මුදලක් නිසයි. එතකොට මේ අමාත්‍යාංශ අටට සමසේ මේක බෙදුවත් එක් අමාත්‍යාංශයකට ලැබෙන්නේ රුපියල් මිලියන 5 ක් වැනි ඉතාමත් සුළු මුදලක්. නමුත් අපි දකිනවා. මේ තුළින් අපි පළාතේ ජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරන්න තිබෙන අමාත්‍යාංශ රාශියක් තිබෙන කොට, අපි කොපමණ විවේචන කළත් වැඩක් නැහැ. ගරු අමාත්‍යතුමාට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් වෙන් වෙලා නැත්නම් මෙම අමාත්‍යතුමාව කොපමණ විවේචනය කළත්, ඒ අමාත්‍යාංශය යටතේ ඵලදායී වැඩ කොටසක් කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දකිනවා. එළැඹෙන වර්ෂයේදී අපේ පළාත් සභාව යටතේ C සහ D, මේ මාර්ග සංවර්ධනය පිළිබඳව කථා කරන කොට 2017 වර්ෂය සඳහා මාර්ග සංවර්ධනය වෙනුවෙන් වෙන් වෙලා තිබෙන මුළු මුදල රුපියල් මිලියන 150 කට අඩු මුදලක්. නමුත් අපට යටත්ව තිබෙන කිලෝ මීටර් 1953 න් 72% ක ප්‍රමාණයක් මේ වනකොට සංවර්ධනය කරලා තිබෙනවා. නමුත් අපට ලොකුම ප්‍රශ්න සහගත තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ මේ 72% ක ප්‍රමාණය නඩත්තු කරන්නටත්, ඒ වාගේම ඉතිරි වෙලා තිබෙන 28% ක ප්‍රමාණය සංවර්ධනය කරන්නටත් මේ මුදල ප්‍රමාණවත්ද කියලා. විශේෂයෙන්ඒ තුළින් එළැඹෙන වර්ෂය තුළදී ලබා ගත හැකි ප්‍රගතිය පිළිබඳව අපට විශාල ප්‍රශ්න සහගත තත්ත්වයක් තිබෙනවා. මේ රුපියල් මිලියන 150 න් නඩත්තුව සහ සංවර්ධනය කියන ක්‍රියාදාමයන් දෙකම සිද්ධ කරන්නට ප්‍රමාණවත්ද කියන එක අපට ලොකු ගැටළුවක් වෙලා තිබෙනවා.

ඇත්තෙන්ම අපේ මාර්ග සංවර්ධනය පිළිබඳව කථා කරන කොට පසුගිය කාල පරිච්ඡේදය තුළ නිමල් ලාන්සා

අමාත්‍යතුමා ඉන්න කොට, මේ පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ අපේ මාර්ගවලට අමතරව, ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහාද ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. අපි දැන් පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක බලධාරියා විධියට ඉදිරිපත් කරන්නේ, ප්‍රාදේශීය ලේකම්තුමා හෝ ලේකම්තුමිය.නැතිනම් අදාළ පළාත් පාලන ආයතනය. නමුත් මේ ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අපි අද විශාල අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දෙනවා. මොකද, අපට අමාත්‍යාංශයක් තිබෙන කොට අපට මේ අමාත්‍යාංශය යටතේ අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවන්න පුළුවන්කම තිබෙනවා නම් ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතාම වැදගත් කාර්ය භාරයක්. ඒ තුළින් අපට ආදායමක් ලැබෙනවා වාගේම මේ පළාත් සභා මන්ත්‍රීවරු සිදු කරන අපේ ව්‍යාපෘති ඉතාමත් සාර්ථකව නිම කරන්න පුළුවන් අවස්ථාව අපට ලැබෙනවා. ඒ පිළිබඳව අපට යම්කිසි වගකීමක් තිබෙනවා. පළාත් සභාව හැටියට අපි මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අපේ අමාත්‍යාංශය යටතට පවරාගෙන, ක්‍රියාත්මක බලධාරීත්වය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දීලා මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළොත්, ඒක උසස් තත්ත්වයකින් අපට නිම කරන්න පුළුවන් වෙනවා. සමහර පළාත් පාලන ආයතනවලින් සිදු කරන ව්‍යාපෘති කිසිම උසස් තත්ත්වයකින් නිම වන ව්‍යාපෘති බවට පත් වෙලා නැහැ. ඒ නිසා ඉතාමත් වැදගත් වෙනවා. අපට පුළුවන්කම තිබෙනවා නම්, අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට විශාල ආදායමක් උත්පාදනය කරන ගමන් යහපත් ව්‍යාපෘති ටිකක් අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ඒ වාගේම මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අමාත්‍යාංශයක් තමයි සමූපකාර අමාත්‍යාංශය. අද සමූපකාර අමාත්‍යාංශය ගැන කථා කිරීමේදී, මෙම සමූපකාර අමාත්‍යාංශයේ මූලික අරමුණ තමයි පරිභෝගිකයාට ගුණාත්මක සේවාවක් සැපයීම. ඇත්තටම මෙයින් පාරිභෝගිකයාට ගුණාත්මක සේවාවක් සැපයෙනවාද කියන එක පිළිබඳව අපට අද ප්‍රශ්න සහගත තත්ත්වයක් තිබෙනවා. මොකද, අද සමූපකාරය තුළින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමැතිතුමාට ඉදිරිපත් කරනවා. මේ සමූපකාර ආයතනය, අතීතයේ පැවැති සමූපකාර ආයතනයක් හා සමානවම තමයි අදත් දකින්නේ. ඒ ආකාරයෙන්ම තමයි මේ සමූපකාර ව්‍යාපාරය ක්‍රියාත්මක වෙන්නේ. නමුත් අද තාක්ෂණයත් සමග ඉදිරියට යන මේ ලෝකය තුළ අපි දකිනවා මේ සමූපකාර ආයතනයට තිබෙන එකම competitionනැත්නම් තරගකාරීත්වයක් ලබා දෙන ආයතනය තමයි Cargills, Keels, Food Cityවැනි ආයතන. මේ සමූපකාර ආයතන හා සමාන කාර්ය භාරයන්වල නිරතවන ආයතන. ඉතින් අපිත් නිර්මාණශීලීව මේ ආයතනත් සමග තරගකාරීත්වයකින් කටයුතු කරන්නට අපේ සමූපකාරයටත් අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි. නැත්නම් මේ සමූපකාරයට කවදාවත් ගොඩ යන්න ලැබෙන්නේ නැහැ. එතකොට මේ සමූපකාරයට, නාගරීකරණය වුණු ප්‍රදේශවල ජනතාව ඉතාමත් අල්ප වශයෙන් තමයි අද ඇදීගෙන එන්නේ. ඉතා අඩු ප්‍රමාණයක් තමයි දකින්නට ලැබෙන්නේ. ඒ නිසා මා දකිනවා සමූපකාර ව්‍යාපාරයෙන් අපට තරගකාරීත්වයක් දෙන්නට පුළුවන් ආකාරයට - දැන් මේ සමූපකාර ආයතනය කියලා මේක හැමදාම පාඩු ලබනවා නම්, මේක පවත්වාගෙන යෑමේ කිසිම වැදගත්කමක් නැහැ. මේකෙන් පාරිභෝගිකයෝ කොපමණ ප්‍රමාණයක් නඩත්තු වෙනවාද කියලා බලන්න ඕනෑ. සාමාජිකත්වය නොවෙයි. ඒ වාගේ මෙහි සාමාජිකයන් කී දෙනෙක් මේ සමූපකාරයට එනවාද? සමහර විට අද මේ සමූපකාරය දේශපාලන අතකොළුවක් බවට පත් වෙලා තිබෙනවා. අපි ඒක පැත්තට දාමු. නමුත් මේ සමූපකාරය තුළින් පාරිභෝගිකයෝ කීදෙනෙක් ප්‍රතිලාභ ලබනවාද කියලා බලන්න ඕනෑ. මේකේ සාමාජිකයෝ ඉන්න පුළුවන්. නමුත් මේ සාමාජිකයෝ කිසි කෙනෙක් මේකට එන්නේ නැහැ. සාමාජිකත්වය තිබුණාට ඒ අය අනෙකුත් ආයතනවලින් බඩු භාණ්ඩ මිලදී ගන්නේ. ඉතින් මේ පිළිබඳව ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරවමින්, ඒ වාගේම අද මේකේ පරිපාලන කටයුතු සිද්ධ කරන්නේ වෙනම, ඒ කියන්නේ දේශපාලනික වශයෙන් පත් වුණු පිරිසක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

බොහොම ස්තුතියි.

[පූ.භා. 10.11]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

**41954196**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂය තුළකථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ, සමූපකාර ක්ෂේත්‍රය ගැන ගොඩක් මන්ත්‍රීවරු කථා කළා. මේ අමාත්‍යාංශය හරහා සමූපකාරය අද රජයේ ආධාර, පළාත් ආධාර සහ සමූපකාර බැංකුව නැත්නම් අද මේක වහන්න වන තත්ත්වයකට වැටුණු ආයතනයක් හැටියටයි අපි කවුරුත් සමූපකාරය දකින්නේ. නමුත් අපි ඔබතුමාට සුභ පතනවා අමාත්‍යාංශය භාර අරගෙන ඉදිරියට ගෙන ඒම පිළිබඳව.

හිටපු අමාත්‍යතුමාගේ චෝදනා ගණනාවක් තිබුණත්, අපි ඒවා උළුප්පා කථා කරන්න නොවෙයි සූදානම් වන්නේ. මම හිතන්නේ මේක අවස්ථාවක් කර ගන්නවා - අඩුම තරමේ සමූපකාර නීතිය වෙනස් කරලා හරි අද ලංකාවේ තිබෙන සමූපකාරවලට කළමනාකාරවරයෙක් තෝරා පත් කරගන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මම දන්න තරමෙන් උපාධිධාරියෙක් තමයි කළමනාකාර තනතුරට පත් කළ යුත්තේ. මේ සමූපකාරයෙන් දෙන පඩියට උපාධිධාරී පුද්ගලයෙක් පත් කරන්න බැහැ. ඒ නිසා මුළු රටේම අද වැඩ බලන කළමනාකාරවරු තමයි සමූපකාරය පාලනය කරන්නේ. එක පැත්තකින් පළපුරුද්දක් නැහැ. අනෙක් පැත්තෙන් අධ්‍යාපන සුදුසුකම් නැහැයි කිය කියා අපි බලාගෙන ඉඳලා පද්ධතිය තවත් පහළට වට්ටන ක්‍රමවේදයකට තමයි අදත් පාලනය වෙන්නේ. එම නිසා ඉදිරියේදීවත් සමූපකාර නීතිය වෙනස් කළ යුතුයි කියන - මමත් ඉදිරියේදී කරන්න ඉන්න යෝජනාවක් එය. විවාදයට තුඩු දෙන යෝජනාවක් හැටියටයි මම දකින්නේ. මේ සමූපකාර ක්ෂේත්‍රය වෙනස් කළ යුතුයි කියන එක. හැබැයි සමූපකාරයේ බඩු ගන්න ගියා නම් දිරාපත් වුණු ගුල්ලො ගහපු බඩු ටිකක් නම් අනිවාර්යෙන්ම ලැබෙනවා කියන එක තමයි ජනතාවගේ මතය. ඒවා වෙනස් කරලා, තරගකාරී මට්ටමට අපි යන්න නම් අපට තවත් සංවර්ධනය කරලා මේවා ඉදිරියට ගෙන යන්නට ඕනෑ. ඒ වාගේම නිවාස අමාත්‍යාංශය භාරව වැඩ කටයුතු කරන්නෙත් ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා. මම මේ ගෞරවනීය සභාවේ යෝජනාවක් කරනවා, මුදල් නිකන් නාස්ති කරන්නේ නැතුව අඩුම තරමේ මේ බස්නාහිර පළාතේ අපට ගෙවල් හිඟය විසඳන්න, නිවාස අඩුව විසඳන්න පුළුවන් ක්‍රමවේදයක් රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාත් යෝජනා කළා. ඇත්තටම ඒක බොහොම හොඳ යෝජනාවක් හැටියටයි දකින්නේ. අඩුම තරමේ එක මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂය ගණනේ ගෙවල් දෙකක් හදන්න කියලා යෝජනා කරලා මුදල් වෙන් කරලා දුන්නා නම්, එක අවුරුද්දකට බස්නාහිර පළාත් සභාවේ ගෙවල් 208 ක් නිර්මාණය කරන්න පුළුවන් වෙනවා. අර ආධාර මේ ආධාර කියලා මුදල් නිකන් නාස්ති කරන්නේ නැතුව, සෘජුවම මන්ත්‍රීවරයෙකුට ගෙවල් දෙකක් හදන්න යෝජනා කරලා, ලක්ෂය ගණනේ ගෙවල් දෙකක් කියන්නේ, අපට ලක්ෂ 28 ක්, 30 ක්, 35 ක්, 50 ක්. අපි අවුරුද්දකට අරගෙන බැලුවාම, මේ ප්‍රතිපාදනවලින් අපි මොනවාද කළේ කියලා දකින්න දෙයක් නැහැ. ඒ නිසා ඒ තුළින් අපට ඇහැට පේන සංවර්ධනයක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙනවා. ඉදිරියේදී හරි ඔබතුමා යෝජනා කරන්න ගරු ඇමැතිතුමනි, එක මන්ත්‍රීවරයෙකුට ප්‍රතිපාදන ලක්ෂයක් වාගේ මුදල් වෙන් කරලා, ගෙවල් දෙකක් හදන්නට.

ඒ වාගේම වතු යටිතල පහසුකම් ගැනත් අපට කථා කරන්න වෙනවා. අද මේ රටේ තේ දළු නෙලන, කිරි කපන ජනතාවට ආධාරයක් ලබා දෙන්නට බැහැ. හේතුව පදිංචියක් නැහැ. උප්පැන්න සහතිකයක්, හැඳුනුම්පතක් හදා ගන්න බැරි අය තවමත් වතුවල ඉන්නවා. ඉඩම් හිමිකම ඉල්ලුවාම රජයේ ඉඩමක පදංචිය.ලැයිම් කාමරය තුළ ජීවත් වෙන්නේ. ඒ නිසා ඒ අයගේ සංවර්ධනයත් අපි සෘජුවම බලන්නට වෙනවා. ඒ නිසා ඒ දේවල් වෙනුවෙන් ඔබතුමාට විශාල පරිවර්තනයක් තිබෙනවා. ඔබතුමාට ජනතාවට සමීපව වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශ ටිකක් තිබෙන්නේ. මට ලැබිලා තිබෙන කාලය විනාඩි 05 යි. ඒ කෙටි කාලය තුළ අදහස ඉදිරිපත් කළේ, ඉදිරියේදී සංවර්ධනය කරන්නට මේ යෝජනා ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.16]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ උපදේශක කාරක සභාව නියෝජනය නොකළත් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන එකම

41974198

අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ කථා කරන්න ලැබීම මම හිතනවා, එක අතකට භාග්‍යයක් කියලා. සමූපකාර විෂයය ගැන තමයි මගේ වැඩිපුර අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙන්නේ. මොකද, ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් සමූපකාරය ගැන බොහොම අඩු තක්සේරුවකින් කථා කළා. මම හිතන්නේ, මේ රටට සමූපකාර ක්ෂේත්‍රය බිහි වෙන්නේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ගමට සහ දුප්පත් අහිංසක ජනතාවට ආදරය කරන නායිකාවක් හැටියට එතුමිය තීන්දුවක් ගන්නවා. ගම තුළ තමන්ට අවශ්‍යභාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාදාමයේදී, ගමේ ඉන්න මිනිහාට පාරිභෝගිකයෙක් හැටියට හොඳ දේවල් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් තුළට යන්න නම්, සමූපකාර ව්‍යාපාරය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. නමුත් අද සමූපකාරයට සිදු වෙලා තිබෙන දේ දිහා බලන කොට අද අපට දුකක් දැනුනත්, විවෘත ආර්ථිකය ඇවිල්ලා, රට තුළ විවෘත ආර්ථිකයත් එක්ක තරගකාරීත්වයට මුහුණ දෙන්න බැරිකමත් එක්ක සමූපකාර ව්‍යාපාරය යම් අඩාලතාවයකට පත් වෙලා තිබුණත්, මම විශ්වාස කරනවා අදටත් සමූපකාරය අපි රැක ගත යුතුයි කියලා. මොකද, බොහෝ අවස්ථාවලදී අපි දැකලා තිබෙනවා. සමූපකාරය හරහා අපට ගම තුළට තමන්ගේ සියලු දේවල් ගෙනියන්න බැරි වුණත් ගම තුළට නොලැබෙන කොටස ගෙනියන්න හැකියාව තිබෙනවා කියලා. විශේෂයෙන්ම කාගිල්ස් ආයතනයත් එක්ක.ආර්පිකෝ ආයතනයත් එක්ක තරගකාරීත්වයෙන් කටයුතු කරන්න බැරි වුණත්, පසුගිය කාල වකවානුව තුළ සමූපකාර අමාත්‍යාංශය හරහා අපි කෝප් සිටි හඳුන්වලා දීලා, ගම තුළට මේ පහසුකම් ටික ගෙනියන්න කටයුතු කරන්න අපට පුළුවන්කම තිබුණා. ඒ හරහා ගමේ ජනතාව තුළට මේ සමූපකාරයේ වැදගත්කම නැවත වතාවක් එකතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. මම හිතනවා. සමූපකාර ක්ෂේත්‍රය තුළ පුංචි පුංචි වෙනස්කම් කිහිපයක් අපට කරගන්න පුළුවන් නම්, සමූපකාරය තුළින් මීට වඩා ඵලදායී යමක් ගම තුළට ගෙනියන්න පුළුවන්කම ලැබෙනවා කියලා.

විශේෂයෙන්ම ගරු ඇමැතිතුමා නම්‍යශීලී අමාත්‍යවරයෙක්. ඕනෑම වෙලාවක එතුමාත් සමග කථා කරලා, බොහොම සුහදශීලීව ඕනෑම ප්‍රශ්නයක් විසඳ ගැනීමේ පුළුවන්කම අපට තිබෙනවා. ඒ නිසා මම එතුමාට යෝජනා කරනවා.ඒ සමූපකාරයේ තිබෙන සීමා බන්ධන වුට්ටක් කඩලා දාලා, ඉන් ඔබ්බට ගිහිල්ලා වැඩ කටයුතු කරන්න අපි පටන් ගමු. විශේෂයෙන්ම අපි බොහෝ වෙලාවට සමූපකාරයේ බඩු ටික ගන්නේ කවුරු හරි එන ඩීලර් කෙනෙකුගෙන්. එහෙම නැතුව අපි ඊට වඩා ක්‍රමවේදයකට ගිහිල්ලා අපට පුළුවන් නම් direct ඒ නිෂ්පාදනය කරන ආයතනත් එක්ක සම්බන්ධ වෙලා මේවා අරගන්න කොට, ඒකෙන් ලැබෙන ප්‍රතිලාභය සමූපකාරය තුළට ලැබෙන වැඩ පිළිවෙළක් හදන්න. මම හිතනවා, ඒක ඉතාමත් වැදගත් කාරණාවක් වෙනවා කියලා.

ඒත් එක්කම හැමදාම එක්සත් ජාතික පක්ෂ රජයක් එනකොට මේ සමූපකාරය කඩාගෙන වැටෙනවා. අපි දැක්කා යහපාලන ආණ්ඩුව ඇවිල්ලා, අද යහපාලන ආණ්ඩුව තුළිනුත් මේ සමූපකාරය විනාශ කරවන වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. (බාධා කිරීමක්) බහුතරයක් සිද්ධ වෙන්නේ මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලය තුළ. පසුගිය වකවානුව තුළ සමූපකාර ව්‍යාපෘතියට බදු සහන ලබා දීලා, සමූපකාරය ඉහළට ගන්න වැඩ පිළිවෙළක් අපේ රජය තුළ ක්‍රියාත්මක වුණා. හැබැයි අද මොකද වෙලා තිබෙන්නේ? අද ඒ බදු සහන සියල්ල කප්පාදු කරලා. අද ආයෝජකයෙක් සමූපකාරයට එන්නේ නැති මට්ටමට ඇවිත්. ගමේ දුප්පත් මිනිහා ඇවිල්ලා තමන්ගේ මුදල් සමූපකාරයේ තැන්පත් කරන්නේ, ඒකෙන් රජයට බදු මුදලක් ලබා ගන්න නොවෙයි. හැබැයි, අද ඒවා නැවත වතාවක් මේ අලුත් අයවැය තුළ ස්ථාපිත වෙලා. අද මනුස්සයෙකුට රුපියල් 5000 ක පොළියක් ලැබෙනවා නම්, ඒකටත් අද බදු වැදෙන වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මෙහෙම ගියොත්, මේ ආකාරයට ක්‍රියාත්මක වුණොත්,මම හිතනවා රට තුළ සමූපකාරය කදාවත් ගොඩ නගන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාත් අද මේ යහපාලන රජයත් එක්ක එකතු වෙලා ශක්තිමත්ව යන කෙනෙක්. ඒ නිසා ගරු ඇමැතිතුමා මේ වැඩ පිළිවෙළට මැදිහත් වෙන්න. සමූපකාරයට මේ ගහන බදු ටිකෙන් සමූපකාරය නිදහස් කරගන්න. සමූපකාරය ස්වාධීන ආයතනයක් හැටියට කටයුතු කරන වැඩ පිළිවෙළට ඉඩ ලබා දෙන්න ඔබතුමා මැදිහත් වෙන්න කියන ඉල්ලීම මම ඔබතුමාට කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**41954196**

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මට හැරෙන්නත් වෙලාව මදී. කෙසේ වෙතත් මාර්ග සංවර්ධනය ගැන කථා කරන කොට පසුගිය කාල වකවානුව තුළ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාත් එක්ක අපේ රජය තිබෙන කාලයේ අපට පුළුවන්කම ලැබුණා, මේ බස්නාහිර පළාත් සභාවේ පළාත් මාර්ගවලින් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් කාපට් දාලා හදන්න. හැබැයි, දැන් ඒවායේ නඩත්තු කිරීමේ වැඩ කටයුතු සහ ඉතුරු වැඩ කිරීමේදී අපි දන්නවා, පසුගිය වසරේ මීරිගම මැතිවරණ කොට්ඨාශයට කිලෝ මීටර් භාගයක්වත් කාපට් දාන්න හම්බ වුණේ නැහැ. මම හිතන්නේ, ඒක අමාත්‍යතුමාගේ වැරැද්දක් නොවෙයි. අමාත්‍යතුමට මීට වඩා මුදල් ප්‍රතිපාදනයක් වෙන් වෙන්න ඕනෑ. හැබැයි එතුමාගේ වැය ශීර්ෂය දිහා බලන කොට, එතුමාට ලැබිලා තිබෙන මුදල දිහා බලන කොට එතුමාට අමාත්‍යවරයෙක් හැටියට මේ කටයුත්ත කරන්න පුළුවන්කම තිබෙයිද කියලා ගැටලුවක් එනවා. වෙනදා නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා මධ්‍යම රජයෙන් ගෙන ආවා වාගේ ඔබතුමා මේ සඳහා මැදිහත්වීමක් ඉල්ලාගෙන පළාත් සභාව තුළ ඉතුරු මාර්ග ටික සංවර්ධනය කරන්න කටයුතු කරන්න.

ඒත් එක්කම තව එක කාරණාවක් කියලා මගේ කථාව අවසන් කරනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන මීට වඩා දැඩි අවධානය යොමු කරන්න. මගේ කාලය ගත වන නිසා මීට වඩා කථා කරන්නේ නැහැ. ඒ ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් අද දවසේ ඔබතුමාට අපි සියලු දෙනාගේම සහයෝගය ලබා දෙනවා. නිර්මාණශීලී අමාත්‍යවරයෙක් හැටියට ඔබතුමාට ඉදිරියේදී ශක්තිමත් ගමනක් යන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.21]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාව වෙන් කර දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධව කථා කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. විශේෂයෙන්ම අපේ ඇමැතිතුමා ගැන වචන කිහිපයක් කථා කළොත් ඉතාමත් සතුටට පත් වෙනවා. මොකද, අද අපට අත්‍යවශ්‍ය ඇමැතිවරයෙක්. නිහතමානී ඇමැතිවරයෙක්. අපට වැඩක් කරගන්න පුළුවන්, අපේ ආසනයට වැඩක් කරගන්න පුළුවන් ඇමැතිවරයෙක් විධියට මා එතුමා ගැන ඉතාමත් සතුටට පත් වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මම අවධානය යොමු කරන්න කැමැතියි, ප්‍රවාහනය ගැන. අපි කථා කළොත් මේ රටේ දවසකට අට දෙනෙක් රිය අනතුරුවලින් මිය යනවා. 25 දෙනෙක් පමණ මොනවා හරි ආබාධිත තත්ත්වයකට පත් වෙනවා. අපි මේක කොහොමද ගුණාත්මකභාවයකට ගෙන එන්නේ? ප්‍රවාහනය ගුණාත්මකභාවයකට ගෙන එන්න නම් අනිවාර්යයෙන්ම දඩ මුදල් අය කිරීම් වාගේම රියැදුරන්ගේ ගුණාත්මකභාවයත් අවශ්‍යයි. අපි එළියට බැස්සාම අද අපට තිබෙන ප්‍රධානම ගැටළුව තමයි පුද්ගලික බස් හා ත්‍රිරෝද රථ. මේ අය නිසා අපට හරියට පාරේ යන්න බැහැ. මේ අයගේ විශාල තරගයක් තිබෙන්නේ. මුදල් හඹා යන නිසා මේ රිය අනතුරුවලට වැඩිපුරම වගකිව යුත්තේ, පුද්ගලික බස් සමාගම් සහ ත්‍රිරෝද රියදුරන්. එම නිසා මේ අයගේ ගුණාත්මකභාවය වැඩි කරන්න, අඩුම තරමේ අපි ඇමැතිතුමාට යෝජනා කරනවා, වසරකට සැරයක් මේ අයගේ ආකල්ප සංවර්ධන වැඩ සටහනක් සහ වසරක් තුළ මේ අය කරලා තිබෙන රිය අනතුරු කොපමණද කියලා බලලා, ඉදිරියට ලයිසන් එක තියා ගන්න පුළුවන්ද කියලා යම් ක්‍රියා මාර්ගයක් කරන්න කියලා ඔබතුමා මාර්ගයෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මොකද, අද යුද්ධයෙන් මිය ගියාට වැඩි ප්‍රමාණයක් රිය අනතුරුවලින් තමයි අපේ රටේ දරුවෝ, කාන්තාවෝ මිය යන්නේ. ඔබතුමාගේ විශේෂ අවධානය ඒ වෙත යොමු කරන්න කියන එක අපි ඉල්ලා සිටිනවා. මේ නොසන්ඩාල රියදුරන්ට එරෙහිව යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඔබතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පුද්ගලික බස් අයිතිකරුවන් 20,000 ක විතර ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවට අයිති බස් 6600 ක වාගේ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් අදටත් අපේ සමහර පාරවල් තිබෙනවා, බස් දුවන්නේ නැතිබස් යන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ මාර්ග හඳුනාගෙන, විශේෂයෙන්ම දරුවෝ පාසල්වලට යන මාර්ග තිබෙනවා. මේ මාර්ගවලට යම් බස්රථ පහසුකම් ප්‍රමාණයක් ලබා දෙන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වාගේම මාර්ග සංවර්ධනය ගැන කථා කළොත්, ඒ ගැන ඔබතුමාගේ අවධානය විශේෂයෙන්ම යොමු වෙන්න ඕනෑ. අද රටේ

**41974198**

ජනතාව පුරුදු වෙලා තිබෙන දෙයක් තමයි, ඇමැතිතුමාට එහෙම නැත්නම් ඒ පැත්තේ ඉන්න මහජන නියෝජිතයාට දොස් කියන එක. අපට පුළුවන් ඇමැතිතුමාට මුදලක් වෙන් කරන්න. නමුත් මේකේ හොඳ ප්‍රතිඵලයක් ලබා ගන්න. පාරක් හැදුවාම, ඒ පාර හදන කොට බෝක්කු, කාණු මේ සියල්ල සංවර්ධනය වෙන්න ඕනෑ. පාරක් හැදුවාම අඩුම අවුරුදු 20 ක් 25 ක් තියෙන්න ඕනෑ. නමුත් අපි හදන සමහර පාරවල් අවුරුදු 10 ක් යනකොට දිය වෙලා යනවා. ඒ නිසා TO මහත්වරු ඇතුළු ඒ නිලධාරීන් ගැන අවධානය යොමු කරලා, පාරක් හැදුවාම ඒ පාර පාස් කරන්න කලින් මේවායේ නියම ප්‍රමිතිය තියෙනවා ද කියන එක පිළිබඳව රාජ්‍ය නිලධාරීන් තුළ යම් දැනුවත්භාවයක් ඇති කරලා මේක ක්‍රියාත්මක කරන්න කියන එක ඔබතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මොකද, අපි මේ සියලු දේවල් කරන්නේ, මහජන මුදල්වලින් තමයි. ඒ නිසා මේවායේ වැඩි පැවැත්මක් සහ ආරක්ෂිතභාවයක් මේ සියල්ල තුළ තිබෙන්න ඕනෑ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන එක ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද ආර්ථිකය ගැන කථා කළොත් යහපාලන ආණ්ඩුවේ ප්‍රධාන ආර්ථික ඉලක්කය බවට පත් වෙලා තිබෙන්නේ, නවෝත්පාදන ආර්ථිකයක්. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. කර්මාන්ත දෙපාර්තමේන්තුව ඔබතුමාටයි අයිතිව තිබෙන්නේ. මේකේදී මැටි, කොහු, පන් වාගේ දේවල්වලින් - විශේෂයෙන් මම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් විධියට එහි පන්වලින් විශේෂ කර්මාන්ත තිබෙනවා. නමුත් මේ කම්කරුවන්ට තිබෙන ලොකුම ගැටළුව තමයි මේවා ප්‍රවාහනය කරන්නේ කොහොමද? ගෙන්නේ කොහොමද? මේ වාගේ ගැටළු ටිකක් තිබෙනවා. මැටි සහ පන්වලට අවධානය යොමු කරන්න. රටේ ආර්ථික ඉලක්කයට යන්න නම්, නවෝත්පාදන ආර්ථිකයකට යන්න නම්, නිෂ්පාදනකරුවන් දිරිමත් කරලා, විශේෂ ණය පහසුකම් -මේ අයට තිබෙන ගැටළු ටික හඳුනාගෙන, මේවාට යම් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. කථා කරන්න ගොඩක් දේවල් තිබුණත් විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සිසු දැරිය, දැතට දිරිය වාගේ වැඩ සටහන් කිරීම ගැන ස්තුතිවන්ත වෙමින්, ඔබතුමාට සහයෝගය ලබා දෙන බව කියා සිටිනවා.

[පූ.භා. 10.26]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂයන් පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම මම මතක් කරනවා. අද එළියේ එනකොට මහ විශාල පොලිස් බලමුළුවක් අපේ ගේට්ටුව ඉදිරිපිට ඉන්නවා. මොකක්ද කියලා හොයලා බැලුවාම මහරගම සණස සමිතියේ ඇති වුණු දූෂණය, වංචාව පිළිබඳව ජනතාවගේ විරෝධයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම ගරු ඇමැතිතුමාට යොමු කරනවා. සණස සමිතියක, සමූපකාර ග්‍රාමීය බැංකුවක, වෙනත් බැංකුවක විශාල වශයෙන් මුදල් යොදන්නේ අහිංසක සාමාන්‍ය මිනිස්සු. මේ මිනිස්සුන්ගේ අරමුදල් මේ ආයතනවල රඳවලා, ඒ අය බලාපොරොත්තු වෙන්නේ, ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් මේ මුදල් අවශ්‍ය වෙලාවේදී ලබා ගන්නයි. නමුත් ඒ බැංකුවල ආයෝජනය කළාම අවශ්‍ය පරිදි ඒක ලබා ගන්න බැරි නම්, ඒකේ පාලකයෝ අර යකඩ මල්ලට ගුල්ලෝ ගැහුවා, නැත්නම් මීයෝ පැන්නා කියන තැනට පත් වන විධියට, දේපළ, මුදල් අරගෙන පැනලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා නම්, ඒකේ වගකිව යුත්තෝ විධියට ඒ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්න අපටත් යම්කිසි බැඳීමක් තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ ගරු ඇමැතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ ජනතාව ආවේ කොයි විධියටද කියලා මම දන්නේ නැහැ. සමහර විට ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීවරු මේ සම්බන්ධව උනන්දුවක් දක්වලා, පොළඹවලා එවලා තිබුණා. හැබැයි අයවැය වෙලාවේදී ඒ අය මේ සම්බන්ධයෙන් විරුද්ධ මතයක් කියන්නෙත් නැහැ. ජනතාවගේ පැත්තෙන් කථා කරන්නෙත් නැහැ. අනෙක් පැත්තෙන් මේ ජනතාව මේ අවස්ථාවට ඇවිල්ලා මේ ඉස්සරහා කුළු හරඹ කරන එකට වඩා ඔවුන්ට සාධාරණයක් කරන්න. එක්කෝ ඔවුන්ගේ නියෝජිතයෙක් කැඳවලා - (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා වහාම මේ සම්බන්ධව මැදිහත් වෙලා මේ ප්‍රදේශයේ ජනතාවට
[ගරු ජගත් කුමාර]

සාධාරණය ඉෂ්ට කරන්න. දඩුවම් ලබා දිය යුතු අයට දඩුවම් ලබා දෙන්න. ඒ වාගේම ජනතාවට අරමුදල් ලබා දෙන්න අවශ්‍ය පියවර ගන්න කියලා මතක් කරනවා.

**41954196**

විශේෂයෙන්ම මේ හා බැඳුණු සමූපකාර ව්‍යාපාරය ඔබතුමාට තිබෙන වැදගත් දෙපාර්තමේන්තුවක්, ආයතනයක්. ඒ සමූපකාර දෙපාර්තමේන්තුව ඇතුළේ පසුගිය කාලයේ හැම තිස්සේ අහන්න, දකින්න ලැබුණේ යම් අවිධිමත්භාවයක්. දූෂණයක්. වංචාවක්. පසුගිය කාලයේ සමූපකාර ව්‍යාපාරයට විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය සමයේ යම් විධියකට ගොඩ එන්න උත්සාහයන් ලබා දුන්නා. ආධාර ලබා දුන්නා. අද අපට පේනවා. මධ්‍යම රජය ගත්තත් සමූපකාරය දිය වෙලා ස්වභාවික මරණයකට පත් වෙන්න අවශ්‍ය කටයුතුයි කරන්නේ. සමූපකාරය එක තැන පල් වෙනවා. දැන් සමූපකාර කඩ තිබුණා නම්, ඒ කඩ ඔක්කෝම වැහෙමින් යනවා. සමහර ඒවා කරන්නේ, ඒවා පෞද්ගලික අංශවලට බදු දෙනවා. දැන් බත්තරමුල්ල සමූපකාරය ගත්තත්. කඩ නැත්තට නැති වෙලා. කඩ 17 ක් 20 ක් තිබුණා. දැන් ආයතනය මට්ටමෙන් පාලනය කරන්නේ 4 ක් 5 ක් විතරයි. අනෙක් සියල්ල බදු දීලා. මේ සමූපකාරය කියන්නේ සේවාවක් සපයන ආයතනයක්. හැබැයි යම් විධියකට සේවයක් සපයන්න යම් ලාභයක් පවත්වා ගන්න ඕනෑ. නමුත් පසුගිය පාලකයන්, විශේෂයෙන්ම කඩුවෙල මහ නගර සභාවේ හිටපු ලොකු උන්නැහේලා කඩුවෙල සහ බත්තරමුල්ල සමූපකාර දෙකටම තමන්ගේ හිතවතුන් පත් කරගෙන, සමූපකාර දෙකම විනාශ කළා. කඩුවෙල තිබුණේ, ලංකාවේ තුන්වැනියාට හොඳම සමූපකාර සමිතිය. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන සමිතිය. හැබැයි අද ඒවා ගන්න දෙයක් නැහැ. වැහිලා විනාශයට පත් වෙලා. මේ ජනතාවගේ දේපළ. ජනතාවගේ අයිතිවාසිකම්. මේ ව්‍යාපාරය රකින්න නම් -මම ගරු ඇමැතිතුමාට ආරාධනා කරනවා. මේ සමිති දෙකට ඇවිල්ලා වෙලාවක බලලා මේ සම්බන්ධව කටයුතු කරන්න. මේක ඔබතුමාගේ වැරැද්දක් විධියට නොවෙයි මම දකින්නේ. නමුත් මේකට නිශ්ශබ්දව හිටියොත්, යන විධියට යන්න දුන්නොත් අපිත් ස්වභාවික මරණයට අවශ්‍ය සහාය, ශක්තිය දුන්නා හා සමාන වෙනවා.ඒ නිසා ඔබතුමාට තිබෙන ආයතන, දෙපාර්තමේන්තු පිළිබඳව මීට වඩා ටිකක් සොයලා බලලා කටයුතු කිරීමේ වගකීමක් තිබෙනවා. මේ ආයතනවල ආයෝජනය කරපු මුදල් පසුගිය කාලයේ හිටපු සභාපතිවරු විශාල වශයෙන් විවිධ අනවශ්‍ය වියදම් සඳහා යොදවලා, අවසානයේ සභාපතිවරයාව දොට්ට දාලා, අද ඔහුට ප්‍රජා අයිතිය අහිමි කරලා තිබෙනවා. හැබැයි, එතැනින් එහාට මොනවත් වෙලා නැහැ. මම පසුගිය කාලයේ කිහිප අවස්ථාවක් ප්‍රශ්න ඇහුවා. කොඩිකාර ඇමැතිතුමා ඉන්න කාලයේත් ප්‍රශ්න ඇහුවා. ලාන්සා ඇමැතිතුමා ඉන්න කාලයේත් ඇහුවා. හැබැයි ඒවාට දෙපැත්තට යාන්තම් උත්තර දුන්නා. මුකුත්ම වුණේ නැහැ. නමුත් මේ වනකොට ඒ සභාපතිවරු අයින් කරලා. ඒ කියන්නේ, අශ්වයා පැනලා ගියාම ඉස්තාලය වැහුවා වාගේ, විනාශ කළාට පස්සේ තමයි අයින් කරන්නේ. අයින් කළා වුණත් දැන් වෙන දඬුවමක් නැහැ. මුදල් අය කරගන්න ක්‍රමයක්, වෙන මොනවත් නැහැ. එතකොට ප්‍රශ්නයක් වෙනවා. දෙපාර්තමේන්තුවේ අයත් මේක සපෝර්ට් එකක් දීලා, ඒ සහායත් එක්කද මේ වැඩේ යන්නේ කියලා.

ඒ නිසා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සමූපකාරය කියන්නේ සාංඝික දේපළ වාගේ. අපේ මුතුන් මිත්තන් මහන්සි වෙලා හදපු දේවල්. ඒ නිසා මේවා රැක ගන්න, මේ ආයතන නිවැරැදි ආකාරයෙන් හදන්න ඕනෑ. මොකද, එක පැත්තකින් විශාල ප්‍රශ්නයක් ආපු වෙලාවට මොන තරම් ආයතන, Food Cityමොනවා තිබුණත් වැඩක් නැහැ. ගංවතුරක් ආවත්, හානියක් ආවත් ඔබතුමන්ලා දන්නවා. හැම තිස්සේම සමූපකාරය තමයි ඕනෑ වෙන්නේ. සමූපකාරය හරහා තමයි බඩු ටික දෙන්නේ. දැන් ගංවතුර ආවාම පසුගිය කාලයේ මහ ඇමැතිතුමා කොළඹ දිස්ත්‍රික්කයේ කටයුතු කරන කොට ගත්තා. අනෙක් තැන්වලත් ගත්තා. නමුත් ඒ ගත්තාට පස්සේ ඒ සමූපකාරයට සැලකිල්ලක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් ඒ සම්බන්ධව අවධානය යොමු කරලා, දූෂණය නවත්වලා, විධිමත්ම කළමනාකරණය කරන්න. ඒත් එක්කම සමිතිවල තිබෙන ණය කපා හරින්න ක්‍රමයක් හැදුවේ නැත්නම්, විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ කඩුවෙල සහ බත්තරමුල්ල සමූපකාර එක්ක ලංකාව පුරාම සමූපකාර සමිතිවල යම් ප්‍රමාණයක් ණය රජයෙන්ම කපා හැරියා. මොකද, සමූපකාර ණය වුණාට පස්සේ පවත්වාගෙන යන්න බැරි තත්ත්වයන් තිබෙනවා. නමුත් අද ඒවා ණය බරින් මිරිකිලා. තමන් උපයන දේ පොලී ගෙවා ගන්න, ණය ගෙවා ගන්න ප්‍රමාණවත් නැති තැනකට ඇවිල්ලා තිබෙනවා. [ගරු ජගත් කුමාර]

අනෙක් කාරණය තමයි ආයතනයට දාන අධ්‍යක්ෂවරු. වැඩ බලන්න දාන අධ්‍යක්ෂවරු හරි. ඡන්දයෙන් එන අධ්‍යක්ෂවරු හරි. මේ අයගේ වියදම් පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ගන්න තීන්දු පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ

**41974198**

නිසා ඒවා සම්බන්ධව මීට වඩා විශාල අවධානයක් යොමු කරලා ඔබතුමාගේ නිලධාරීන් හරහා කටයුතු කරන්න. ඒ ප්‍රදේශයේ මහජන නියෝජිතයෝ විධියට අපටත් එහි වගකීමක් තිබෙන නිසයි විශේෂයෙන් මේ සම්බන්ධව මතු කරන්නේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමෝටම තිබෙන මූලික අයිතිවාසිකම් අතර අපට හොඳ නිවසක් සාදා ගැනීම අත්‍යවශ්‍යයි. නිවාස ප්‍රශ්නය අත්‍යවශ්‍ය කාරණාවක්. මිනිස්සුන්ට කෑම බීම, ඉඳුම් හිටුම් හා සමානම අවශ්‍යතාවයක් තමයි නිවාස. නමුත් දිගින් දිගටම නිවාස අමාත්‍යාංශය පසුගිය කාලයේ විවිධ සාකච්ඡාවලදී, මෙවැනි වැය ශීර්ෂ ගැන සාකච්ඡා කිරීමේදී නිරන්තරයෙන් කියනවා නිවාස අමාත්‍යාංශය ඒ සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නැහැයි කියලා. පොදුවේ අනෙක් ආයතනවලට, දෙපාර්තමේන්තුවලට අඩු කරලා තිබෙනවා වාගේම මේකට ඊටත් වඩා අඩුම මට්ටමකටයි මුදල් යෙදවෙන්නේ. ඒ මුදල් අඩු මට්ටමකට යෙදවීම තුළ අහිංසක දුප්පත් ජනතාවට සේවය කරන්න තිබෙන අවස්ථාව නැති වෙලා තිබෙනවා. ඔබතුමා යම්කිසි විධියකින් හොඳ නිවාස කොමසාරිස් කෙනෙක් ලැබිලා තිබෙනවා. ආයතනයේ වැඩ කරන්න පුළුවන් නිලධාරීන් ඔබතුමාගේ මේ අංශවල ඉන්නවා. මේ ගැන අපි සතුටු වෙනවා. නමුත් ඒ නිලධාරීන්ටත් තිබෙන මුදල් ප්‍රමාණයත් එක්ක විතරයි වැඩ කරන්න සිද්ධ වෙන්නේ.

ඉතින් ඒ නිසා මීට වඩා වැඩි වැඩ කොටසක් විශේෂයෙන්ම අහිංසක ජනතාව -මධ්‍යම ආණ්ඩුවේ ඉන්න නිවාස අමාත්‍යාංශය කියන්නේ, එකට දෙකට තිබෙන අමාත්‍යාංශයක්. ඉතින් නිවාස අමාත්‍යාංශයෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. විශේෂයෙන්ම අපේ පළාතේ විශාල වශයෙන් අඩු ආදායම් ලබන ජනතාව ඉන්නවා. ඔවුන්ට අපෙන් සේවාව ඉෂ්ට සිද්ධ විය යුතුයි. නමුත් අපේ නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා අපට දෙන්න පුළුවන් වෙන්නේ, බොහොම සුළු ආධාරයක්. බොහොම සුළු පිරිසකට. ඒ නිසා මෙයට වඩා වැඩි මුදලක් අපි අඩු ගාණනේ ඉදිරි අයවැයකින් එහෙම නැත්නම් පරිපූරක ඇස්තමේන්තුවකින් හරි යොමු කරගෙන මේ ජනතාවට සහන සලසන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා තිබෙන්නා වූ කොන්දේසි ලිහිල් කරන්න ඕනෑ. ඒ වාගේම දැන් අපි ගන්න ඕනෑ පසුගිය කාලයේ අපේ පළාත් අරමුදල් යොදවන කොටත්, නිවාස ආධාරයක් දෙනවා නම්,එක්කෝ ඒ අය වැන්දඹු වෙන්න ඕනෑ. එක්කෝ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කථා කරන්න කාලය ප්‍රමාණවත් නැහැ. නමුත් ඉතින් කාලයට ගරු කරලා, ඔබතුමන්ලාට ගරු කරලා අවසන් කරන්නම්. කෙසේ වෙතත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නිවාස දෙපාර්තමේන්තුවෙන් මීට වඩා විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. අපි ගැමි කථාවක් අහලා තිබෙනවා. කරතොත් කරපන් හරියට. බැරිනම් පලයන් අහකට කියලා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙකේ කරන්න පුළුවන් ආයතන ටිකක් තිබෙන්නේ. අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා මිනිස්සුත් එක්ක ළඟින් සම්බන්ධ වෙලා වැඩ කරන්න උත්සාහ කරනවා. අපි යමක් කිව්වොත් ඇහුම්කන් දෙනවා. අපි ළඟ කිසිම ඩබල් ගේම් එකක් නැතුව හැම තිස්සේම ඔබතුමාට සහාය, ශක්තිය දෙන්නේ ඒ නිසා. නමුත් ඒ අංශවල නිලධාරීනුත් කාර්යක්ෂම කරගෙන ඒ වාගේම අරමුදලුත් ලබාගෙන - ඔබතුමාට වැය ශීර්ෂ ගණනාවක් තිබෙනවා. හැබැයි ඒවාවලට අරමුදල් නැති වුණාම වැඩ කරන්න බැරි වෙනවා. වැඩ කරන්න බැරි ආයතන තියාගෙන වැඩක් නැහැ. ඒ නිසා ඒවාට අදාළව මුදල් ලබා ගත්තොත් තමයි වැඩ කරන්න පුළුවන් වෙන්නේ. නැත්නම් ඔබතුමා අකාර්යක්ෂම අමාත්‍යවරයෙක් බවට පත් වෙලා කියලා ජනතාවගේ පැත්තෙන් චෝදනා කරන්න පුළුවන්. මෙපමණ අමාත්‍යාංශ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් වැඩ වෙන්නේ ප්‍රමාණවත් පරිදි නොවෙයි කියලා. ඒ නිසා මේ අමාත්‍යාංශ මට්ටමින් ඒ කටයුතු කරන්න.

ඒ වාගේම මාර්ග සංවර්ධනය පැත්තෙන් ගත්තාම, අපේ ප්‍රදේශවල මාර්ග සංවර්ධනයේදී ඔබතුමාගේ සහාය, ශක්තිය ලැබුණා. මම නැවත ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් විශේෂයෙන්ම අර ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට අතුරු මාර්ගවල වැඩ කටයුතු කර ගන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ විශාල මුදලක් ලබා දුන්නා.
[ගරු ජගත් කුමාර]

ලාන්සා ඇමැතිතුමාට මුදල් දුන්නෙත්, බැසිල් රාජපක්ෂ ඇමැතිතුමාගේ ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා. ඒ නිසා සම්පූර්ණයෙන් මේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ වැඩ මේ ආණ්ඩුවෙන් අත්හිටුවලාද කියලා ප්‍රශ්නයක්

තිබෙනවා. රටක සංවර්ධනයේ ප්‍රධාන නිර්ණායකයක් තමයි මාර්ග පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය. හැබැයි ඒ සඳහා ලැබෙන්නා වූ මුදල් අඩු නම්, රටේ සංවර්ධනය ඉස්සරහාට යන්න බැහැ. ගමනක් කෙටි කර ගන්න, ගමනක් අඩු කාලයකින් කර ගැනීම තුළ තමයි සංවර්ධනයට දායක වෙන්න පුළුවන්. ඒ නිසා මාර්ග පද්ධතිය හදන්න මීට වඩා වැඩි මුදලක් ගන්න ඕනෑ. ඒ වාගේම එහි අත්‍යවශ්‍ය මාර්ග සංවර්ධනය, විශේෂයෙන් අතුරු මාර්ගත් සංවර්ධනය සඳහා දායක වෙන්න කියලා ඉල්ලමින් ඔබතුමාට නැවතත් මගේ ස්තුතිය පුද කරමින් නිහඬ වෙනවා.

[පූ.භා. 10.36]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. හයවැනි පළාත් සභාවේ 29 වැනි මුදල් ප්‍රකාශයට සම්බන්ධ වීමට හැකියාව ලැබීම ගැනත් සතුටු වෙනවා. අපේ ඇමැතිතුමාත් එක්ක අපි විරුද්ධව කථා කරන්නේ නැහැ. අපි බොහොම ගරු කරන ඇමැතිවරයෙක්. පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව කථා කරපු සියලු දෙනාම ඔබතුමාගේ අමාත්‍යාංශය ගැනත් විවේචනාත්මකව තමයි කථා කළේ. ඒක අපි ඔබතුමාගේ අමාත්‍යාංශ විවාදය පටන් ගත්තු දිනයේත් දැක්කා. ඔබතුමාට පටන් ගත්තෙත් එහෙම. ඒක ඔබතුමාගේ අඩුවක් නොවෙයි. ඔබතුමාව විවේචනය කරනවාත් නොවෙයි. ඔබතුමා පොඩ්ඩක් මීට වැඩිය වෙනසකින් නිලධාරීන් සමග එකතු වෙලා වැඩ කරන්න ඕනෑ කියන එක තමයි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ සියලු දෙනාම අදහස් කරන්නේ. එතකොට අපි දැක්කා. මේ වනකොට හැම මන්ත්‍රීවරයෙක්ම කථා කළා නම් කථා කළේ, සමූපකාර ණය දෙන සමිතිය ගැන. සණස ණය දෙන සමිතිය ගැන. මොකද හේතුව, අද විශාල අර්බුදයක පැටළිලා තිබෙනවා. බස්නාහිර පළාතේ වැදගත්ම අමාත්‍යාංශයක් වශයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයත් අද එතැනට පත් වෙලා තිබෙනවා. මොකද, මේ රටේ ජනතාවට යමක් කරන්න පුළුවන් අමාත්‍යාංශයක් තමයි ඔබතුමාගේ යටතේ තිබෙන්නේ. මාර්ග තිබෙනවා. සමූපකාර තිබෙනවා. සියලුම දේවල් ඔබතුමාගේ යටතේ තමයි තිබෙන්නේ. යටිතල පහසුකම්. අපට මේ දිහා බලලා - මම විශ්වාස කරනවා. මේ මන්ත්‍රීවරු දෙන අදහස් අරගෙන, නිලධාරීන් සමග එකතු වෙලා, යමක් කරන්න උත්සාහයක් ගනී කියලා. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ විවාදයට එකතු වෙලා යමක් කියලා ඒක අනෙක් පැත්තෙන් අතහැරලා දාන්න එපා. මේ සම්බන්ධව අපිත් එක්ක එකතු වෙන්න. අපි ඔබතුමාට ගරු කරනවා.

මම හිතන්නේ, ගිය ගමන අයවැය විවාදය වනකොට ඔබතුමාට ලොකු ප්‍රෙෂර් එකක් තිබුණා. මොකද, මගේ අමාත්‍යාංශයත් කොහේට යයිද කියලා. මම දන්නවා. හැබැයි ඒ ප්‍රෙෂර් එකෙන් දැන් නිදහස් වෙලා. අද ඔබතුමාට එහෙම ප්‍රෙෂර් එකක් නැහැ. අද පක්ෂ විපක්ෂයෙන් බලපෑමක් නැහැ. අද ඔබතුමාට එකහව, සියලු දෙනාම ඡන්දය දෙන බව ඔබතුමා මුල ඉඳලාම දැනගෙන හිටියා. අපි සියල්ල එක ගොඩේ ඉන්නේ. නමුත් මේ යන ගමන් මග වෙනස් කරන්න ඕනෑ. අද උදේ වනකොට අපට ඉස්සරහා වාහනයක් නවත්ත ගන්න බැහැ. පොලීසිය ඔක්කෝම ඉඩ අයින් කරනවා. මම හිතන්නේ දැන් Protestඑකක් යනවා. මොකද, මේ? අපි විවාදයට එන්න ඕනෑ නැහැ. විවාදයට කලින් ඉඳලා. කෙසේ වෙතත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා පුන පුනා කිව්වා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා කියලා. අද කියලා, හෙට ඔබතුමාට ඒකට විසඳුම් හොයන්න බැහැ. ඒ විසඳුම් හොයන්න දීර්ඝ කාලීන සැලැස්මක් යොදවන්න ඕනෑ. මේක ඔබතුමා කළේ නැහැයි කියලා ඇඟ බේරා ගන්න එපා. එහෙම කරන්න අමාරුයි. ඔබතුමාත්, මේ නිලධාරීන් ටිකත් එකතු කරගෙන, අපි මේකට සැලැස්මක් හදාගන්න ඕනෑ. කොහෙන්ද අපි නීතියට ගොනු කරගන්නේ? මේ වැරදි කරපු උදවිය නීතිය මාර්ගයට ගෙන එන්න ඔබතුමා උත්සාහ ගන්න ඕනෑ. මේකේදී ඔබතුමා පරීක්ෂණ පවත් වනකොට ඔබතුමාට මුණ ගැහෙයි අභවල් ඇමැතිවරයාගේ යාළුවෝ මේකේ ඉන්නවා. අරෙහේ ඇමැතිවරුන්ගේ සම්බන්ධකම් තිබෙනවා. ඔබතුමාගේ යහළු මිත්‍රකම් මෙතැනට ගොනු වෙන්න පුළුවන්. ඒවා අතහරින්න. මේක මේ පළාතේ ජීවත් වන හුදෙක් මහජනයා වෙනුවෙන් එකතු වෙලා කරන කටයුත්තක්.මේක ලොකු පිංකමක්. අපේ කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, පිංකමක් කරනවා වාගේ වැඩක් කියලා. මේ මහජන මුදල්. ඒ නිසා ඔබතුමාට ලොකු අයිතියක් තිබෙනවා. මේ සමූපකාර අර්බුදය ගැන මම දිගින් දිගට කථා කරන්න යන්නේ නැහැ. මේ අර්බුදය විසඳන්න, මේකට විසඳුම් සොයන්න එළැඹෙන වර්ෂයේදී 2017 දී අපි බලාපොරොත්තු වෙනවා. මේ පළාත් සභා වාරය අවසන්

වෙන්න ඉස්සෙල්ලා ඔබතුමා මේක නිදොස් කොට නිදහස් කරයි කියලා අපේක්ෂා කරනවා. ඒක මේ මන්ත්‍රීවරුන්ගේ එකම පැතුම බවට පරිවර්තනය වෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කර්මාන්ත අධිකාරිය තිබෙන්නේ, ගරු ඇමැතිතුමාගේ යටතේ. අපි සන්තෝෂ වෙනවා. කර්මාන්ත අධිකාරියට අපේ හිටපු මන්ත්‍රීවරයෙක් පත් කරගෙන, රෙහෙන්සිරි වරාගොඩ හිටපු ගරු මන්ත්‍රීතුමාත් එක්ක එකතු වෙලා යම්කිසි වැඩ පිළිවෙළක් මේ රටට හඳුන්වා දෙන්න යනවා. බොහොම හොඳයි. අපි එකඟයි. හොඳ දේවල් කරන කොට අපිත් ඔබතුමන්ලාට උදව් කරනවා. අපි දකිනවා, පැත්තක ඉඳගෙන. අපි කථා කළේ නැති වුණාට, වාදවලට නොගියාට, ඔබතුමන්ලාව විවේචනය නොකළාට, හොඳ දේවල් දැකලා, හොඳ දේවල් එළියට අරගෙන අපි පෙන්වන්න ඕනෑ. ධෛර්ය දෙන්න ඕනෑ. නිලධාරීන්ට දොස් කියනවා නොවෙයි. නිලධාරීන්ගේ අඩුපාඩුකම් ඇති. ඔබතුමාත් නිලධාරීන් දෙන දේම කියන්න යන්න එපා. නිලධාරීන් දෙන මතයම ඉෂ්ට කරන්න යන්න එපා. ඔබතුමා සියලු දෙනාත් එක්ක එකතු වෙලා හොඳ දේ කරන්න. ඔබතුමාත් හොඳ උපදේශකයෝ දෙතුන් දෙනෙක් ලං කර ගන්න. නිලධාරීන් කියන දේත් අහලා, ඒ උපදේශකවරුන්ගෙනුත් අහලා හොඳ මතය කරා, හොඳ ගමන් මගක් කරා යන්න ඔබතුමා ලැහැස්ති වෙන්න කියන එක මම මතක් කරනවා.

අවසාන වශයෙන් තව එකක් ඔබතුමාට කියන්න ඕනෑ. මගේ පාරක් හදාගන්න ඔබතුමා මට පොඩි උදව්වක් කළා. ලක්ෂ 6 ක මුදලක් දුන්නා. මම ඒකට සභාව මැදම ස්තුතිවන්ත වෙනවා. ප්‍රසිද්ධ රහසක් නොවෙයි. හැබැයි, මේ වනකෙට පිළියන්දල, කැස්බෑව ප්‍රදේශයට අපේ බල ප්‍රදේශයට ඔබතුමා එක මන්ත්‍රීවරයෙකුට දීලා තිබෙනවා, රුපියල් මිලියන 6.8 ක්. තවත් රුපියල් මිලියන 9.5 ක් දීලා තිබෙනවා. තව රුපියල් මිලියන 13.8 ක් දීලා තිබෙනවා. මේ වාගේ දීලා තිබෙනවා. අපේ ප්‍රශ්නයක් නැහැ. මේකෙන් අපේ පැත්තේ පාරවල් තමයි සංවර්ධනය වෙන්නේ. මන්ත්‍රී කවුද? යූ.එන්.පී ද, ශ්‍රී ලංකාද භේදයක් නැහැ. හැබැයි අපිත් පාරක් යෝජනා කළාම ඒකටත් පොඩි ඇහුම්කන් දීමක් කරගන්න. ඔබතුමා දන්නවා නේ? මට හයක් දුන්නා. එතුමා දන්නවා හය ගත්තු හැටි. පස්සෙන් ගිහින් ගිහින්, වැඳලා, වැටිලා, එල්ලිලා තමයි ඒ හය ගත්තේ. මම එතුමාගේ මුහුණට කියන්නේ. එතුමාගේ හදවත දන්නවා. මට ඒ ලක්ෂ හය දුන්නේ කොහොමද කියලා. මම ලක්ෂ 11 ක Projectඑකක් ඉල්ලුවේ. 6 ක් දුන්නා. මම සන්තෝෂ වෙනවා. ඔබතුමා එහෙම අපව අතහැරියේ නැහැ. ඉල්ලුවාම අන්තිම මොහොතේ හරි ඒක බොහොම කලබලයෙන් කරගෙන යන්නේ. කමක් නැහැ. ඒ පක්ෂයට හෝ මේ පක්ෂයට ප්‍රශ්නයක් නැහැ. අපේ පළාතට මේ ප්‍රතිපාදන එන්නේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

උපදේශක කාරක සභාවේ නැද්ද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මම එතුමාගේ උපදේශක කාරක සභාවේ නැහැ. නමුත් ඔබතුමා ඒ දේ කරන්න. අපි ඔක්කෝටම එකට සලකන්න. අපි දැන් පංගු බෙරුවක් නැහැ. යහපාලන ආණ්ඩුව අපි යන්නේ.ඔබතුමා ඇමැතිවරයෙක් වශයෙන්, අතිගරු ජනාධිපතිතුමාට ගරු කරනවා නම් අපටත් ඒකේ පොඩි ගරුත්වයක් දෙන්න ඕනෑ. ඒ ගැන මතක් කරමින් මේ අවස්ථාව ලබා දුන්නාට - මම කථාවට ලැහැස්ති වෙලා හිටියේ නැහැ. මම මෙතැනට ආවාම වෙලාව තියෙනවා කියලා කථාව දුන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමා කථාව නවත්වන්න කියලා කියනවා. අපට කථා කරනවා නම් ඕනෑ තරම් කථා කරන්න පුළුවන් ගරු නියෝජ්‍යසභාපතිතුමනි. මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 10.45]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධව මම ප්‍රථමයෙන්ම සතුටු වෙනවා. ඒ වැය ශීර්ෂය යටතේ ඒ ඒ අංශවලින් කාරණා, ඒ කියන්නේ විෂයන්හතරකට අයිතිව තිබෙනවා. මම
[ගරු උපාලි කොඩිකාර]

2013 අයවැය පොත ගෙනාවා. මම 2014 අයවැය පොත ගෙනාවා. ඒ වාගේම 2016, 2017 අයවැය පොත් ගෙනාවා. දැන් මේ පොත් ටික කියවලා බලලා එතුමා හැදුවා නම්, මීට වඩා පොඩි අනාගතයක් ගන්න තිබුණා. දැන් කරපු වැඩ

මේකේ තිබෙනවා. මේ පරණ හිටපු නිලධාරී මහත්වරු දන්නවා, අපි කළේ කොහොමද කියලා. මේ අමාත්‍යාංශවල වැඩ කරන්න සල්ලි ඕනෑ නැහැ. මම සිකුරාදාත් කිව්වා,සල්ලි හොයන හැටි. සමූපකාර අමාත්‍යාංශය කියන්නේ මහා වස්තුවක්. දැන් මොකද වෙලා තිබෙන්නේ? සමූපකාර අමාත්‍යාංශයට දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒකේ මහා ධනස්කන්දයක් තිබෙන්නේ. අපේ තිබෙන බුද්ධ ශාසන අමාත්‍යාංශයත් එක්ක අපේ රටේ තිබෙන බෞද්ධ ඉඩකඩම් අරුණාම වැඩිම ඉඩකඩම් ප්‍රමාණයක් තිබෙන්නේ සමූපකාරය යටතේ. වැඩිම ඉඩම් ප්‍රමාණයක්. දුම්රිය දෙපාර්තමේන්තුවට. සමූපකාරයට. වැඩිම ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. දැන් මේ ඉඩම් ප්‍රමාණය බස්නාහිර පළාතේ මම ඉන්න කොට ගණනය කරලා, අපි කැබිනට් තීරණයක් අරගෙන, හදන්න බැරි ඉඩම් ඔක්කෝම අපි යම් පෞද්ගලික,Partner Shipඑකක්.ඒ කියන්නේ, පෞද්ගලික අංශයත් එක්ක ඒකරාශී වෙලා, මේ වැඩේ කරන්න අපි ඉඩ දුන්නා. විශාල ආදායමක්. අද බලන්න කෝට්ටේ තිබුණු සමූපකාරය වහලා දාලා තිබෙන්නේ. මම එනකොට වහලා දාලා තිබුණේ. පාඩුයි. Loss. සේවකයන්ට පඩි ගෙවන්න බැරි වුණා. මම හදපු අලුත් ගොඩනැගිලි හතර බද්දට දීලා, ලක්ෂ 4 ½ ක් අරගෙන පඩි ගෙවනවා. මේ වහලා දාලා, කඩලා දාලා තිබුණු තැන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ලොකු ඉඩම් ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේලා ගිනි තියපුවා තමයි ඒ කාලේ මම හැදුවේ. පොලිස් රිපෝට් එකේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් බලන්න හෝමාගම සමූපකාරය. ඉංගිරිය සමූපකාරය. තමුන්නාන්සේ උප සභාපති වෙලා ඉන්න අපේ පරණ සමූපකාරය. බස් ස්ටෑන්ඩ් එකත් එක්ක ඒකාබද්ධ කරලා මම ගහපු වෙළඳ සංකීර්ණය බලන්න. තමුන්නාන්සේ මේ සභාවට කියන්න. කෝකිලා හර්ෂණී ගරු මන්ත්‍රීතුමිය මෙතැන හිටියා. ඒ සමූපකාරය. කළුතර සෞඛ්‍ය ඇමැතිතුමාගේ සමූපකාරය. මම පාඩු වුණු ඒවා ලාභ ගන්න පුළුවන් තත්ත්වයට හැදුවා. දැන් මේ පොත ඇවිල්ලා, අපේ පළාත්වල පතෝල කොටුවලට, බණ්ඩක්කා කොටුවලට ගිරව් එනවාටහදලා තියෙන පඹයා වාගේ. මුකුත් නැහැ. මේකේ අපේ මන්ත්‍රීවරයෙකුට අඩු වුණු ගණන. අඩු වුණු ගණන හත් ඉලව්වේ කථා කරලා වැඩක් නැහැ නේ? දෙන්නේ නැහැ නේ? මොකද, මහ බැඳුම්කරය ගැහුවා නේ? ගහලා අර්ජුන මහේන්ද්‍රන් සල්ලි ටික අරගෙන පැන්නා නේ? දැන් ආණ්ඩුවට සල්ලි නැහැ. අඩු වුණු ගණන කථා කරලා දැන් වැඩක් නැහැ. ආණ්ඩුවට පාණ්ඩුව. පාණ්ඩුව කහිනවා. යහපාලනයට අපෙන් පත් වුණු, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පත් වුණු අය තමයි තමුන්නාන්සේලා.

දැන් ගන්න අපේ ප්‍රවාහන ක්ෂේත්‍රය. එක බස් ස්ටෑන්ඩ් එකක් - මම ගැහුවේ නම ගහලා. කළුතර දිස්ත්‍රික්කයේ, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ ලස්සන බස් ස්ටෑන්ඩ්. පානදුර බස් ස්ටෑන්ඩ් එක බලන්න. මතුගම තමුන්නාන්සේලාගේ ගමේ බලන්න. මේ කඩ ටික දුන්නාම ආදායමක් එනවා. මම ඉන්න කොට ටෙන්ඩර් කළා. අපේ ගැමුණු විජේරත්න මැතිතුමා. ප්‍රවාහන විශේෂඥයා. එතුමා ගිය පාර ස්ට්‍රයික් එකෙන් පෙන්දෙක් බවට පත් වෙලා ගෙදර ගියා. එතුමා මට ස්ට්‍රයික් 17 ක් දැම්මා. ස්ට්‍රයික් 17 ක් දැම්මා. මම අත්හැරියාද? අද මුකුත් නැහැ. තමුන්නාන්සේට වැඩ කරන්න පුළුවන්. ස්ට්‍රයික් නැහැ. ආදායම් ගන්න තමුන්නාන්සේ දාපු ටෙන්ඩරය බලන්න. ටෙන්ඩරය ගෙනාවාම පළමුවැනි ටෙන්ඩර්කරුට යනවා. එයා ගන්නේ නැහැ. එයා හතරක් දානවා. එයා අතින් ජරාව දෙනවා. ඒකයි මේකේ කතන්දරේ. මේ ලන්සුව යන්නේ එහෙමයි. බස් මාර්ගවලට ටෙන්ඩර් දානවා. ටෙන්ඩර් දැම්මාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා. මූලාසනයට කථා කරලා අවසන් කරන්න.

41974198

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මෛත්‍රීපාල සිරිසේනගේ දින 100 ය. මෛත්‍රීපාල සිරිසේනගෙයි, රනිල් වික්‍රමසිංහගෙයි දින 100 මේකේ තිබෙනවා. සමූපකාර සේවක සේවිකාවන් සම්බන්ධයෙන් තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? වැට් එක දාලා පඩි ගෙවන්න බැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා පනතක් ගෙනැල්ලා, කැබිනට් ජේපර් එකක් දාලා, පාර්ලිමේන්තුවේ අනුමත කරලා වැට් ඔක්කෝම කපා දැම්මා. ඒක සේවාවක්. සමූපකාරයට වන සේවාවක්. අද සමූපකාරයට වැට් ගත්තාම ගෙවන්න බැහැ. මම තමයි සමූපකාර සේවක සේවිකාවන්ගේ විශ්‍රාම වැටුප හදලා දුන්නේ. මම තමයි මේ බස්නාහිර පළාත් සභාවේ විශ්‍රාම වැටුපක් හැදුවේ. මම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවට අයිති ගොඩනැගිලිවලින් ලොකුම ගොඩනැගිල්ල හැදුවේ. සල්ලි තිබිලා හැදුවේ නැහැ. බස් ස්ටෑන්ඩ් හැදුවේ සල්ලි තිබිලා නොවෙයි. ණයට. ඉංජිනේරු සංස්ථාවෙන් - කොටස් වශයෙන් ගෙව්වේ. එහෙමයි මේවා හැදුවේ. අද මේ අවුරුදු දෙකක් තුනක් මේ අයට එක මුල්ගලක් තියා ගන්න කළුගල් කැටයක් දාන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාගෙන් හරි තව විනාඩි 02 ක් දෙන්න. ඉතුරු ටිකත් කියන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට කියන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණෙන් දෙනවා. විපක්ෂයෙනුයි දෙකෙන්ම දෙනවා. මොකද, ජනතා විමුක්ති පෙරමුණ තමයි සමූපකාරය ගිනි තිබ්බේ. මේගොල්ලෝ තමයි ඒකට සහාය දුන්නේ. මේගොල්ලෝ තමයි යාපනයට ගිහිල්ලා පුස්තකාලය ගිනි තියලා ඒ ත්‍රස්තවාදය මේ රටට ගෙනාපු කට්ටිය. එතකොට -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සමූපකාරයේ ඉඩම කාටද ලිව්වේ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

වත්තේගෙදර සණසේ කට්ටියට උත්තරයක් දීලා ඉන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගමනාගමන මණ්ඩලයේ ඉඩම -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒකෙන් ඡන්දෙට දීපු ගණන කියන්න. සණසේ සභාපති දීපු ගණන කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් බලන්න මේ හාල් අර්බුදය ගැන කියනවා. අහගෙන ඉන්න.මෙතුමාගේ තාත්තා හදපු සමූපකාරයේ නිලධාරියෙක්. දැන් හාල් අර්බුදය තිබෙනවා. මම මොකද කළේ? පකිස්තානයෙන් හාල් ගෙනැල්ලා සමූපකාරයට දුන්නා රුපියල් 55 යි. සමූපකාරය රුපියල් 60 ට වික්කා. අර 110 ට තිබුණු ඒවා -

[සභාවේ ඝෝෂා]

මම චීනයෙන් ළූණු ගෙනාවා. ළූණු රුපියල් 40 ට දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි 15 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

41954196

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36 (1) යටතේ. උපාලි කොඩිකාරගරු මන්ත්‍රීතුමා කිව්වා සමූපකාරය සඳහා විශ්‍රාම වැටුපක් ගොඩනැඟුවා කියලා. ඒකේ ඇත්තක් තිබෙනවා. නමුත් එතුමාට ඉස්සෙල්ලා නැගෙනහිර හේවාගම් කෝරලයේ විවිධ සේවා සමූපකාර සමිතිය ඇතුළු කොළඹ දිස්ත්‍රික්කයේ සමිති තුනක විශ්‍රාම වැටුප අපි විසින් ලබා දුන්නා කියන එක මේ අවස්ථාවේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි කියන්නේ කවුද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේ කථා කරන මම විසින් ලබා දුන්නා කියන එක නිවැරදි කිරීමකට මතක් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකෙන් මාධ්‍ය නොමඟ යනවා. ඒ නිසා සුමිත් ද සොයිසා ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ නැවත ඉස්කෝලේ ගිහිල්ලා, පෙර පාසල් ගිහිල්ලා මේකට එන්න කියලා. මොකද, හේතුව මෙතුමා ඉස්කෝලේ ගිහිල්ලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සමූපකාරය පිළිබඳව -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, භාෂාව මොකක්ද කියලා මට පැහැදිලි වුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමන්ලා දෙන්නාම වාඩි වෙන්න. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා. 10.55]

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ කරුණු ඉදිරිපත් කිරීමේදී මට මඟ හැරලා යන්න බැහැ, වත්තේගෙදර සණස සමිතියේ ඒ මුදල් තැන්පත්කරුවන්ට වුණු අසාධාරණයත් එක්ක සිද්ධ වෙලා තිබෙන තත්ත්වය. මම පොදු සාකච්ඡාවේදීත් මේ සම්බන්ධව කරුණු ටිකක් ඉදිරිපත් කළා. නමුත් මේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කියලා තිබෙනවා - ඒක එතුමාට දැනෙන ආකාරය වෙන්න ඇති. එතුමා කියලා තිබෙනවා ඒ මිනිස්සු ඇවිස්සුවේ ජනතා විමුක්ති පෙරමුණෙන්. ජනතා විමුක්ති පෙරමුණ පිටින් ඉඳන් ඒ අයව හසුරුවනවා. ඒ අයව අවුස්සනවා. නමුත් මේ පළාත් සභාවේ වචනයක්වත් කථා කරන්නේ නැහැයි කියලා. ගරු මන්ත්‍රීතුමා මම දන්නේ නැහැ, ඔබතුමා අද උදේ මොනවා හරි පාවිච්චි කරලා ඇවිල්ලා කථා කරනවාද කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ, මොනවත් විශේෂයෙන් පාවිච්චි කරන්නේ නැහැ. ඔබතුමන්ලා බොන දේවල් මම පාවිච්චි කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

මේ පළාත් සභාවට මේ සම්බන්ධව ගෙන ආවේ - (බාධා කිරීමක්) මොනවා හරි තියෙනවාද දන්නේ නැහැ නේ? මේ පළාත් සභාවට ඔය ප්‍රශ්නය ගෙනාවේත් අපි. ඒ කථා කළේ පළාත් සභාවේ. වෙන කොහේවත් නොවෙයි. ඒ නිසා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පැහැදිලිව කිව්වේ මෙතුමන්ලා කථා කරන්න මේ වෙලාවේ නැහැ. ඒත් එක්කම කිසිම විරුද්ධතාවයක් දැක්වුවේත් නැහැ. වැය ශීර්ෂයේ හැමෝටම සපෝර්ට් කරලා -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

41974198

ඔබතුමාට ඕනෑ දේ කරන්න නොවෙයි අපි මේ පළාත් සභාවේ ඉන්නේ. ඔබතුමාට ඕනෑ අපි ලව්වා මේ වැය ශීර්ෂයට බෙදීමක් ඉල්ල ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මූලාසනයට කථා කරන්න. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම වාඩි වෙන එක හරි. මාව නැගිට්ටව ගත්තේ තමුන්නාන්සේලා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

මේකේ තේරුම් ගන්න ඕනෑ කාරණයත්, අපි මේ පළාත් සභාවේ දෙවැනි වාතවටත් කාගේවත් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

වැරැදි දේවල් කියන්න එපා. මේ පළාත් සභාවේ මම කියපු දේ ගැන වගකීම මම ගන්නවා. මම පැහැදිලිව වගකීම ගන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

පොඩ්ඩක් වාඩි වෙන්න කෝ? අද අනිවාර්යයෙන්ම පාවිච්චි කරලා. පාවිච්චි කරලා ඉන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මොනවාද මේ අනිවාර්යයෙන් පාවිච්චි කළා කියන්නේ? මට නේ කියන්නේ? මේගොල්ලේ රෑට ගිහිල්ලා මත්පැන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මූලාසනය කාලය පිළිබඳ ගැටළුවක ඉන්නේ.ඔබතුමන්ලා මේ අමාත්‍යාංශයට කරන අසාධාරණයක්. අනවශ්‍ය මාතෘකවක් එක්ක ඔබතුමන්ලා යනවා නම්, ඒක සභාවට කරන අසාධාරණයක්. මේ වැය ශීර්ෂයට වෙන කාලයක් දෙන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ මන්ත්‍රීතුමාට බැලුම් බෝලයක් පුම්බන්න දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගිය සතියේත් ඕක වුණා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සභාවේ මන්ත්‍රීවරු මේ පැත්තෙන් ගන්න පුළුවන් දේවල් අරගෙන අන්තිමට විරුද්ධ වෙන්නේ නැතුව අදහස කියලා යනවා. ඒක මම කිව්වේ. ඒ ඇර දෙයක් කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඇත්තටම ඒ මිනිස්සුන්ව කවුරුවත් අවුස්සන්න ඕනෑ නැහැ. මොකද, තමන්ගේ සල්ලි නැති වුණාට පස්සේ කවුරුවත් අවුස්සන්න
[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඕනෑද? අපි කථා කරලා කියන්න ඕනෑද ඔයගොල්ලන්ගේ සල්ලි ටික ගන්න මේ පළාත් සභාව ඉස්සරහාට එන්න ඕනෑ කියලා. ඒ මිනිස්සු එනවා. ඒ මිනිස්සුන්ගේ උවමනාව වෙනුවෙන් එන්නේ. මේක වෙන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.දැන් ඒ මිනිස්සු මෙතැනට එනකොට පොලිසියෙන් ගෙන්නන්න කට්ටිය ඉන්නවා. පොලීසිය මෙතැනට ගේන්න කට්ටිය ඉන්නවා. හැබැයි, ඒ මිනිස්සු

**41954196**

දෙසිය ගණන් මිරිහාන පොලීසියේ පැමිණිලි ආලා තිබෙනවා. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න කවුරුවත් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම නම් කිසිම පොලීසියකට කථා කළේ නැහැ. මම එනකොට පොලීසියෙන් ඉන්නවා දැක්කා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

නැහැ, නැහැ. අපි කියන්නේ නැහැ ඔබතුමා ගෙන්නුවා කියලා. කවුරු හරි, කොහොම හරි ගෙන්නලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට එදා මේ අයගේ මුදල් අරගෙන තිබෙන ප්‍රමාණය කියන්න බැරි වුණා. ඒ නිසා මම මේ අවස්ථාව අරගෙන ඒක ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේගොල්ලෝ ඇප බැඳුම්කර හැටියට මේ සණසේ ඔප්පු උකස් තියලා තිබෙනවා. නමුත් මේ මුදල් ගෙවන්නේ නැතුව මේ ඔප්පු නිදහස් කරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒකට කවුද අනුමැතිය දුන්නේ? අලුත්ගම හේවගේ ශම්මි ප්‍රීතිකා සිල්වා. ලක්ෂ 80 යි. මහරගම. ඔප්පු අංකය8677. ජයසිංහ ලියනපතිරණගේ සිදත් ගුණසේකර. ඔප්පු අංකය 8054. එක්කෝටි විසි ලක්ෂයයි. නැහැ දොලොස් ලක්ෂයයි. ලියනපතිරණගේ සිදත් ගුණසේකර. ණය මුදල තිස්හතර ලක්ෂ පනස්තුන්දහස් තුන්සිය තිස් හතරයි.වන්නිආරච්චිගේ සුරංගි රසිකා කුමරි. තිස්පන් ලක්ෂයයි. ගිනිමැල්හේවගේ නිශාන්ත කුමාර. මේ කවුද? මේකේ ලේකම්. එස්. විනෝදහේවා එකතුව මේ මුදල් ගන්න කම්පැණියක් හැදුවා. ඒකට උදව් කළේ මේ නිලධාරීන්. මේකේ පරීක්ෂණයට ආපු නිලධාරිනිය තමයි - මම එදා නම කිව්වා. ඒ නිලධාරිනිය තමයි මේ අයට උපදෙස් දුන්නේ,ඔයගොල්ලෝ කම්පැණියක් හදාගන්න කියලා. ඒකේ කෝටි 6 යි. ඊට පස්සේ නිශාන්ත කුමාර. තවත් වෙනම රුපියල් හැට ලක්ෂයක් අරගෙන තිබෙනවා. මේ විධියට තමයි මේ මුදල් අරගෙන තිබෙන්නේ. නමුත් මේ ඔප්පු නිදහස් කරගන්න ඉඩකඩ දුන්නා. ඒ සාක්ෂි තිබෙනවා. මේක හරියට මහ දවල් මංකොල්ලයක්. ඇත්තටම මේක මංකොල්ලකෑමක්. ඉතින් මේකට ක්‍රියාත්මක වෙන්න බැරි ඇයි? ඔබතුමන්ලා හරියට මේක කියන්න ඕනෑ. අඩුම ගණනේ තමුන්නාන්සේ ඇමැතිතුමා හැටියට හත් දෙයියනේ තවම වචනයක් කියන්නේ නැහැ නේ? ඒ නිසා මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඒක තමයි ඇත්තටම මේ අමාත්‍යාංශයේ වැදගත්කම. එහෙම නැත්නම් අර සුනිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ තමුන්නාන්සේ මේ විෂයය අත්හැරලා මධ්‍යම ආණ්ඩුවට දෙන්න. මේක අපට කරන්න බැහැයි කියලා. ඒකයි අපි කියන්නේ. ඒක කරන්න බැරි නම් මේක අත්හැරලා දාන්න. මේක අත්හැරලා දෙන්න. පළාත් සභාවට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. සමගාමී විෂයය කියලා තිබ්බාට වැඩක් නැහැ. ඒක නිසා මේකේ වගකීම අරගෙන තමුන්නාන්සේලා මේකට මොකක් හරි කරන්න ඕනෑ.මේ අයවැය ඉවර වෙන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා ක්‍රියා මාර්ගයක් ගන්න. අන්තිමේදී මේ සම්බන්ධව අපට වග කියන්න බැහැ. ඊට පස්සේ අපට බෝලේ දාන්න එපා. මේ සම්බන්ධව කථා කරලා. ඒ මිනිස්සු ඇවිස්සුවාය, අනන් මනන් කතන්දර අපට කියන්න එපා. මේ තියෙන්නේ අපේ ප්‍රශ්නයක් නොවෙයි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහෙම දෙයක් තිබෙනවා. ඇත්තටම ඔබතුමාට පෞද්ගලික කවුරුවත් දොස් කියන්නේ නැහැ. ඔබතුමා හරි අහිංසකයි. ඒක ඇත්තද නැත්තද කියන එක වෙනම දෙයක්. දැන් එක එක්කෙනා සම්බන්ධව චිත්‍රයක් තිබෙනවා. දැන් ඔබතුමාට කවුරුවත් පෞද්ගලික කියන්නේ නැහැ.නමුත් ගරු ඇමැතිතුමනි, ඔබතුමා ඇමැතිවරයෙක්.අපි සලකන්නේ, ඇමැතිවරයෙක් විධියට. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. හැබැයි මෙහෙම දෙයක් තිබෙනවා. මොනවාත් නොකරන මිනිහෙක්ගෙන් ප්‍රශ්න වෙන්නේ නැහැ. ඇත්තටම මේක තමුන්නාන්සේගේ බලය යටතේ සිද්ධ වුණු දේවල් නොවෙයි. කලින් හිටපු කට්ටිය - මට කලින් කථා කරලා තමුන්නාන්සේට උපදෙස් ටිකක් දුන්නේ. අන්න ඒ උපදෙස් දීපු කට්ටිය කරපු වැඩ තමයි මේ. ඒවාට තමයි දැන් තමුන්නාන්සේට වග කියන්න වෙන්නේ. ඒ නිසා අපේ රටේ පරිපාලන ක්ෂේත්‍රය ඇතුළේ තමන් බලයේ ඉන්න මොහොතේදී පරණ ඒවාට වග කියන්න වෙනවා. ඒ විධියට තමයි අපේ නීතිරීති හැදිලා තිබෙන්නේ. ඒ නිසා තමයි ඔබතුමාට මේකෙන් ගැලවෙන්න බැරි. මම නොකරපුවා. ඔබතුමා කරපුවා. දැන් නිලධාරීන් වුණත් එහෙමයි. මගේ කාලය නොවෙයි කියලා කියන්න බැහැ. සමූපකාර කොමසාරිස්තුමා නම්, දැන් ඉන්න කොමසාරිස්තුමා. මීට

කලින් කොමසාරිස්තුමාගේ වැරැද්දක් වෙන්න පුළුවන්. කලින් නිලධාරීන්ගේ වැරැද්දක් වෙන්න පුළුවන්. හැබැයි තමන් වගකියන්න ඕනෑ. තමන් නම් ඒ තනතුරේ ඉන්නේ, තමන් වග කියන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ කලින් කරපු වැරැදි බොහොමයක් තිබෙනවා. විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඔය අමාත්‍යාංශය තමයි මේ පළාත් සභාවේ සල්ලි විශාල ප්‍රමාණයක් නැති නාස්ති කරලා තිබෙන්නේ. මම කලිනුත් කිව්වා. ඔය රන්මහ පාය පිටිපස්සේ ඉඩමක් අරගෙන අද ඒ ඉඩම කිසි වැඩක් නැති ඉඩමක් බවට පත් වෙලා තිබෙනවා. පාරක් නැති ඉඩමක් බවට පත් වෙලා තිබෙනවා. අර හෝමාගම බස් ස්ටෑන්ඩ් එක ලක්ෂ හත්සිය ගණනක්. කවුද ඒ මුදල් කෑවේ? කවුද ඒ මුදල් විනාශ කළේ? මේ අමාත්‍යාංශය තමයි. කලින් ඉඳලා උපදෙස් දෙන කට්ටිය තමයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ වගකීමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ නම කිව්වේ නැහැ. මූලාසනයට කාලය පිළිබඳ ගැටළුවක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාර්ග සංවර්ධන අධිකාරියෙන් හදලා, සමූපකාරයට නොමිලේ හදලා දීලා (බාධා කිරීම්) මම ඉන්න කොට තමයි ඉඩම ගත්තේ. CID එකට ගිහිල්ලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තමයි තවමත් ඒ බස් ස්ටෑන්ඩ් එක - ඊට පස්සේ තව මුදලක් වෙන් කරලා ආපහු ප්‍රතිසංස්කරණය කළා. ගිලා බැස්සාට පස්සේ. නමුත් අදටත් ඒ බස් ස්ටෑන්ඩ් එකෙන් ප්‍රයෝජන ගන්නේ නැහැ. බස් ස්ටෑන්ඩ් එකක් තිබෙනවා. දැන් බලන කොට මම හිතන්නේ, ලක්ෂ එක්දහස් දෙසිය ගණනක වාගේ ප්‍රමාණයක් දැන් ඕකට වියදම් කරලා තිබෙනවා. නමුත් කිසිම වැඩක් ගත්තේ නැහැ. කාගේ සල්ලිද? මේ ජනතාවගේ සල්ලි. අපි එක පැත්තකින් කියනවා, පළාත් සභාවට දෙන සල්ලි මදී කියලා. දීපු සල්ලිවලට කරලා තිබෙන වැඩේ. මේක හරියට මධ්‍යම ආණ්ඩුවෙන් බැලුවොත් එහෙම, දෙන ටික දෙන්නෙත් නැහැ. ඒ වාගේ අතිවිශාල මුදල් ප්‍රමාණයක් කාබාසිනියා කරලා තිබෙන අමාත්‍යාංශයක්. ඒක නිසා තමයි මම ඇමැතිතුමාට කිව්වේ. ඕනෑ නම් ඇමැතිතුමාට පුළුවන් මොනවත් නොකර ඉන්න. එතකොට කිසි වැරැද්දක් වෙන්නේ නැහැ. හැබැයි වැඩ කරන මිනිහාගෙන්, පිහන් හෝදන මිනිහාගෙන් තමයි පිහන් කැඩෙන්නේ. ඉතින් ඒක නිසා, එහෙම කියලා අපට බය වෙලා ඉන්නත් බැහැ. මේ අමාත්‍යාංශය යටතේ කටයුතු කරන්න පුළුවන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. දැන් විශේෂයෙන්ම ප්‍රවාහන විෂයය තමුන්නාන්සේ යටතේ තිබෙනවා. ඒ ප්‍රවාහන විෂයය යටතේ ඇත්තටම මේ බස්නාහිර පළාත් සභාවේ අපි ඉන්නේ. ඒ බස්නාහිර පළාත් සභාව යටතේ ප්‍රවාහන ප්‍රශ්නය කියලා කියන්නේ, ප්‍රවාහන ප්‍රශ්නයට ඉඩක් තියන්න බැහැ. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය, ජනතාවට තිබෙන ප්‍රවාහන ප්‍රශ්නයට උත්තරයක් හදාගන්න පුළුවන් අමාත්‍යාංශයක්. මම දැක්කා. අද පත්තරේට බෙල්ලන්විල නායක හාමුදුරුවෝ කියලා තිබෙනවා, මේ දේශපාලකයෝ කයිවාරු ගහනවා. කථා කරනවා. අඩුම ගණනේ මේ කොළඹට වාහන පාර්ක් කරගන්න තැනක් නැහැ. කොළඹට එන වාහන ටික අඩු කරගන්න ක්‍රමයක් අපට නැහැයි කියලා. ඇත්තටම පළාත් සභාව පැත්තෙන් අපි ක්‍රියාත්මක වුණොත්, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ඒ වාගේම ත්‍රිරෝද රථ -අර නිකන් ත්‍රිරෝද රථ ලියාපදිංචි කරන්න ගියාම, අපි ඒකට විරුද්ධ වුණේ. ඇත්තටම ඒක පැත්තකට දාන්න නොවෙයි. ඒක නියාමනය කිරීමේ අයිතියත් ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙනවා. දැන් අපි දන්නවා ඊයේ පෙරේදා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ත්‍රිරෝද රථ - මම දන්නේ නැහැ,ඔබතුමාට කථා කළාද?

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඔබතුමා දැනුවත්ද? ඔබතුමාගේ අමාත්‍යාංශය දැනුවත්ද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, ත්‍රිරෝද රථකරුවන් ගෙන්නුවා. ගෙන්නලා සාකච්ඡාවක් දුන්නා. අපි දන්න ත්‍රිරෝද රථ සංගම් ඒ අයගෙන් යෝජනා ඉල්ලුවා. ඊට පස්සේ ඒ අය යෝජනා ඉදිරිපත් කළා. මෙන්න මේ කටයුතු ටික කෙරෙන්න ඕනෑය කියලා. ඒ නිසා මම කියන්නේ, ඕනෑ නම් ඔබතුමාට මොනවත් නොකර ඉන්නත් පුළුවන්.

**41954196**

හැබැයි, තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට තිබෙන විෂයයන් පිළිබඳව බැලුවොත් එහෙම මේවාට ක්‍රියාත්මක වෙලා නිලධාරීන් හරියට මෙහෙයවලා තමුන්නාන්සේ කටයුතු කළොත් එහෙම, බස්නාහිර පළාත තුළ තිබෙන ලොකුම ප්‍රශ්න ටිකකට උත්තර ටිකක් තමුන්නාන්සේට හදන්න පුළුවන්. ඒකට තමුන්නාන්සේගේ පැත්තෙන් ක්‍රියා කළ යුතු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ඇත්තටම මේ ප්‍රශ්නය මට විතරක් නොවෙයි. මේ මුළු සභාවටම මේ සණස ප්‍රශ්නය ප්‍රශ්නයක්. දැන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා. මේ ගැනම කථා කරන්න ගියාම ඇත්තටම මේකෙන් ලොකු කාලයක් වැය වෙනවා. ඇමතිතුමාගේ අතේ මේකට උත්තරය තිබෙනවා. මම හිතනවා. මේ ප්‍රශ්නයට ඒ උත්තරේ ඇමතිතුමාට කියන්න පොඩි වෙලාවක් දුන්නා නම් අපි සියලු දෙනාටම පහසුවක් වෙනවා. එහෙම වුණොත් එහෙම, මේ ගැන කථා කිරීම වළකිනවා. නැත්නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද උදේ එනකොටත් මෙතැනට එන්න අපට ප්‍රමාද වුණා. ඒ කියන්නේ, පොලීසිය එතැන වට කරලා. ඒ නිසා එන්න ප්‍රමාද වුණා. මේකට උත්තරයක් දුන්නේ නැත්නම් හෙටත් ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්නය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමාගේ කථාවේදී කරන්න පුළුවන්. ඊට කලින් අවශ්‍ය නම් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඊට කලින් කළා නම් මේ හැම දෙනාම දන්නවානේ මේ ප්‍රශ්නය? එතකොට ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැනේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතකොට ඇමතිතුමාගේ කාලයෙන් මට දෙන්න වෙන්නේ. කාලය මදි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කාලයෙන් පොඩ්ඩක් දුන්නා නම් එතකොට හැමෝම ප්‍රශ්නය දැන ගන්නවානේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ඇමතිතුමාට අවස්ථාව දෙනවා.

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වත්තෙගෙදර දැනට හඳුනාගෙන ඇති ප්‍රශ්න පිළිබඳවයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. අපි කමිටු - (බාධා කිරීම්)

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක සභාවෙන් තීන්දු කරන්නේ. මම නොවෙයි තීන්දු කරන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි**(කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වඩා හොඳ මෙතුමාගේ පිළිතුරු කථාවේදී ඒක කරන එකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට මම ඒකයි කිව්වේ.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැඩේ වැරදියි. ගරු මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන කාලය නැති වෙන්නේ. ඒ නිසා පිළිතුරු කථාවේදී කියන්නදෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමාගේ විෂය යටතේ කථා කරන කොට ඇමතිතුමා ඉල්ලපු නිසයි මම ඒ කාලය දුන්නේ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කථා කරන එක වඩාත් හොඳයි.

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

41974198

මගේ වෙලාවෙන් දෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවේ අයවැය විවාදය. ඒකේ ගෞරවයත් ආරක්ෂා කර ගනිමින් තමයි අපි ප්‍රශ්නවලට විසඳුම් සෙවිය යුත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, ඒ වෙලාවේ කථා කරනවා නම් වඩා හොඳයි. ඒක ඔබතුමන්ලා කථා කර ගන්න ඕනෑ. බොහොම ස්තුතියි. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 06 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.10]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු ලලිත් වනිගරත්න අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. දැවැන්ත, විශාල අමාත්‍යාංශයක්. විෂයයන් ගණනාවක් තිබෙන අමාත්‍යාංශයක්. අපි සතුටු වෙනවා. ගරු ඇමතිතුමා ඉතාම වාසනාවන්ත අමාත්‍යවරයෙක්. හැමදාම දැවැන්ත අමාත්‍යාංශයක් එතුමාට ලැබෙනවා. මම හිතන්නේ, මේ තනතුරු ලැබෙද්දී වාසනා ගුණයත් බලපානවා. එතුමාට ඒ වාසනාව තිබෙනවා. හැබැයි, ඒ වාසනාව පාවිච්චි කරලා ජනතාවට සේවය කරන්න විශාල වගකීමක් එතුමාට තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඒ වගකීම එතුමා නිවැරදිව ඉෂ්ට කරාවි කියලා. මේ විවාදයේ සාකච්ඡාවට යද්දී හැම වෙලාවේම කථා කරන ප්‍රශ්නයක් තමයි වත්තෙගෙදර සණස සමිතියේ ප්‍රශ්නය. වත්තෙගෙදර සණස සමිතියේ මුදල් තැන්පත් කරපු සියලු දෙනාට අසාධාරණයක් වෙලා තිබෙනවා කියන එක අපි කවුරුත් පිළිගන්න කාරණයක්. හැබැයි, අපි කියන්නට ඕනෑ කාරණාව තමයි, වත්තෙගෙදර සණස සමිතියේ මුදල් තැන්පත්කරුවන්ගේ කඳුළු දේශපාලන උවමනාව සඳහා පාවිච්චි කරන එක ඉතාම වැරදි සහගතයි කියලා. එක මේ වෙලාවේ කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ, හොරු අල්ලන පොලීසියක් ලංකාවේ හදලා තිබෙනවා. ඒ පොලීසියේ පොලිස්පතිකම ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමාට දුන්නා, කියලා මේ රටේ කවුරුත් දන්නවා. එතුමාට අරලියගහ මන්දිරයේ කාර්යාලයකුත් තිබෙනවාය කියලා අපි හැමෝම දන්නවා. ඉතින් අපි දන්නවා, මේ වන කොට මේ ආණ්ඩුව බලයට ගේන්න දැවැන්තව කටයුතු කරපු ලංකා e news editor සඳරුවන් සේනාධීරව අල්ලන්න කියලා ජාත්‍යන්තර රතු නිවේදනයක් නිකුත් කළාය කියලා, අධිකරණ ඇමතිවරයා පාර්ලිමේන්තුවේ කිව්වා. Interpolඑකෙන් නියෝගයක් දීලා,Interpol එක හරහා ඔහුව අත්අඩංගුවට ගන්නවාය කියලා කිව්වා. ඒ නිසා මේ සභාවේ මෙපමණ කෑ ගහන වෙලාවේ මේ අයට පුළුවන්, මේ ගොනුව අරගෙන ගිහිල්ලා මේ හොරු අල්ලන පොලීසියට භාර දෙන්න. ඊට පස්සේ ජාත්‍යන්තර පොලීසිය හරහා හෝ මේ හොරු අල්ලයි. මේකේ දිගට කිය කියා, දේශපාලන වාසි ගන්න මේ වත්තෙගෙදර සණස සමිතියේ අහිංසක තැන්පත්කරුවන්ව පාවිච්චි කරනවා නම්, ඒක ඉතාම වැරදි සහගතයි කියන කාරණය අපි මේ වෙලාවේ මතක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන්ම ප්‍රවාහන සේවය ගැන මතක් කරන්න ඕනෑ. අපි හැමෝම දන්නවා. සාමාන්‍යයෙන් ලංකාව කියන්නේ සුභ සාධන රාජ්‍යයක් කියලා. සුභ සාධන රාජ්‍යයක ප්‍රධාන කාරණයක් තමයි අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය වාගේ ක්ෂේත්‍රයන් සුභ සාධන විෂයයන් විධියට නඩත්තු කරන එක. මේ විධියටම තමයි 1956 දී,එදා පත් වුණු මහජන එක්සත් පෙරමුණ රජයේ බණ්ඩාරනායක මැතිතුමා බස් ජන සතු කරනු ලැබුවේ. ලොකු සමාගම්කරුවන් අතේ ප්‍රවාහන සේවය තිබුණා. සමාගම් කිහිපයකට බස් ප්‍රවාහන පද්ධතිය අයිති වෙලා තිබුණා. මේක ආණ්ඩුවට පවරාගෙන ආණ්ඩුව මගින් සුභ සාධන සේවාවක් විධියට මේක නඩත්තු කර ගෙන ගියා. නමුත් 1977 ට පස්සේ නැවත වතාවක් පෞද්ගලික අංශය අතට මේක ගියා. ඒ ගියාට පස්සේ මේ පුංචි අයට පුළුවන්කම ලැබුණා, විශේෂයෙන් මැද පෙරදිග රස්සාවට ගිය අය ඒ හම්බ කර ගෙන ආපු සල්ලිවලින් බස් එකක්

[ගරු මහේෂ් අල්මේදා]

අරගෙන අහිංසක මිනිස්සුන්ගේ සේවාවක් විධියට බස් ප්‍රවාහන සේවය පවත්වාගෙන යන්න. දැන් මේක ආපහු පෞද්ගලික මුදලාලිලා අතට යමින් තිබෙනවා. ඒ හරහා මේ පෞද්ගලික අංශයේ ලොකු ඒකාධිකාරයක් නිර්මාණය වෙලා තිබුණා. මේ හරහා කොළඹ දිස්ත්‍රික්කයට බලපෑ ප්‍රධාන කාරණයක් තිබෙනවා. ගරු

41954196

නියෝජ්‍යසභාපතිතුමනි, මාර්ග අංක ගණනාවක් මට කියන්න පුළුවන්. මාර්ග අංක 167 තොටළඟ - දෙහිවල, මාර්ග අංක 195 හෙට්ටියාවත්ත - නුගේගොඩ, මාර්ග අංක 116 මට්ටක්කුලිය - පිළියන්දල, මාර්ග අංක 134 අංගොඩ - ගල්කිස්ස, මාර්ග අංක 131 වැල්ලම්පිටිය - මහරගම, මාර්ග අංක 111 කොල්ලුපිටිය - බොල්ලැගල, මාර්ග අංක 132 දෙහිවල සත්වෝද්‍යානය - මට්ටක්කුලිය. මේ මාර්ග අංක එකකවත් අද බස් දුවන්නේ නැහැ. මේ මාර්ග අංක අහෝසි වෙන්න යවලා තිබෙනවා. මේවායේ දිව්වේ පුංචි බස්කාරයෝ. මේවායේ සේවය ගත්තේ අහිංසක මිනිස්සු. ප්‍රවාහන පද්ධතිය රටේ කාර්යක්ෂමතාවයට බලපානවා කියලා අපි සියලු දෙනාම දන්නවා. හැබැයි, බස් සේවාව එහෙම මුදලාලිලා අතට ගිහිල්ලා, මේ පුංචි පාරවල් ටික, පුංචි මිනිස්සු දුවපු තැන් ටික වැටිලා තිබෙනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා ලංකාවේ වාහන තිබෙනවා 4,441,902 ක්. මේකෙන් 1,595,719 ක්ම 36% ක්ම තිබෙන්නේ, බස්නාහිර පළාත ඇතුළේ. බස් ලියාපදිංචි කරලා තිබෙනවා. 2015 අන්තිම වන කොට පෞද්ගලික බස් 6200 ක් ලියාපදිංචි වෙලා. ඒකෙන් 5300 ක් 2015 දෙසැම්බර් 31 වැනිදා වන කොට බස්නාහිර පළාතේ පාරවල් ඇතුළේ දිව්වා. මේ අසීමිත බස් සංඛ්‍යාවක් දුවන නිසාම, ඒ වාගේම වාහන වැඩි වෙලා තිබෙන නිසාම විශාල මාර්ග අනතුරු සංඛ්‍යාවක් වෙනවා. මේ මාර්ග අනතුරු වළක්වන්න පෞද්ගලික බස් අංශය නියාමනය කිරීමේ වගකීම ප්‍රවාහන අධිකාරියට පැවරිලා තිබෙනවා. මේ වගකීම නම් ඉෂ්ට වෙන්නේ නැහැ. අපි දන්නවා. මාර්ග පරීක්ෂකවරු ගණනාවක් පාරේ දාලා තිබෙනවා. ඒක අතිශයින්ම දූෂිත සේවාවක්. මේ මාර්ග පරීක්ෂකවරු සම්පූර්ණයෙන්ම මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ගයක ඉන්නවා මිසක, මේවා නඩත්තු කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට හොඳම උදාහරණයක් මට කියන්න තිබෙනවා. පසුගිය 11 වැනිදා, සෙනසුරාදාඅවිස්සාවේල්ල ආසනයේ, කොස්ගම හන්දියේ දැවැන්ත අනතුරක් සිද්ධ වුණා. මම ගරු ඇමතිතුමාට අවධාරණයෙන් කියනවා. මේ කටයුත්ත කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා. මේ බස් එකේ අයිතිකරුවා සම්පත් මංචනායක. ඔහු බස් දහයක් පහළොවක් තිබෙන අයිතිකරුවෙක්. බස් තිස් ගණනක්. මාර්ග අංක 122. අංක ND – 8913 කියන බස් එකෙන් තමයි මේ අනතුර සිද්ධ කරනු ලැබුවේ. මේ බස් එක එළවපු මනුස්සයාට කියන්නේ උණ පැටියා කියලා. අවිස්සාවේල්ල හෝල්ට් එකේ දඟ පැටියා කියලත් කියනවා. මෙයාට ලයිෂන් එකක් තිබෙනවාද නැද්ද කියලත් අපි දන්නේ නැහැ. මේ පෞද්ගලික අංශයේ ඉන්න බස් රියදුරන් 90% ක් බස් ධාවනය කරන්නේ, එක්කෝ අරක්කු බීලා. එහෙම නැත්නම් ගංජා බීලා. ඒකට සාධාරණ හේතුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සේවාවේ සේවය කරන රියදුරන්ගෙන් අසීමිතව වැඩ ගන්නවා. විවේකයක් නැහැ. මේ අයගේ අතපය රිදෙනවා ඇති. ඒ නිසා තමයි බීලා හුඟක් අය එළවන්නේ. හැබැයි, ඒ අය බිව්වාට, ඒ අයගේ අත පය රිදුනාට පාරේ යන මගියෝ මේකට පළි නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රියදුරා, මේ දඟ පැටියා කිලෝ මීටර් තුනක්ම බස් එක එළෙව්වේ ෆෝන් එක කනේ තියාගෙන. ෆෝන් එක කනේ තියාගෙන තමයි එළෙව්වේ. කොස්ගම හන්දියට බස් එක එන කොට ඔහුගේ කනේ ෆෝන් එක තිබුණා. ඔහු රියැදුරු අසුන පැත්තේ තිබෙන දොරට හේත්තු වෙලා සිටියේ. කොස්ගම හන්දියේ වංගුවේදී මේ දොර ඇරුණා. ඔහු රියදුරු අසුනින් බිමට වැටුණා. බිමට වැටෙන කොට එක අතෙන් අල්ලාගෙන හිටපු ස්ටියරින් වීල් එක කැපිලා පැත්තකට ගිහිල්ලා, පාරෙන් එළියට බස් එක පැන්නා. පැන්නාම, එතැන තිබුණු සැලුන් එකකුයි, එතැන තිබුණු බයිසිකල් අලුත්වැඩියා කරන තැනකුයි දෙකක් කඩාගෙන ගියා. බයිසිකල් අලුත්වැඩියා කරමින් සිටි කාර්මිකයා ඒ ස්ථානයේම මිය ගියා. මේ බස් රථයේ රියදුරා පැනලා ගියා. ඔහු භාර වෙන්න තිබුණේ, කොස්ගම පොලීසියට. හැබැයි, භාර වුණේ අවිස්සාවේල්ල පොලීසියට. ඔහු බීලා හිටියාද නැද්ද කියන පරීක්ෂාව සිද්ධ වුණාද නැද්ද කියලා අපි දන්නේ නැහැ. මගේ ඉල්ලීම මේ පරීක්ෂණයට ප්‍රවාහන අධිකාරිය මැදිහත් වෙන්න ඕනෑ කියලා. අපි අනිවාර්යයෙන්ම කියනවා. මේ අනතුරට මේ බස් එක වගකියන්න ඕනෑ කියලා. ඒ නිසා මේ මාර්ග බලපත්‍රය. මාර්ග අංක 122 මාර්ග බලපත්‍රය අවලංගු කරන්න කියන ඉල්ලීම ගරු ඇමතිතුමාගෙන් කරනවා. එහෙම කරලා ආදර්ශයක් දෙන්න, මෙහෙම වැරදි කරන රියදුරන්ට ප්‍රවාහන අධිකාරිය තදින් නීතිය ක්‍රියාත්මක කරනවාය කියලා. එහෙම නැති වුණොත් මේ මාර්ග අනතුරු ප්‍රමාණය පාලනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ.ප්‍රවාහන අධිකාරියේ

විෂයයන්වල, එහෙම නැත්නම් ප්‍රවාහන අධිකාරියේ වගකීම්වල, ඒ අය බොහොම තදින් කියලා තිබෙනවා. විනය ගරුක ප්‍රවාහන සේවක පිරිසක් එක්ක මගී ප්‍රවාහන සේවය ගුණාත්මකභාවයෙන් යුතුව පවත්වාගෙන යනවා කියලා. ඇත්තටම මගී ප්‍රවාහන සේවය කිසිම ගුණාත්මකභාවයක් නැති ප්‍රවාහන සේවයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේක නියාමනය කරන්න වැඩ පිළිවෙළක් යොදන්නය කියලා. මම දන්නේ නැහැ මේ ගෙවුණු අවුරුද්දේ මේ ඉන්න රියදුරන්ව, මේ ඉන්න කොන්දොස්තරවරුන්ව දැනුවත් කරන්න, ඔවුන්ට යම් දැනුමක් ලබා දෙන්න පුහුණු වැඩ සටහන් එකක්වත් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියලා. මේ අය පුහුණු කරන්න ඕනෑ. මේ අයගේ රියදුරු බලපත්‍ර පරීක්ෂා කරන්න ඕනෑ. අර කියන මාර්ග මගී පරීක්ෂකවරු මුදල් ගන්න පුළුවන් යම් ක්‍රියාදාමයක් කරනවා මිසක, කවදාවත් ප්‍රවාහන පද්ධතියේ යෙදිලා ඉන්න මේ අය විනයගරුකව තමන්ගේ රැකියාව කරනවාද කියලා සොයා බලන්නේ නැහැ. මේ අඩුව නිසාම ප්‍රවාහන පද්ධතියේ මගී ප්‍රවාහන සේවාවේ ගුණාත්මක තත්ත්වය පිරිහිලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට කියනවා. මේක ගුණාත්මක සේවාවක් කරන්න, ඔබතුමාගේ මැදිහත්වීම තදින් ක්‍රියාත්මක කරන්නය කියලා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.19]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ 107, 121, 122, 123, 124, 125 හා 103 වැය ශීර්ෂයන් සම්බන්ධව උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට අවස්ථාව ලබා දීම පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ තිබෙන කාලයත් එක්ක අපට අමාත්‍යාංශය පිළිබඳවත් සමහර අධිකාරී පිළිබඳවත්, සමහර විෂයයන් සම්බන්ධවත් කථා කරන්න අවස්ථාවක් නැතත් සංක්ෂිප්තව හරි මේ සංඛ්‍යාලේඛන පිළිබඳව අපි මතක් කළ යුතුයි. ඒ නිසා අපි මුලින්ම සමූපකාර සේවක කොමිෂන් සභාව පිළිබඳව කථා කළාම, 2016 ට සාපේක්ෂව 2017 දී පුනරාවර්තන වියදම මිලියන 2 ක වැඩි වීමක් තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම පන් ලක්ෂ තුන් දාහක අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම කර්මාන්ත දෙපාර්තමේන්තුව ගත්තාම පුනරාවර්තන වියදම මිලියන 25 ක වැඩි වීමක්, 11% ක වැඩි වීමක් තිබෙනවා. ප්‍රාග්ධන වියදම ලක්ෂ 2 කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ තිබෙන පේෂකර්මාන්ත, කුඩා කර්මාන්ත සහ වෘත්තීය පුහුණු සංවර්ධන කටයුතු සඳහා මොනම වැය ශීර්ෂයකවත් මුදල් වෙන් කරලා නැහැ. ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒක අමාත්‍යතුමාගේ වරදක් නොවෙයි. මුදල් වෙන් කරන කොට නිලධාරීන් ඒ පිළිබඳව කටයුතු කරන්නට ඕනෑ.

ඒ වාගේම නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව. පුනරාවර්තන වියදම ලක්ෂ තුනක වැඩි වීමක්. 4% ක වැඩි වීමක්. ඒ වාගේම ප්‍රාග්ධන වියදම ලක්ෂ දෙකකින් තමයි වැඩි කරලා තිබෙන්නේ. නමුත් නිවාස ආධාර ලබා දීම, ගෙවල් කුලී නීතිය ක්‍රියාත්මක කිරීම වැනි කාරණා ක්‍රියාත්මක කිරීමට සේවකයින්ගේ හිඟයක් තිබෙනවා. අපි දන්නවා.එතුමිය ගෙවල්වලට ගිහිල්ලා, ඒ ලබා දුන්න නිවාස ආධාර සම්බන්ධව සොයා බලා කටයුතු කරනවා. නමුත් අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේවා කර ගන්න ගියාම, අපට ලොකු ගැටළුවක් මතු වෙලා තිබෙනවා. අද වන තෙක් ඒවා බෙදා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අද නිලධාරීන් ලබා ගැනීම සඳහා පුනරාවර්තන වියදම් වැඩි කරලා තිබුණා නම් මම හිතන්නේ, නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව,ඇමතිතුමාගේ අමාත්‍යාංශයට ලොකු ශක්තියක් වෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා.

ඊළඟට ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව. පුනරාවර්තන වියදම රුපියල් මිලියනයකින් වැඩි වීමක් තිබෙනවා. නමුත් ප්‍රාග්ධන වියදම රුපියල් පහළොස් දාහකින් තමයි වැඩි වෙලා තිබෙන්නේ. නමුත් 2015 සත්‍ය ආදායම මිලියන 53 ක් සොයලා දීලා තිබෙනවා. ඒ වාගේම 2017 ටත් මිලියන 53 ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.පුනරාවර්තන
[ගරු සහන් ප්‍රදීප් විතාන]

වියදම මිලියන නවයකින් අඩු කරලා තිබෙනවා. පුනරාවර්තන වියදම් අඩු වෙනවාය කියන්නේ, දෙපාර්තමේන්තුව ගෙනියන්නේ කොහොමද කියන එක පිළිබඳව ලොකු ගැටළුවක් මතු වෙනවා. සමූපකාර සමිති සංවර්ධනයට මුදල් වෙන් කරලා නැහැ.

**41954196**

ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. පුනරාවර්තන වියදම ලක්ෂ හතකින් අඩු කරලා තිබෙන්නේ. ප්‍රාග්ධන වියදම මිලියන තුනකින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරන ගාස්තු, සහා අනෙකුත් ලැබීම් මිලියන 900 යි. මෝටර් රථ වාහනවලින් අය කරන දඩ මුදල මිලියන 230 යි. නමුත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම්වල අඩු කිරීමක් සිද්ධ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ 107 වැය ශීර්ෂයේ PDG වල සහා ආදායම් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම් මිලියන 309 ක් වෙන් කරලා තිබුණත්, මේ මොන විෂයයන් සඳහා ද වෙන් කරලා තිබෙන්නේ කියන එක පිළිබඳව දැනුවත් කිරීමක් මුදල් ප්‍රකාශයෙන් සිදු කරලා නැහැ. ඒක ලොකු අඩුපාඩුවක් හැටියට අපි දකිනවා. දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගණනාවක් ඉන්නවා. ඒ අයගේ විෂයයන් යටතේ මුදල් වෙන් කරලා දෙනවා නම් මම හිතන්නේ, විශාල ප්‍රගතියක් අපට ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. PSDG යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මිලියන 192 යි. ඒ වාගේම 12 වැය ශීර්ෂය සහා ආදායම ආයතනිකප්‍රාග්ධන යෙදවුම් මිලියනයක් පමණයි වෙන් වෙලා තිබෙන්නේ. PSDG මිලියන 192 බෙදී යන ආකාරය මෙසේ සඳහන් වෙනවා. කුඩා කර්මාන්ත විෂය සඳහා ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ මිලියන හයක් පමණයි. නිවාස සඳහා ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ මිලියන හතරක් විතරයි වෙන් වෙලා තිබෙන්නේ. ප්‍රවාහන යටතේ ගොඩනැගිලි හා ඉදි කිරීම් සඳහා මිලියන 15 ක් හා පුහුණු හා ධාරිතා සංවර්ධනය හැටියට මිලියන දෙකක් වෙන් කරලා තිබෙනවා. සමූපකාර, වෙනත් ආයෝජන යටතේ මිලියන එකක් පමණයි වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන යටතේ ගොඩනැගිලි හා ඉදි කිරීම් යටතේ මිලියන හතක්, පුහුණු හා ධාරිතා සංවර්ධනයට මිලියන තුනක් වශයෙන් මිලියන දහයක් වෙන් කරලා තිබෙනවා. පළාත් මාර්ගවලට වෙනත් වැය ශීර්ෂ යටතේ මිලියන 150 ක් වෙන් කරලා තිබෙනවා.වතු මාර්ග සඳහා වෙන් කරලා තිබෙන්නේ, වෙනත් වැය ශීර්ෂ යටතේ මිලියන හතරක් විතරයි. ඒ වාගේම මේ PDG මුදල්වල - විශේෂයෙන්ම අපි මතක් කරන්නේ, අපි බන්දුල මහතාගෙනුත් ඉල්ලීමක් කරනවා, 2018 වර්ෂය වන කොට මේ PDG මුදල් මොන විෂයයන් යටතේ වෙන් කරනවාද කියන එක මුදල් ප්‍රකාශයේ සඳහන් කරන්න, කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. හැම අවස්ථාවකදීම උපදේශක කාරක සභාව නිරන්තරයෙන් මාසයකට සැරයක් කැඳවන අමාත්‍යවරයෙක්. එතුමා තවම අමාත්‍යාංශය භාර අරගෙන අවුරුද්දක් විතරයි. නමුත් අපි දන්නවා එතුමා ඉතාමත් විනිවිධභාවයෙන් යුතුව හැම කෙනෙකුගේම ප්‍රශ්නවලට උපදෙස්වලට ඇහුම්කන් දෙමින් මේ අමාත්‍යාංශය කර ගෙන යන අමාත්‍යවරයෙකු හැටියට කටයුතු කරනවා. ඒ වාගේම අපි පැහැදිලිවම මතක් කරන්න ඕනෑ. ලේකම්තුමියත් ඒ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාත් සියලු දේවල් පසු විපරම් කරමින් කටයුතු කරනවා. ඒ වාගේම එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයත් සෑම මන්ත්‍රීවරයෙකුගේම ප්‍රශ්න පිළිබඳව සොයා බලා කටයුතු කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ප්‍රවාහන අධිකාරිය සම්බන්ධව කථා කරන කොට ගම්පහබස් හිමියන්ගේ ගැටළුවක් තිබුණා. ඒ වෙලාවේ ගරු ඇමතිතුමාත්, සභාපතිතුමාත් එකතු වෙලා ඒ ප්‍රශ්නය විසඳුවාට පස්සේ සාමාන්‍යාධිකාරීතුමා නැවතත් ඒ ප්‍රශ්නය අවුල් කරලා තිබෙනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

ඒ වාගේම වත්තෙගෙදර සණස ප්‍රශ්නය පිළිබඳව සමූපකාර කොමසාරිස්තුමාට නිරන්තරයෙන්ම - අද ඇමතිතුමා කමිටුවක් පත් කරලා, ඒ පිළිබඳව පරීක්ෂණ කියලා, ඒ වාර්තාවෙන් අනුවඉදිරි කටයුතු කර ගෙන යන්න කටයුතු සිද්ධ කරලා තිබෙනවා. පැහැදිලිවම, ඒ පිළිබඳව හොඳ තීන්දුවක් ගරු අමාත්‍යතුමා ලබා දෙන්න කටයුතු කරයි කියලා අපි දැඩිව විශ්වාස කරනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට එතුමාට උපරිම සහයෝගය ලබා දෙනවා කියන එක මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ ආසනය නියෝජන කරන පිරිසක් පිටත

විශාල උද්ඝෝෂණයක් කරනවා. ඒකේදී අනිවාර්යයෙන්ම ඒ සමූපකාරය හරහා සිදු වෙලා තිබෙන අවිධිමත් වැඩ කටයුතු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමාගේ කථාවේදී ඒ පිළිබඳව කථා කරන්න ඉන්නේ. ඒකට වැඩ පිළිවෙළක් -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ඒ පිළිබඳව වහාම සොයා බැලීමක් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කේ.ටී. කුරුසාමි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 11.25]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusami

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා, අපේ ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය පිළිබඳව මෙම අයවැයේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන. ඇත්ත වශයෙන්ම සියලුම ගරු මන්ත්‍රීවරුන් පැවසූ පරිදිම මමත් මගේ ස්තුතිය මේ අවස්ථාවේදී අපේ ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාට පුද කර සිටිනවා. ඇත්තටම ඒ ගරු ඇමතිතුමා ඉතාමත් හොඳින් සියලුම මන්ත්‍රීවරුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනවා. ඒ වාගේම ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් හා පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සියලු දෙනාම හොඳ ආකාරයෙන් මන්ත්‍රීවරුන්ට උදව් උපකාර කරනවා. නමුත් ගරු නියෝජ්‍යසභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කියන්නේ කළුතර, ගම්පහ, කොළඹ කියන දිස්ත්‍රික් තුනක් එකතු වුණු සභාවක්. මම නම් හිතන්නේ, අනික් දිස්ත්‍රික් දෙක මොන වාගේ සංවර්ධන වැඩ කටයුත්තක් ඔය අමාත්‍යාංශය තුළින් කරලා තිබෙනවාද කියලා නම් මම දන්නේ නැහැ. නමුත් කොළඹට නම් හුඟාක් අඩුයි කියන එක මම කියන්න ඕනෑ. මම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මෙම අමාත්‍යාංශය තුළින් කොළඹ දිස්ත්‍රික්කය ගැනත් පොඩ්ඩක් සිතා බලා කටයුතු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මෙම අවස්ථාවේදී, ගරු මහ ඇමතිතුමාත් සභාවේ රැඳී සිටින නිසා එතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා. ඇත්තටම පසුගිය දිනක අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මෙම සභාවේදී කියා සිටියා අපේ මහ ඇමතිතුමා එක පක්ෂයක මහ ඇමතිවරයෙක් නොවී මේ මුළු සභාවටම මහ ඇමතිවරයෙකු හැටියට ක්‍රියා කරන්න ඕනෑය කියලා. ඒ නිසා එතුමාට අපේ සියලු ආශිර්වාදය, සියලු සහයෝගය ලබා දෙනවා කියලා මම මේ අවස්ථාවේදී කියා සිටිනවා. විශේෂයෙන්ම ගරු මහ ඇමතිතුමාත්, ගරු ප්‍රවාහන ඇමතිතුමාත්, ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යාංශයේ සියලුම කාර්ය මණ්ඩලය මේ අවස්ථාවේදී සිටින නිසාමම මේ අමාත්‍යාංශය ගැන යම්කිසි දෙයක් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලයේ කියා සිටියා, දෙසැම්බර් මාසය වන කොට සමහර මන්ත්‍රීවරුන්ට බස් හෝල්ට් හදලා දෙනවා කියලා. එහෙමකථාවක් කියලා මටත් කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ ප්‍රදේශයක - මම එදත් අපේ උපදේශක කාරක සභාවේදී කියා සිටියා. එම බස් හෝල්ට් එක හදන්න ඔබතුමාගේ නිලධාරීන් සියලු දෙනාම ඉදිරිපත් වුවත්, තවම ඒ බස් හෝල්ට් එකමට ලබා දුන්නේ නැහැ. ඒකට හේතුවක් වුණේ මොකක්ද කියලා. මේ ගැන ඇත්තටම සොයා බලන්න කියලා මම ගරු ඇමතිතුමා ඇතුළු සියලුම නිලධාරීන්ට කියා සිටිනවා. කොළඹ නගර සභාව මෙම බස් හෝල්ට් එක හදන්න ගිහිල්ලා අපි අනුමැතියක් ඉල්ලලා යන කොට ඒගොල්ලෝ පවසා සිටියේ මොකක්ද කියලා මම කිව්වා. මේ අවස්ථාවේදී මේ සභාවේදී ඒක මම පැහැදිලි කරන්න ඕනෑ. කොළඹ නගර සභාවෙන් කියන්නේ, කොළඹ නගර සීමාව තුළ මාර්ග ගැන මොනවා හරි කරන්න ඕනෑ නම් ඔවුන්ගෙන් අනුමැතියක් අරගෙන තමයි කරන්න ඕනෑ කියලා. නමුත් අපි කියන්නේ මොකක්ද? පළාත් සභාව, ඒ කොළඹ නගර සභාවට වඩා උසස් තැනක තිබෙනවාය

[ගරු කේ.ටී. කුරුසාමි]

කියලා. තව වෙන තුරු ඒ ප්‍රශ්න උඩ - මේ බස් හෝල්ට් එක කියන්නේ, එක ප්‍රශ්නයක්. නමුත් මේ වාගේ අපේ පළාත් මාර්ග අමාත්‍යාංශය තුළින් යම්කිසි වැඩක් කොළඹ නගර සීමාව තුළ කරනවා නම්, අපි කොළඹ නගර සභාවෙන් අනුමැතිය ලබා ගන්න ඕනෑද කියලා කරුණාකර සොයා බලන්න ඕනෑ. ඒ වාගේම දැන් කොළඹ නගරයේ මොකක් හරි වාහනයක් පාර්ක් කරන්න ගියොත් - ගරු ඇමතිතුමා මේ ගැනත් සොයා බලන්න. කොළඹ නගර

**41954196**

සභාව සමග යම්කිසි ගිවිසුමකට ගිහිල්ලා සමහර පෞද්ගලික ආයතනParking කටයුතු කරනවා. අද කොළඹ නගරය තුළ පොඩි පොඩි පාරවල්වලවත් වාහනයක් නවත්වන්න බැහැ. මේ ළඟදී දවසක මම පැනඩෝල් දෙකක් ගන්න අතුරු පාරක කාර් එක නවත්තලා ගියාම පැනඩෝල් දෙක රුපියල් පහයි. පාර්කින් චාර්ජ් එක රුපියල් 30 යි. ඉස්සර නම් යම්කිසි තැන්වල විතරයි ගත්තේ. දැන් අතුරු පාරවල් ඔක්කොම පෞද්ගලික ආයතනවලට දීලා කෝටි ගණන් සල්ලි හම්බ කරනවා. මේ ගිවිසුම අපේ පළාත් සභාව දැනුවත් කරලාද කරන්නේ කියන එක ගැනත් කරුණාකර සොයා බලන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.30]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩි 05 යි නේ? මට කාලය නම් මදී. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහන, මාර්ග ප්‍රමුඛ විෂය පථයන් කිහිපයක් භාරව සිටින අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ විෂයයන් යටතේ තමයි මට කථා කරන්න ලැබිලා තිබෙන්නේ. මට ලැබිලා තිබෙන වෙලාව අනුව මම මාර්ග ගැන වැඩි විස්තර කථා කරන්නේ නැහැ. මොකද, මේ මාර්ග සංවර්ධනය දැනට අවුරුදු ගණනක සිට හිටපු ඇමතිවරුත්, දැන් සිටින ඇමතිතුමාත් ඉතාමත් ක්‍රමානුකූලව හැම ආයතනයකටම පොදුවේ වැටෙන විධියට ඒ මාර්ග සංවර්ධනය කර ගෙන යනවා. ඒකට අවශ්‍ය පසුබිම ඒ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, ඒ වාගේම කළමනාකාර අධ්‍යක්ෂතුමා ඇතුළු සියලු නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් වෙලා තමයි වැඩ කරන්නේ. ඒ නිසා ඒ ගැන අපි කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟට තිබෙනවා, ප්‍රවාහනය. ගරු නියෝජ්‍යසභාපතිතුමනි, ප්‍රවාහනය ගැන කථා කරන කොට බස්නාහිර පළාත් සභාවට අයත් පෞද්ගලික බස් රථ ප්‍රවාහනය පිළිබඳව නියාමනය කරනවා වාගේම, අපි ගිය අවුරුද්දේ - සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කරනවා වාගේ අපි කථා කළා. බස්නාහිර පළාතේ තිබෙන ත්‍රී රෝද රථ ලියාපදිංචි කරලා, ඒකට නියාමනයක් හදලා,ඒ අයගේත් සුරක්ෂිතභාවය ආරක්ෂා වන විධියට වැඩ කටයුතු කරන්නය කියලා. නමුත් මේක පටන් ගත්තාට - මේ පසුගිය මාස දෙකකට ඉස්සෙල්ලාත් කොළඹ සීමාව තුළ ඒ බලපත්‍ර ලබා දුන්නා. නමුත් ඒක නිසියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. යම්කිසි ස්ථානයක මේ ගැන අඩුපාඩුවක් තිබෙනවා. ගරු ඇමතිතුමා කොපමණ වීරිය දැරුවත්, කොපමණ ධෛර්යය දැරුවත් ඒ ත්‍රීරෝද රථ නියාමනය කරන්න යම් යම් නිලධාරීන්ගේ අඩුපාඩුකම් නිසා හෝ මෙය මන්දගාමීව යනවා. ඒ නිසා ලබන අයවැයට පෙරවත් බස්නාහිර පළාත් සභාවේ තිබෙන සියලුම ත්‍රීරෝද රථ ඒ අයගේ සුරක්ෂිතභාවය ආරක්ෂා වන විධියට නියාමනයක් හදලා, නියාමනය කරන ගමන් එය බස්නාහිර පළාත් සභාවේ ආදායමක් විධියට ලබා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට සමූපකාරය ගැන කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමූපකාර ගැන කථා කරන කොට මම උදාහරණයක් වශයෙන් කියන්නම්.මේක අමාත්‍යතුමාට මඩ ගැසීමක් නොවෙයි. මේ අමාත්‍යාංශවල හැම වැය ශීර්ෂයකම කථා කරද්දී, මේ ගරු මන්ත්‍රීවරු ඇමතිතුමා ගැන විශ්වාසය තිබ්බා. ඇමතිතුමා ගැන හොඳ කථා කළා. ඇමතිතුමාට යමක් කරන්න ඕනෑකම තිබෙනවා කියලා කථා කළා. ඒ වාගේම යම් යම් නිලධාරීන්ටත් එය තිබෙනවා කියලා කථා කළා. නමුත් ඇතැම් නිලධාරීන් කරන වැරදි වැඩ නිසා ගරු ඇමතිතුමාගේ නම තමයි අපකීර්තියට ලක් වෙන්නේ. උදාහරණයක් වශයෙන් වත්තල විවිධ සේවා සමූපකාර සමිතිය ගැන මම කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වත්තල විවිධ සේවා සමූපකාර සමිතියේ අක්‍රමිකතා සහ අවුරුදු ගණනක සිදු වෙමින් පවතින පාඩු නිසා කොමසාරිස්තුමා තීන්දු කළා - එම ධූර කාලය අවසන් නිසා, එම ආයතනයට ඇමතිතුමාගේ අනුමැතිය පරිදි කොමසාරිස්තුමා විසින් නිලධාරීන් තුන් දෙනෙක් පත් කළා. ඊට පස්සේ කොමසාරිස්තුමාගේ ලිපිය යවන්න ඕනෑ 48 වගන්තිය යටතේ නම්, 48 වගන්තිය යටතේ ඔබ මේ මේ වැරදි කර ඇති නිසා ඔබගේ සභාපතිධූරය පමණයි අහෝසි කරන්නේ. අධ්‍යක්ෂ

මණ්ඩලය අහෝසි කරන්නේ නැහැ. නමුත් 48 (අ) කියලා වගන්තියක් දාලා ඇරියා. එහෙම වගන්තියක් නැහැ. එහෙම (අ) යටතේ ඡේදයක් නැහැ. ඒක අරගෙන හිටපු සභාපතිතුමා උසාවි ගියා. නඩුකාර උන්නාන්සේ බැලුවාම (අ) කියලා වගන්තියක් නැහැ. ඒ අඩුපාඩුව නිසා වාරණ නියෝගයක් අරගෙන නැවතත් ඒ තනතුරට පත් වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හරිම අසාධාරණයක් කරන්නේ. අනික් අයට අටක් දුන්නා. මට විනාඩි 05 යි දීලා තිබෙන්නේ. ඒ නිසා අසාධාරණයට පත් වුණා. ඒ පත් වුණු සභාපතිවරයාට පක්ෂව වැඩ කළාය කියලා අද කළමනාකාරතුමියගේ උත්සව අත්තිකාරම් මුදලත් නතර කරලා, ඒ කළමනාකාරතුමියව බැංකුවකට මාරු කරලා තිබෙනවා. මේ වාගේ ඒකාධිපති විධියට තමයි අද සමූපකාරවල ඉන්න සභාපතිවරු වැඩ කරන්නේ. ඇතැම් සමූපකාරවල. ඒ නිසා තමයි මේ සමූපකාර පාඩු ලබන්නේ. මේ සමූපකාර බැංකු මත යැපෙනවා. ඒ බැංකු එන්න එන්නම පාඩුයි. වෙන පාරිභෝගික අංශ නැහැ. ඒවා වැහිලා ගිහිල්ලා. මේ අය මේ බැංකුවල ලබන සුළු ලාභය දඩ මීමා කර ගෙන, මේ අය ඒවාත් අරගෙන පිටරට සංචාරවල යනවා. වත්තල සමූපකාරයේ සභාපතිතුමා මේ වසර ගණනට දහ වාරයක් රට ගිහිල්ලා තිබෙනවා. මේ කාගේ සල්ලිද? ලාභ ලබනවා නම්, මේ වර්ෂයට වඩා ලබන වර්ෂයේ ලාභය වැඩි වෙන්න ඕනෑ. එන්න එන්නම අඩු වෙනවා. සමූපකාර වැහිලා යනවා. සභාපතිවරු ඇතුළු නිලධාරීන් රට සවාරි යනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේවා ගැන අධ්‍යයනය කරන්න. මේ ගැන කල්පනා කරලා ඔබතුමා යටතේ තිබෙන ආයතන දියුණු කරන්න කටයුතු කරන්න. අවසාන වශයෙන් කියනවා, මේ ගරු ඇමතිතුමා තමයි ගම්පහ දිස්ත්‍රික්කයට ඉන්න එකම ඇමතිතුමා. මැණිකක් රකින නා රජෙකු සේ අපි එතුමාව මොන බාධක ආවත් මෙම ස්ථානයේ රඳවා ගන්නවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමාට විනාඩි තුනක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.35]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට මට විනාඩි 09 ක කාල සීමාවක් වෙන් කරලා තිබුණත්, ඒකෙන් තුනෙන් එකක්, ඔබතුමා දැන් මට මූලාසනයේ ඉඳගෙන විනාඩි තුනකට මේ කථාව කරන්න කියනවා. මම දන්නේ නැහැ මේවා කොහෙන් කපා හරිනවාද කියන එක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අපට විනාඩි 09 ක් තිබුණා. දැන් විනාඩි 03 යි. අපට වෙලාව ලබා දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අපතේ යනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුලින්ම කථා කරන්නම් මාර්ග සංවර්ධනය සම්බන්ධව. මාර්ග
[ගරු මොරිස් විජේරත්න]

සංවර්ධනය සම්බන්ධව පසුගිය කාල සීමාවේ විශාල වැඩ කොටසක් කර ගෙන ගියා. ඒ කර ගෙන ගිය සංවර්ධනය මේ පසුගිය වසර දෙකක කාල සීමාව තුළ පළාත් මාර්ග සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන ශක්තිය අපට ලබා දුන්නේ නැහැ. අනික් පැත්තෙන් මේ වසරේත් බිලියන 9 ක් කෝටි 900 ක් අපේ පළාත් සභාවේ මුදල් කපා හැරලා තිබෙනවා. ඉතින් අලුත් ලංකාවක් හදන්නට, මේ ආකාරයට

**41954196**

මුදල් කපා හැරලා කොහේටද යන්නේ කියන එක තමයි අපට අහන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟ ප්‍රශ්නය තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. මීට වසර කිහිපයකට කලින් මොරටුවේ කටුබැද්දේ පටන් ගත්තා Park and Drive කියලා ව්‍යාපෘතියක්. අද බැලුවාම කොළඹ නගරයට වාහන දහස් ගණනක් පැමිණෙන කොට, ඒ අයට Park and Driveස්ථානයේ ඒ කාර් එක නතර කරලා සුඛෝපභෝගී බස් රථයකින් තමන්ගේ අවශ්‍ය සේවා ස්ථානය සඳහා යන්න පුළුවන් වැඩ සටහන ක්‍රියාත්මක කළා. ඒ ක්‍රියාත්මක කිරීම මාස ගණනාවක් ක්‍රියාත්මක වෙලා ඊට පසුව ඒ වැඩ සටහන මේවා වුණා. අපේ කොළඹට ඇතුළු වන මාර්ග කිහිපය තුළ ඒ ආකාරයෙන් Park and Driveවැඩ සටහන ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් මම හිතනවා, කොළඹ තිබෙන අධික වාහන තදබදය අඩු කරන්න පුළුවන්. බස් 25 ක් වත් ගාලුපාරේ සිට කොළඹට දාන්න පුළුවන් නම් ඒ 25 තුළ 40 ගණනේ සිටියා නම් වාහන 1000 ක් පමණ මොරටුවේ නතර කර ගැනීමේ හැකියාව තිබෙනවා. අඩුම ගණනේ කොළඹට එන වාහන 4000 ක් 5000 ක් නතර කිරීමේ හැකියාව තිබුණා. එවැනි නිර්මාණශීලී වැඩ සටහන්වලට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යන්න ඕනෑ. මොකද, මගියා තමයි ඔවුන්ගේ පාරිභෝගිකයා. මගියා ගන්න ටිකට් එකෙන් තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වැඩ කරන්නේ. අද වන කොට කිසිම ආකාරයකට බස් හෝල්ට් එකක් ගහන්න බැහැ. මාස තුනකට ආසන්න කාලයක් තිස්සේ කඩා වැටුණු බස් හෝල්ට් එකක් ගැන කථා කළා. මාස තුනක් ඉක්මවා ගිහිල්ලා තමයි ඒ වැඩේ කරන්න හැකියාව තිබුණේ. ඒකෙත් අඩුපාඩු තිබෙනවා. දෙපැත්තට පින්න ගහනවා. ඒ නිසා පාරිභෝගිකයා රකින එක අපේ වගකීමක් බව, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අපි දැන ගන්න ඕනෑ. අනික් එක එතැනට පැමිණෙන රියදුරු මහත්වරුන්ට සහ ඒ බස් අයිතිකරුවන්ට සලකන ආකාරය සම්බන්ධයෙන් මට ගිය සතියට එපිට සතියේ මැදිහත් වෙන්න සිදු වුණා. ලොග් ෂීට් එකක් ගන්න ගියාම. සභාපතිතුමාට කථා කරලා තමයි ඒ ප්‍රශ්නය බේරා ගන්න ලැබුණේ. මෙතැනට පැමිණෙන අයට එක එක ආකාරයට කටයුතු කරන්න එපාය කියන ඉල්ලීම කරනවා. මොකද, එහෙම කළොත් එහෙම අපේ ජනතාවට හිරිහැර සිදු වෙනවා.

අවසාන වශයෙන්, මොරටුව කියන්නේ වර්ග කිලෝ මීටර් 23.2 ක ඉඩම් තිබෙන ප්‍රමාණයක්. අපේ මොරටුව ප්‍රදේශයේ වඩු කර්මාන්තයේ නියැලෙන විශාල පිරිසක් ඉන්නවා. මීට කලින් උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා ඉන්න කොට විශාල වැඩ කොටසක් කර ගෙන ගියා. බිඳුනු පුටුවට දැතේ සවිය. ඒ වාගේම ත්‍රී රෝද රථ මීටර් ලබා දෙන වැඩ සටහන්. ඒ වාගේ ලොකු වැඩ සටහන් කළා. පසුගිය කාල සීමාව තුළ කර්මාන්ත සංවර්ධන අධිකාරියෙනුත්, කර්මාන්ත දෙපාර්තමේන්තුවෙනුත් මේ වාගේ දේවල් සිදු වෙනවා මම දැක්කේ නැහැ. කර්මාන්ත අධිකාරියෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කෝටි ගණනක් ඉතිරි කරලා දුන්නා. මේවා සැලකිල්ලට අරගෙන කටයුතු කරන්නය කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.39]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය විනාඩි තුනක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අර පොඩි කාලේ ඉස්කෝලේ ගියාම වූ කරලා එන්නත් දෙනවා ඔය වෙලාව. මුත්‍රා කරලා එන වෙලාව තමයි ඉස්කෝලේ ගියාම විනාඩි තුන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාරසංවර්ධනහාවෙළඳ,නිවාසහාඉදිකිරීම්, වතුයටිතලපහසුකම්, කර්මාන්තහාග්‍රාමසංවර්ධනඅමාත්‍යාංශයේවැය ශීර්ෂය යටතේ විනාඩි තුනක් ලබා දීම ගැන කනගාටු වෙනවා. නමුත් වෙලාව මීට වඩා දෙන්න බැරි තත්ත්වයක් තිබෙන බව දන්නවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ සමුපකාර ක්ෂේත්‍රයේ වගකීමක් තිබෙනවා. වැඩිම සමුපකාර ප්‍රමාණයක් තිබෙන්නේ, සණස සමිති. සමිති 1309 ක් අපේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වෙලා තිබෙනවා. මේ වගකීම පැහැර හැරීම නිසා තමයි අද දිනයේත් ජනතාව ඇවිල්ලා මේ මහරගම වත්තේගෙදර අපේ ප්‍රදේශවාසීන්ට ඇවිල්ලා, මෙතැන හිටගෙන ඉන්න වෙලා තිබෙන්නේ.

මේකේ දේශපාලන පැතිකඩක් තිබෙනවා. ඒ පැතිකඩ ගැන අපි කනගාටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය උලුප්පා ගන්න, එදා එතුමා යෝජනාවක් ගෙනාවා. හදිසි යෝජනාවක්. එදත් බස් දාලා මිනිස්සු අරගෙන ආවා. අදත් එතුමා කථා කරනවා. අදත් බස් දාලා ගෙනාවා. ඒ මිනිස්සු තවත් නැති කරනවා. ඒ බස්වලට තවත් මුදලක් එකතු කරලා ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ මේ පාරවල් ගානේ රස්තියාදු කරනවා. මේකට මුදල් ආලා තිබෙන්නේ අපේ ගමේ වැඩි හරියක් වාමාංශික මිනිස්සු. මොකද, මේ සමිතියේ සභාපතිතුමා කොමියුනිස්ට්. එතුමාගේ නොමිනිස්කම නිසා - මේ මිනිස්සු ගෙනැල්ලා තැන්පත් කළා. දෙනගම සිරිවර්ධන මහතා. එතුමාගේ නෝනා වැනි අයත් මුදල් තැන්පත් කරලා අද මේ විධියට අසරණ වෙලා ඉන්නවා. අසරණ මිනිස්සුන්ව මෙතැනට ගෙනැල්ලා තවත් අසරණ කරනවා. අර යමක් කමක් තිබුණු මිනිස්සු මේ මහ පාරේ වාඩි කරවලා තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. මේ පිළිබඳව අපේ ගරු ඇමතිතුමා ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපේ උපදේශක කාරක සභාව ක්‍රියාමාර්ග අරගෙන දැන් ඒකට වැඩ පිළිවෙළක් සකස් කර ගෙන තිබෙනවා. ඒ නිසා අපට මේ පන්සල්වලට - අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ තිබෙන මුදල්වලට වඩාවැඩියි ණය ප්‍රමාණය. ඒ නිසා ඒ පිළිබඳව අපට දෙන්න පුළුවන් උපරිම සහනය දෙන්න අපි මැදිහත් වෙනවා. අපේ ඇමතිතුමාත් මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම වෙළඳ අමාත්‍යාංශයත් අපට අයිතියි. අද වන කොට අහස උසට බඩු මිල ඉහළ නැගලා තිබෙනවා. මම පෙරෙයිදා වෙනකල්ම හිතාගෙන හිටියේ උම්බලකඩ කියන්නේ, පාරිභෝගික භාණ්ඩයක් කියලා. පෙරෙයිදා තමයි මම දැන ගත්තේ උම්බලකඩ කියන්නේ ප්‍රාග්ධන භාණ්ඩයක් කියලා. අපි පෙරෙයිදා කඩේකට කන්න ගියා. මම තේ එකක් බිබී හිටියා. ඒ කඩේ හිටපු ගැහැණු කෙනා හැන්දකින් අරගෙන උම්බලකඩ කැල්ල තෝරලා, තෝරලාඅනෙක් හොද්දට දානවා. උම්බලකඩ දැන් ප්‍රාග්ධන භාණ්ඩයක් වෙලා. සමහර විට ඒක අරන් තියනවා ඇති. අරන් තියලා ඊළඟ දවසේ හොද්දට දානවා ඇති. ඒ තත්ත්වයට පත් වෙලා. උම්බලකඩ ලාභ කරනවා කියලා තමයි මේ ආණ්ඩුව කිව්වේ. යහපාලනය යටතේ උම්බලකඩත් ප්‍රාග්ධන භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ, ඒක තමයි වෙනස. රුපියල් දෙකයි සීනිවලින්. ඒ නිසා අද අහස උසට බඩු මිල නැගලා තිබෙද්දීත්, මේකේ වැඩ පිළිවෙළක් නැහැ. අපේ ආණ්ඩුව කාලයේ රු. 45/- ට තිබුණු හාල් දැන් රු. 95/- යි. කෝරා රු. 95/-යි. සුදු හාල් රු. 95/- යි. අපි සීනි වලට හොඳ නිසා බාස්මතී මොනවා හරි තමයි අපි කන්නේ. අද ඒවා දෙසිය ගණනක් වෙලා. ඒ නිසා මෙහෙම බඩු මිල අහස උසට තිබෙන කොට ලෝකයේ ලොකුම නත්තල්ගහ ගහනවා. මැල්කම් රංජිත් පියතුමා කිව්වා, මේක නවත්වලා ඒ සහන ජනතාවට දෙන්න කියලා. නිවාස හදන්න දෙන්න කියලා. බස්නාහිර පළාතේ නිවාස දෙපාර්තමේන්තුවට ගන්න තිබුණා. දැන් මොකද කරන්නේ? ආයිත් හදනවා. ගරු අගමැතිතුමාට රටේ බඩු මිලට වඩා වැඩියි මේ හදන නත්තල් ගහ. එතුමා විශේෂයෙන් සාකච්ඡාවට ගියා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආණ්ඩුවේ සල්ලි යන්නේ නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ආණ්ඩුවෙන් සල්ලි නොගියත් මහජනතාවගේ සල්ලි. මේ සල්ලි දෙන්න තිබුණා මේ මහජනතාවගේ සුභ සිද්ධියට. එහෙම තමයි එතුමා ඉල්ලීම කළේ. එවැනි වැඩ පිළිවෙළක් නැති මේ කුජීත ආණ්ඩුව ලබන අවුරුද්දේ සිට මේ සියලු සහන අපේ බස්නාහිර පළාතේ ජනතාවට ලබා දෙන්න බස්නාහිර පළාත් සභාවේ අපි පියවර ගන්නවාය කියමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.44]

Hon. Upali Gunarathne
**ගරු උපාලි ගුණරත්න**

Hon. Sir, I thought that I would speak a few words in English. Because nowadays the whole country is talking about the value of English. So, I thought I will speak a few wards in English. Please don't disturb me.
[Hon. Upali Gunarathne]

I would like to extend my support to our Minister's Hon. Lalith Wanigaratne for bring his very best to with the available resources to serve the People of this Western Province. Only one thing he has to be careful in selecting people to the Key positions in his ministry and institutions. Because, Only You will all know when it is too late, if it is true the wrong people and

**41954196**

first of all Deputy Chairman, I would like to within my short time I like extend my sincere gratitude to the President Maithripala Sirisena, the Leader of the Sri Lanka Freedom Party, Hon. Ranil Wickremasinghe and Chandrika Bandaranaike Kumaranatunga to making arrangements to strengthen and support Chief Minister of the Western Province, during the Budget Debate because of the support extended by the oppositions with our ministers could stand with honour.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

පස් ටික කපලා ඉවරද?

Hon. Upali Gunarathne
**ගරු උපාලි ගුණරත්න**

They were trying to topple the Ministries So I take opportunity to thank Hon. Ranil Wickremasinghe, President Maithripala Sirisena, Chandrika Bandaranaike Kumaranatunga to make arrangements and we know Hon. Ranil Wickremasinghe and Maithripala Sirisena have made a pact for understand 2020 and those who are waiting to topple the government will have to wait for long long time.

Sir, we can be assured that our Ministers, that Chief Minister can conduct their work and duty with honour and dignity, because of the support extended by the oppositions also.

I wish to say the small poem to our Hon. Chief Minister, I can enrich that at least I like to say to our Chief Minister this little poem.

One ship Drives East
And one ship Drives West
With the self same winds that blow
'tis the set of the sails
And not the gails
Which tells us the way to go

මුහුදේ තිබෙන නැව් බටහිරට යනවා. මුහුදේ තිබෙන නැව් නැගෙනහිරට යනවා. නමුත් එකම සුළඟට තමයි යන්නේ. නැව් යන්නේ සුළං හමන දිසාවට. රුවල් හසුරුවන විධියට. අපේ මහ ඇමතිතුමාට ශක්තිය ලැබිලා තිබෙනවා. එතුමාට හැකියාව තිබෙනවා. එක එක හුළං එන විධියට, ඔය පොහොට්ටුකාරයින්ට ඕනෑ විධියට නොවෙයි. ඔබතුමාට ශක්තිය ලැබිලා තිබෙනවා. නැව හරියට ගෙනියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ඔබතුමාට නියමිත කාලය අවසන්.

Hon. Upali Gunarathne
**ගරු උපාලි ගුණරත්න**

Hon. Deputy Chairman,Our President Maithripala Sirisena and Ranil Wickremasinghe they know,

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

දෙන්නාගෙන්ම තමයි පස් කැපුවේ.

Hon. Upali Gunarathne
**ගරු උපාලි ගුණරත්න**

Mahinda Rajapaksha knows he was defeated by this lot, because of the holiest to be defeatedand one question I want to ask ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

දෙන්නාගෙන් තමයි පස් කපා ගත්තේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

තාම පස් කපනවාද?

An hon. Member
**ගරු මන්ත්‍රීවරයෙක්**

Please stop now.

41974198

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

Ok. Ok. එහෙම නම් අන්තිමට ඒ කථාව කියන්නම්. මිනිත්තුවයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් පස් කියුබ් එක කීයද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෙතෙක් වෙලා මගේ - (බාධා කිරීම්)බොහොම ස්තුතියි. අපේ පන්තියේ හිටියා -

An hon. Member
**ගරු මන්ත්‍රීවරයෙක්**

please sit down.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පන්තියේ හිටියා වෝල්ටර් (බාධා කිරීම්) කියලා. ඔහු කිව්වා -

An hon. Member
**ගරු මන්ත්‍රීවරයෙක්**

Your time is over, please sit down

Hon. Upali Gunarathne
**ගරු උපාලි ගුණරත්න**

I wholly disapprove of what you say, But I will defend to death your right to say it.

මට විරෝධතාවය දැක්වීම හා මට බාධා කිරීම මම කිසිසේත් අනුමත කරන්නේ නැහැ. නමුත් එසේ කිරීමට ඔබට ඇති අයිතිය ආරක්ෂා කිරීමට මම දිවි හිමියෙන් බැඳී සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මහින්ද මහත්තයාව නැති කළේ මේ පොහොට්ටුකාරයෝ ටික. මුන් එක්ක නැගිටින්න බැහැ මහින්ද මහත්තයාට. මහින්ද මහත්තයා නැති කළේ මේ හොරු ටික. මේ මුන් ටික මුහුදට දාලා වළලන්න ඕනෑ මහින්ද මහත්තයා නැගිටින්න නම්. මහින්ද මහත්තයාට වැඩ කළේ අපි. මේ පොහොට්ටුව කාටද වැඩ කළේ? මේ හොරු ටිකත් එක්ක මහින්ද මහත්තයාට කවදාවත් නැගිටින්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට අවස්ථාව.

[පූ.භා. 11.49]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අද මේ තත්ත්වයට ඇවිල්ලා, මෙම පළාත් සභාවේ දීර්ඝ කාලයක් සිටීමට ලැබීම සම්බන්ධව සතුටු වෙනවා. සමූපකාර ක්ෂේත්‍රය සම්බන්ධව කථා කරනවා නම්, පළමුවෙන්ම කැලණිය සමූපකාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණව තිදෙනෙක් පත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම වත්තේගෙදර සමූපකාර සමිතිය සම්බන්ධව අර්ජුන අමරසේකර කියලා මගේ ඥාති සහෝදරයෙකුත් මේ ප්‍රශ්නයට මැදි වෙලා තිබෙනවා. එතුමාගේ පෙත්සමක් පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම කොමසාරිස් කාර්යාලය. මේ දක්වා පොලිස් පැමිණිල්ලක් දාලා තිබෙනවාද කියලා මම ප්‍රශ්න කරනවා. ඒ වාගේම මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ පාරවල් සම්බන්ධව කථා කරනවා. කැලණියේ පරණ නුවර පාර, ඒ වාගේම කැලණිය
[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]
ගෝනගම්පල පාර. දැන් කැලණිය රජමහා විහාරස්ථානයේ පළමුවැනි දොරකඩ අස්න පෙරහැර පැවැත්වෙනවා. ඊට පෙර ඒ පාලම් සංකීර්ණය නිම කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමාගේ පුත්‍රරත්නය විවාහ වෙලා තිබෙන්නේත් දළුගම ටයර් සංස්ථා හන්දියේ පාලම් සංකීර්ණය අසළ. ඒක නිම කරලා දෙන්න.

මේවා පළාත් සභා පාරවල්. ඒවා ඉක්මනට කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම කර්මාන්ත දෙපාර්තමේන්තුව ගැන කථා කරනවා නම්, නිර්නාමික පෙත්සමක් අපට ඇවිල්ලා තිබෙනවා. ඒ පෙත්සම ගැන කථා කරන්න ඕනෑ. එස්.ඒ. ජයසිංහ සහකාර අධ්‍යක්ෂතුමිය මෙතුමාගේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරනවා. බිඳුනු පුටුව වැඩ පිළිවෙළ කඩාකප්පල් කරනවා.හිටපු අමාත්‍ය උදය ගම්මන්පිල ඇමතිතුමාගේ අවතාරයක් විධියට තමයි මෙතුමිය කටයුතු කරන්නේ. ඒ සම්බන්ධවත් කටයුතු කරන්න. පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්න වෙලාවේ ඉල්ලීමක් කරනවා. ආණ්ඩු පක්ෂයට ලක්ෂ (බාධා කිරීම්) දුන්නාද නැද්ද කියලා ප්‍රකාශයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ජනවාරි දෙවැනිදාට ප්‍රථම සපත්තු කුට්ටම් හැම ප්‍රාදේශීය සභාවකම, නගර සභාවකම ලක්ෂ 50 ගණනේ බෙදන්න කියලා ගරු මන්ත්‍රීවරු - (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඒ වාගේම වත්තෙගෙදර සණස සමිතියේ කොඩිකාර මන්ත්‍රීතුමාගේ ඡන්ද ව්‍යාපාරයට තමයි අර නිලධාරීන් දෙදෙනා සල්ලි වියදම් කරලා මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා ඒ ගැනත් කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම කියනවා (බාධා කිරීම්) මෙතුමාගේ තාත්තා සමූපකාරයෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා[යසපාල කෝරලගේ මහතා]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාට පිළිතුරු කථාව කිරීම සඳහා විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.52]

**ගරු ලලිත් වනිගරත්න-**අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම වත්තෙගෙදර සණස සමිතියේ උද්ගත වෙලා තිබෙන ඒ ප්‍රශ්නය පිළිබඳව කථා කරනවා. දැනට හඳුනාගෙන ඇති තැන්පත් ප්‍රමාණය කෝටි 52 ක් වෙනවා. දැනට ණය ගෙවන ලෙස දන්වා 1072 දෙනෙකුව ලිපි මගින් දැනුවත් කරලා තිබෙනවා. එන්තරවාසි යවා ඇති පිරිස 301 ක් වෙනවා. තීරකකරණයට යොමු කර ඇති පිරිස 80 යි. උසාවි බලගැන්වීම 36 යි. එන්තරවාසි යවා ඇති, හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු දෙනාම තීරක කරණයට යොමු කර ඇත. 13 දෙනෙකු. ඔවුන් ණය ලෙස රුපියල් කෝටි 20 ක් ලබා ගෙන තිබෙනවා. ඒ කියන්නේ ඒ 13 දෙනා. දෙපාර්තමේන්තු නිලධාරීන් 10 දෙනෙකු විගණනය සඳහා දැනට යොමු කර තිබෙනවා. විමර්ශනය සඳහා තවත් නිලධාරීන් 05 දෙනෙකු ඇතුළු 15 දෙනෙකු යොදවා ඇත. හඳුනාගත් වංචනික ඉඩම් ගනුදෙනු හතක් සඳහන් මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. වත්තෙගෙදර සණස සමිතිය පිළිබඳව දැනට අපි ගත් ක්‍රියාමාර්ග ගැන තමයි කථා කළේ.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශයට අදාළ 2017 අයවැය විවාදයට පක්ෂව, විපක්ෂව කරුණු ඉදිරිපත් කළ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වන අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් ඉතා වැදගත් ලෙස සලකා කටයුතු කරන බව මම මුලින්ම කියන්නට කැමැතියි. සමස්තයක් ලෙස සලකා බැලීමේදී 2016 වර්ෂය තුළ අප අමාත්‍යාංශය මගින් බස්නාහිර පළාත තුළ ජීවත් වන ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවීම සඳහා විශාල වැඩ කොටසක් ඉටු කිරීමට හැකි වූ බව මාගේ විශ්වාසයයි. 2016

**41974198**

වර්ෂය තුළ ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ඉලක්කගත වැඩ සටහන් 2017 වර්ෂය තුළ ප්‍රමුඛතාවය දී ඉටු කිරීමට මා බලාපොරොත්තු වෙනවා. 2016 වර්ෂයේ අයවැය ලේඛනයේදී පොරොන්දු වූ පරිදි බස්නාහිර පළාතේ සමූපකාර සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමට අපට හැකි වුණා. මධ්‍යම රජයේ සමූපකාර ප්‍රඥප්තිය සකස් කර අවසන් නොමැති වීම හේතුවෙන් බස්නාහිර පළාත් සමූපකාර ප්‍රඥප්තියට සංශෝධන කර අවසන් කිරීමට 2016 වර්ෂය තුළ අපට නොහැකි වුණා. කෙසේ වුවත් බස්නාහිර පළාතේ සමූපකාර රීති මාලාව සකස් කර අවසන් කර ඇති අතර, එය ඉදිරි සති දෙකක කාලය තුළ ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇති බව ඉතාමත් වගකීමෙන් ප්‍රකාශ කරනවා.

2017 වර්ෂය තුළ බස්නාහිර පළාත තුළ සියලුම පාසල් ආවරණය වන පරිදි, නවතාවයකින් යුක්තව පාසල් සමූපකාර ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම බස්නාහිර පළාතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පළාතේ ඇති සමූපකාර කටයුතුවල ගුණාත්මකබව වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. සමූපකාර කොමිෂන් සභාව මගින් සමූපකාර සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීමට ක්‍රියා කරනවා. ඒ වාගේම 2016 අයවැය ලේඛනයේ සඳහන් පරිදි තෝරා ගත් බස් නැවතුම්පලවල් හතක්, මධ්‍යම රජයෙන් මෙගා පොලිස් වැඩ සටහන යටතේ නවීකරණය කිරීමට ආරම්භ කර ඇති බව ප්‍රකාශ කරනවා. බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා සේවක අර්ථ සාධක ලබා දීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා පෙන්වා දුන්නා. ඒ සඳහා බස් රථ කර්මාන්තය පිළිබඳව විශේෂ අවධානයක් ඇති ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර ඉදිරියේදී පියවර ගැනීමට බලාපොරොත්තු වෙනවා. රියදුරන් කොන්දොස්තරවරුන් සඳහා ඩිජිටල් තාක්ෂණයෙන් යුත් හැඳුනුම්පත් ලබා දීමට නොහැකි වී ඇත්තේ බස් හිමියන් පවසන පරිදි නිරන්තරයෙන්ම කටයුතු කරන ස්ථිර සේවකයින් නොමැති වීම හේතුවෙන් බව ප්‍රකාශ කරනවා. GPS තාක්ෂණය සහිත බස් රථ බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහනය සඳහා යොදවා ගැනීමට විශාල පිරිවැයක් වැය වන හෙයින් කැමැත්ත ප්‍රකාශ කර ඇති බස් රථ හිමියන්ගේ හෝ මේ වැඩ සටහන ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර, මේ සඳහා බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මට මීට වඩා කාලය දෙන්න බැහැ. ඒ නිසා කථාව අවසන් කරන්න වෙනවා.

**ගරු ලලිත් වනිගරත්න-**අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ අනෙකුත් සියලුම විෂයයන් පිළිබඳව මම හිතන්නේ අපි සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා මම හිතන්නේ අපට හොඳ යෝජනා ගෙනාවා. අදහස් ඉදිරිපත් කළා. ඒ නිසා ඒ සියලුම යෝජනා මම මගේ පෞද්ගලික ලේකම්තුමාට කිව්වා සටහන් කර ගන්න කියලා. ඒ නිසා ඒ සියලු යෝජනා සටහන් කර ගෙන ගරු මන්ත්‍රීතුමන්ලාත් සමඟ සාකච්ඡා කරනවා. ඒ යහපත් යෝජනා සියල්ල ඉෂ්ට කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයටත්,ඒ වාගේම ගරු සභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, සභා ලේකම්තුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන්ටත් මගේ ස්තූතිය පුද කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, මේක මෙහෙම කරන්න බැහැ. අදාළ ඇමතිතුමාට ඔබතුමා වෙලාව දෙන්න. ඔබතුමා මේ කරන විහිළුව මොකක්ද? විනාඩි 03 යි. විනාඩි 04 යි. එහෙම කරන්න එපා. ඇමතිතුමාට වෙලාවක් දෙන්න පිළිතුරු කථාව කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්- ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම නොවෙයි කාලය වෙන් කළේ. ගරු ඇමතිතුමාගේ ලැයිස්තුව මම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑකමින් කරන්නේ. එතුමා පොහොට්ටුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කොහොමද කථා කරන්නේ? මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරනවා. ඒවාට උත්තර දෙන්න එතුමාට වෙලාව නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමතිතුමන්ලාව අවුල් කරන්න කරන්නේ. එයා පොහොට්ටුවේ.

***ඊට අනුකූලව අ.භා. 12.00 ට, අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Accordingly discussion on the Expenditure Head Nos 107, 121, 122, 123,124, 125 and 103Was concluded at 12.00 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ මොහොතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 107, 121, 122, 123, 124 හා 125 පිළිබඳව සහ ශීර්ෂ අංක 103 යටතේ සමූපකාර සේවක කොමිෂන් සභාවේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ සම්බන්ධව බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 107 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 107 was proposed and adopted.*

***ශීර්ෂ අංක 121 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 121 was proposed and adopted.*

***ශීර්ෂ අංක 122 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 122 was proposed and adopted.*

***ශීර්ෂ අංක 123 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 123 was proposed and adopted.*

***ශීර්ෂ අංක 124 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 124 was proposed and adopted.*

***ශීර්ෂ අංක 125 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 125 was proposed and adopted.*

***ශීර්ෂ අංක 103 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 103 was proposed and adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, මම කලින් ප්‍රකාශ කළ ආකාරයට වත්තෙගෙදර සමූපකාර ප්‍රශ්නය සම්බන්ධව. මම තලංගම පොලිස් ස්ථානාධිපතිතුමාට උපදෙස් දුන්නා. ඔබතුමාටයි කොමසාරිස්තුමාටයි මම මේ කියන්නේ. මගේ නිල කාමරයේ පොඩි සාකච්ඡාවක් ලැහැස්ති කරලා තිබෙනවා. සාකච්ඡා කරලා ඒ සඳහා මොකක් හරි විසඳුමක් ලබා දෙන්න.

**ගරු ලලිත් වනිගරත්න-**අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වාගේම විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, පළාත් සභාවේ සම්ප්‍රදායක් තිබෙනවා,ගරු ඇමතිතුමාට වෙලාව වැඩියෙන් දෙන්න ඕනෑ. එතුමාට වෙලාව වැඩිපුර දෙන්න. මේක විහිළුවක් වෙනවා. මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරලා, අවසානයේදී විෂය භාර අමාත්‍යතුමාට විනාඩි දෙකක්වත් කථා කරන්න නැහැ. මොකක්ද මේකේ තේරුම? අයවැයේ සාර්ථකභාවයක් නැහැනේ? ඒ නිසා ඔබතුමා මේක පාලනය කරන්න. කපන්න ඕනෑ කට්ටිය මම කපන්නම්. විනාඩි 03 ක් දෙනවා. මොකක්ද මේ වැඩේ.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ අදාළ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී ආණ්ඩු පක්ෂයේ කථාවන් සූදානම් කළේ ගරු

ඇමතිතුමාගේ එකඟතාවය මත. එතුමා තමයි මේ ආකාරයට කාලය වෙන් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කිව්වාට, ඔබතුමා ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමානේ? ඔබතුමාට කියන්න පුළුවන් විනාඩි දෙකක් දෙන්න කියලා. එහෙම කරන්න බැහැ.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු ඇමතිතුමාගේ උපදෙස් මත තමයි මේ ලේඛනය හදලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදෙස් මත නොවෙයි. ඔබතුමා මාත් එක්ක සාකච්ඡා කරන්න. විෂය භාර ඇමතිතුමා නොවෙයි මෙතැන මූලාසනයේ ඉන්නේ. අසීරුතාවයට පත් වෙන්නේ මූලාසනය. විනාඩි දෙකයි. විනාඩි හතරයි. කට්ටිය මෙතැන රණ්ඩු වෙනවා. අන්තිමට ඇමතිතුමාට විනාඩි පහක්වත් නැහැ.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා තමයි කථික ලැයිස්තුව හැදුවේ. වෙලාව වෙන් කළේ. මට එතුමාට අභිබවා යන්න බැහැ. එතුමාගේ ඉල්ලීම අනුව තමයි මම ලේඛනය ඉදිරිපත් කළේ. එතුමාගේ පිළිතුරු කථාවට එතුමා විනාඩි 14 යි වෙන් කර ගෙන තිබුණේ. අද දවසේ සිදු වුණු සිදුවීම්නුත් එක්ක කාලය අඩු වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා මම කියන දේ ඔබතුමාට තේරෙන්නේ නැහැ. මූලාසනයේ සිටින කෙනාට තමයි ඒකේ ප්‍රශ්නය තිබෙන්නේ.විනාඩි 03 ක් වෙන් කළාම විනාඩි 05 ක් කථා කරනවා. ඇමතිතුමාගේ කාර්යභාරය තමයි මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන එක. ඇමතිතුමා කාලය අඩුවෙන් අරන් ඒක මග අරිනවා නම්, ඒක ඇමතිතුමාගේ ප්‍රශ්නයක්.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 105** | **-** | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 113** | **-** | **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 114** | **-** | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 115** | **-** | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 116** | **-** | **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** |
| Head No 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs |
| Head No 113 | - | Department of Health Services |
| Head No 114 | - | Department of Ayurveda |
| Head No 115 | - | Department of Social Services |
| Head No 116 | - | Department of Probation and Child Care Services |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, *"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 වැය ශීර්ෂවලින් රුපියල් 10/- ක් කපා හැරිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට ආරාධනා කරනවා, විපක්ෂය වෙනුවෙන් විවාදයට සහභාගී වෙන්න කියලා. ඔබතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.05]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, 2017 අයවැය විවාදයේදී සෞඛ්‍යඅමාත්‍යාංශය වෙනුවෙන් යමක් ප්‍රකාශ

කරන්න, කාලය ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ ඉතා වැදගත් අමාත්‍යාංශයක් වන සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න නම් බොහෝ දේවල් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු වශයෙන් පසුගිය කාල වකවානුවල අපි දැක්කා, නිලධාරීන්ගේ පොඩි පොඩි අදහස් - හිටපු අධ්‍යක්ෂතුමිය බොහොම හොඳ වැඩ සටහනක් අප වෙත ඉදිරිපත් කළා. මොකක්ද මේ වැඩ සටහන. ඩෙංගු මර්දනය පිළිබඳව. කසළ කළමනාකරණය කිරීම මගින් ඩෙංගු නිවාරණය කිරීම පිළිබඳව තමයි එතුමිය ගෙනාපු යෝජනාව. ඔබතුමාට මතක ඇති අපි තර්ක විතර්ක කළා. අපි ඒකට විරුද්ධ වුණේ නැහැ. අපි කැමැති වුණා කොහොම හරි ක්‍රමයකින් මේ පළාතට යම් සේවයක් සැලසෙනවා නම්. නමුත් මෙතැන තිබෙන ගැටළුව එතුමිය ගෙනාපු වැඩ සටහන නොවෙයි. කාලය නිම කරලා අවසන් වෙලා යන කොට ඒ ක්‍රියාදාමය එතැනින් ඉදිරියට ක්‍රියාත්මක වෙනවාද කියන එකයි මට දැන ගන්නට ඕනෑ. එතුමිය ඒ වැඩ සටහන හඳුන්වා දුන්නේ ඩෙංගු මර්දනය කර ගැනීම සඳහා. හැබැයි, එතුමිය ඒ අලුත් වැඩ සටහන හඳුන්වලා දුන්නේ, ක්‍රියාත්මක වුණු වැඩ සටහනක් නවත්වලා. මේ රටේ බස්නාහිර පළාතෙන් ඇති කළා. ක්ෂණික විහිදුම් බලකාය කියලා, ඩෙංගු මර්දනය කිරීමට විශාල වියදමක් කරලා හොඳ වැඩසටහනක්. ඔබතුමාගේ කාලයේ අපි ඉදිරිපත් කළා. හැබැයි, ඒ වැඩ සටහන නවත්වලා එතුමිය තව එකක් හඳුන්වාදෙන්න ගියා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ, ඔබතුමා පත් කර ගන්නා ඉදිරි නිලධාරියාගෙනුත්. දැන් මේ වැඩ සටහන් දෙකෙන් කොයිකද? ක්‍රියාත්මක කරන්නේ කියලා පොඩි ගැටළුවක් තිබෙනවා. මම හිතනවා, මේකට අපි ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍යයට විතරක් නොවෙයි. මම අද සන්තෝෂ වෙනවා. මේ අමාත්‍යාංශ හතරටම ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. අපි යම්කිසි ප්‍රතිපත්තියක් ගෙනෙන කොට මේක මොකා ආවත් වෙනස් කරන්නේ නැහැයි කියන මතයක ඉන්න ඕනෑ. අද නිලධාරියා මාරු වෙන කොට ඒ ගෙනාපු ප්‍රතිපත්තිය මාරු වෙනවා. මේක නොවෙයි ක්‍රමවේදය වෙන්න ඕනෑ. හොඳ වැඩ සටහනක් නිලධාරියෙකු ඉදිරිපත් කළාම ඔබතුමා ඇමතිවරයා වශයෙන් ඒක අනුමත කළාම, උපදේශක කාරක සභාව වශයෙන් අපි ඒක අනුමත කළාම, ඒක ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඇමතිවරයා මාරු වුණත්, නිලධාරියා මාරු වුණත් මේ වැඩේ කෙරෙන්න ඕනෑය කියන එක අපේ මේ අමාත්‍යාංශයේ තිබෙන්න ඕනෑ. අද අපට ලොකු අර්බුදයක් ඇති වෙනවා,මෙහෙම වුණාම.

ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නේ. අපි මේ රටේ හොඳටම ක්‍රියාත්මක වුණු වැඩ සටහනක් තමයි, මේ ඩෙංගු රෝගය සම්බන්ධයෙන් විශේෂ විහිදුම් බලකායක් හැදුවා. ඒකට ගොඩක් වියදම් කළා, ගරු සභාපතිතුමනි. අද ඒක නවත්වලා වෙන වැඩක් පටන් ගත්තා. මේ දෙකෙන් එකක්වත් දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම නම් ඔබතුමා තදින් ඉඳගෙන,මේ නිලධාරීන් එක්ක එකතු වෙලා තීන්දුවක් ගන්න ඕනෑ. කවුරු හරි ප්‍රතිපත්තියක් ගෙනාවොත් - මට මේ ක්‍රම දෙකම හොඳයි. අධ්‍යක්ෂතුමිය අපට තේරුම් කරලා දුන්නා, මේකෙන් වෙන්නේ මෙන්න මෙහෙමයි කියලා. තිබුණු වැඩ සටහනත් හොඳයි. දැන් දෙකම අතරමග නැවතිලා තිබෙනවා. මම අද උදේ ගරු ඇමතිතුමාගෙන් ඇහුවා. දැන් ඉන්න අධ්‍යක්ෂතුමාව ඇයි? ස්ථිර කරන්නේ නැත්තේ කියලා. එතුමා කිව්වා, තව වසරක කාලයක් තිබෙනවා. අපි ඊළඟ වසරේ සිට ස්ථිර කරනවාය කියලා. බොහොම හොඳයි. අපි ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. මේ බස්නාහිර පළාතේ ඩෙංගු උවදුරෙන් මරණ 24 ක් 25 ක් තමයි, ගිය වර්ෂයේ අපට වාර්තා වෙලා තිබෙන්නේ. නමුත් සන්තෝෂ වෙන්න එපා, ගිය වසරේ මරණ ගණන අඩු වුණාය කියලා. ඩෙංගු රෝගීන් ගණන අඩු වුණේ නැහැ. ඩෙංගු රෝගීන් සැලකිය යුතු ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කයේ හම්බ වෙලා තිබෙනවා. හැබැයි, ඔබතුමා දැන ගන්න, නිලධාරීන්ගේ තත්ත්වයත්. වෛද්‍යවරුන්ගේ දක්ෂකමට නොවෙයි ඩෙංගු මරණ ගණන අවම වුණේ. මේ රටේ ජනතාව ඩෙංගු රෝගය ගැන දැනුවත් වීම හින්දයි අද මේ මරණ සංඛ්‍යාව අඩු කර ගන්න පුළුවන් වුණේ කියන එක ගරු සභාපතිතුමා මාර්ගයෙන්, ගරු ඇමතිතුමා මාර්ගයෙන් නිලධාරීන්ව දැනුවත් කරනවා. ඉක්මණටම මේකට විසඳුමක් සොයා ගන්න ඕනෑ. දැන් ඔබතුමා තීන්දුවකට එන්න. තිබුණු වැඩ සටහන ක්‍රියාත්මක කරනවාද? නැත්නම් හඳුන්වා දීපු වැඩ සටහන ක්‍රියාත්මක කරනවාද කියලා අපි උපදේශක කාරක සභාවේ තීන්දුවක් ගනිමු.එහෙම නම් අපි ඩෙංගු රෝගය ගැන ඒ විධියට කථා කරද්දී, ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් මේ රට - මම හිතන්නේ, මහ ආණ්ඩුවෙනුත් අපට උදව් කරනවා. ඒ සියල්ල අරගෙන අපි ඩෙංගු රෝගය සම්බන්ධයෙන් අපි ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යන්න

ඕනෑය කියන එක මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාව දැනුවත් කරනවා. එහෙම නම් මේ ඩෙංගු රෝගයත් කසළ සම්බන්ධයෙන් අපට හොඳට ගැලපෙනවා. අද මහ ඇමතිතුමාත් ඉන්නවා. බොහොම සන්තෝෂයි. ශරීර සෞඛ්‍ය එපමණ හොඳ තත්ත්වයේ නොතිබුණු නිසා පසුගිය දිනවල මට විවාදවලට සම්බන්ධ වෙන්න ලැබුණේ නැහැ. මහ ඇමතිතුමාත් මේ සභාවේ අපේ අනෙක් ඇමතිවරුත් බොහොම දක්ෂ ලෙස හොඳට වැඩ කටයුතු කර ගෙන යනවා. මේ කසළ සම්බන්ධව අපි මීට වඩා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. මේ ගම්වල ජනතාව දැනුවත් කරන්න ඕනෑ. කසළ බැහැර කිරීමේදී, තවම මේ රටේ ජනතාව දැනුවත් වුණේ නැහැ. කසළ කිව්වාම. බැර ලෝහ කිව්වාම. මේ රටේ අහිංසක මධ්‍යම පාන්තිකයෝ දන්නේ නැහැ බැරලෝහවල තිබෙන හානිදායක තත්ත්වය. අපේ සෞඛ්‍යට මේවා අදාළයි.

අපි මේ අමාත්‍යාංශ කිහිපයම එකතු වෙලා වැඩ සටහන් පවත්වලා මේ රටේ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහනක් ඉදිරියට අරගෙන යන්න ඕනෑ. මේ සම්බන්ධව. මොකද, අද හැම තැනම CFL බල්බ් පාවිච්චි කරනවා. ගරු ඇමතිතුමනි, මෙහේ තිබෙන්නේත් CFL බල්බ්. මම සභා ලේකම්තුමාගෙන් අහන්න කැමැතියි. මේ සභාවේ මේ CFL බල්බ් එක ගැලෙව්වාම අපි ගත්ත කඩේට මේ බල්බ් එක ගිහින් දෙනවාද? නැද්ද? කියලා. මේක ගිහින් දෙන්නේ නැහැ. මේක දැනුවත්කමක් නැහැ. මේ රටේ නීතියක් තිබෙනවා, මේ CFL බල්බ් එකක්, ෆ්ලෝරසන්ට් බල්බ් එකක් පාවිච්චි කළාම මේක ආපහු නැවත ඒ ගත්ත කඩේට ගිහින් භාර දෙන්න ඕනෑ. මේ රටේ ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු මහ ඇමතිතුමනි, ඔබතුමාත් මේකට සම්බන්ධ වෙන්න ඕනෑ. අපි ඔක්කොම එකට එකතු වෙලා මේ ව්‍යාපෘතිය ගෙනියන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවාද මේ CFL බල්බ් එකකින් කොපමණ රස දිය මේ පොළොවට බැහැර වෙනවාද කියලා. අපි බල්බ් එකක් පොළොවට විනාශ කළොත් ඔබතුමන්ලා මේ ප්‍රමාණය දන්නවාද ජල ගැලුම් 6000 ක් අපට නැති වන ප්‍රමාණයට මේ පරිසරය නිර්මාණය වෙනවා. මේක ලොකු පරිසර හානියක්. මේක මේ රටේ ජනතාව දන්නේ නැහැ. අපි මේ රටේ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් අපේ පළාත් පාලන අමාත්‍යාංශයෙන්, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ සඳහා මේ ඇමතිවරු සියලු දෙනාටම වගකීමක් තිබෙනවා. මේ සියලුම ඇමතිතුමන්ලාට මේක කරන්න හැකියි. අපට අධ්‍යාපනය ඕනෑ. පළාත් පාලනය ඕනෑ. සෞඛ්‍ය අමාත්‍යාංශය ඕනෑ. මේ හරහා අපි මේ බැර ලෝහ පාසලේ සිට, රෝහලේ සිට - පළමුවෙන්ම මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලනවා. හොඳ වැඩ සටහනක් කරලා පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. මේ මන්ත්‍රීවරු එන එකක් නැහැ. වැඩ සටහනක් තිබෙනවා, වරෙන් කිව්වාම. අපි ඒකට යොමු කර ගන්න පළාත් සභාවේ හොඳ - දැන් බලන්න. අපි අයවැය වැඩ සටහන කරන කොට මන්ත්‍රීවරු සියයට ගණනාවක්,හොඳ ප්‍රතිශතයක් එනවා. එහෙම හරි ගෙන්වලා මේ ගරු මන්ත්‍රීතුමන්ලාව දැනුවත් කරන්න. ඉන් පස්සේ ගුරුවරු දැනුවත් කරන්න. රෝහල්වල ඉන්න සුළු සේවකයෝ දැනුවත් කරන්න. මේකේ තිබෙන භයානකකම පිළිබඳව දැනුවත් කරන්න කියන එක මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ ගරු මහ ඇමතිතුමාත් ඉන්නවා. ඔබතුමාගේ විෂය පථයට සියලු දෙනාම එක්කහු කර ගන්න ඕනෑ.

ඊළඟට, මේ වන කොට ජලභීතිකා රෝගත්, මේ රටේ මිනිස්සු ජීවත් වන ආකාරය අනුව, දියුණු වන රටක අඩුවීගෙන යන තත්ත්වයක් අපට පේන්න තිබෙනවා. ඔබතුමාගේ දත්ත ජලභීතිකා මරණ සංඛ්‍යාව ඉතා සීඝ්‍රයෙන් අනුව අඩු වෙලා තිබෙනවා. හයක් තමයි මෙතැන පෙන්වන්නේ. නමුත් මට අපේ පළාත්වල නම් ජලභීතිකා මරණත්, ජලභීතිකා හැදුනු රෝගීන්වත් හම්බ වෙලා නැහැ, අවංකවම කථා කරන කොට. නමුත් නිදැල්ලේ යන බල්ලෝ සංඛ්‍යාව නම් ඉතාම සීඝ්‍රයි. අපි ඒවාට එන්නත් කරලා ඉවර වෙලා නැහැ. මම අපේ MOH කාර්යාලයෙන් ඇහුවාම, මෑතකදී ඒ ජල භීතිකා එන්නත් ක්‍රමය ආපහු දුර්වල වෙලා තිබෙනවා. මේවා අමතක කරන්න එපා.
[ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

මරණ සංඛ්‍යාව අඩු වුණාය කියලා, ඒක අතඅරින්න එපා. ඩෙංගු මරණ අඩුයි කියලා ඒක අතඅරින්න එපා. අපි මේක හිර කර ගෙන, තද කරගෙන අරගෙන යද්දී නිලධාරීනුත් එක්කහු කරගෙන කටයුතු කළාම මේක තව අවම කර ගන්න පුළුවන්. මේ රටෙන් තුරන් කරන්න පුළුවන්.

තවත් වැදගත්ම මාතෘකාවක් තිබෙනවා. ක්ෂය රෝගය. මට මතකයි, 2004 වර්ෂයේ මම පළාත් සභාව නියෝජනය කරන කොට ක්ෂය රෝගය වැඩ සටහනක් කළා. බොහොම සාර්ථක වැඩ සටහනක්. ක්ෂය රෝගය ගැන ඇහුනාම බොහොම භය හිතුනා. ක්ෂය රෝගය හඳුනා

ගන්නේ කොහොමද? මම ඒකයි කිව්වේ. හැම තිස්සේම මේ මන්ත්‍රීවරුන්ව කොහොම හරි ගෙන්වා ගෙන,මේ මහජන නියෝජිතයන්ව ඉස්සෙල්ලාම දැනුවත් කරන්න. ක්ෂය රෝගය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ දත්තවලට අහු වුණේ නැති වුණාට, මේ රටේ බහුතරයක්, අපි මිනිස්සුත් එක්ක ඉන්න හින්දා අපට දැනෙනවා, ක්ෂය රෝගයෙන් පෙළෙන මිනිස්සු කියලා. හැමදාම කාසේ තිබෙනවා. කහිනවා. බීඩි සුරුට්ටු බොන අය හරියට ඉන්නවා. මට දැනෙන හැටියට ඒ මිනිස්සු ළඟ ක්ෂය රෝගය තිබෙනවා. නමුත් අපි හඳුනාගෙන නැහැ. අපට මේ දත්තවලට යන්න බැහැ. එහෙම නම් මේ රටේ ක්ෂය රෝගය ඉතා සීඝ්‍රයෙන් යට ගම් මට්ටමේතිබෙනවාය කියන එක අපි විශ්වාස කරනවා. රෝහලකට ආවාම, වෛද්‍යවරයා ඒ ආපු රෝගියාගේ අවශ්‍යතාවය විතරයි බලන්නේ. ඒ මිනිහාට කාසයක් තිබුණාට, වෛද්‍යවරයා ඒ පැත්ත එළවාගෙන යන්නේ නැහැ. අපි ඒ වාගේ වෛද්‍යවරු දැනුවත් කරලා මේ රටේ ජනතාවට සේවය සලසන්න විශාල කාර්යභාරයක් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා අපට කරන්න තිබෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

එහෙම නම් මේ වැය ශීර්ෂය යටතේ අපට කථා කරන්න බොහෝ දේ තිබෙනවා. නමුත් මෙන්න මේ ඉතාම වැදගත් කියලා හිතෙන කරුණු කාරණා ටික මම අදහස් කර ගෙන ආවා. ඔබතුමා උපදේශක කාරක සභාව හරියට කරගෙන යනවා. නමුත් පසුගිය කාලයේ අපට කිහිපයක් මඟ හැරුණා. අපි ඒ අඩුපාඩු හදාගෙන ඉදිරියට මේ අමාත්‍යාංශයෙන් විශිෂ්ට සේවයක් මේ පළාතේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාට තවත් එකක් මතක් කරන්න ඕනෑ. අපේ පාසල්වල කුඩා දරුවන්ට අපි සේවයක් ඇති කරන්න ඕනෑ. මම හිතන්නේ, අපි ළඟ එහෙම වැඩ සටහනක් නැහැ. මේ දරුවන්ගේ මුඛ පරීක්ෂා කරන්න. ඇස් පරීක්ෂා කරන්න. ප්‍රාථමික පන්තිවල ඉන්න දරුවන් දිහා බලලා අපට විශාල ප්‍රමාණයක් හඳුනාගන්න පුළුවන්. මම මොකද එහෙම කියන්නේ? අපේ Lions Club එක හරහා මේ වාගේ වැඩ සටහනක් පාසලක කළාම,අපට දත් රෝගවලින් පෙළෙන විශාල දරුවන් සංඛ්‍යාවක් සොයා ගන්න හම්බ වුණා. ඇහැ සම්බන්ධව අඩුපාඩු තිබෙන දරුවෝ ඕනෑතරම් සොයා ගන්න පුළුවන්. මේ අහිංසක දරුවන්ට අපි මේ දේවල් ඉෂ්ට සිද්ධ කරලා, එලෙස හරි මාර්ගයේ යන වැඩ සටහනක් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍යඅමාත්‍යාංශය හරහා අපේ පාසල්වල පවත්වන්න, එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න යෝජනා කරනවා. එළඹෙන විවාදයේදී අපේ සම්පූර්ණ සහයෝගය ඔබතුමාට ලබා දෙනවාය කියමින් ඉදිරි වර්ෂයේ දී මේ මුදල් සමඟ අපි සැහෙන සැලකිය යුතු සේවයක් මේ පළාතේ ජනතාව වෙනුවෙන් කිරීමට ඔබතුමාට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කෙටි අදහස මෙයින් අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.19]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍ය සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාගේ වැය ශීර්ෂයට අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම ස්තූතිවන්ත වෙනවා. ඉතාම කෙටි කාලයක් එම අමාත්‍යාංශයේ අමාත්‍ය ධූරය හොබවන්න මට අවස්ථාව ලැබුණා. අනෙකුත් සියලු ආකාරයේ හිරිහැර, කෙනහිලිකම් මැද ඒ අමාත්‍ය ධූරය අහිමි වුණත් ඒකෙන් ලබා ගත් අත්දැකීම් සහ දැනුම ඒ වාගේම අවබෝධය සම්බන්ධයෙන් මම සතුටු වෙනවා, විශේෂයෙන්ම සුමිත් ලාල් ඇමතිතුමා වාගේ අත්දැකීම් තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට උරුමකම් කියන ඉතිහාසයක් තිබෙන මෙවැනි ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් මෙම අමාත්‍ය ධූරය හෙබවීම සම්බන්ධයෙන් ද මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. අපේ බුදුහාමුදුරුවෝ ප්‍රකාශ කරලා තිබෙනවා, “ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං” කියලා. නිරෝගී බව තරම් සැපතක් තවත් නැහැ. ඒ වාගේම සතුට කියන එක අපි සියලු දෙනාටම අවශ්‍ය දෙයක්. අද මේ දෙකම අපට අහිමි වෙලා තිබෙනවා. අද බස්නාහිර පළාත තුළ තුන් බියක් පැතිරී යමින් තිබෙනවා. එකළ බුදුහාමුදුරුවන්ගේ කාලයේ විසාලා මහනුවර තමයි තුන් බිය පැතිරුනේ. අද බස්නාහිර පළාතේ විශේෂයෙන්ම මේ මධ්‍යම පාන්තික, ඉහළ මධ්‍යම පාන්තික පන්තිය විතරක් නොවෙයි, සාමාන්‍ය ජනයා අතර පවා වේගයෙන් පැතිරී යමින් තිබෙන උවදුරක් බවට පත් වෙලා තිබෙනවා. ජාතික ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා මේ කියන රෝග තුන. එකක් පිළිකාව. අනික් එක දියවැඩියාව සහ හෘද රෝග කියන එක. මේක තමයි අද ප්‍රධාන වශයෙන්ම අපේ සමාජය පෙළාගෙන තිබෙන තුන් බිය. ඒ නිසා අපේ සෞඛ්‍ය ප්‍රතිපත්ති, අපේ සෞඛ්‍යපිළිවෙත්, අපේ ආහාර පිළිවෙත්, ඒ වාගේම කැළි

කසළ කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති අනිවාර්යයෙන්ම අපේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපානවා.

ඒ වාගේම පැහැදිලිව කියන්න ඕනෑ. අපේ රටේ ජනතාව අද ලෝකයේ අසතුටින්ම ඉන්න ජාතියක් බවට පත් වෙලා ඉන්නවා. දකුණු ආසියාවේ, භූතානය කියන රටේ තමයි ලෝකයේ සතුටින්ම ඉන්න ජනතාව ජීවත් වෙන්නේ. ඒක බෞද්ධ රටක්. නමුත් ඔවුන්ගේ අවශ්‍යතා ඉතාම සීමිතයි. සරළ ජීවිතයක් ගෙවන්නේ. නමුත් අද අපේ රට ඉතාම සංකීර්ණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද ලෝකයේ අනික් රටවල් එක්ක සන්සන්දනාත්මකව අරගෙන බැලුවාම ලෝකයේ වැඩිම මානසික ආතතියක් තිබෙන රටක් බවට ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙනවා. එහෙම නම් මේ මානසික ආතතිය ප්‍රධාන වශයෙන්ම මේ රෝගාබාධවලට හේතු වෙලා තිබෙනවා. අද රටේ ජනගහනයෙන් අරගෙන බැලුවාම සෑම පස් දෙනෙකුගෙන්ම එක් අයෙක් මානසික රෝගයකට, මානසික ව්‍යාධියකට ගොදුරු වෙලා තිබෙනවා. එහෙම නම් මේක බරපතළ තත්ත්වයක්. නමුත් මේ මානසික ව්‍යාධීන්වලට ප්‍රතිකාර කරන්න අවශ්‍ය කරන මානසික වෛද්‍යවරු අපේ රටේ නැහැ. මේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් ජනතාව ජීවත් වෙනවා. නමුත් මේ දෙකෝටි විසි ලක්ෂයක් වූ ජනතාවට ඇති වන මානසික ව්‍යාධීන්වලට, මානසික රෝගවලට ප්‍රතිකාර කරන්න අපට ඉන්නේ මානසික වෛද්‍යවරු 67 දෙනෙක් පමණයි.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපේ දරුවන් මත අද විශාල අධ්‍යාපන බරක් පැටවිලා තිබෙනවා. මේ කඩඉම් විභාග නිසා පහ වසර ශිෂ්‍යත්වය විතරක් නොවෙයි. අ.පො.ස(සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) වැනි විභාගවලට අපේ දරුවන්ගේ තිබෙන තරඟකාරීත්වය නිසා, ඒ දරුවෝ අද විශාල මානසික ආතතියකට ගොදුරු වෙලා තිබෙනවා. ඔවුන් විවිධ මානසික ආබාධවලට ගොදුරු වෙලා තිබෙනවා. හැබැයි, මේවා පිළිබඳව සොයා බලන්න නිසි ක්‍රමවේදයක්, වැඩ පිළිවෙළක් නැහැ. ඒ දරුවෝ මේ මානසික ආබාධවලට ගොදුරු වෙලා ඉන්නවාද නැද්ද? ඒ පිළිබඳව පාසල්වලට ගිහිල්ලා ඒ දරුවන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳව, ශාරීරික සෞඛ්‍ය පිළිබඳව සොයා බලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම දන්නා ආකාරයට අපේ රටේ ළමා මනෝ වෛද්‍යවරු ඉන්නේ හතර දෙනෙකු පමණයි. එහෙම නම් කොහොමද?මේ දරුවන් පිළිබඳ ප්‍රශ්නය අපි විසඳන්නේ.

විශේෂයෙන්ම මේ මානසික ආතතිය හේතු කොට ගෙන අද රටේ ජනගහනයෙන් 52% ක් මත්පැන්වලට ඇබ්බැහි වෙලා තිබෙනවා. මත් උවදුරට ගොදුරු වෙලා තිබෙනවා. ඒ වාගේම අපි කියන්න ඕනෑ. මේ සියල්ල අපේ සෞඛ්‍යයත් එක්ක බැඳිලා තිබෙන ප්‍රශ්නයක්. මානසික සෞඛ්‍ය වාගේම ශාරීරික සෞඛ්‍ය. නමුත් අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩිපුර අවධානය යොමු වෙන්නේ, මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩිපුර අවධානය යොමු වෙන්නේ මේ ශාරීරික, භෞතික සෞඛ්‍ය පිළිබඳව විතරයි. මානසික සහ ආධ්‍යාත්මික සෞඛ්‍ය පිළිබඳව විමසීමක්, සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා අපි පැහැදිලිව මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අපේ දරුවෝ අද අධ්‍යාපනය නිසා විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා. ඒ නිසාම ඔවුන් අද විවිධ වර්ගයේ ශක්තිජනක පානවලට යොමු වෙලා තිබෙනවා. ඒවායේ විශාල වශයෙන් ඇල්කොහොල් ඇතුළත් වෙලා තිබෙනවා. මත් පෙති, සිරප් වර්ග විශාල වශයෙන් අද ඖෂධ සැල්වලින් අලෙවි වෙනවා. අවශ්‍ය නම් මේ පිළිබඳව සංඛ්‍යාත්මකව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මෙහිදී වැදගත් වන්නේ, දත්ත විශ්ලේෂණයකට යොමු වීමයි. දත්ත විශ්ලේෂණය ඉතාම වැදගත්.

ඒ වාගේම අද අරගෙන බැලුවාම දියවැඩියාව පිළිබඳ ප්‍රශ්නය. රටේ ජනගහනයෙන් 26% ක් අද දියවැඩියාවට ගොදුරු වෙලා තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම මේ බස්නාහිර පළාත. ඒකට ප්‍රධාන වශයෙන්ම හේතු වෙලා තිබෙන්නේ, මේ ජනාකීර්ණත්වය විතරක් නොවෙයි. අද අපි මැදි
[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ආදායම් ලබන රටක්. ඒ නිසා මෙවැනි තත්ත්වයන් ලෝකයේ අනික් රටවල්වලත් ඇති වෙලා තිබෙනවා. එහෙම නම් මේ මැදි ආදායම් උගුලෙන් ගැලවිලා අපි කොහොමද රටක් විධියට ඉස්සරහාට යන්නේ කියන එක කල්පනා කරන්න ඕනෑ. අපි රටක් විධියට නිරෝගී වුණේ නැත්නම්, ජාතියක් විධියට නිරෝගී වුණේ නැත්නම් අපි බලාපොරොත්තු වන සංවර්ධන ඉලක්ක සපුරා ගන්න බැහැ. ලෙඩ්ඩු ටිකක් එක්ක රටක් ගොඩ නගන්න බැහැ. මානසික රෝගීන් එක්ක රටක් ගොඩ නගන්න බැහැ. රටේ විනය හදන්න බැහැ. ඒ නිසා අනිවාර්යයෙන්ම අපට අවශ්‍යයි පැහැදිලි සෞඛ්‍ය ප්‍රතිපත්තියක්. ඒ සෞඛ්‍ය ප්‍රතිපත්තිය අපි සකස් කර ගන්න ඕනෑ. එහිදී විශේෂ අවධානය යොමු කළ යුතු පැති ගණනාවක් තිබෙනවා.

ඒ වාගේම අද ඩෙංගු උවදුර වසංගතයක් වාගේ පැතිර යමින් තිබෙනවා. රට පුරා ඩෙංගු රෝගීන් 47,000 ක් වාර්තා වෙනවා. මොකක්ද මේකට හේතුව? මේ පිළිබඳව අපේ ජනතාවගේ ආකල්පවල වෙනසක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ කැළි කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් අපි සොයා ගන්න ඕනෑ. එහෙම නැතිව හැම වර්ෂයකම ඩෙංගු රෝගීන් ගණන ඉදිරිපත් කරන එක හරි, මිය ගිය සංඛ්‍යාව ඉදිරිපත් කරන එක නොවෙයි අවශ්‍ය වෙන්නේ. මේක ක්‍රමානුකූලව කොහොමද අපි අවසන් කරන්නේ. ඒ සඳහා සමාජ නියාමනයක් අවශ්‍යයි. මේ ඩෙංගු රෝගය පිටු දකින්න අපි සමාජය තුළින්ම යම්කිසි ආකාරයක වැඩ පිළිවෙළක් හදා ගන්න ඕනෑ. එහෙම නැතිව අපට මේ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද මේ සෞඛ්‍ය පිළිබඳ කාරණයේදී, විශේෂයෙන්ම මේ සීනි පාලනයක් අවශ්‍යයි. අද අපේ රටේ සීනි නිෂ්පාදනය ගත් විට රටට අවශ්‍ය කරන සීනි ප්‍රමාණයෙන් 10% ක් පමණයි, මේ රට තුළ නිෂ්පාදනය කරන්නේ. 90% ක් අපි සීනි පිටරටින් ආනයනය කරනවා. ඒ වාගේම ඒ සීනිත් එක්ක අපි දැක්කා - සීනිවලට වඩා දැන් මේ රට ඇතුළට ගලාගෙන එන්න පටන් අරගෙන තිබෙන්නේ කොකේන්. එහෙම නම් බ්‍රසීලයෙන් මේ රටට ගෙන්වන සීනිත් එක්ක එන මේ කොකේන් නිසා අපේ සෞඛ්‍ය පිරිහෙනවා. කාටද මේ කොකේන් ගේන්නේ? මේ රටේ තරුණයින්ට බොන්නද? එහෙම නැත්නම් මේ රට තුළින් ඒවා ප්‍රති අපනයනය කරන්නද? කියන එක පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අද ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් මත් කුඩු බෙදා හරින ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ රාජපක්ෂ පාලන සමයේදී දකුණු ආසියාවේ විශාලතම හෙරොයින් කන්ටේනර් එක හසු වුණේ, ශ්‍රී ලංකාවෙන්. කිලෝ 262 ක් අහු වුණා. දැන් තත්ත්වය මොකක්ද? දැන් කන්ටේනර් පිටින් කොකේන් ගලාගෙන එනවා. දකුණු ආසියාවේ විශාලතම කොකේන් ප්‍රමාණය අහු වුණේ ශ්‍රී ලංකාවෙන්. එහෙම නම් අපි බලන්න ඕනෑ මේ රට කොහාටද මේ ගමන් කරමින් තිබෙන්නේ කියන එක.

ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අපි කල්පනා කරන්න ඕනෑ. මේ බස්නාහිර පළාත තුළ අපේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවන්න. ඒ වාගේම ඔවුන්ගේ ශාරීරික සෞඛ්‍ය, මානසික සෞඛ්‍ය ගැන විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. දියවැඩියාව පිටු දකින්න අවශ්‍ය කරන අලුත් ප්‍රතිපත්ති සම්පාදනය කරන්න ඕනෑ. අපේ දරුවන්ව පොඩි කාලයේ ඉඳලාම අපි සීනිවලට හුරු කරනවා. මේ සීනිවලට ඇබ්බැහි වුණාට පස්සේ, ඒ නිසාම අද විශාල ව්‍යසනයක් ඇති කරලා තිබෙනවා. මම අහන්න කැමැතියි. බස්නාහිර පළාතේ කොපමණ ප්‍රමාණයක් දියවැඩියා රෝගීන් ඉන්නවාද? ඒ අයට අවශ්‍ය කරන මෙට්ෆොමින් ගෙන්වන්න කොපමණ මුදලක් අපි වැය කරනවාද? ඒ වාගේම ඉන්සියුලින් ගෙන්වන්න කොපමණ මුදලක් අපි වැය කරනවාද කියන එක පිළිබඳව අපි සොයා බලන්න ඕනෑ. ඒ නිසා මේ කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, මේ රට නිවැරදි මගට ගන්න නම් නිරෝගී ජනතාවක් අපට අවශ්‍යයි. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් අවශ්‍යයි.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ සුමිත් ලාල් මැනිදිස් ඇමතිතුමා මේ පිළිබඳව අවධානය යොමු කරලා ඉදිරි වර්ෂය තුළ කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අද අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධාන සංකල්පයක් තමයි වස විෂෙන් තොර ගොවිතැන. ඒ වාගේම මත් උවදුර පිටුදැකීම. ඒ වාගේම වකුගඩු රෝගය නිවාරණය කිරීම, ඒ වාගේම ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම කියන මේ මූලික ජාතික වැඩ සටහන් පිළිබඳව අද අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරලා,තිබෙනවා. ඒ වාගේම මේ වන කොට බස්නාහිර පළාත තුළත් වකුගඩු රෝගීන් වාර්තා වෙලා තිබෙනවා. උතුරු මැද ගොවි කලාපයට පමණක් සීමා වෙලා තිබුණු වකුගඩු රෝගය දැන් බස්නාහිර පළාතටත් ක්‍රමානුකූලව ඇතුළු වෙමින් තිබෙන්නේ. එහෙම නම් අපේ පොළොව විෂ වෙලා නම්, අපේ ජලය විෂ වෙලා නම් අපේ පරිසරය විෂ වෙලා නම්, වායුගෝලය විෂ වෙලා නම් අපේ ශරීර සෞඛ්‍ය විනාශ වන එක, විෂ වන එක වළක්වන්න බැහැ. ඒ නිසා පැහැදිලිවම මේ පිළිබඳව අවධානය යොමු කරලා පරිසර ප්‍රතිපත්තිය විතරක් නොවෙයි. අපේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය, කසළ ප්‍රතිපත්තිය මේ හැම එකක්කම එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා මේ පිළිබඳව සමස්තයක් විදියට අවධානය යොමු කරලා, රටේ අනාගතය වෙනුවෙන් "ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී

පරමං ධනං" කියන ප්‍රතිපත්තිය හිස් මුදුනේ තියා ගෙන මේ රට ඉදිරියට ගෙනියන්න ඕනෑ.

රජෙක් වුණත් වැඩක් නැහැ ගරු සභාපතිතුමනි ලෙඩෙක් වුණොත්. ඒ නිසා විශේෂයෙන්ම මේ සභාවේ අපට ආහාර ලබා දෙනවා. ඒ ආහාරවල පවා සීනි පිළිබඳව මීට වඩා අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, අපි සියලු දෙනාගේ සෞඛ්‍ය රකින්නත්, රටේ ජනතාවගේ සෞඛ්‍ය රකින්නත් මේ මන්ත්‍රීවරු නිරෝගීව ඉන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන්ගේ නිරෝගීභාවය වෙනුවෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.30]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන සහ පරිවාස, ළමා රක්ෂක සහ කාන්තා කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ විෂයයන් කිහිපයක් එතුමාගේ යටතේ මෙහෙයවන මේ අවස්ථාවේදී මම හිතනවා, අපේ 2017 අයවැය ලේඛනයේදී එතුමාගේ අමාත්‍යාංශය යටතේ විෂයයන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. එහි ප්‍රධාන එක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය. මේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ග්‍රාමීය රෝහල් සහ වෙනත් බෙහෙත් ශාලා සහ ආයුර්වේද ඔබතුමා යටතේ පාලනය වෙනවා. 2016 වර්ෂයේදී රුපියල් මිලියන 1360 ක් මේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. 2017 වර්ෂයේදීත් මම හිතන්නේ, ඒ හා සමානම මුදලක් ලබා ගෙන, ඔබතුමාගේ උත්සාහය තිබෙන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළින් බස්නාහිර පළාත් සභාවේ ජනතාවට උපරිම සේවාවක් කරන්න.

ගරු සභාපතිතුමනි, මේ මුදලින් මුළු පළාත් සභාවේම රෝහල්වලට විශාල සේවාවක් කරන්න ලැබෙන්නේ නැහැයි කියලා මම හිතනවා. පළාත් සභාවේ මේ රෝහල්වලින් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව බලාපොරොත්තු වෙනවා, තමන්ගේ ගමේ රෝහලට ගිහිල්ලා තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න. ගරු සභාපතිතුමනි අපි පසුගිය කාල සීමාව තුළදී දැක්කා, මේ රෝහල්වලින් හරියට බෙහෙත් හේත් මහජනතාවට ලැබෙන්නේ නැහැ. මේකට අවශ්‍ය කරන වෛද්‍යවරු මේ රෝහල්වල නැහැ. මේ වෛද්‍යවරුන්ට අවශ්‍ය කරන කාර්ය මණ්ඩල මේ රෝහල්වල නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ අමාත්‍යාංශය අරගෙන ඉතාමත්ම කෙටි කාල සීමාවක්. නමුත් අපි ඉදිරි කාල සීමාව තුළදී බලාපොරොත්තු වෙනවා, ඔබතුමා ජ්‍යෙෂ්ට අමාත්‍යවරයෙක්. ඔබතුමාගේ නායකත්වයෙන් මේ පළාත් සභාවට අයත් රෝහල් ටික, මේ රෝහල්වලට අවශ්‍ය කරන අඩුපාඩු ටික ඔබතුමා හැකි ඉක්මණින් ලබා දීලා විසඳයි කියලා. විශේෂයෙන්ම බියගම මැතිවරණ කොට්ඨාශයට යාබදව දොම්පේ ප්‍රාදේශීය රෝහල තිබෙනවා. උඩුපිල ප්‍රාදේශීය රෝහල තිබෙනවා. බියගම ග්‍රාමීය රෝහල තිබෙනවා. ඒ රෝහල්වලට අවශ්‍ය කරන අඩුපාඩු ටික ඔබතුමා සොයා බලලා, මේවාට හැකි ඉක්මණින් විසඳුම් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ඩෙංගු මර්දන ව්‍යාපාරය. ගරු සභාපතිතුමනි,අපි පසුගිය දශකය පුරාම මේ ඩෙංගු මර්දනයට සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන සහ මධ්‍යම ආණ්ඩුව විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළා. නමුත් අද අපි ප්‍රවෘත්තිවල දැක්කා. අපේ ලංකාවේ ඩෙංගු වැඩිපුරම තිබෙන්නේ, මේ අවුරුද්දේ. ඩෙංගු මරණ කෙසේ වෙතත් ඩෙංගු රෝගීන් වැඩිපුරම වාර්තා වෙලා තිබෙන්නේ මේ අවුරුද්දේ. ඒ නිසා ඔබතුමා යම්කිසි උත්සාහයක්
[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ගත්තත්, අපි බලාපොරොත්තු වෙනවා, මේ ඩෙංගු මර්දන වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව ඉස්සරහාට අරගෙන යන්න. මේක සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් කරන්න බැහැ. මේක අධ්‍යාපන අමාත්‍යාංශය, අනෙකුත් අමාත්‍යාංශ හරහා ඔබතුමා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. ඒ එක්කම ආයුර්වේද රෝහල්. වර්තමානයේදී මේ ආයුර්වේද රෝහල් අත්‍යවශ්‍යම දෙයක්. මම හිතන්නේ, මේ රෝහල්වල විශාල අඩුපාඩු රාශියක් තිබෙනවා. අපේ බියගම ප්‍රදේශයේත් කඳුබොඩ ආයුර්වේද රෝහල තිබෙනවා. ඒකේත් අවශ්‍යතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මට දීර්ඝ වශයෙන් කථා කරන්න බැහැ. විනාඩි 07 යි තිබෙන්නේ. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**41954196**

ඒ එක්කම ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු අමාත්‍යතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ අපේ බස්නාහිර පළාතේ විශාල ළමා ආරක්ෂක මධ්‍යස්ථාන තිබෙනවා. මම හිතනවා ඒ මධ්‍යස්ථානවල අවුරුදු දෙකේ සිට අවුරුදු පහළොව, දහසය දක්වා දරු දැරියන් ඉන්නවා. මේ දරු දැරියන්ට එක දවසකට වෙන් කරන්නේ ගරු අමාත්‍යතුමනි, තුන් වේලටම කන්න රු. 20/- යි. මම දැන් තොරතුරු ගත්තා. තුන් වේලටම රු. 20/- යි. මම දැන් දුරකථනයෙන් තොරතුරු ගත්තා. විහාර මහා දේවි ළමා නිවාසයෙන්. ළමයින් 70 ක් ඉන්නවා. ඒ ළමයින් 70 ටම උදේට, දවල්ට සහ රාත්‍රියට කෑමවලට රු. 20/- යි වෙන් කරන්නේ. මම හිතනවා, මේකේකිසිසේත්ම ප්‍රායෝගිකතාවයක් නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඊළඟ වර්ෂයේදීවත් මේ රු. 20 සීමාව - මනුස්සයෙකුට තියා සතෙකුටවත් එක දවසකට කෑමවලට මදී. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ අසරණ දරුවන් ඉන්නේ. සමහර අයගේ අම්මා නැහැ. සමහර අයගේ තාත්තා නැහැ. සමහර අයට අම්මා තාත්තා දෙන්නාම නැහැ. සහෝදරයෝ නැහැ. කවුරුවත් නැති දරුවෝ තමයි මේකට ගෙනැත් දාන්නේ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ රු. 20/- මේ දරුවන්ට සෑහෙන පරිදි වැඩි කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මේ පරිවාස ගොඩනැගිලිවල විශාල ප්‍රශ්න තිබෙනවා. අපේ විහාර මහා දේවී ළමා නිවාසයේ කාන්තාවන් තමයි විශාල ප්‍රමාණයක් ඉන්නේ. ඔබතුමාට මම කියලා තිබෙනවා, ඒකේ තාප්පයක් ගහන්න අවශ්‍යයි. ඒකට අවශ්‍ය කරන ඒ රැඳවුම් නිලධාරීන්ගේ අඩුපාඩුවක් තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමා අවධානය යොමු කරන්න. ඒ එක්කම විශේෂයෙන්ම තවත් ඉල්ලීමක් කරනවා. කාන්තාවන් සම්බන්ධයෙන්. අපි කොපමණ සංවර්ධනය කරා මෙහෙයවූවත් කාන්තාවන්ගේ විශාල ප්‍රශ්න අපේ රටේ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ මේ වැඩ පිළිවෙළ යන කොට සමහර අවස්ථාවලදී හෝටල්වල පිටුපස ගිහිල්ලා බලන්න. විශාල වශයෙන් පනුවෝ ගහලා උයන්නේ කිසිම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමයක් නැතිව. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමා හරහා මේ බස්නාහිර පළාතේ තිබෙන ඒ හෝටල්වල තිබෙන කෑම සෞඛ්‍යාරක්ෂිතව ලබා දෙන්නට නිසි වැඩ පිළිවෙළක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ලවා සකස් කරන්න කියලා. ගරු සභාපතිතුමනි, මේක නිසියාකාරව වෙන්නේ නැහැ. හැම හෝටලයකම පිටුපසට ගිහිල්ලා බැලුවාම පනුවෝ ගහලා තිබෙනවා. ඔක්කොම එකට දාන්නේ. ඒ පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කරන්නය කියලා ගරු ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, බුදු රජාණන් වහන්සේ තුන් පාරක් අපේ ලංකාවට වැඩියා. සමහර විදේශිකයෝ අපේ රටට එනවා, භාවනා කරන්නට. අපි දැක්කා, සමහර භාවනා මධ්‍යස්ථානයට සහ අනෙකුත් ස්ථානවලට කටුනායකින් බැහැලා එනවා. මේ බැහැලා එන කොට අපි ඉස්සෙල්ලාම දකින්නේ ගරු සභාපතිතුමනි, මස් එල්ලලා තිබෙනවා. අපි දැක්කා සමහර වෙලාවට ඌරු මස් එල්ලනවා. කුකුල් මස් එල්ලනවා. එළු මස් එල්ලනවා. විදේශිකයෙකු ලංකාවට එන කොට මම හිතන්නේ ඉස්සෙල්ලාම දකින්නේ,පාරවල්වල මස් එල්ලලා තිබෙනවා. අපි ඔබතුමා හරහා විශේෂ ඉල්ලීමක් කරනවා. ඒ කොපමණ තැන් දුන්නත් ඒ මිනිස්සු මස් ටික එල්ලන්නේ පේන්න. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා පළාත් පාලන ආයතනවලට වහාම නියෝගයක් දාන්න මේ මස් විකුණන කොට අඩුම ගණනේ මේ මීගමුව පාරේවත් - විදේශිකයෝ එන කොට ඉස්සෙල්ලාම පේන්නේ මස් ටිකනේ? ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා මේකට අවශ්‍ය කරන නිසි වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, තවත් වැදගත් යෝජනාවක් කරනවා. අපේ රටේ දැන් පුරුද්දක් වෙලා තිබෙනවා. Foot Massage. මේක සෞඛ්‍ය අමාත්‍යාංශයට තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක්. මම බත්තරමුල්ලේ සිට බියගමට යන කොට මේවා 78 ක් තිබෙනවා, මේ දිගටම. (බාධා කිරීම්) මම මේ දැක්ක එක කියන්නේ. මේ 78 ටම කිසිම සෞඛ්‍යමධ්‍යස්ථානයකින් අවසරයක් අරගෙන නැහැ. පළාත් පාලන ආයතනයකින් අවසරයක් අරගෙන නැහැ. මේවායේ බහුතරයක් ඉන්නේ කාන්තාවෝ. මේ කාන්තාවන්ගේ විවාහ ජීවිතය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වෙලා, ඒකෙන් එන්නේ මෙතැනට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කොහොමද දන්නේ?

41974198

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මම ප්‍රායෝගිකව බලාගෙන යනවා. මම දැක්කානේ? පසුගිය මාසයේ මම දැක්කා. ගරු සභාපතිතුමනි, මම දැන් මෙතැනට ඇවිල්ලා අවුරුද්දක් පමණ වෙනවා. දවසින් දවස මේක වැඩි වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වෙලා, පළාත් පාලන ආයතනවලට උපදෙස් දෙන්න. මේවා අලුතෙන් ආරම්භ කරන කොට අනිවාර්යයෙන්ම බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අවසරයක් ගන්න. නැත්නම් ගොඩනැගිල්ලක් තිබෙනවා. කාන්තාවෝ කිහිප දෙනෙක් සොයා ගන්නවා. මේක ආරම්භ කරනවා. මේක අපේ රටේ දිගටම පුරුද්දක් වශයෙන් යනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරමින්, 2017 ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට අපි සුභ පතනවා. අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබා දීලා, මේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ඔබතුමා හරහා ඉදිරි කාල සීමාව තුළදී බස්නාහිර පළාතට සේවාවක් කරනවාත් එක්කම, බියගම මැතිවරණ කොට්ඨාශයටත් ගම්පහ දිස්ත්‍රික්කයටත් විශාල ශක්තියක් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.39]

**ගරු සන්ධ්‍යා සිරිවර්ධන**
Hon. Sandya Siriwardana

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මට වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ජන ජීවිතය පිළිබඳව ගොඩ නැගීම සම්බන්ධව විශාල වශයෙන් බලපෑමක් කරන අමාත්‍යාංශයක් තමයි අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාට ලැබී තිබෙන අමාත්‍යාංශය. ඉතාමත්ම වැදගත් වූ අමාත්‍යාංශයක්. මම හිතනවා, මාස දහයක පමණ කාලයක් වෙන්නේ, මෙතුමා අමාත්‍යාංශය භාර අරගෙන. මේ වන කොට ඉතාමත්ම හොඳින් එතුමා කළමනාකරණය කර ගෙන යනවා. මම හිතනවා, ඒකට හේතුව වෙනවා, වසර 20 කට වැඩි කාලයක් අපිත් එක්ක මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරලා එතුමා ලබපු පන්නරය. ඒ අත්දැකීම් තුළින් තමයි මේ කටයුතු කර ගෙන යන්නේ. ඒ වාගේම උපදේශක කාරක සභා කලට වේලාවට පවත්වනවා. මමත් උපදේශක කාරක සභාවේ ඉන්නවා. ඒ අවස්ථාවන්හිදී අපේ මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට ඇහුම්කන් දෙමින්, ඔවුන්ගේ උපදෙස් අනුශාසනා ප්‍රයෝජනයට ගනිමින් එතුමා කටයුතු කරන එක ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමා කළුතර දිස්ත්‍රික්කයේ හිටියත් අපට ඕනෑම වෙලාවක දුරකථන ඇමතුමකින් සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබීම පිළිබඳව එතුමාට නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා. මොකද, අපට යම්කිසි ගැටළුවක් ඇති වූ අවස්ථාවකදී එය ඉතා වැදගත් වෙනවා.

ඒ වාගේම කාර්ය මණ්ඩලය ගැනත් වචනයක් කියන්න ඕනෑ. එතුමාගේ කාර්ය මණ්ඩලයත් ඒ ආකාරයෙන්ම අපට විශාල සහයෝගයක් දෙනවා, මේ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යන්න. ඒ වාගේම විශේෂයෙන් ලේකම්තුමිය මම හිතන්නේ, පරිපාලනයේ පරිනත දැනුමත් ඇති දමයන්ති මහත්මිය. එතුමිය අපට විශාල වශයෙන් ඒ සඳහා ආධාර උපකාර කරනවා. ඒ වාගේම සමාජ සේවා කොමසාරිස්තුමිය ශිරෝමාලි මහත්මිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සමාජ සේවයට කැප වූ අයෙක්. මොකද, වැඩිහිටියන්ගේ, ළමයින්ගේ ප්‍රශ්න ගැටළුවලදී එතුමිය අපට විශාල වශයෙන් ඒ සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම ආයුර්වේද කොමසාරිස්තුමියත් මගේ ගම් ප්‍රදේශයේ. එතුමියත් එතුමියගේ කාර්යභාරය කරලා අපට විශාල සහයෝගයක් අපට ලබා දෙනවා. ඒ වාගේම පරිවාස කොමසාරිස්තුමියත් චන්දිමා මහත්මියත් ඒ කටයුත්ත කරනවා. මම මේ නම් වශයෙන් සඳහන් කළේ, විශේෂයෙන්ම කාන්තාවන් පිරිසක් ඒ පුටුවල නිලතල දරන නිසා කාන්තාවක් විධියට අගය කිරීමක් කළ

[ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

යුතු නිසා තමයි මම ඇත්තෙන්ම ඒ වචන ටික සඳහන් කළේ.

විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍යතුමා අපේ ආරාධනයකට අනුව වතුපිටිවල රෝහලට ඇවිල්ලා නිරීක්ෂණ කටයුතු කළා. එතැනදී අපි ඉල්ලපු ඉල්ලීම්වලින් ¾ ක් මේ වන කොට අපට සපයා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ළදරු දරුවන් හම්බ වුණු අම්මලාව දාන්න තැනක් නැතිව එතැන එහා පැත්තේ වාට්ටුවක් හිස් වෙලා තිබෙනවා. මම එතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කළා. එතැනට විදුලි සෝපානයක් දාන්න මිලියන හතක පමණ මුදලක් යනවා. අපට කාලාන්තරයක් තිස්සේ තිබුණු ගැටළුවක්. එතුමා ඒක විසඳලා දීලා මේ වන කොට ඒකේ අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතිනවා. ඒකයි මම කිව්වේ, එතුමා

අපේ ප්‍රශ්න ගැටළුවලට හැකි උපරිම ආකාරයෙන් සහයෝගය ලබා දෙනවාය කියලා.

ඒ වාගේම අද සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කථා කරද්දී බෝ නොවන රෝග ගැන කථා නොකර බැහැ. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා තුන් බිය ගැන. මේ සඳහා අපට කළ යුත්තේ බෝ නොවන රෝග - රෝගයක් ඇති වීමට පෙර අපි මේ දෙයින් වැළකී සිටීමයි. මම හිතනවා, අද විශේෂයෙන් ඒ සඳහා අවශ්‍ය වෙලා තිබෙනවා ව්‍යායාම කිරීමේ අවශ්‍යතාවය. ව්‍යායාම කරනවා හිඟයි. මම ගිය වසරේත් ප්‍රකාශ කළා, අපේ වතුපිටිවල රෝහලේ මේ සඳහා ඇවිදීමේ වැඩ සටහනක් කරනවා. වෛද්‍ය සමන් ජයකොඩි වෛද්‍යතුමා හරහා කරන්නා වූ ඒක දැන් ගිය වසරට වඩා ප්‍රචලිත වෙලා තිබෙනවා. මම හිතනවා, මේක මීට වඩා පුළුල් ආකාරයෙන් ගම් හරහා ව්‍යාප්ත කිරීමට නම්, MOHකාර්යාල හරහා මේ කටයුත්ත ගෙනිහිල්ලා අපේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් තුළින් ඒ ග්‍රාම සේවා නිලධාරී වසම් දෙක තුනක් එකතු කරලා, මේ කටයුත්ත ඉතා හොඳින් කළොත් - මම අපේ සභාපතිතුමා මඟින් අපේ අමාත්‍යතුමාට යෝජනාවක් කරනවා. ලබන වසරේ මේ කටයුත්තට දායකත්වය ලබා දීලා කළොත් මම හිතනවා, මේක ඉතාමත්ම හොඳ කටයුත්තක් වේවි කියලා.

ඒ වාගේම දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ගැන කථා කරන කොට, දැන් ජනතාව හුඟාක් දෙනෙක් අවබෝධ කරගෙනතිබෙනවා,දේශීය වෛද්‍ය ප්‍රතිකාර තුළින් රෝගය සුව වෙන්න කල් ගියත් නිට්ටාවට සුව වෙනවාය කියන පණිවුඩය ගිහින් තිබෙනවා. ඒ නිසා එතැනදීත් මම බෝ නොවන රෝග පැත්ත ගත්තොත්, එතැනත් අපට තිබෙනවා යෝග ව්‍යායාම කරලා මේ බෝ නොවන රෝග තත්ත්වයෙන් වළකින්නට. මම ඒකට උදාහරණයක් කියන්නේ. මේ වසරේ මම යෝගී ව්‍යායාම පන්ති,එක් දින පන්ති හතරක් කළා. මම හිතන්නේ, අපේ කොමසාරිස්තුමිය ඒ පන්ති හතරටම සහභාගී වුණා. එතුමිය දැක්කා ඒකේ තිබෙන සාර්ථකත්වය. මොකද, ඒක වියදමක් දරන්නේ නැතිව කරන්න පුළුවන් දෙයක්. උදෑසන අවදි වූ විගසම තමන්ගේ කාමරයේ ඉඳගෙන ඒ ව්‍යායාම පෙළ කරන්න. පැය භාගයක් විතර යන්නේ. එතැනින් සිරුරට නම්‍යශීලී බවක් ඇති වෙනවා. ඒ වාගේම විශාල ප්‍රබෝධයක් දවස පුරාම ඇති වෙනවා. මම හිතන්නේ, එදා අපේ පන්තිවලට සහභාගී වුණා අපේ පාසල් දරුවන්ගේ සිට වයස 70, 75 දක්වා වැඩිහිටියෝ. මේක එක දවසක් කරලා මදී. මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් අපේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සඳහා අපේ හොඳ පළපුරුදු දේශීය වෛද්‍යවරු ඉන්නවා. අපේ අමාත්‍යාංශය යටතේ ඉන්නවා. ඒ නිසා ඒ වෛද්‍යවරු ලවා සතියට එක දවසක් හරි ග්‍රාම නිලධාරී මට්ටම් කිහිපයක් එකතු කරලා, මේක දිගටම සතියකට එක වරක් බැගින් පවත්වාගෙන යන්න කියලා යෝජනා කරනවා. ඒ වාගේම මේ මුදල් ප්‍රකාශයේ සඳහන් වෙලා තිබෙනවා මම දැක්කා, ඖෂධ උයන් ව්‍යාපෘතියක් පිළිබඳව. ඒක ඉතාමත්ම හොඳ දෙයක්. විශේෂයෙන්ම ඖෂධ නිෂ්පාදනාගාරයක් මීරිගම ප්‍රදේශයේ ඉදි කරන්න අපි කටයුතු කරලා තිබෙද්දී, අක්කර කාලක පමණ භූමි ප්‍රමාණයක ඒ ඖෂධ නිෂ්පාදන - මොකද, ඖෂධ නිෂ්පාදනාගාරය ඉදි කළාට වැඩක් නැහැ. නිෂ්පාදන ඇති කරවන්නට, ඒ ගම් මට්ටමෙන් ඉඩකඩම් තිබෙන අය ඉන්නවා. අක්කර කාලක පමණ ප්‍රමාණයක අපට ඒ ඖෂධ උයන් සඳහා අවශ්‍යඋපකරණ ලබා දීලා, ඔවුන්ව දිරි ගන්වලා ලබන වසරේ ඒ කටයුත්ත කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම දැක්කා, ගම්පහ ප්‍රදේශයේ පසුගිය දිනක ප්‍රදර්ශනයක් පැවැත්වුවා. විශේෂයෙන්ම අපේ ආසන 13 ම නියෝජනය කරමින්, ප්‍රාදේශීය සභා බෙහෙත් ශාලාවල ඉන්න වෛද්‍යවරු. විශේෂයෙන්ම මමත්, අපේ ගරු සභාපති සුනිල් විජේරත්න මැතිතුමාත් අපි දෙන්නාමුල සිට අග දක්වාම මෙම ප්‍රදර්ශනය නැරඹුවා. ඒකේ ඉතාමත්ම වටිනා කියන දේවල් තිබුණා.අපේ වෛද්‍යවරුන් සතු විශාල දක්ෂතා තිබුණා. ඔවුන්ගේඡ් දක්ෂතාවයන් ඔවුන්ගේ ඒ හැකියාවන් අරගෙන අපි ඒවාවලින් ප්‍රයෝජනයක් ගන්න ඕනෑය කියන එක මට ඒ අවස්ථාවේදී හිතුණා. විශේෂයෙන් ගම් මට්ටමෙන් මේ වාගේ දේවල් කරලා අපේ බෙහෙත් ශාලා වැඩි දියුණු කරලා, මේ කටයුතු කරනවා නම්, තව තවත් අපේ දේශීය වෙදකම වෙත ජනතාව නැඹුරු කරවන්න පුළුවන්. මම දැක්කා, තොටිල්ලගහවත්ත ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා වෛද්‍ය බෙහෙත් ශාලාවේ ආතරයිටිස් සඳහා විශේෂ පත්තුවක් නිර්මාණය කරලා තිබුණා. ඒ වෛද්‍යවරයා. මම හිතන්නේ, ආතරයිටිස් කියන රෝගය සුව කළ නොහැකි රෝගයක් කියලා කිව්වත්, එතුමාට අපත් එක්ක සඳහන් කළා. අපට එහි සාම්පලයකුත් ලබා දුන්නා. ඒ සඳහා පුහුණුව ලත් ඉතාමත් හොඳ වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ වාගේ වෛද්‍යවරු ඉදිරියට අරගෙන,අපි ඔවුන්ගෙන් හැකි ආකාරයෙන්

ප්‍රයෝජන අරගෙන, මේ දේශීය වෛද්‍ය අංශය දියුණු කරන්නට මුදලක් වෙන් කරලා ඒ කටයුතු කරන්න. ඒ වාගේම ලබන වසරේදීත් මේ වාගේ ප්‍රදර්ශනයක් පවත්වලා, ජනතාව අතර පුළුල් අවබෝධයක් ලබා දෙන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

ඒ වාගේම කාන්තා අංශය ගැන කථා කරන කොට,51% ක් අපේ කාන්තා දායකත්වයක්තිබෙනවාය කියලා, ශ්‍රී ලංකාව තුළ නියෝජනය වෙනවාය කියලා කියනවා. නමුත් හැමදාම අමාත්‍යාංශ වැය ශීර්ෂය හරහා අපට ඉතාමත් සොච්චම් මුදලක් තමයි වෙන් කරන්නේ. ඒ කියන්නේ, මිලියන 20 ක පමණ ප්‍රමාණයක් තමයි මේ අවස්ථාවේදී වෙන් වෙලා තිබුණේ.මම හිතනවා, මිලියන 20 ක ප්‍රමාණය වුණත්, අපි හැමදාම යොමු කරන්නේ කාන්තාවන්ගේ ආර්ථිකය සවිබල ගන්වන්න. ඒ සඳහා අපි හැමදාම පාරම්පරිකව කර ගෙන එන දෙයක් තමයි රූපලාවන්‍ය, ඉවුම්පිහුම්, අත්කම් නිර්මාණ, බෑග්, සෙරෙප්පු වාගේ පන්ති පවත්වන එක. මම දකිනවා, වසර ගණනාවක් මේ පන්ති ආදිය කරලා මමත් ලද අත්දැකීම් අනුව මම හිතනවා, ඔවුන් ඒ ක්ෂේත්‍රය එතැනින් නවත්වනවා. එක්කෙනෙක් දෙන්නෙක් පමණක් මේක කර ගෙන යනවා. ඉතිරි කොටසට ඒක කරගෙන ගිහින්, ඒක වෙළඳාම් කර ගන්නට, අලෙවි කර ගන්නට තැනක් නැතිව ඔවුන් එතැනම නවතිනවා. ඉතින් මම අහගෙන මේ ළඟදී සෙරෙප්පු නිෂ්පාදනයකරන්න - ඒගොල්ලෝ ගෙනාපු බඩු තාමත් එහෙම්මම තිබෙනවා. අපට අලෙවි සැලක් සොයා දෙන්න කියන එක ඒ කාන්තාවන්ගෙන් නිතරම යෝජනා ඉදිරිපත් වෙනවා. ඉතින් මම හිතනවා. මේ සඳහා අපේ දිස්ත්‍රික් තුනට එකක් බැගින් ඉස්සෙල්ලාම පොඩියට අලෙවි සැලක් පටන් අරගෙන - මම උදාහරණයක් වශයෙන් කිව්වොත් සුපිරි වෙළඳසැල් තිබුණත් සමූපකාරයට හැමදාම තැනක් තිබෙනවා. ඒ වාගේ අපේ මේ කාන්තාවන්ගේ නිර්මාණ අගය කරලා, යම්කිසි එක් ස්ථානයක අලෙවි සැලක් පවත්වලා, ගම්පහ දිස්ත්‍රික්කය ගත්තාම ගම්පහ එක් ස්ථානයක බස්නාහිර පළාත් අලෙවි සැල වාගේ හොඳ නමක් දාලා, ආකර්ෂණීයත්වයෙන් යුතුව මේ අලෙවි සැල පවත්වන්න. එතැනට ඒ නිෂ්පාදන ගෙනිහිල්ලා දුන්නොත් මම හිතන්නේ, ඒ ජනතාව ඒකට හුරු වෙනවා. ඊට පස්සේ ජනතාවට ඒ පිළිබඳව විශ්වාසයක් ගොඩ නැගෙනවා. මොකද, බස්නාහිර පළාත් සභාව හරහා කරන්නා වූමේ කර්තව්‍යයන්. ඒ වාගේම අපේ කාන්තාවන්ට බඩු අඩු මිලකට දී ගන්න පුළුවන්කමක් වෙනවා. මම හිතනවා,ඒ යෝජනාව මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනවා. හැකි ආකාරයක් තිබෙනවා නම්, සුළුවෙන් හෝ අපි එවැනි අලෙවි සැලක් පටන් ගනිමු. මම අපේ ආසන සංවිධායකතුමිය වන චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියටත් යෝජනා කරලා තිබෙනවා. මොකද, අත්තනගල්ල ආසනයෙන්වත් අපි මේක පටන් ගනිමු කියලා. මොකද, ගිය වසර තුළ මේ වන කොට පන්ති 52 ක් පවත්වලා තිබුණා. ගිය වසරට පමණක්. ඉතින් ඒගොල්ලන්ගේ නිෂ්පාදන එතැනම නතර වෙනවා මිසක්, ඔවුන්ට ඉදිරියට යන්නට අපි කොතරම් ආර්ථිකය සවිලබල ගන්වන්න හැදුවත් ඒක කෙරෙන්නේ නැති නිසා තමයි මම මේ යෝජනාව කරන්නේ.

ඒ වාගේම ඔබතුමාගේ මුදල් ප්‍රකාශයේ සහ අමාත්‍යාංශ ප්‍රකාශනයේ සඳහන් වෙලා තිබෙනවා, කෘෂි බෝග වවන්නට මූලික උපකරණ දෙන 500 දෙනෙකු පුහුණු කරනවාය කියලා. ඉතින් මම හිතනවා, ඒකත් ඉතාමත් හොඳ යෝජනාවක්. මොකද, කාන්තාවන් කෘෂිකර්මය පැත්තට යොමු කළාම ඒ කාන්තාවන්ට පුළුවන් තමන්ට හිමි ඉඩමක ස්වයං රැකියාවක් විධියට අවශ්‍ය බෝග - ඒ වාගේම මූලික උපකරණ ආදිය දීලා ඒවා සූදානම් කරලා දුන්නාම, ඔවුන් ඒවා ඉතාමත්ම හොඳින් පරිහෝජනය කරලා ඒ නිෂ්පාදන කෘෂිකර්මාන්තය දියුණුවට පත් කර ගන්නවා. ඒ ගේම තමන්ගේ ගෙදරටඅවශ්‍ය එළවළු ටික, මිරිස්

[ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

ටික, ඒ වාගේම පලතුරු ටික සූදානම් කර ගන්නත් පුළුවන් වෙනවා. එතැනදීත් මම හිතනවා, අර අලෙවි සැල කියන එක ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියලා. මොකද, එතැනදීත් අපි නිෂ්පාදනය කරන බෝග ටික ඒ අලෙවි සැල වෙත ගෙනිහිල්ලා, පළාතේ ජනතාව ඒ වෙනුවෙන් යොමු කරවන්න හැකියාවක් ඇති වෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ වාගේම තීන්දු තීරණ ගන්න අවස්ථාවේදී ඒ ස්ථානවල කාන්තාවෝ ඉතාමත්ම අඩුයි කියන එක අපේ. ප්‍රකාශයේ සටහන්ව තිබුණා. ඒක මම පිළිගන්නවා. මොකද, ඒ තීන්දු තීරණ ගන්නේ ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල සහ පාර්ලිමේන්තුවේ. ජනගහනය තව තවත් වැඩි කරන්න යම්කිසි ක්‍රමවේදයක් යොදන්න කියලා කියන ගමන් විශේෂයෙන්ම අපට රාජකාරී කටයුතුවලදී විශාල සහයෝගයක් ලබා දෙනවා. ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ගයාන් මහතාත්, ඒ වාගේම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (වැ.බ.) ෆරීඩ් මහතා

ඇතුළු ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම මගේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.52]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම ගැන. මට ඇත්ත වශයෙන්ම ගරු ඔබතුමා හරහා අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාට වචන ස්වල්පයක් කථා කරන්න සිදු වෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. ගරු ඇමතිතුමනි, රටක් හැටියටත් - මම අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන කොට මම කිව්වා, එතුමාගේ අමාත්‍යාංශය තමයි රටක් හැටියටත්, පළාතක් හැටියටත් වැදගත්ම අමාත්‍යාංශය කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය තමයි දෙවැනියාට වැදගත්ම එක. අඩුම ගණනේ මම හිතන විධියට ඒකයි. මොකද, අපි බුද්ධිමත් ජනතාවක් හැදුවාට පස්සේ ඊළඟට වටින්නේ, නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති කිරීම. ගරු සභාපතිතුමනි, ඒ ක්‍රියාවලිය කිරීමේදී මම දන්නවා, අපේ පළාත් රෝහල්වලින් විශාල සේවයක් කරන බව. ඔබතුමාත් සෞඛ්‍ය ඇමතිවරයා හැටියට පුළුවන් උපරිම සේවය ඒ ආයතනවලට ලබා දෙනවා. ඔබතුමාට මම ඒවාවල තිබෙන අඩුපාඩු ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. මොකද, මම හොඳටම දන්නවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය කියන්නේ, හැමදාම බැනුම් අහන්න වෙන ක්ෂේත්‍රයක්. කොයි තරම් හොඳ කළත්, මේක අපේ තිබෙන ආර්ථික මට්ටම ඇතුළේ ගොඩ ගන්නත් බැහැ. ඒ විතරක් නොවෙයි. ඇමරිකාව, එංගලන්තය වාගේ රටවල්වලත් ඒ සෞඛ්‍යඇමතිවරුනුත්, ඒ දේශපාලඥයිනුත් සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තාම පොඩ්ඩක් නොවෙයි, හොඳටම බැනුම් අහනවා. මේක ජනතාව සතුටු කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් නොවෙයි. ඒ නිසා අපි උපරිම වැඩ කරන්න ඕනෑ. තිබෙන රෝගවලට ප්‍රතිකාර ලබා දීම අපි කරන්න ඕනෑ. නමුත් සෞඛ්‍ය ඇමතිතුමනි, අපි රෝගය වැළදෙන්න ඉස්සෙල්ලා ජනතාව දැනුවත් කරලා ඒක මග හරවා ගන්න පුළුවන් නම්අපට ඒ ප්‍රශ්නවලින් ගොඩක් දුරට ගැලවෙන්න පුළුවන් වෙනවා. රෝගය හැදෙන්න ඉස්සෙල්ලා. සෞඛ්‍යඇමතිතුමනි, අද අපේ රටේ ජනතාව කොයි තරම් උගත් වුණත්, බුද්ධිමත් වුණත් සාමාන්‍ය දැනීම කියන එක - විශේෂයෙන්ම තමන්ගේ විෂය පථයෙන් පිට කිසිම දෙයක් උගන්වන්නේ නැතිකම හින්දා, අපේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන දුර්වලකම හින්දා අද අපේ ජනතාව රෝග නිවාරණය, ඒ කියන්නේ රෝගය හැදෙන්න ඉස්සෙල්ලා වළක්වා ගන්නේ කොහොමද කියන එක ගැන තිබෙන දැනුම අපේ ජනතාවට හරියටම අඩුයි. ඒක ඇත්තටම අපි ඉංජිනේරුවරයෙකුගෙන්ඇහුවොත්,ගණකාධිකාරීවරයෙකු ගෙන් ඇහුවොත්ඒගොලලෝ ඇත්තටම මේ රෝග ගැන දන්නේ නැහැ.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම දකින විධියට මේකට තිබෙන විශාලම ප්‍රශ්නය තමයි, අපේ පාසල්වල ලබා දෙන අධ්‍යාපනය හොඳටම මදී. ඉතින් මම හිතනවා. ඔබතුමාට පුළුවන්කම තිබෙනවා නම්, අපේ අධ්‍යාපන ඇමතිතුමා එක්ක එකතු වෙලා හරි ඒක පාසල් මට්ටමට - ඒ විතරක් නොවෙයි. අපේ අඩු ආදායම්ලාභී ජනතාව අතරට ඔබතුමාට ගෙනියන්න පුළුවන් නම්, ඒ කියන්නේ නිවාරණය පිළිබඳ වැඩ සටහන් ටිකක් අපට ගෙනියන්න පුළුවන් නම්, මීට වඩා අපේ ඉස්පිරිතාලවලට එන සංඛ්‍යාව අපට අඩු කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, මම එකක් ගැන විතරක් කථා කළොත් සමාජ රෝග පිළිබඳව අපේ ජනතාවගේ තිබෙන දැනුම ඉතාම අඩුයි. පාසල්වල මේ පිළිබඳව කථා කරන්නේ නැහැ. ලිංගික අධ්‍යාපනය කියන එක දරුවන්ට ලබා දෙනවාට දෙමව්පියොත් කැමැති නැහැ. නමුත් දරුවෝ ගිහිල්ලා මොකක්හරි ලෙඩක් හදා ගත්තාට පස්සේ සමාජයට බණින්න ඒගොල්ලෝ ලැහැස්තියි.

සෞඛ්‍ය ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමන්ලා වගකීමක් දරන, බලයක් තිබෙන ඇමතිවරු හැටියට අපිසමහර වෙලාවට ජනතාව විරුද්ධ වුණත් යම්කිසි තීරණ අපට ගන්න වෙනවා. ඔබතුමාට පුළුවන්කම තිබෙනවා, අපේ වෛද්‍යවරු පාවිච්චි කරලා, ඔබතුමාට තිබෙන සම්පත් පාවිච්චි කරලා පාසල්වලට මේ පිළිබඳ දැනුම අරගෙන යන්න. ඒ වාගේම මම දකින තවත් දෙයක් තමයි, අපි මත්ද්‍රව්‍ය භාවිතය ගැන. මම මේ කියන්නේ, කුඩු විතරක් නොවෙයි. දුම් පානය, මධ්‍යසාර භාවිතය ගැන දැනුවත් කිරීම ගැන විශාල අඩුවක් තිබෙනවා. මොකද, මම මේක හොඳටම දැක්කා. ගරු සභාපතිතුමනි, මගේ පරම්පරාව තමයි මම දැකපු විධියට වැඩිම දුම්පානයට පුරුදු වුණු අන්තිම පරම්පරාව වාගේ. මොකද, අපි ඉස්කෝලේ යන කාලේ ඒ දවස්වල රූපවාහිනියෙනුත්,වැඩ සටහනක් ඒ

**41974198**

වාගේම අපේ පාසල්වලටත් ඇවිල්ලා වැඩ සටහන් කළා. දුම්පානයේත්, මධ්‍යසාර භාවිතයේත්, මත්ද්‍රව්‍ය භාවිතයේත් තිබෙන ආදීනව ගැන. ඇවිල්ලා, ඒ ගැන වැඩ සටහන් කළා. සමහර වෙලාවට පොඩි පොඩි නාට්‍ය ඉස්කෝලවල කළා. නාට්‍ය උළෙලවල් කළා, මේවායේ ආදීනව කියලා දෙන්න. මම ඒක හොඳටම දැක්කා. ගරු සභාපතිතුමනි, මගේ පරම්පරාවට පස්සේ ආපු පරම්පරාව දුම් පානය කියන එකෙන් - මම ඇත්තටම දකිනවා, අන්තිම නරක දෙයක් කියලා. නමුත් ඒකෙන් ගොඩක් අය දුරස් වුණා. මට පස්සේ ආපු පරම්පරාවල කට්ටිය. නමුත් ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම අද ආපහු දකිනවා. මේ තරුණයන් අතරේ, පාසල් දරුවන් අතරේ මේ දුම් පානය, මත්ද්‍රව්‍ය භාවිතය ආපහු වැඩි වී ගෙන එනවා. ඒකට හේතුව හැටියට මම දකින්නේ, පසුගිය වකවානුවල මම දැක්කේ නැහැ ලොකු නිවාරණ වැඩ සටහනක් යනවා. ඒකට මම ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නොවෙයි. ඒක මධ්‍යම රජයෙනුත් කෙරුණේ නැහැ. දැන් මෙවර අයවැයේ අපි දැක්කා, මේ නිවාරණ වැඩ සටහන් කර ගෙන යන්න දුම්කොළ නිෂ්පාදන සමාගම්වලින් මධ්‍යම රජය මිලියන 500 ක් ඉල්ලුවා. ඔබතුමාත් පොඩ්ඩක් උත්සාහ කරලා බැලුවොත් ලබා ගන්න පුළුවන් වේවි. මොකද, ඔය දුම්කොළ සමාගම්වලින් අපටත් කීයක් හරි දෙන්න කියලා ඔබතුමාත් පොඩ්ඩක් ඉල්ලලා බලන්න.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

දුම්පානය මන්ත්‍රීවරුන්ට නම් හොඳම නැහැ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

හොඳම නැහැ. කාටවත් හොඳම නැහැ. ඒක මම දැන දැන තමයි මේ කියන්නේ. ඒකෙන් පහු පරම්පරාව හරි අපට බේරා ගන්න පුළුවන්. අපට විශාල පිරිවැයක් යනවා, මේ පෙනහළු ආශ්‍රිත රෝග හැදෙන ප්‍රතිශතයත් එක්ක. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි පොඩ්ඩක් බලන්න ඕනෑ අපේ පරිසරයත් පොඩ්ඩක් දියුණු කර ගන්න විධිය. ඒ කියන්නේ, අපේ පාරවල්වල දුවන වාහනවලිනුත් ශ්වසන ආබාධ එනවා. ඒ වාගේම අපි තවත් දෙයක් පුරුදු කරන්න උත්සාහ කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අද අපි සනීපාරක්ෂාව ගැන, එහෙම නැත්නම් හරියට වැසිකිළියක් පාවිච්චි කිරීම ගැන අපේ ජනතාවගෙන් 85% කට 90% කට වාගේ ඇත්තටම වැටහීමක් නැහැ. මොකද, මේවා අපි පාසල්වල කියලා දෙන්නේ නැහැ. මම පොඩි උදාහරණයක් හැටියට ගන්නවා. ජපානයේ පාසලක් ගත්තොත් කිසිම පාසලක පිරිසිදු කරන්නන් කියලා කෙනෙක් නැහැ. පන්ති කාමරය අතු ගාන්න හරි, එහෙම නැත්නම් ඒ පාසලේ වැසිකිළිය සුද්ධ කරන්නවත් පිටස්තර පුද්ගලයින්ව යොදවලා නැහැ. ඒක දරුවෝම එකතු වෙලා කරනවා. මොකද, ඒගොල්ලන්ගේ විෂය පථයට එකතු කරලා තිබෙනවා, පිරිසිදුව ජීවත් වෙන්නේ කොහොමද? වැසිකිළියට ගියාම වැසිකිළිය පාවිච්චි කරන්නේ කොහොමද? ඊට පස්සේ ඒක ඊළඟ පුද්ගලයාට පාවිච්චි කරන්න පුළුවන් විධියට තියලා එන්නේ කොහොමද කියන එක ගැන ඒ ගුණධර්ම කියලා දෙනවා. එතකොට ගෙවල්වල ඒ දේවල් තිබුණේ නැති වුණත් පාසලෙන් ඒ කියන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා අපට පාසල්වල වැඩ සටහනක් කරන්න පුළුවන්. පාසලේ අපි කියලා දුන්නොත්, වැසිකිළියක් පාවිච්චි කරන්නේ මෙහෙමයි. තමන් ඉන්න තැන පිරිසිදුව තියා ගන්නේ මෙහෙමයි. එහෙම නැති පුද්ගලයා සමාජයටත් තමන්ටත් කර ගන්නා හානිය, අපි ඒ දරුවන්ට පෙන්වා දුන්නොත්, සමහර වෙලාවට ඒගොල්ලෝ ගෙදර ගිහිල්ලා අම්මා තාත්තා හරි කරන වැරැද්දක් හරි පෙන්වලා දෙයි. අම්මේ, තාත්තේ, අපට ඉස්කෝලේදී කියලා දුන්නා, මේක මේ විධියට කරන්න එපාය කියලා. වැසිකිළිය පිරිසිදුව තියා ගන්න. තමන්ගේ වට පිටාව පිරිසිදුව තියා ගන්න.
[ගරු අනුරාධ විමලරත්න]

පාසල්වල ඒක නොකර ඉන්න එකෙන් පිටස්තර පුද්ගලයන් පිරිසිදු කිරීමට භාවිතා නොකරන එකෙන් ඒගොල්ලෝ පාවිච්චි කරන්නේ දරුවන්ට ඒ රැකියාවේ තිබෙන වටිනාකම කියලා දෙන්න වාගේම තමන් ඉන්න පරිසරයත් පිරිසිදුව තියා ගන්නයි. මොකද, මදුරුවෝ බෝ වන එක වාගේම ගොඩක් රෝග අපේ අපිරිසිදුකම නිසාම සිද්ධ වෙනවාය කියන එකත් අපි කියන්න ඕනෑ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, මම පොඩි අදහසක් දෙනවා. මේක අපට කරන්න පුළුවන්ද බැරිද කියලා මම හරියටම කියන්න දන්නේ නැහැ. නමුත් අපට වැඩිපුර ආදායම් මාර්ගයක් ගේන්නත්, ඒ වාගේම අපේ ඉන්න ජනතාවට - ඇත්තටම සෞඛ්‍ය ක්ෂේත්‍රය, අද විශාල ඉල්ලුමක් තිබෙන ක්ෂේත්‍රයක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වෛද්‍යවරුන්ට වැඩිය අද ලෝකයේ හෙද සේවයට, ඇටෙන්ඩන් සේවයට විශාල ඉල්ලුමක් තිබෙනවා.

අපට පුළුවන්කමක් තිබෙනවා. ඔබතුමාගේ දැනුම හැටියට ඔබතුමා බලන්න කරන්න පුළුවන්ද බැරිද කියලා. අපේ පළාත් රෝහල් හරහා මොකක් හරි public private partnership එකක් හරහා හරි, එහෙම නැත්නම් අපට තනිවම කරන්න පුළුවන් නම් ඒත් කමක් නැහැ. හෙද සේවය පිළිබඳ දැනුමක්, ඇටෙන්ඩන් සේවය පිළිබඳ දැනුමක් ලබා දෙන පොඩි ඉස්කෝලයක් හරි, හැම රෝහලකම විසි දෙනෙකු අවුරුද්දට පුහුණු කරන ක්‍රමයක් වාගේ ගේන්න පුළුවන් නම්, ඒක අපේ හෙද සේවයටත්, ඒ විතරක් නොවෙයි අපේ ශ්‍රම බලකායටත් විශාල දෙයක් ඒකෙන් කර ගන්න පුළුවන් කියලා මම හිතනවා. ඒක ඔබතුමා අදහසක් හැටියට ගන්න. කරන්න පුළුවන්ද බැරිද කියලා බලන්න. ප්‍රයිවට් කම්පැනියක් එක්ක එකතු වෙලා හරි. අපට රෝගීන් ඉන්නවා. හෙද සේවය තිබෙනවා. එතකොට අපට voluntary staff එකක් හැටියට දාන්න පුළුවන්, ඒගොල්ලන්ගේ training period එක. ඒ ජනතාවටත් විශාල වටිනාකමක් එනවා.

ඒ වාගේම අපි ළමා ආරක්ෂාව ගැන කථා කරන්න ඕනෑ. ඒ ගැන නම් මම සතුටු වෙනවා. මොකද, ළමා ආරක්ෂාව පිළිබඳව ඔබතුමාගේ ඉන්න නිලධාරීන් දෙපළ ඇත්තටම හොඳ විශාල සේවයක් කරනවා. නමුත් අපි මීට වඩා ළමයින්ගේ ආරක්ෂාව ගැන හිතන්න ඕනෑ. ඒ වාගේම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පිළිබඳවත් - මම දන්නවා, අපේ නිලධාරිනියන් දෙදෙනාගේ උනන්දුවත් එක්ක හොඳ වැඩ සටහනක් කරනවා. මොකද, අපි තවම මේ විශේෂ අවශ්‍යතා තිබෙන දරුවන් හඳුනා ගන්නත්, ඒගොල්ලන්ට අවශ්‍ය කරන ශක්තිය ලබා දීලා - මොකද, ඒගොල්ලන්ට ඉගෙන ගන්න බැරි වෙන්න පුළුවන්. නමුත් වෙනත් සැඟවුණු කුසලතා ඒගොල්ලන්ගේ තිබෙනවා. ඒගොල්ලන්ව අපි ශ්‍රම බලකායෙන් අයින් කරලා, අපි සමාජයට බරක් කර ගන්න අවශ්‍ය නැහැ. මොකද, පිටරටවල්වල ඒගොල්ලන්වත් ආර්ථිකයට දායක කර ගන්න ක්‍රම හදලා තිබෙනවා. ඒක කරලා තිබෙන්නේ ඒගොල්ලන්ට හරියන අධ්‍යාපන ක්‍රමයක් තුළින්. ඒ ගැනත් බලන්න.

ඒ වාගේම දෙමව්පියන්ට දරුවන් ලබා දීම. Adaption. දරුවන් නැති දෙමව්පියන්ට දරුවන් ලබා දීම, අද රටේ තිබෙන්නේ හරිම අමාරුම ක්‍රමයක්. ඒ කියන්නේ, ඒගොල්ලෝ පනින්න ඕනෑ ගොඩක් පිම්මවල් තිබෙනවා. ඒකේ හරි පැත්තකුත් තිබෙනවා. වැරදි පැත්තකුත් තිබෙනවා. මොකද, දරුවන් අපචාරයට, වැරදි මාර්ගයට, වැරදි අවශ්‍යතාවයන්වලට යොමු වීම අඩු වෙනවා වාගේම දරුවන්ට හොඳ අවස්ථාවක් ලැබෙන, හොඳ දෙමව්පියන් ළඟට යන්න තිබෙන අවස්ථාවත් ඒකෙන් ඇකිලිලා තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, මේ ගැනත් පොඩ්ඩක් බලන්න. මේක මීට වඩා ලෙහෙසි කරලා,ඒ කියන්නේ නියම ක්‍රමය හරියට කෙරුණත් මීට වඩා ඉක්මණට දරුවන් පවුල්වලට ලබා දීලා, ඒ දෙමව්පියන්ගේ යහපත පිණිස වැඩ කිරීම ගැනත් අපි පොඩ්ඩක් බලමු.

මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා ඉතාමත්ම වැදගත් දෙයක් ගැනත් මම ඔබතුමාට කියන්න ඕනෑ. අපේ කාන්තාවන් පිළිබඳ විෂයයත් ඔබතුමාට තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අපි කාන්තාවන් ශ්‍රම බලකායට එකතු කර ගැනීම අපේ රටේ ඉතාම අඩුවෙන් සිද්ධ වෙන්නේ. මොකද, අපේ තිබෙන විශේෂම සම්පතක් අපි භාවිතා කරන්නේ නැතිව යනවා. 52% කට වඩා වැඩි ප්‍රමාණයක් මේ රටේ ඉන්නේ කාන්තාවන්. නමුත් ඒගොල්ලෝ ගොඩක් වෙලාවට එක්කෝ ගෙදර වැඩ කරනවා. එහෙම නැත්නම් අපි ගෘහ සේවිකාවන් හැටියට පිටරට පටවනවා. මේකට හේතු වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි, අපේ රටේ තිබෙනවා මේ කාන්තාවන්ට කරන්න බැරි දේවල් කියලා. කරන්න බැරි රස්සාවල් කියලා යම් මානසිකත්වයක්. ඔය මානසිකත්වය වෙනස් කරන්නජනතාවත්, ඒ වාගේම සමාජයත් දැනුවත් කිරීමේ වැඩ සටහනකට අපි යන්න ඕනෑ. මොකද, පිටරටවල්වල තිබෙනවා මැකැනික් ජොබ් එකද, මේසන් වැඩද, බැකෝ එක එළවන එක ද, එහෙම නැත්නම් පොලිස් සේවය ද ඒ වාගේ පිරිමි විතරක් කරනවාය කියන ගැරේජ් මැකැනික්, වෙල්ඩින් ඒ හැම දේම කාන්තාවනුත් හරි හරියට කරනවා. අපේ සමාජයේ තිබෙන්නේ, මේ කාන්තාවන්ට බැහැ. මේක කාන්තාවන්ට අමාරුයි කියන ඒ මතයෙන් අපි වෙනස් වෙන්න ඕනෑ. ඒක හරහා අපි බලන්නේ -අපට ශ්‍රම බලකායට එකතු කර ගන්න පුළුවන් 52% ක් අපි අපතේ යවනවා. ඒ නිසා අපට පුළුවන් නම් පාසල්වල ඉඳන් හරි, අපේ සමාජවලට ගිහිල්ලා හරි අපේ කාන්තාවන් අපේ තරුණ දූ දරුවන්, ගැහැණු ළමයින් ටික ශක්තිමත් කරන්න පුළුවන් නම්, ඒගොල්ලන්ගේ මනසට කා වද්දන්න පුළුවන් නම්, ඕගොල්ලන්ට බැරි දෙයක් නැහැ. පිරිමින්ට කරන්න පුළුවන් ඕනෑ දෙයක් ඕගොල්ලන්ට සමහර වෙලාවට ඊටත් වඩා හොඳට කරන්න පුළුවන් කියන එක ඒගොල්ලන්ට කා

**41974198**

වද්දන්න පුළුවන් නම් මම හිතනවා, අපට මීට වැඩිය ඒ කාන්තාවන්ගෙන් අපේ ආර්ථිකයටත්, අපේ සමාජයටත් මීට වඩා විශාල දායකත්වයක් - අද විශාල දායකත්වයක් ලැබෙනවා. ඊට වඩා දායකත්වයක් අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තුවක් නැහැ. ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉවසීමෙන් මට අවස්ථාව ලබා දීම පිළිබඳව. අසා සිටි මගේ සහෝදර මන්ත්‍රීවරුන්ටත් බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම ගරු සභාව දිවා ආහාර විවේකය සඳහා ප.ව. 2.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.00 ට යළිත් රැස් විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 2.00 p.m.*

[අ.භා. 02.02]

**ගරු ඩී.ඩබ්ලිව්.සී. පුෂ්පකුමාර ද සිල්වා**
Hon. D.W.C. Pushpakumara De Silva

ගරු සභාපතිතුමනි, 2017 අයවැය විවාදයේදී සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ සහෝදර සියලුම මන්ත්‍රීවරු මෙම අමාත්‍යාංශය යටතේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරියේදී තම අමාත්‍යාංශය සාර්ථකව කර ගන්නට විශේෂ අදහස් ලබා දුන්නා. මීනුවන්ගොඩ ආසනය නියෝජනය කරන කෙනෙක් හැටියට මම විශේෂ කාරණා කථා කරන්න යන්නේ නැහැ. නමුත් මේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ මීනුවන්ගොඩ ආසනයේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් ගැනයි මම කථා කරන්න යන්නේ. මේ මීනුවන්ගොඩ ආසනයේ රෝහල - මම හිතන්නේ, මූලික රෝහලක් හැටියට 2014 ජූලි මාසේ 17 වැනිදා එවකට හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා, හිටපු ප්‍රධාන අමාත්‍යප්‍රසන්න රණතුංග මැතිතුමාගේ ආරාධනයෙන්, එතුමන්ලා සම්බන්ධ වෙලා, මධ්‍යම ආණ්ඩුවේ නිසි අවසරයක් නොමැතිව එදා බෝඩ් ලැල්ලකට පමණක් සීමා වන පරිදි මේ රෝහල මූලික රෝහලක් හැටියට ස්ථාපිත කළා.

නමුත් ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මීට පෙරත් මේ ගැන සඳහන් කරලා තිබෙනවා. මේ රෝහල තමයි රාගම, මීගමුව, ඒ වාගේම ගම්පහ රෝහල් හැර ඒ ප්‍රදේශයේ සියලුම දුප්පත් ජනතාවට ප්‍රතිකාර ලබා ගන්න තිබෙන එකම රෝහල. මම හිතන්නේ, ජනතා මුදල් විශාලවශයෙන් නාස්ති කරලා මේ රෝහල ප්‍රතිසංස්කරණය කළා. මේ රෝහලේ විදුලි උත්පාදක යන්ත්‍රයක් තිබෙනවා. මම හිතන්නේ ඒක කෝටි ගණනක් වටිනවා. මේක අද තෙමෙමින් පවතිනවා. ඒ වාගේම කෝටි ගණනක් වියදම් කරලා ශල්‍යාගාරයක් ඉදි කළා. ගරු අමාත්‍යතුමනි, මේ වන තුරු මේ කිසිම දෙයකින් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. මම ඔබතුමාව දැනුවත් කළේ ඒකයි. මේ රෝහල දිවුලපිටිය, කටාන, මීනුවන්ගොඩ මේ ආසනවල ඒ ප්‍රදේශවලවිශේෂයෙන්ම බොහොම දුප්පත් ජනතාවක් ජීවත් වෙන්නේ. මේ අයට විශාල වශයෙන් සහන සලසන්න පුළුවන් එකම රෝහල තමයි මේ මීනුවන්ගොඩ රෝහල. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, එදා හිටපු අපේ සෞඛ්‍ය ඇමතිතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ රෝහල තුළ කාපට් කරලා, සුදු ඉරි ටිකක් ගහලා, බෝඩ් එකක් ගහලා මේක මූලික රෝහලක් බවට පත් කළා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව කාරුණික අවධානය යොමු කරන්න. මේ මුදල් ජනතාවගේ මුදල්. ඒ නිසා මේවා නිකරුනේ නාස්ති වෙන්න දෙන්නේ නැතිව තමුන්නාන්සේගේ අවධානය යොමු කරලා, මේවා නිසි පරිදි ඒ ජනතාවට සේවයක් වන විධියට සලසලා දෙන්න.

[ගරු ඩී.ඩබ්ලිව්.සී. පුෂ්පකුමාර ද සිල්වා]

ඒ වාගේම තමයි මේ රෝහලේ ප්‍රධාන පරිපාලන වෛද්‍යවරයා ඉතාමත්ම අකාර්යක්ෂම විධියට තමයි වැඩ කරන්නේ. එතුමා බොහොම දුර්වල වෛද්‍යවරයෙක්. එතුමාගේ ඒ අවිධිමත් පරිපාලනය තමයි, අද මේ රෝහලේ මේ තත්ත්වය උද්ගත වෙන්න පළමුවැනිම හේතුව. ඒ වාගේම තමයි, මේ මීනුවන්ගොඩ රෝහලට ශල්‍යවෛද්‍යවරයෙකු, ඒ වාගේම ප්‍රසව හා නාරි වෛද්‍යවරයෙකු සහ ඊට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා දෙන්න පුළුවන් නම්, ඔබතුමාට මම ඉස්සෙල්ලා ප්‍රකාශ කළා වාගේ ඒ සියලු දේවල් නාස්ති වෙන්නේ නැතිව, ඒවාවලින් උපරිම ප්‍රයෝජන ගන්න පුළුවන් රෝහලක් බවට පත් කර ගන්නට පුළුවන්. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. ඒ රෝහලේ තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය අරගෙන එය මූලික රෝහලක් බවට

පරිවර්තනය කරලා, ජනතාවට සේවය කරන්න පුළුවන් තැනක් බවට පත් කරන්නය කියලා.

ඒ වාගේම තමයි ගම්පහ දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝගය ගැන කථා කරනවා නම් ගරු ඇමතිතුමනි, මීනුවන්ගොඩ ආසනයේ දවස් කිහිපයකට පෙර අවුරුදු ඩෙංගු රෝගයෙන් 36 ක තිදරු මවක් මිය ගියා. එතුමියගේ දරුවන් තිදෙනාමත් ඩෙංගු රෝගයෙන් පෙළෙනවා. මේ වන කොට ඒ ආශ්‍රිතව ඩෙංගු රෝගීන් 100 කට අධික ප්‍රමාණයක් සිටින බව දැන ගන්නට ලැබිලා තිබෙනවා. මේ සියලු දේ සම්බන්ධයෙන් මම හිතනවා, ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතන, එහෙම නැත්නම් පොලීසිය සහ MOH එක එකතු වෙලා යම්කිසි ක්‍රියාමාර්ග ගන්නවා. මේ හැම දෙයක්ම අපි කියන්නේ, අර පෙරහැර ගියාට පසු අලි බෙටි අහුලනවා වාගේ, ඒ දේ සිද්ධ වුණාට පස්සේ මේ දේවල් ක්‍රියාත්මක කරලා වැඩක් නැහැ. එක එක්කෙනාට නඩු පවරලා වැඩක් නැහැ. මේවා ක්‍රමවේදයක් තුළ,MOH එක හරහා හෝ ඒ පළාත් පාලන ආයතන හරහා හෝ එහෙම නැත්නම් මේ පොලීසියත් මැදිහත් වෙලා ක්‍රමවත් විධියට මේ රෝගකාරී තත්ත්වයෙන් මිදෙන්නේ කොහොමද කියන එක පිළිබඳව ජනතාව දැනුවත් වන වැඩ සටහනක් ඔබතුමාගේ සෞඛ්‍යඅමාත්‍යාංශය හරහා ඉදිරි අවුරුද්ද තුළ ක්‍රියාත්මක කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මොකද, ගරු ඇමතිතුමනි අපි අද මේ විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට වාඩි වෙලා ඔබතුමන්ලාව මේ ස්ථානයට ගේන්නට ඔය ඇමති පුටුවේ වාඩි කරවන්න අපි බොහොම උත්සාහ කරපු මිනිස්සු හැටියට අද මීනුවන්ගොඩ ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමාට ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් ගිලන් රථ රියදුරු රැකියාවන් පහක් ලැබිලා තිබෙනවා. ඒ ආසනයේ මන්ත්‍රීවරු හැටියට අපට අද කනගාටුයි ගරු සභාපතිතුමනි. තමුන්නාන්සේලාගේ ඔය බෙදන හැන්ද, ඇමතිවරුන්ගේ බෙදන හැන්ද අපේ පැත්තටත් යොමු කරන්න.මොකද, මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුනුත් - තමුන්නාන්සේලා කැමැති නැද්ද දන්නේ නැහැ. ඊළඟ පළාත් සභාවේදීත් මේ විධියට තමුන්නාන්සේලාත් එක්ක වාඩි වෙලා කටයුතු කරන්න අපට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා මේ සියලු ඇමතිවරුන්ට කාරුණික හදවත් පහළ වෙන්නය කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, එම ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාව ඉතාමත් බරපතළ කාරණාවක්. මීනුවන්ගොඩ ප්‍රදේශයේ ඩෙංගු ප්‍රශ්නය. මමත් දැක්කා. මටත් ආරංචි වුණා. ඒ නිසා ඔබතුමා වහාම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඉන්නවා. එතුමාට දැන්මම නියෝගයක් දෙන්න මේ ගැන සොයා බලන්න කියලා. මීනුවන්ගොඩ ආසනයේ එක ප්‍රදේශයක් තිබෙනවා. ඒ නිසා ඒක පස්සට දාන්න එපා. පුළුවන් නම් අදම ක්‍රියාත්මක කරන්න. එතුමාටත් මේ ප්‍රකාශය ඇහෙන්න ඇති. එතුමා කියපු කථාවත්, මගේ කථාවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාට ඇහෙන්න ඇති. ඒ නිසා කරුණාකර කඩිනම් පියවරක් ගන්න. මීළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 02.10]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මුලින්ම ස්තුතිවන්ත වෙනවා ඔබතුමාට මෙන්ම අමාත්‍යතුමාට, බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. අපි විශ්වාස කරනවා. රටේ මිනිස්සු ජීවිතයේ ඉපදිලා ඉගෙන ගන්නවා වාගේම වඩාත්ම වැදගත් දේ හැටියට තමයි අපි සෞඛ්‍ය සලකන්නේ. ඒ නිසා සෞඛ්‍යවඩාත් ශක්තිමත් වෙලා, ජනතාවට වඩාත් පුළුල් සේවාවක් කරන්න පුළුවන් වන ආයතනයක් හැටියට පවතින්න ඕනෑය කියන එකයි අපි විශේෂයෙන්ම විශ්වාස කරන්නේ. සෞඛ්‍ය ගැන කථා කරන කොට, අපි පළාත් සභාව හැටියට වුණත් ජනතාව බලන්නේ නැහැ මේක පළාත් සභාවේ රෝහලක්ද? එහෙම නැත්නම් මහ ආණ්ඩුවේ රෝහලක්ද? කියලා. මේ රෝහල්වලින් ජනතාවට නිසි සේවයක් වෙනවාද? අවශ්‍ය බෙහෙත් ටික ලැබෙනවාද? එහෙම නැත්නම් වෛද්‍ය පහසුකම් ටික ලැබෙනවාද කියන කාරණාවේදී ජනතාව බලන්නේ නැහැ, මහ ආණ්ඩුවෙන් මේක වුණාය. එහෙම නැත්නම් පළාත් සභා රෝහලකින් මේ අඩුපාඩුව සිද්ධ වුණාය කියලා

ජනතාව එහෙම බලන්නේ නැහැ. වැරැද්දක් වුණොත් කෙළින්ම රජයටත්, හොඳක් වුණොත් ඒත් රජයටත් තමයි මිනිස්සු ඇඟිල්ල දික් කරන්න පුරුදු වෙලා තිබෙන්නේ.

ඒ නිසා අපි විශ්වාස කරනවා, අපේ පළාත් සෞඛ්‍යඅමාත්‍යාංශයේ කටයුතු කිරීමේදී විශේෂයෙන්ම මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකට එකතු වෙලා කටයුතු කිරීම වඩාත් ඥානාන්විත වෙනවාය කියන එකයි අපි විශ්වාස කරන්නේ. මොකද, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා, රාජිත සේනාරත්න මැතිතුමාත් මේ ප්‍රතිපත්තිය මූලික වශයෙන්ම පිළිඅරගෙන සෞඛ්‍ය කියන එක මධ්‍යම ආණ්ඩුවේද පළාත් සභාවේද කියලා වෙන් කරන්න උවමනාවක් නැහැයි කියන ප්‍රතිපත්තියේ ඉඳලා, අපේ පළාත් රෝහල් දියුණු කරන්න විශාල වශයෙන් ප්‍රතිපාදන පසුගිය අවුරුද්ද තුළ ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේ බොහෝ වැඩ කොටස් දැනට ආරම්භ වෙලා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මම ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය ගැන වැඩි තොරතුරක් කියන්න නොදැන ගත්තත් මම දන්නවා, නාගොඩ මහ රෝහල නෙදර්ලන්ත ආධාරයක් යටතේ දස ලක්ෂ හත්දාහකට වැඩි මුදලක් වියදම් කරලා අලුත් ළමා රෝහලක් ආරම්භ කරන්න සූදානම් කරලා තිබෙනවා. ලේඩි රිජ්වේ රෝහලට දෙවෙනි නොවන ආකාරයට. ගරු සභාපතිතුමනි, අපේ ජගත් අංගගේ මැතිතුමා කටයුතු කරන පානදුර රෝහල, දස ලක්ෂ දහ දාහකට වැඩි මුදලක් ජර්මන් ආධාරයක් යටතේ අලුත්ම රෝහලක් හැටියට කටයුතු කරන්න සූදානම් කරලා තිබෙනවා. මම නියෝජනය කරන පිඹුර රෝහල මූලික රෝහලක් හැටියට දියුණු කරන්න, දස ලක්ෂ දෙදාහක විතර මුදලක් ඉල්ලා සිටියා. ඒකෙන් ගිය අවුරුද්දේ වැඩ කරන්න පුළුවන්කම තිබුණේ, දස ලක්ෂ පන්සියයක විතරයි. ඒ ඉංජිනේරු වාර්තාවලට අනුව. ඒ මුළු මුදලම ලබා දුන්නා,මේ අවුරුද්දේ ඉතිරි මුදල ලබා දෙන පදනම මත. මීගහතැන්න, ඉත්තැපාන, බදුරලිය, බුලත්සිංහල, හොරණ මේ සියලු රෝහල්වලට අඩුම වශයෙන් රුපියල් බිලියන දෙකකට වැඩි මුදලක් මධ්‍යම ආණ්ඩුවෙන් පසුගිය අවුරුද්දේ කළුතර දිස්ත්‍රික්කයට පමණක් ලැබිලා තිබෙනවා. දැන් බස්නාහිර පළාත් සභාව හැටියට බිලියන 09 ක් අපේ මුදල් අඩු වෙලා තිබෙනවා කිව්වත්, බිලියන 03 ක් විතර ප්‍රාග්ධන මුදල් අඩු වෙලා තිබෙනවා කිව්වත්, මේවායේ ප්‍රාග්ධන වියදම බිලියන දෙකක් විතරම මේ මධ්‍යම ආණ්ඩුවෙන් පසුගිය අවුරුද්ද තුළ සහ මේ අවුරුද්ද තුළ ලැබෙමින් පවතිනවා. ඒක නිසා මම කියන්නේ, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ සෞඛ්‍යයෙන් ලැබෙන සහයෝගය විශේෂයෙන්ම අපේ ග්‍රාමීය රෝහල්, අපේ පළාත් රෝහල් දියුණු කර ගන්න විශාල ශක්තියක් වෙනවා. මේ කටයුතු අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා සෞඛ්‍ය ඇමැතිතුමා ඉන්න කාලයේ ආරම්භ වුණා. අද අපේසුමිත් ලාල් මැන්දිස් මැතිතුමා -මම දන්නවා. එතුමා ඉතා කිට්ටුවෙන් මධ්‍යම ආණ්ඩුවේ ඇමැතිවරයාත් එක්ක එකට කටයුතු කරමින්, අද අපේ ප්‍රදේශයේ රෝහල් දියුණු කරන්න විශාල උනන්දුවකින් ක්‍රියා කරන නිසා මම හිතනවා මධ්‍යම ආණ්ඩුවත් එක්ක සහයෝගයෙන් වැඩ කිරීම නිසා අපට විශාල වශයෙන් ප්‍රතිපාදන ලබා ගෙන අපේ ප්‍රදේශයේ සෞඛ්‍ය දියුණු කරන්න ඒක එක හේතුවක් වෙනවා කියලා. බටහිර සෞඛ්‍යය විතරක් නොවෙයි. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන, ග්‍රාමීය රෝහල් මේ සියල්ලක් දියුණු කිරීමට විශාල වශයෙන් ප්‍රතිපාදන මුදල් ලැබිලා තිබෙනවයි කියන එක අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ වෙනුවෙන් අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා විශේෂයෙන් ක්‍රියාකාරී වෙලා කටයුතු කිරීම පිළිබඳව එතුමාටත් විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්පහට නැද්ද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම දන්න තරමට මීගමුවට, ඒ වාගේම අනික් රෝහල්වලට මුදල් ලැබිලා තිබෙනවා. මම ඒවා ගැන එකින් එක දන්නේ නැහැ. ඇමැතිතුමාගේ පිළිතුරු කථාවේදී ගරු ඇමැතිතුමා පැහැදිලි කරන කොට මම හිතනවා ඒ ගැන පැහැදිලි කිරීමක් කරයි. මම දන්නේ කළුතර දිස්ත්‍රික්කය ගැන විතරයි.

ඒ වාගේම අපි කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණු දෙයක් තමයි සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය මේ රටේ ක්‍රියාත්මක කරන්නය කියන එක. යහපාලන ආණ්ඩුවක් හැදෙන්න යන වෙලාවේ මූලික ඉල්ලීමක් සහ මූලික බලාපොරොත්තුවක් හැටියට තිබුණොත් සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන එක. සියල්ල අංගසම්පූර්ණ වෙලයි කියලාමම කියන්නේ නැහැ . නමුත් පැහැදිලිවමඅත්‍යාවශ්‍යම බෙහෙත් ද්‍රව්‍ය 48 ක විතර

මිල බැහැලා තිබෙනවා. මිනිස්සු එදිනෙදා ගන්න බෙහෙත්වල මිල බැහැලා තිබෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත් පැනඩෝල් පෙත්ත රුපියල් 35 කට තිබුණු ඒ කාඩ් එක, අද රුපියල් 15 කට බැහැලා තිබෙනවා. ඒක නිසා මම හිතනවා, මේ ප්‍රතිපත්තිය යටපත් කරන්න නොවෙයි. මේකේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. තව දියුණු කරන්න පුළුවන් වෙයි. නමුත් අපේ වාගේ රටක දීර්ඝ කාලයකට පසුව ආරම්භ වුණු මේ දේ ආරක්ෂා කර ගන්න සහ ශක්තිමක් කරන්න අපි කටයුතු කරන්න ඕනෑය කියන එකයි විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම එතුමාගේ අමාත්‍යාංශය යටතේම තමයි කාන්තා කටයුතු අමාත්‍යාංශය තිබෙන්නේ. මේ රටේ 52% ක් වාගේ කාන්තාවන් තමයි ඉන්නේ.අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා, මේ කාන්තාවන්ගේ ආදායම් මට්ටම දියුණු කරන්න. ඒ සඳහා කාන්තාවන් වෙනුවෙන් විශේෂ වැඩ සටහනක් ග්‍රාමීය මට්ටමෙන්, පළාත් මට්ටමෙන් ආරම්භ කරන්න අමාත්‍යාංශය කටයුතු කරාවී. එතුමා ගිය අවුරුද්දේ ප්‍රතිපාදන මුදල් වෙන් කරලා තිබුණා, කාන්තාවන් වෙනුවෙන් ස්වයං රැකියා වැඩ සටහන් ආරම්භ කරන්න. අද කුමන සමිතියක්, කුමන දෙයක් තිබුණත් විශාල වශයෙන් කාන්තාවන් තමයි ඉදිරිපත් වන්නේ. ඒක නිසා පවුලේ ආදායම ශක්තිමත් කරන්න විශේෂයෙන්ම කාන්තා සුභසාධනය වෙනුවෙන් තවදුරටත් මීට වැඩිය බරක් යොදවලා කටයුතු කරයි කියන එක අපි විශේෂයෙන්ම විශ්වාස කරනවා.

ඒ වාගේම බෝනොවන රෝග අද විශාල ගැටලුවක් හැටියට ඉදිරිපත් වුණා. ඒ විතරක් නොවෙයි, අද සමාජ රෝග පැත්තෙනුත් අවධානය යොමු කරන්න ඕනෑ තැනකට ඇවිල්ලා තිබෙනවා. HIV වෛරස. මම හිතනවා, පසුගිය කාල පරිච්ඡේදය තුළ ලංකාවේ ඒ පිළිබඳව රෝගීන් එන්න එන්න වැඩි වෙලයි තිබෙන්නේ. අඩුවීමක් නැහැ. වැඩි වීමක් තිබෙන්නේ. ඒක විශාල වශයෙන් හේතු වෙලා තිබෙන්නේ, දැනගන්න තිබෙන තොරතුරු අනුව, වෛද්‍ය ආශ්‍රිත තොරතුරු අනුව සමලිංගික සිද්ධීන් තමයි වඩාත් බලපාලා තිබෙන්නේ. ඒක නිසා එවැනි රෝගවලට පෙළඹෙන්න තිබෙන ඉඩකඩ වළක්වන්න මිනිස්සුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් විශේෂයෙන්ම ආරම්භ කරගෙන යනවා. දැන් බටහිර රටක මේක ගත්තොත් එහෙම, බටහිර රටක මේ සිද්ධීන් වෙනවාය කියන එක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. නමුත් මේවායෙන් ආරක්ෂා වෙන්න තිබෙන ඉඩකඩ වඩාත් ශක්තිමත් කරනවා. මොකද, ඒක තමයි ආණ්ඩුවකට කරන්න පුළුවන් පහසුම කාර්යය බවට පත් වෙන්නේ. ඒක නිසා මම විශ්වාස කරනවා. අපිත් එවැනි වැඩ සටහන්වලට යන්න අවශ්‍ය වෙනවා.

ඒ වාගේම තමයි ළමා හිමිකම් වැනි කාරණා. ළමයින්ව හිංසනයට පත්වීම. කාන්තාවන් හිංසනයට පත් වීම පිළිබඳව නීතියේ යම් යම් බලපෑම් කරන්න පුළුවන්. නීතියෙන් උසාවියට ගේන්න පුළුවන්. නමුත් නීතියෙන් උසාවියට ගෙනෙන කොට වෙන්න තිබුණු බොහෝ දේවල් සිද්ධ වෙලා හමාරයි. ඒක නිසා අපි හිතනවා මේ සඳහා අපි වඩාත් වැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. කොහොමද ගමට ගිහිල්ලා මිනිසුන්ව දැනුවත් කරන්නේ?ඒ සඳහාප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රජා සේවා කටයුතු කරයි කියලා විශ්වාස කරනවා. අවසාන වශයෙන් අපි වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. වෛද්‍යවරුන් තමන් වෙනුවෙන් රෝගීන් පහුරක් හැටියට තබාගෙන, විශේෂයෙන්ම පටු දේශපාලන උවමනාවන් ඉෂ්ට කර ගන්න කොටස් බවට පත් වෙන්නේ නැතිව ජනතාවට වඩාත් සේවයක් කරන කොටසක් හැටියට කටයුතු කරන්න වෛද්‍යවරු ක්‍රියා කරයි කියන එකත් බලාපොරොත්තු වෙමින්, ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මූලාසනයේ වාඩි වෙන්න මූලාසන මණ්ඩලයේ සභාපති නාමාවලියේ මන්ත්‍රීවරු නැති නිසා, මූලාසනයේ මන්ත්‍රීතුමා හැටියට හිටපු නියෝජ්‍ය සභාපති සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මම යෝජනා කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

එම යෝජනාව මම ස්ථිර කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

41974198

එම යෝජනාව අනුව සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට මම ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා[සුනිල් විජේරත්න මහතා]මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් විජයමුණිද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne]left the Chair and Hon. Sumith Wijayamuni de Soysa M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 20 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 02.22]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම විපක්ෂ නායකතුමාටත්, සංවිධායකතුමාටත් මගේ ගෞරවය පුද කරනවා, මේ අවස්ථාව සලසා දීම පිළිබඳව. සමස්තයක් හැටියට අපි ගත්තාම ලංකාවේ විශේෂයෙන් බස්නාහිර පළාතේ වැඩිමහල් පුද්ගලයින් අතරින් 1/3 ක්, දළ වශයෙන් 30% ක් බර වැඩි, තමන්ට තිබෙන්න ඕනෑ බර ඉක්මවා ගිය අය කියලා සොයාගෙන තිබෙනවා. ¼ ක්, 25% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රුධිර පීඩනයෙන් පෙළෙන අය බව සංඛ්‍යාලේඛන අනුව පෙනී යනවා.දොළහකට එකක්, නැත්නම් වැඩිමහල් අයගෙන් 8% ක්, 10% ක් අතර අවම ප්‍රමාණයක්, දිය වැඩියාවෙන් පෙළෙන අය හැටියට සංඛ්‍යා ලේඛන අනුව පෙන්නුම් කරනවා. මේ තත්ත්වය පාලනය කර ගැනීමට අපට නොහැකි වුණොත්,ඉන් ඇති වන ප්‍රතිඵලයන් වන්නේ, අපේ පළාතේ ඉන්න ජනතාවගේ ජීවිතය කොටවීමයි. නැත්නම් මරණය ඉක්මන්වීමයි. ඔවුන්ගේ සෞඛ්‍යසේවාව පිළිබඳව වැය කළ යුතු වියදම් අධික වීමයි. රටක් වශයෙන් සහ පළාත් සභාවක් වශයෙන් මේ පිළිබඳව නිසි පියවර අපි නොගත්තොත්, ඒ සෞඛ්‍ය පහසුකම් අපි ලබා නොදුන්නොත්, රටක් සහ පළාත් සභාවක් හැටියට අපේ සෞඛ්‍ය සඳහා කෙරෙන වියදම් තව තවත් අධික වීම සිදු විය හැකියි. මේ තත්ත්වය පාලනය කර ගැනීමට අවශ්‍ය පියවර හැටියට මම හිතන්නේ, ජේතීය අමාත්‍යාංශයත් අනිකුත් ආයතනත් පිළිඅරගෙන තිබෙනවා, මෙන්න මේ පියවර ගත යුතුයි කියලා.

අංක 01, අදාළ රෝගීන් වෛද්‍ය සායනවලට යොමු කිරීම. රෝග පීඩාවන් පිළිබඳව දීර්ඝ කාලීන සෞඛ්‍යඋපදෙස් සහ වෛද්‍ය සේවාවන් සැපයීම. ඒ කියන්නේ දියවැඩියාව, රුධිර පීඩනය වාගේ ඒවාට දීර්ඝ කාලීනව ඒ සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ. නිරෝගී සම්පන්න ජීවන රටාවකට ඒ පුද්ගලයන් යොමු කිරීම. අවශ්‍ය ඖෂධ සහ පරීක්ෂණ කිරීමට අවශ්‍ය උපාංගයන් ලබා දීම.

බස්නාහිර පළාත තුළ ජීවත්වන සියලුදෙනාට අවශ්‍යසේවාවන් සැපයීම සඳහා වර්ග කිහිපයක රෝහල් තිබෙනවා. ඒකෙන් ප්‍රධානම රොහල් ගණය හැටියට අපට සඳහන් කරන්න පුළුවන්, ප්‍රාථමික මට්ටමේ රෝහල්. Primary Hospitalsකියලා අපි කියනවා. ඒ වාගේ ප්‍රාථමික රෝහල් අපට 78 ක් තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කය තුළ 28 යි. ගම්පහ දිස්ත්‍රික්කය තුළ 44 යි. කළුතර දිස්ත්‍රික්කය තුළ 07 යි. ධනවත් අය නොවෙයි. ධනේශ්වර පන්තියට අයත් ඒවා නොවෙයි. සාමාන්‍ය දරිද්‍රතාවයෙන් පෙළෙන කෙනෙකුට රෝගයක් හැදුනාම මුලින්ම යන්නේ ප්‍රාථමික මට්ටමේ තිබෙන, ඒ රෝහලට. ඒ නිසා මම හිතනවා. පළාත් සභාවක් හැටියට අපි යුතුකමක් තිබෙනවා.ඒකී ප්‍රාථමික රෝහල නැත්නම් Primary Care Units කියන ඒවාට අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය සහ සහාය ලබා දෙන්නට.

ප්‍රාථමික රෝහලකින් සැලසෙන්නේ - අතීතයේ අපි Central Dispensaries කියලා කිව්වා. මධ්‍යම බෙහෙත්
[ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

ශාලාවන් කියලා කියපු බෙහෙත් ශාලාවන් තමයි මේ බොහොමයක් ප්‍රාථමික සෞඛ්‍ය ඒකකයන් ලෙස දැන් පරිවර්තනය කරලා තිබෙන්නේ. ඒ ප්‍රාථමික රෝහල්වල නේවාසික රෝගීන් නැහැ. සතියේ දිනවල සහ සෙනසුරාදා දින භාගයක් - සතියේ දිනවල පෙ.ව. 08.00 සිට ප.ව. 4.00 වනතුරු ඒවා විවෘතව පවතිනවා. ඉස්සර ආදි කාලයේ AMP ලා, නැත්නම් සහායක වෛද්‍යවරුන් කියපු අය තමයි මේවායේ කාර්ය භාර්ය කෙරුවේ. අද එහෙම නොවෙයි.MBBS උපාධිය ලබපු වෛද්‍යවරුන් මේ ප්‍රාථමික රෝහල් බොහොමයක් භාරව කටයුතු කරනවා. එවන් ප්‍රාථමික රෝහලක විශේෂඥ වෛද්‍යපහසුකම් අපට ලැබෙන්නේ නැහැ. මොකද, මම දන්න තරමට කිසිම ප්‍රාථමික රෝහලක විශේෂඥ වෛද්‍යවරු නැහැ.

**41954196**

එයට අමතරව අපට ප්‍රාදේශීය රෝහල් ගණනාවක් තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළ තිබෙන ඊට වඩා ඉහළ මට්ටමේ රෝහල් A, B, C කියන කොටස් තුනකට වෙන් කරලා තිබෙනවා. A ගණයට අයත්වන රෝහල් හයක් මේ දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. B ගණයට අයත්වන රෝහල් 13 ක් තිබෙනවා.Cගණයට අයත්වන රෝහල්14 ක් තිබෙනවා. ඒ රෝහල්වල නේවාසික රෝගීනුත් ඉන්නවා. නමුත් විශේෂඥ වෛද්‍ය පහසුකම් ඒ රෝහල්වල නැහැ. හැබැයි මම දන්න තරමට බස්නාහිර පළාතේ තිබෙන මේ රෝහල් හයක පවුල් විශේෂඥ වෛද්‍යවරුන් ඉන්නවා. ඉන් කිහිපයක් නම් කරනවා නම්, දොම්පේ රෝහල. දිවුලපිටිය රෝහල. මීනුවන්ගොඩ රෝහල. පිළියන්දල රෝහල. මම දන්න තරමට.මට වඩා ගම්පහ නියෝජනය කරන මන්ත්‍රීවරුන් දන්නවා ඇති. දොම්පේ රෝහලේ, ඉතාමත්ම කාර්යක්ෂමව මේ පවුල් වෛද්‍ය සංකල්පය කියන එක, ක්‍රියාත්මක කරන බව මට දැනගන්නට ලැබිලා තිබෙනවා. ඒ රෝහලට ඒ පළාතක් භාර දීලා තිබෙනවා. නවීන පරිගණක තාක්ෂණය යොදවා ගනිමින් එම ප්‍රදේශයේ වැසියන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක ඒ රෝහලේ නිලධාරීන් අද ක්‍රියාත්මක වෙලා තිබෙනවා කියලා අපට දැනගන්නට ලැබෙනවා. මම හිතන්නේ,ඒ රෝහල වාගේ අනෙකුත් රෝහලුත් අපට ඒ තැනට ගෙනෙන්න පුළුවන් නම්, ඒ කියන්නේ යම් ප්‍රදේශයක් ඒ රෝහලට භාර දීලා නවීන තාක්ෂණය යොදා ගනිමින් ඒ පළාතේ ඉන්න අය ලියාපදිංචි කරලා ඒ අවශ්‍ය පහසුකම් ලබා දීම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළ සංවාදය මෙතුමාගේ කථාවට බාධාවක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කරන්න උත්සාහ ගන්නවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මගේ ඉල්ලීම මේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාට යොමු කරනවා.

අපේ රටෙන් බෙහොමයක් දුරට තුරන් කරපු, නැත්නම් පාලනය කරපු රෝග වර්ග තිබෙනවා. මැලේරියාව, බරවා රෝගය ලංකාවෙන් තුරන් කරපු රෝග හැටියට අද ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තහවුරු කරලා තිබෙනවා. ඊට අමතරව ඩිප්තීරියා, පෝලියෝ, දරු උපත්වලදී ටැටනස් - Nero nettle tetanus කියලා අපි ඉංග්‍රීසියෙන් කියනවා. ආදී ලෙස සඳහන් කරන රෝග ලෝක සෞඛ්‍ය සංවිධානය, අපේරේකීය සෞඛ්‍ය අමාත්‍යාංශයත් පළාත්බද සෞඛ්‍ය අමාත්‍යාංශයත් එකතු වී කරපු වැඩ පිළිවෙළක් නිසා බොහෝදුරට අද පාලනය වෙලා තිබෙනවා කියලා අපට වාර්තා කරන්නත් පුළුවන්. අපට කියා සිටින්නත් පුළුවන්. වර්තමානයේ වැඩි මරණ සංඛ්‍යාවක් ඇති වන්නේ බෝ නොවන රෝග හේතුකොටගෙනය කියලා සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරනවා. මේ අනුව දියවැඩියාව, රුධිර පීඩනය, ඇදුම, හෘදයාබාධ සහ මහා මාර්ගවල සිදුවන අනතුරු මගින් ඇතිවන විපත් අසීමිතයි. මෙන්න මේ කාරණාව මම හිතන්නේ, අපි සටහන් කරගත යුතු කාරණාවක්. මෙම තත්ත්වයන් අවම කිරීම සඳහා අපි අපේ සෞඛ්‍ය සේවාව තුළ ඇති අඩුපාඩුකම් හඳුනාගෙන ඒවාට පිළියම් යොදන්නට උත්සාහ ගත යුතුයි. බස්නාහිර පළාත් සභාව තුළ ඇති රෝහල්වල ඇති අඩුපාඩු සලකා බැලීමේදී - සියලු කාරණා ගැන මගේ කාලය ඇතුළත සඳහන් කරන්නට බැරි වුණත් එක කාරණාවක් පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන්නට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. එනම්, සමස්තයක් හැටියට ගත්තාම, විශේෂයෙන් ප්‍රාථමික රෝහල්වල බහුතරයක් දරිද්‍රතාවයෙන් පෙළෙන අය තමන්ගේ රෝගයට පිළියමක් ගන්න, ඒ සේවාව ලබා ගන්න එන රෝහල්වල රසායනාගාර පහසුකම් නැහැ. රසායනාගාර පහසුකම් ඒ සියලු ප්‍රාථමික රෝහල්වල ඇති කිරීමත් ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. ඒක අපි පිළිගන්නට ඕනෑ. දවසකින්, මාසයකින්, අවුරුද්දකින්, දෙකකින් ඒ ඇති කරන්නට පුළුවන්කමක් නැති වෙන්න පුළුවන්. දැනට මා දන්නා තරමින් ප්‍රාථමික රෝහල්වල නියැදි,Samples, රුධිර නියැදි එකතු කරලා රසායනාගාර පහසුකම් ඇති රෝහල්වලට පොදු ප්‍රවාහන ක්‍රමය මගින් යවන පිළිවෙළක් තිබෙනවා. මෙය එතරම් කාර්යක්ෂම සහ ප්‍රතිඵලදායී ක්‍රමයක් ලෙස අපට හඳුන්වා දෙන්නට බැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මේ අවස්ථාවේදී මා ගරු අමාත්‍යතුමාට යෝජනා කරනවා. දිනපතා එවැනි නියැදි රසායනාගාර පහසුකම් ඇති රෝහල්වලට යැවීම සඳහා සෑම කුඩා රෝහලකටම මෝටර් සයිකලයක් හරි, ත්‍රීවිල් එක්ක හරි ලබා දෙන්නය කියලා, එහි හැකියාව පිළිබඳව සලකා බලන්නය කියලා මම ඉතා ගෞරවයෙන් සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට ඔබතුමා හරහා යෝජනා කරනවා. මම හිතන්නේ, අඩු තරමින් සමහර

රෝහල්වලට ඒ පහසුකම ලබා දෙන්න පුළුවන් නම්. එදිනෙදා එකතු කර ගන්නා නියැදි, එදාම ඒ රසායනාගාර පහසුකම් තිබෙන රෝහල්වලට යවලා කාලය විනාශ කරන්නේ නැතිව, ඒවායේ ප්‍රතිඵල ලබා ගෙන ඒ රෝගියාට යම්කිසි සේවාවක් ලබා දීම සඳහා, වාර්තා ලබාගැනීමේ හැකියාවක් උත්පාදනය කරන්න පුළුවන් නම් මම හිතනවා, ඒක ඉතාමත්ම වැඩදායි කාරණාවක් වෙනවා ඇති. ඒ වාගේම රජයේ රෝහල්වල - සිංහල වචනය මගේ කටට එන්නේ නැහැ. උග්‍ර MLT හිඟයක් තිබෙන බව අපි දන්නවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

වෛද්‍ය රසායනාගාර තාක්ෂණ නිලධාරී

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ස්තුතියි. අවුරුද්දකට පමණ ඉස්සෙල්ලා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් ඒකේ වෛද්‍ය පීඨයේ පවුල් සෞඛ්‍ය අංශයේ සහාය ඇතිව ගෝනදූව සහ ගල්පාත රෝහල් දෙකට අදාළ පරීක්ෂණ පවත්වන්න යන්ත්‍ර සූත්‍ර ලබා දුන්නා. මම හිතන්නේ හිටපු සෞඛ්‍ය ගරු ඇමැතිතුමා ඒ පිළිබඳව දන්නවා. පළාත් සභාවෙන් මේ වියදම දැරුවේ. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන MLT අවසන් වසරේ සිසුන් සතියකට වරක් ඒ රෝහල්වලට යවන ක්‍රමවේදයක් මමත් මැදිහත් වෙලා - මගේ භාර්යාව එම අංශයේ මහාචාර්යවරියක්. අපි මැදිහත් වෙලා කටයුතු සලස්වා, ඒ ක්‍රියාවලිය කළා. ඒ මගින් එක පැත්තකින් එය ප්‍රද්ශයේ ඉන්න ප්‍රදේශවාසීන්ට ඒ වාර්තා ලබා ගැනීමේ, නැත්නම් රසායනාගාර පහසුකම් නැති ඒ රෝහල් දෙකේ ඒ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ලැබුණා. අනික් අතට මේ MLT ශිෂ්‍යයින්ට ප්‍රායෝගිකව තමන්ගේ වෘත්තියට සූදානම්වීම සඳහා යම් ක්‍රියාවලියක් කරන්නට අවස්ථාවක් ලැබුණා. ඒ නිසා එය රෝගීන්ට පමණක් නොවෙයි. ඒ ශිෂ්‍යයින්ටත් ඒකෙන් ප්‍රයෝජනවත් යමක් සිද්ධ වුණාය කියලා මම විශ්වාස කරනවා. මොකද, අවාසනාවට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 10 ක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ස්තුතියි. මම හිතනවා, එපමණ වෙලාවක් මට අවශ්‍ය වන එකක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි. හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. නමුත් මම පෞද්ගලිකව දන්නවා. ඒ ක්‍රියාවලිය දැන් ලොප් වෙලා තිබෙන්නේ. ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමා හරහා වර්තමාන සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. පුළුවන්කමක් තිබෙනවා නම් - අපට පේනවා. රෝහල්වලට මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න බැරි වේවි. නමුත් අඩුම ගණනේ තෝරාගත් රෝහල් හත අටකට, ඒ රසායනාගාර පහසුකම් නැති රෝහල්වලට මේ MLT අවසන් වසරේ ශිෂ්‍යයින්ව යවලා සතියකට වරක් ඒ පරීක්ෂණ පවත්වලා ඔවුන්ට ඒ සහාය ලබා දෙන්න පුළුවන් නම් මම හිතන්නේ, ඔබතුමා ඉතාමත්ම වැඩදායී දෙයක් මේ බස්නාහිර පළාතට කළා වෙනවා. ඒ කිරීමේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා මම ඔබතුමාට යෝජනා කරනවා. දැන් මේක ලොප් වෙලා තිබෙන්නේ. නැවතිලා තිබෙන්නේ. ඒක ව්‍යාප්ත කළ යුතුව තිබුණු ක්‍රියාවලියක්. ඒ සඳහා ශ්‍රී ජයවර්ධනපුර වෛද්‍ය විද්‍යාලයේ පීඨාධිපතිතුමා සමඟ සාකච්ඡා කළොත් මම හිතන්නේ නැවත වාරයක් මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් අපට ලැබෙයි කියලා.

[ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

ඒ වාගේම මම ගරු ඇමැතිතුමාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා යෝජනා කරනවා. මේ විවිධ වූ රෝහල්වල විවිධ වූ අඩුපාඩුකම් තිබෙන්නේ. සමස්තයක් වශයෙන් හැම රෝහලකම මෙන්න මේ අඩුපාඩුකම් තිබෙනවා කියලා අපටකියන්නට බැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා. හැකියාවක් තිබෙනවා නම් එක්කෝ, සෞඛ්‍ය උපදේශක කමිටුව, එහෙම නැත්නම් මේ මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් එක දිස්ත්‍රික්කයකට එක කමිටුව ගණනේ පිහිටුවලා, ඒ කමිටුවේ සාමාජිකයන්ට වගකීමක් පවරන්න. මේ විවිධ වූ, ඒ ඒ දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල්වලට අඩුම ගණනේ කලින් කලට ගිහිල්ලා, විටින් විට ගිහිල්ලා, තමන් කවුද කියලා කියන්නේ නැතිව, අපි මන්ත්‍රීවරුන් කියන්නේ නැතිව ඒ තැන්වලට ගිහිල්ලා,ඒ රෝහල්වල තිබෙන යම් යම් අඩුපාඩුකම් තිබෙනවා නම්, ඒවා සොයාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කිරීමේ ක්‍රියාවලියක් ඔබතුමාට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්,

ඒක ඉතාමත්ම වැඩදායි දෙයක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම අවසාන වශයෙන් මම අවසර ඉල්ලා සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රේඛීය අමාත්‍යාංශය - මට හොඳටම විශ්වාසයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා භාරයේ මේ ලේඛනය ඇතැයි කියලා. රේඛීය සෞඛ්‍යඅමාත්‍යාංශයෙන් A Family doctor for all Bringing healthcare closer to 20 million people සෑම පුද්ගලයෙකුටම, සෑම පුරවැසියෙකුටම රජයේ මුදලින් නඩත්තු කරන පවුල් වෛද්‍යවරයෙක් සහ මිලියන 20 ක් වූ ජනගහනයට සෞඛ්‍ය සේවාව තවත් ආසන්න කර ලබා දීමේ අරමුණින් ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙනවා. මම විශ්වාස කරනවා. අපේ ගරු ඇමැතිතුමා ඒ පිළිබඳව දන්නවා ඇතියි කියලා. කෙසේ වෙතත් මම ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා, මේ ලේඛනය එහි මේ සියලු විස්තර සඳහන් වෙනවා. Shared care cluster system කියන එකේ. ඒ කියන්නේ, පළාතක තිබෙන කුඩා රෝහල්වලට රෝගීන් යොමු කරලා ඒ රෝහල්වලින් ඒ මාර්ගයෙන් referral system එකක් මගින් පළාතේ තිබෙන ප්‍රධාන රෝහලකට ඒ රෝගීන් යොමු කිරීම මගින්, බස්නාහිර පළාතේ ඉන්න අපේ වැසියන්ට වඩාත් හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා දීමට පියවර ගන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ සමඟ මේ ලේඛනය සභාගත කරන්නට ඔබතුමාගේ අවසරය මම ඉල්ලා සිටිනවා.[1]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් තිබෙන අයට පෞද්ගලික රෝහල් තිබෙනවා. නමුත් මුදල් නැති අයට විකල්පයක් තිබෙන්නේ, ගෙවල්වල මියැදෙන්න. ඒ තැනින් ඔවුන්ව නිදහස් කරලා ඔවුන්ටත්, සියලු දෙනාට සමාන අවස්ථා සලසා දෙන සමාජයක් ගොඩනැගීම අපේ අරමුණ නම් - මම මේ ධනවත් අයට විරුද්ධව කථා කරනවා නොවෙයි. ධනවත් අය, තවත් ධනවත් වෙනවා දකින්න මම කැමැතියි. නමුත් මේ රටේ ජීවත්වන සෑම පුද්ගලයෙකුටම, සෑම පුරවැසියෙකුටම, අසරණකමින් පල්ලෙහාම මට්ටමේ ඉන්න දරිද්‍රතාවයෙන් පෙළෙන අසරණ වූ පුද්ගලයාටත්,මේ රටේ සෞඛ්‍ය පිළිබඳව සමාන අවස්ථාවක් සලසා දීමට යුක්ති ධර්මය පිළිබඳව විශ්වාසය තිබෙන මහජන නියෝජිතවරුන් හැටියට අපි බැඳිලා ඉන්නවා. ඒ නිසා එවන් සමාජයක් ගොඩනඟන්නට සෑම පුද්ගලයෙකුටම, මේ රටේ ඉපැදෙන සෑම දරුවෙකුටම සමාන සෞඛ්‍ය අවශ්‍යතා සලසා දෙන සමාජයක් ගොඩනැඟීම සඳහා අපි සියලුදෙනාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන භේදයන්ගෙන් තොරව, පන්ති භේදයන්ගෙන් තොරව අපි එකාමෙන් අත්වැල් බැඳගෙන,ඒ සමාජය ගොඩනඟන්නට -අපේ ජීවිත කාලයේදී ඒ අපි බලාපොරොත්තු වන සමාජය ගොඩනඟන්නට නොහැකි වුණත් අඩු තරමින් අපේ දරුවන්ගේ ජීවිත කාලයේදීවත් එවන් සමාජයක් ගොඩනැඟෙනවා දකින්නට ආරම්භයක් දෙන්න අපි එක් වෙමුය කියන වචන ටිකත් නැවත වරක් කියමින්, මේ අවස්ථාව සලසා දීම ගැන නැවත වරක් ඔබතුමාටත්ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 02.40]

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 පිළිබඳව සාකච්ඡා වන වෙලාවේ මේ වැය ශීර්ෂය පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන් අපේ ගරු අමාත්‍යතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන වසරක් වාගේ කාලයක් ගත වෙන්නේ. නවක ඇමැතිතුමෙක් විධියට යම් යම් අඩුපාඩු සුළු වශයෙන් තිබෙන්නට පුළුවන්. කොහොම වුණත් එතුමාගේ උත්සහාය මත යම් යම් ක්‍රියාමාර්ග අරන් තිබෙනවා. එතුමා ඉදිරිපත් කරලා තිබෙන පොතේ පණිවුඩයේ සඳහන් කරලා තිබෙන කාරණාවකුත් එක්කමමම කථාව පටන් ගන්න කැමැතියි. ඒක විශේෂයෙන්ම මම එතැනින් ආරම්භ කරන්න කල්පනා කළේ, අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණාත් එක්ක අපේ ඇමැතිතුමා මේ පොතේ කියනවා, *"2017 වසර වන විට පළාතේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි තෝරාගත් මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්,ග්‍රාමීය රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා කිහිපයක් ඉතා උසස් මට්ටමක් දක්වා සංවර්ධනය කිරීමට අවශ්‍ය සියලු පියවරයන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගනු ඇත"*කියලා. ඒක ඉතාම හොඳ පැහැදිලි කිරීමක්. මම ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. 2017 වසරේ ඒ ආකාරයෙන්ම ඒ කාරණා ඉෂ්ට සිද්ධ කරන්න ලැබේවා කියලා.

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

41974198

අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී සඳහන් කළා කළුතර දිස්ත්‍රික්කයට ලැදිමහ ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ලැබුණු ව්‍යාපෘති ප්‍රමාණයක් පිළිබඳව. ඒ පිළිබඳවත් අපේ ගරු සෞඛ්‍යඇමැතිතුමා මේ පොත් පිංචේ 22 වැනි පිටුවේ සඳහන් කරලා තිබෙනවා, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයහරහා ලැබුණු ව්‍යාපෘති පිළිබඳව. හැබැයි, අපේ ගරු ඇමැතිතුමා මේ පොතේ සඳහන් කරලා තිබෙන ආකාරයට මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු ව්‍යාපෘති සියල්ලම ලැබිලා තිබෙන්නේ කළුතර දිස්ත්‍රික්කයට පමණයි. එතුමා ව්‍යාපෘති 22 ක් සඳහන් කරලා තිබෙනවා. මෙහි මුදල් ප්‍රමාණයන් පිළිබඳව සඳහනක් නැහැ. මම හිතන්නේ, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට දැවැන්ත මුදල් කන්දරාවක් කළුතර දිස්ත්‍රික්කයට මධ්‍යම ආණ්ඩුවෙන් ලැබුණා. අපි ඒ ගැන සතුටු වෙනවා. හැබැයි අපි කනගාටු වෙන්නේ, ඔබතුමාගේ පොතේ ආරම්භයේ සඳහන් කරපු ආකාරයට සෑම දිස්ත්‍රික්කයටම සාධාරණවන ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් කනගාටු වෙනවා. ලබන වසරේවත් ඔබතුමාගේ මේ පොතේ සඳහන් කරපු ආකාරයට අනික් දිස්ත්‍රික්ක දෙකටත් ඒ සාධාරණය ඉෂ්ට කරන්නය කියන කාරණාව මේ වෙලාවේදී මම මතක් කරනවා.

ඒ කොහොම වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මේ රජය බලයට පත්වන කොට කිව්වේ සෞඛ්‍යයට දළ ජාතික නිෂ්පාදනයෙන් 3% ක් වෙන් කරනවා කියලා. මේ රජය බලයට පත් වන කොට එහෙම කිව්වත් කනගාටුවට කාරණය තමයි, 2017 වසරේ අයවැය යෝජනා හරහා 2016 වසරට සාපේක්ෂව ගත්තාම, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයටත් වෙන් කරලා තිබෙන මුදල7.5 කින් අඩු කරලා තිබෙනවා. 3% කොහොම වුණත්. ඒ වාගේම සමාජ සුභසාධන අමාත්‍යාංශයටත් ඒ 3% ක් දෙනවා කිව්වාට 7.5 කින් මුදල් අඩු කරලා තිබෙන තත්ත්වයක් තුළ තමයි අද අපි මේ විවාදයට සහභාගී වෙන්නේ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බරපතළම කාරණාව බස්නාහිර පළාත් සභාවට මේ අමාත්‍යාංශය සඳහා වෙන් කරලා තිබෙන, මහ ආණ්ඩුවෙන් ලබා දෙන මුදල් ප්‍රමාණය සලකා බැලුවාම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හැටියට මේ අමාත්‍යාංශයට ලැබෙන මුදල් අතිවිශාල මුදල් ප්‍රමාණයක් අඩු වෙලා තිබෙන පසුබිමක සිට තමයි අපි මේ 2017 අයවැය සාකච්ඡා කරන්නේ. අපි කල්පනා කළොත්, 2017 වසරේ මේ මහ ආණ්ඩුව අපට බටහිර වෛද්‍ය අංශය සඳහා දෙන්නට බලාපොරොත්තු වන මුදල් 2016 වසරේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 650 ක් දෙන කොට 2017 වසරට අපට දෙන්නේ, රුපියල් මිලියන 130 යි. රුපියල් මිලියන 520 ක අඩුවක්. ඊළඟට දේශීය වෛද්‍ය අංශය සඳහා 2016 වසරේ අපට රුපියල් මිලියන 110 ක් දෙන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 වසරට අපට දෙන්නේ රුපියල් මිලියන 12 යි. රුපියල් මිලියන 98 ක අඩුවක්. පරිවාස හා ළමාරක්ෂක සේවා සඳහා 2016 වසරට අපට රුපියල් මිලියන 18 ක් ලැබෙන කොට 2017 වසරට ලැබෙන්නේ රුපියල් මිලියන 14 යි. එතැනත් රුපියල් මිලියන 04 ක අඩුවක්. සමාජ සේවා සඳහා 2016 වර්ෂයේ රුපියල් මිලියන 16 ක් දෙන කොට 2017 වසරට අපට හම්බ වන්නේ, රුපියල් මිලියන 04 යි. එතැන රුපියල් මිලියන 12 ක අඩුවක් තිබෙනවා. සමස්තයක් හැටියට ගත්තාම මේ ක්ෂේත්‍ර හතර සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2016 ත් එක්ක සංසන්ධනය කළාම 2017 වසරට අපට රුපියල් මිලියන 634 ක අඩුවක් තිබෙනවයි කියන කාරණාම මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කිව්වාට, මහා ආණ්ඩුවෙන් මේ ව්‍යාපෘතිය අපේ පළාත් සභාව තුළ

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ක්‍රියාත්මක කරනවා නම් පළාත් සභාව අවශ්‍ය නැහැ. එහෙමනම් පළාත් සභාව විසුරුවන්න ඕනෑ. පළාත් සභාව ක්‍රියාත්මක වෙනවා නම්, තැන තැන, එක එක අමාත්‍යාංශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නැහැ. අපට අයත් අපේ ක්ෂේත්‍රයන්ට අදාළ අපේ රෝහල් දියුණු කරන්න නම් පළාත් සභාව හරහා ඒ මුදල් දෙන්න ඕනෑය කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා. එහෙම නැතිව මහ ආණ්ඩුවෙන් මේ මුදල් ක්‍රියාත්මක වෙනවා නම් අපේ ගරු ඇමැතිතුමා මේ පොතේ ආරම්භයේ සඳහන් කරපු ආකාරයට දිස්ත්‍රික් තුනට සම සමව ඒ මුදල් මහ ආණ්ඩුවෙන් ලබා දෙන වැඩ පිළිවෙළකට අපේ ගරු ඇමැතිතුමාට මැදිහත් වෙන්නය කියන කාරණාව මම මේ වේලාවේ බොහොම පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පළාත් අධ්‍යක්ෂක හරහා දෙනවා.

**41954196**

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

පළාත් අධ්‍යක්ෂවරු හරහා දුන්නාට, පළාත් සභාවේ ක්‍රියාත්මක වෙලා තිබෙන්නෙ පළාත් සභාවේ මහජන නියෝජිතයන්ගේ අදහස් අනුව නොවෙයි. එක්තරා ඇමැතිවරයෙක්ගේ උවමනාවට, ඔහු විසින් නම් කරන ව්‍යාපෘති සහ ස්ථාන සඳහා පමණයි මේ මුදල් ලබා දීලා තිබෙන්නේ. අන්න ඒකටයි අපේ විරෝධය. එහෙමනම් මේ පළාත් සභාව ඕනෑ නැහැ. එහෙමනම් මේක විසුරුවන්න. මේක විසුරුවලා මහ ආණ්ඩුවෙන්ම මේ ටික කරන්න. මොකටද මේ? මෙපමණ මහජන නියෝජිතයන් ගණනක් නඩත්තු කරලා, මෙච්චර නිලධාරි පැලැන්තියක් නඩත්තු කරලා,-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්පහ පුතා ඉන්නවා නේ?

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ඒක තමයි. ගම්පහ පුතා ඉන්නවාට ඒකටවත් දීලා නැහැ. මම දන්නේ නැහැ. ඊළඟට පුතා එහෙන් ඉල්ලන්නේ නැතිව ආයේ කළුතරට එනවාද දන්නේ නැහැ. කොහොම වුණත් මේ පළාත් සභාව හරහා සාධාරණය ඉෂ්ට වෙන්න වැඩ පිළිවෙළක් හදන්නය කියන කාරණාව තමයි මම මේ වෙලාවේ කියන්නේ.

මේ විධියට පළාත් සභාවේ මුදල්කපා හරිද්දී තව බරපතළ ගැටලුවකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එකොළොස් වැනි මාසයේ 25 වැනිදා පාර්ලිමේන්තුව හරහා පනතක් ගැසට් කරලා තිබෙනවා. ඒක බපරතළ කාරණා ගණනාවකට අපට මුහුණ දෙන්න සිදු වන පනතක්. මේ පළාත් සභාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය කාලයේ දිවි නැගුම පනත ගෙනැල්ලා, පළාත් සභාවේ බලයන් යම් ප්‍රමාණයක් අපි අත්හැරියා. ඊට පස්සේ මේ වර්තමාන ආණ්ඩුව කාලයේ තිරසාර සංවර්ධන පනත ගෙනැල්ලා, ඒකෙන් ද අපේ තිබෙන බලයන් යම් ප්‍රමාණයක් අපි අත්හැර ගත්තා. දිගින් දිගටම මේ කාරණා සිද්ධ වෙනවා නම් අපට හිතන්න සිද්ධ වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.මට බපරතළ සැකයකුත් තිබෙනවා. එක පැත්තකින් මේ කාරණා මේ ආකාරයට සිද්ධ වෙන්නේ මොන උවමනාවන් සඳහාද කියලා. මේ එකොළොස් වැනි මාසයේ 25 වැනිදා සංවර්ධන විශේෂ විධිවිධාන පනත ගැසට් කරලා තිබෙනවා. මේක බරපතළ පනතක්. මේ පනත හරහා පළාත් සභාවාට හිමි බොහෝ බලතලයන් උදුරා ගන්න, අගමැතිවරයාගේ යටතට ගන්න පනතක් බවට මේ තිබෙන කරුණු වල සඳහන් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැනට තිබෙන තොරතුරු අනුව මේ පනතේ බලය ලැබෙන්නේ අග්‍රාමාත්‍යවරයාට. මුළු රාජ්‍ය සේවයම ඔහුගේ අතට ගන්න පනතක් බවට මේ පනත පත් වෙලා තිබෙනවා. සියලුම ආයතනවල, සියලු දෙපාර්තමේන්තුවල, සියලුම අධිකාරීවල අණපනත්යටත් කරන පනතක් බවට,මේ පනත පත් වෙනවා. මේ සම්මත කරන්න යන පනත දැනට ගැසට් කරලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ විශාල බල ප්‍රමාණයක් - අපට තිබෙන අයිතිවාසිකම්, අපේ පාලනයට යටත් වුණු සියලු දේවල් මේ පනත හරහා උදුරාගන්න යන වැඩ පිළිවෙළකට, මේ පනත හේතු වෙනවාය කියන කාරණාව මම මේ වේලාවේ සඳහන් කරනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා. එක පැත්තකින් අපේ මුදල් කපා හරිනවා. ඊළඟට අපට තිබෙන බලයත් කපා හරින වැඩ පිළිවෙළකට මේ යන්නේ. මේකට කිසිසේත් අපේ එකඟතාවය ලබා නොදෙන්න ඕනෑය කියන කාරණාව මම මේ වේලාවේ බොහොම පැහැදිලිව සඳහන් කරනවා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ බියගම ප්‍රාදේශීය රෝහල තිබෙනවා. මේ රෝහලේ බාහිර රෝගී අංශය සහ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කරමින් පවතිනවා. ඒ ගොඩනැගිල්ලේ සියලු කටයුතු ඉදි කරලා හමාර කරන්නත්, ඒ වාගේම ඊට අවශ්‍ය අනිකුත් සම්පත් සියල්ල ලබා දෙන වැඩ පිළිවෙළකටත් 2017 වසරේ අවතීර්ණ වන්නට ගරු ඇමැතිතුමාගේ අවධානය ඔබතුමාගේ මාර්ගයෙන් යොමු කරවනවා. ඒ එක්කම බියගම මැතිවරණ කොට්ඨාශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා ක්‍රියාත්මක වන සායනවලට පැමිණෙන ජනතාව යම් අපහසුතාවන්ට පත් වෙනවා. විශේෂයෙන් සියඹලාපේවත්ත, ගොළුම්මහර, කම්මල්වත්ත, දෙල්ගොඩ ප්‍රදේශයේ ජනතාවට විශාල දුරක් ගෙවන්නට සිද්ධ වෙනවා, සායනයකට යන්න. ඒ නිසා අපි සියඹලාවත්ත ජනපදයේ

මාතෘ සහ ළමා සායන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් වෙන් කරගෙන තිබෙනවා. පවුල් 3000 කට ආසන්න ප්‍රමාණයකට සෙත සැලසෙන සියඹලාපේවත්ත රජයේ වෙන් කරලා තිබෙන ඒ ඉඩමෙහි මාතෘ හා ළමා සායන ගොඩනැගිල්ලක් 2017 වසරේ ආරම්භ කරන්න කටයුතු කරන්නය කියන කාරණාව මතක් කරමින්, මම ගරු ඇමැතිතුමාට සුභපතමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.52]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයට අදාළව වචන ටිකක් එකතු කරන්න, නැත්නම් අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම තුළින් බස්නාහිර පළාතේ ජීවත්වන ජනතාවට යම් හෝ සහනයක්, සෞඛ්‍ය සම්පන්න නිරෝගී ජීවිතයක් ගත කරන්න යම් හෝ තරමින් හැකියාව ලබා දෙන්න පුළුවන් නම්, එය තමයි මහජන නියෝජිතයන් හැටියට අපි ලබන සතුට. අපි නිදහස් අධ්‍යාපනයක්, නිදහස් සෞඛ්‍ය සේවයක් ගැන කථා කරනවා. නමුත් නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය ඉදිරියේදී අපට කථා කරන්න හැකියාවක් තිබෙනවාද කියන ගැටලුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතු වෙමින් තිබෙනවා. 2017 වසරට පාර්ලිමේන්තුවේදී සෞඛ්‍යයට අදාළ අයවැය විවාදයේදී අපි දැක්කා, ලබන වසරට අදාළව විශාල මුදල් ප්‍රමාණයක් කප්පාදු කරලා තිබෙන ආකාරය. ඒකේ තිබුණු විශේෂත්වය තමයි,ඒ අයවැය විවාදයේදී අපි දැක්කා, රජයේ රෝහල්වල පෞද්ගලික වාට්ටු ඉදි කරන වැඩ පිළිවෙළ. ඒ වාගේම එහි රජයේ රෝහල්වල පෞද්ගලික රසායානාගාර හදන වැඩ පිළිවෙළ තිබුණා. ඒ වාගේම රජයේ රෝහලක නැවැතිලා ප්‍රතිකාර අරගෙන යන කොට ඔවුන්ට බිලක් නිකුත් කරන වැඩ පිළිවෙළ අපි දැක්කා. මේ එන්නේ, නැවතත් අර නිදහස් සෞඛ්‍ය සේවයට කණකොකා හැඬීමද? කියන ගැටලුව අපට මේ මොහොතේ මතු වෙමින් තිබෙනවා.

ඒ වාගේම තමයි අපි රටක් හැටියට ගත්තොත් එහෙම, රටක් සංවර්ධනය කළ හැක්කේ, ඒ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය හොඳට පවත්වාගෙන ගියොත් පමණයි. නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි කළොත් පමණයි. නමුත් ඒ රටේ නිෂ්පාදනයට රටේ ජනතාව සහභාගි කරවා ගන්න පුළුවන් නම් තමයි අපට සංවර්ධන ඉලක්ක කරා යන්න පුළුවන් වෙන්නේ. එහෙම සංවර්ධන ඉලක්ක කරා යන්න පුළුවන් හැකියාව ලැබෙන්නේ, නිරෝගී ජනතාවක්, හොඳ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් රටේ ජීවත් වුණොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා බස්නාහිර පළාත් සභාව ගත්තත් අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව ඇමැතිවරයෙක් ඉන්නවා. ඒ වාගේම තමයි ලංකාවේ අනිකුත් පළාත් 08 ටම සෞඛ්‍ය ඇමැතිවරු ඉන්නවා. ලංකාවේ ගත්තාම පළාත් සභාවලට විතරක් සෞඛ්‍ය ඇමැතිවරු 09 ක් ඉන්නවා. ඒ වාගේම මධ්‍යම රජයේත් ඇමැතිවරයෙක්, නියෝජ්‍ය ඇමැතිවරයෙක්. අපේ රටේම ගත්තොත් ඇමැතිවරු 11 ක් මේ සෞඛ්‍ය අංශය සඳහා ඉන්නවා. එහෙම තිබෙද්දී තමයි අපේ රටේ පසුගිය කාලයේ පත්තරවල මෙවැනි වාර්තාවක් දැක්කේ. 2015 වර්ෂයේ අපේ රටේ ජනගහනය ලක්ෂ 220 යි. අපේ රටේ OPD වලින් ලක්ෂ 500 ක් බෙහෙත් අරගෙන තිබෙනවා. නේවාසිකව ප්‍රතිකාර අරගෙන තිබෙන රෝගීන් සංඛ්‍යාව ලක්ෂ 60 ක්. ඒ වාගේම තමයි 2015 වර්ෂයේ හෘදයාබාධවලින් මියගිය සංඛ්‍යාව 39,420 ක්. පිළිකා රෝගයෙන් 3380 ක් මිය ගිහින් තිබෙනවා. වකුගඩු රෝගවලින් 2190 ක් මිය ගිහින් තිබෙනවා. හදිසි

[ගරු නන්දන පත්මකුමාර]

අනතුරු වලින් 2920 ක් මිය ගිහින් තිබෙනවා. සියදිවි නසා ගැනීම් 5110 ක් වී තිබෙනවා. ඒ අනුවහෘදයාබාධවලින් දිනකට 108 ක් මිය යන රටක් බවට පත් වෙලා තිබෙනවා. පිළිකාවලින් දිනකට 12 දෙනෙක් මිය යන රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. වකුගඩු රෝගයෙන් දිනකට 06 දෙනෙක් මිය යන රටක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා, පළාතෙද?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

නැහැ. මේ රටේම. පළාතේ ටිකත් මම ඔබතුමාට කියන්නම්. හදිසි අනතුරුවලින් 08 දෙනෙක් මිය යන රටක් බවට පත් වෙලා තිබෙනවා. සියදිවිනසා ගැනීම් 14 ක් අපේ රටේ දවසකට සිදු වෙනවා. ඒ අනුව ගත්තොත් ලෝකයේ හතරවැනි තැනට, අපේ රට ඇවිල්ලා තිබෙනවා. බස්නාහිර

පළාත ගත්තත් අපේ බස්නාහිර පළාතේ ලක්ෂ 58 ක් ජනතාව ජීවත් වෙනවා. ගරු ඇමැතිතුමාගේ පොතේ වාර්තාව අනුව බස්නාහිර පළාත තුළ මහ රෝහල්, මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, සෞඛ්‍ය ආයතන 165 ක් තිබෙනවා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය 42 ක් තිබෙනවා. මාතෘ හා ළමා සායන 450 ක් තිබෙනවා. අපේ බස්නාහිර පළාත තුළ රෝහල්වල ඇඳන් 6131 ක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම තිබෙද්දී ලක්ෂ 58 ක් ජීවත්වන බස්නාහිර පළාත තුළ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් රෝගීන් ප්‍රමාණය දස ලක්ෂ පනස් හය දහස් පන්සිය හතළිස් හතක් වෙනවා. සෑම පුරවැසියන් පස් දෙනෙකුගෙන් එක් කෙනෙක් නේවාසික ප්‍රතිකාර අරගෙන තිබෙනවා. සායනවලින් ප්‍රතිකාර ලබා ගත්තු රෝගීන් සංඛ්‍යාව ගත්තොත් දාහත් ලක්ෂ හැත්තෑ දහස් නවසිය විසි අටක් වෙනවා. සෑම තුන් දෙනෙක් ගෙන් එක් අයෙක් සායනවලින් ප්‍රතිකාර අරගෙන තිබෙනවා. අපේ පළාතේ ලක්ෂ 58 ක් ජීවත් වෙද්දී OPD වලින් බෙහෙත් අරගෙන තිබෙන රෝගීන් සංඛ්‍යාව පනස් අට ලක්ෂයෙන් පනස් තුන් ලක්ෂ අසූ නව දහස් අටසිය හතළිස් දෙකක් බෙහෙත් අරගෙන තිබෙනවා. මේ බස්නාහිර පළාත තුළ මෙම පොතෙන් ගත්ත දත්තයන් තිබෙන්නේ. ඉතින් මෙහෙම ගත්තොත් එහෙම අපිසෞඛ්‍ය සම්පන්න ජාතියක්ද? නිරෝගී සම්පන්න ජාතියක් අපේ රටේ ජීවත් වෙනවාද? කියන ගැටලුව අපි ඉදිරියේ තිබෙනවා.

අපි පසුගිය කාලය පුරා කොතරම් කථා කළත්, කොතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කළත් අපේ රටේ වැඩිපුරම මිය යන්නේ, මේ බෝ නොවන රෝගවලින්. බෝ නොවන රෝගවලින් - අනිකුත් රෝගයකින් මිය ගියාට පස්සේ, අපි යන මළගෙවල්වලින් වැඩිපුරම තිබෙන්නේ හෘදයාබාධ හෝ නැත්නම් පිළිකාවලින් මිය ගිය ඒවා. මෙහෙම ගියාට පස්සේ පාංශුකූලය දෙන හාමුදුරුවොත් අපිත්, ගෙදර ඉන්න ඥාතියෙනුත් හිත හදා ගන්නවා, මේක කරුමෙට යට කරලා. මේ කරුමේ නොවෙයි තිබෙන්නේ. සෞඛ්‍ය සේවයේ යම් යම් අඩුපාඩුකම්. පසුගිය කාලය පුරා ක්‍රියාත්මක කරපු යම් යම් අඩුපාඩුකම් තමයි මේ සෞඛ්‍ය සේවයේ දකින්න තිබෙන්නේ. මෙතෙක් ක්‍රියාත්මක කරපු වැඩ සටහන්, වැඩ පිළිවෙළවල් අසාර්ථක නම්, අපි නැවත සොයා බැලීමක් මේ සෞඛ්‍ය අංශය කෙරෙහි කරන්න ඕනෑ.

ලෝක සෞඛ්‍ය පිළිබඳව කථා කරද්දී අපි වැඩිපුර කථා කරන්නේ සමාජවාදී කියුබාව ගැන. මෙහි ඉතාම ප්‍රබල සෞඛ්‍යය අංශයක් තිබෙනවා. මම පසුගිය කාලයේ එම රටේ සෞඛ්‍යය පිළිබඳව ඔවුන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ ගත්තොත් එහෙම වසර 50 ක් එක දිගට ප්‍රතිපත්ති හතරක යටතේ සිට ඒ වැඩ සටහන සැලසුම් කරලා තිබෙනවා.

පළමුවැනි එක තමයි සැලසුම් කළ සෞඛ්‍ය සේවා සහ රජයේ වගකීම කියන ප්‍රතිපත්තිය.

නොමිලේ ලබාදෙන හැම දෙනාටම ළං විය හැකි ප්‍රාථමික සෞඛ්‍ය අංශයක් ඔවුන් සංවර්ධනය කරලා, ඒ ප්‍රතිපත්තියක් යටතේ වැඩ කරලා තිබෙනවා. ඒ වාගේම තමයි රෝග වැළැක්වීමේ මූලික ප්‍රතිපත්තිය යටතේ ඔවුන් කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම උසස් සෞඛ්‍ය තත්ත්වයක් සඳහා ජනතා සහභාගීත්වය කියන මූලික ප්‍රතිපත්ති හතර යටතේ ඔවුන් වැඩ කරලා, ලෝකයේ ප්‍රධාන රටක් හැටියට, සෞඛ්‍ය අංශය ගැන කථා වෙද්දී ඒ තුළින් ඉහළ තැනක සිටින රටක් හැටියට කියුබාව අපි හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම තමයි පසුගිය කාලයේ අපේ රටේ බොහෝ වෛද්‍යවරු, බොහෝදෙනා කියුබාවේ ගිහිල්ලා මේ ඩෙංගු මර්දන ව්‍යාපාරය පිළිබඳ සොයා බැලීමක් කළා. අපට මතකයි පසුගිය කාලයේ BTI බැක්ටීරියාව ගෙනැල්ලා, ලංකාවේ ඩෙංගු රෝගයට පිළියම් සොයා ගන්නවා කියලා - ඒ වාගේම තමයි නොයෙක් ඇමැතිවරු පසුගිය කාලයේ නොයෙක් වැඩ පිළිවෙළවල් ගේනවා අපි දැක්කා. කළුතර දිස්ත්‍රික්කයේ ඉන්න ජගත් අංගගේ මැතිතුමා, අපට මතකයි. ඩෙංගු විශේෂ කාර්ය බලකායක් හදලා යම් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. පසුගිය කාලයේ සම්පූර්ණයෙන්ම ඒක අනික් පැත්ත හරවලා, ඒ බලකාය විසුරුවලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ගත්තොත් එහෙම මෙතෙක් ඉතිහාසයේ වැඩිම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙන්නේ මේ වසරේ තමයි. එහි ප්‍රමාණය ගත්තොත් එහෙම 47,834 ක් මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 10 වැනිදා වන කොට ඩෙංගු රෝගීන් වාර්තා වෙලා තිබෙනවා. කොළඹ ඩෙංගු රෝගීන් 14,510

කුත්, ගම්පහ 6042 කුත්, කළුතර 3119 කුත් වශයෙන් වාර්තා වෙනවා. 2015 වර්ෂය ගත්තොත් එහෙම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩියක කාලයක් තව ඉතිරිව තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ කාලය එතුමාට ලබා දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මට විනාඩි එකක් හෝ දෙකක් ලබා දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි දෙකක් දෙන්න. පොඩි කාරණයක් කියන්න තිබෙනවා. මාගේ ඉතිරි කාලය මෙතුමාට ලබා දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ විනාඩි 07 න් විනාඩි 05 ක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

2015 වර්ෂයේ බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් වාර්තා වන්නේ 12,481 ක් වුණාට, මේ වන කොට 23,671 ක් වාර්තා වෙනවා. ඒ වාගේම තමයි ඩෙංගු මරණ ගත්තත් මේ වසරේ ඩෙංගු මරණ 76 ක් තිබෙන කොට බස්නාහිර පළාතේ 24 ක් තිබෙනවා. ඒ නිසා අපි විශේෂ වැඩ පිළිවෙළක් මේ ඩෙංගු රෝගය සඳහා ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපට මතකයි. පසුගිය යුද්ධය කාලයේ ගම් මට්ටමින් සිවිල් ආරක්ෂක කමිටු හදලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. ඒ වාගේම මේ ඩෙංගු රෝගය සඳහා ගම් මට්ටමින් විශේෂ මැදිහත්වීමක් කරලා, ගමේ සියලු ජනතාව එකතු කරලා, ගමේ රාජ්‍ය නිලධාරීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ග්‍රාමසේවක, පවුල් සෞඛ්‍ය නිලධාරී, සංවර්ධන නිලධාරී,ඒ වාගේම කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී මේ වාගේ විශාල නිලධාරී පිරිසක් ඉන්නවා. මේ සියලු දෙනා එකතු කරලා විශේෂ වැඩ පිළිවෙළක් හැදුවොත්, පළාත් පාලන ආයතන සම්බන්ධ කරලා වැඩ පිළිවෙළක් හැදුවොත් මේ ඩෙංගු රෝගීන් ප්‍රමාණය අඩු කරලා ඒ මරණ සංඛ්‍යාව අඩු කරලා ඩෙංගු රෝගය අපේ රටින් තුරන් කිරීමටඅපට පුළුවන් වෙනවා.

ඒ වාගේම මෙන්න මේ කාරණා පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානයට මම යොමු කරනවා. විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාත තුළ තිබෙන මූලික රෝහල්වල සවස හතරෙන් පස්සේ සේවක ප්‍රශ්න නිසා, ප්‍රතිකාර ලබා ගැනීමේ ක්‍රියාවලිය නතර කරලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය හතරෙන් පසුත් ක්‍රියාත්මක කරන්න ආරම්භ කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි බියගම රෝහලේ භාගෙට ඉදි වෙලා තිබෙන ගොඩනැගිල්ල සම්පූර්ණ කරන්නය කියලා මේ අවස්ථාවේ මතක් කරනවා. ඒ වාගේම ඒ බියගම රෝහලේ OPD ගොඩනැගිල්ල අබලන් වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. ඒ වාගේම හෝමගම මීගොඩ බහු කාර්යය සායනයේ අයිතිය අවුරුදු 40 කට පස්සේ අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා මැදිහත් වෙලා, ඒක ප්‍රාදේශීය සභාවට පවරාගෙන තිබෙනවා. ඔබතුමා ලබන වසරේ මුදල් වෙන් කරලා, මේ බහු කාර්යය ගොඩනැගිල්ල සම්පූර්ණ කරන්නය කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම ගරු ඇමැතිතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා. කොළඹ නගර සභාවේ පසුගිය කාලයේ
[ගරු නන්දන පත්මකුමාර]
තිබුණු ගැටලුව පිළිබඳව. ඒ කියන්නේ පසුගිය කාලයේ සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හෝටල් පරීක්ෂා කරලා යම් යම් සම්මාන ලබා දුන්නා. එහෙත් පසුගිය කාලයේ කොළඹ නගර සභාවේ ඒසම්මාන දෙද්දී බෝ ගහ ඉදිරිපිට තිබෙන හෝටලයක පිළුණු කෑම විකුණලා ජනතාව ලෙඩ වන ආකාරය අපි දැක්කා. ඒ වාගේම සෝන්ඩර්ස් පෙදෙසේ තිබෙන හෝටලයක පරණ කුකුල් මස් විකුණන එක අපි දැක්කා. ඒ නිසා මෙවැනි කාරණා පිළිබඳ විශේෂයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි පනාපිටිය ග්‍රාමීය රෝහල. ඔබතුමාගෙන් මම කිහිප වාරයක් ඉල්ලා සිටියා. මෙම ග්‍රාමීය රෝහලේ කටයුතු සම්පූර්ණ කරලා සෑහෙන කාලයක් වෙනවා. නමුත් එය විවෘත කිරීම දිනෙන් දින ප්‍රමාද වෙමින් පවතිනවා. ඒ වාගේම තමයි, කළුතර දිස්ත්‍රික්කයේ රෝහල් කිහිපයක

ස්ථාන මාරුවීම් පිළිබඳව විශේෂයෙන් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. එදාත් මම ඔබතුමාට මතක් කළා. මේ ස්ථාන මාරු ලබා දීමේදී දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරුවීම් ලබා දෙන්නය කියලා මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සෞඛ්‍ය අංශයේදී විශේෂයෙන්ම බෝ නොවන රෝග ගැන හැම ගරු මන්ත්‍රීවරයෙක්ම කථා කළා. අපි මේ බෝ නොවන රෝග පිළිබඳ නිවාරණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී, විශේෂයෙන්ම ඒ ඒ වයස් කාණ්ඩයන් තෝරා ගනිමින්, ඒ ඒ ජන කොටස් සහභාගීත්වයෙන් විශාල වැඩ පිළිවෙළක් හැදුවොත් විතරයි මේ බෝ නොවන රෝගවලින් ජනතාව මුදවා ගන්න හැකියාව ලැබෙන්නේ. එහෙම නැතිව අපි කාලයෙන් කාලයට එක එක වැඩ සටහන් හදලා, එක එක ඇමතිවරයාගෙන් ඇමතිවරයාට වැඩ සටහන් හදලා, ක්‍රියාත්මක කළොත් එහෙම අපි දවසින් දවස මා ඉදිරිපත් කළ දත්තයන් අනුව මරණය තමයි අපට දකින්න ලැබෙන්නේ. ලෙඩ ජාතියක් අහන්න ලැබෙන්නේ. ඒ නිසා ඒ සියලු දෙයට අපි දැක්මක්, වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අපේ රටේ දක්ෂ වෛද්‍යවරුන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම හෙදියන් ප්‍රමාණයක් ඉන්නවා. ඒවාගේම අනිකුත් සේවක සංඛ්‍යාවන් විශාල වශයෙන් ඉන්නවා. ඔවුන් දැඩි කැපවීමෙන්, දැඩි ආත්ම ශක්තියෙන් වැඩ කරනවා. ඔවුන්ට නැත්තේ දැක්මක්, වැඩ පිළිවෙළක් විතරයි. ඒ නිසා එම දැක්ම, වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ මහජන නියෝජිතයන් හැටියට අපි තමයි. දැක්මක්, වැඩ පිළිවෙළක් හදලා නිලධාරීන් අතට පත් කළොත් අපට හැකියාව ලැබෙනවා, විශේෂයෙන් බස්නාහිර පළාත තුළ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගන්න හැකි, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් නිර්මාණය කරගන්න. එහෙම නැති වුණොත් එහෙම, අපි හැමදාම බැණ බැණ, සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියට, එහෙම නැත්නම් අඩු ආදායම් ලබන රටක් හැටියට කියමින් ඉන්න එක තමයි අපට කරන්න වෙන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ගරු ඇමතිතුමා අපේ දිස්ත්‍රික්කයේ ජීවත්වන ඇමතිවරයෙක් හැටියට ඉදිරි වර්ෂයේ කරන්න බොහෝ කටයුතු තිබෙනවා. ඒ නිසා ඒ බොහෝ කටයුතුවලදී එතුමාගේ මැදිහත්වීම, එතුමාගේ කාර්ය භාරය, එතුමාගේ වැඩ පිළිවෙළ තමයි අපට ඊළඟ වසරේ කථා කරන්න වෙන්නේ. ඒ පිළිබඳවත් එතුමාගේ අවධානය, එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරලා මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබාගෙන, අපි කාගේත් අදහස් යෝජනා අරගෙන ඒ වැඩ පිළිවෙළ සකස් කරලා, ලබන වසරේ අඩුම ගණනේ මේ ඩෙංගු මරණ සංඛ්‍යාව, ඩෙංගු රෝගීන් වාර්තා වන ප්‍රමාණය, බස්නාහිර පළාත තුළ ජීවත්වන රෝගීන්ගේ ප්‍රමාණය, බෝ නොවන රෝගීන්ගේ ප්‍රමාණය, OPD වලින් බෙහෙත් ගන්න රෝගීන්ගේ ප්‍රමාණය අඩු කරගන්න වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ.

ඒ වාගේම මේ පාසල්වල පවත්වාගෙන යන ආපනශාලා සම්බන්ධයෙන්ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. ඒවා විශේෂ පරික්ෂාවකට ලක් කරලා, ඒවා ගැන සොයා බැලීමක් කරන්න ඕනෑ. පාසල්වල තිබෙන කැන්ටින් - විශේෂයෙන්ම පාසල්වල ඉන්න දරුවන් තමයි මේවායෙන් ආහාරපාන ලබා ගන්නේ. ඒ සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් හදලාක්‍රියාත්මක කළොත් අපට පුළුවන් අපේ දරු පරපුර නිරෝගී සම්පන්න ජීවිතයකට හුරු කරගන්න. ඒ වාගේම සෞඛ්‍ය ගරු ඇමතිතුමනි, අපි පාසල් පද්ධතිය තුළ දරුවන් විශාල සංඛ්‍යාවක් මානසික ආතතියෙන් පෙළෙනවා. ඔබතුමා ජීවත්වන, අප ජීවත් වන ප්‍රදේශයේ පසුගිය කාලයේ ඉතාම අඩු වයසින් ළමයින් සිය දිවි නසා ගන්නා ආකාරය අපි දුටුවා. පසුගිය කාලයේ ධම්මානන්ද විද්‍යාලයට අල්ලපු වැටේ ඉන්න, මේ වසරේ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවෙක් ළිඳේ පැනලා මැරෙනවා. ඒ වාගේම තමයි තරුණ සේවා මාවතේ අවුරුදු 13 ක ළමයෙක් එල්ලිලා මැරෙනවා. මේ වාගේ ඕනෑ තරම් මේ පාසල් පද්ධතිය තුළ අඩු වයසින් දරුවන් විශාල ප්‍රමාණයක් සියදිවි නසා ගන්නා තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සඳහා පාසල් පද්ධතිය තුළ විශේෂ වැඩ පිළිවෙළක් හදන්න වෙයි. අපට මේ මානසික ආතතිය තිබෙන, මානසික ප්‍රශ්න තිබෙන දරුවන් හඳුනාගනිමින් ඔවුන් නියමිත වෛද්‍යවරයන් වෙත යොමු කරලා ඔවුන්ට තිබෙන ප්‍රශ්න, ගැටලු හඳුනා ගත යුතුව තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට හිතවත්, එහෙම නැත්නම් තමන්ට ගැටලුව, ප්‍රශ්නය කථා කරන්න පුළුවන් සෞඛ්‍ය අංශය මැදිහත් වෙලා ඒ සඳහා නිලධාරියෙක් යොමු කරන්න පුළුවන් නම්, අපට පුළුවන් මෙවැනි මරණ සංඛ්‍යාව අඩු කරන්න. පාසල් යන දරුවන්ගේ විශාල සංඛ්‍යාවක් මේ මරණ සංඛ්‍යාවෙන් ගලවා ගන්න පුළුවන්. එහෙම වුණොත් විතරයි අපට මේ යහපත් සෞඛ්‍යයක් ගොඩනඟා ගන්න පුළුවන් වන්නේ. මේ සියලු කාරණා පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, දැක්මක් සහිත වැඩ පිළිවෙළක් තුළින් මේ බස්නාහිර පළාතේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය නඟා සිටුවන්න ගරු ඇමතිතුමාට

ශක්තිය, ධෛර්යය ලැබේවා කියා මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 03.07]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය,සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විවාදයට සම්බන්ධවීමට කාලය ලබා දීම ගැන ස්තූතිවන්ත වෙනවා. එතුමාගේ පළමුවැනි මංගල අයවැය. අපි සුභ පතනවා. අපේ අමාත්‍යාංශ්‍ය පොතේ තිබෙන ඒවාට අමතරව බරපතළ කාරණා ගණනාවක් තියෙනවා. අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, අපේ අගමැතිතුමාගේ උපදේශක ලේකම්වරයෙක්. එතුමා පටන් ගත්තේ මේ සමලිංගික විවාහ ඒඩ්ස්වලට හරියට බලපානවා. ඒ නිසා මේවා බෝ වෙනවා වැඩියි කියලා. මේක එතුමා අපට නොවෙයි කියන්න ඕනැ. මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාට තමයි මතක් කරන්න ඕනැ. එතුමාගේ විදේශ ඇමැතිතුමා තමයි ගිහිල්ලා ජිනිවා මානව හිමිකම් කවුන්සිලයට ගිහිල්ලා සමලිංගික විවාහ අනුමත කරන්න ඡන්දය දීලා ආවේ. මංගල සමරවීර තමයි අනුමත කරලා ආවේ. සමලිංගික විවාහ අනුමත කරනවා කියලා ඡන්දය දීලා ආවේ. ඉතින් එතුමාට තමයි ඉස්සෙල්ලාම කියන්න ඕනැ. ඔබතුමා උපදේශකයෙක් වශයෙන්, උපදෙස් දෙන්න ඕනැ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට. මොකටද අපේ විදේශ කටයුතු ඇමැතිතුමා ඡන්දය දුන්නේ කියලා සමලිංගික විවාහ ලංකාවට ගෙනෙන්න කියලා. මැල්කම් රංජිත් පියතුමා ඊයේ පෙරෙයිදා සාකච්ඡාවක් තියලා කිව්වා, ක්‍රිස්තියානි දහම අනුව කවදාවක්වත් මේ සමලිංගික විවාහ ජේසුස් ක්‍රිස්තු වහන්සේ අනුමත කරන්නේ නැහැ. එතුමා බොහොම විරුද්ධව, බොහොම පැහැදිලිව අපේ ආණ්ඩුව කරවන අයට කණේ ඇඟිලි ගහගන්න, එතුමා ඊයේ පෙරෙයිදා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා හොඳ උත්තරයක් දුන්නා. ඒ නිසා මෙවැනි දේවල්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් තමයි මේ අපරාධය සිද්ධ වන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මැල්කම් රංජිත් පීරිස් කාදිනල් තුමා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

එතුමා තමයි මේ උත්තරය දුන්නේ. මට අපේ මහරගම පිළිකා රෝහල පිළිබඳව විශාල ගැටලු රාශියක් තිබෙනවා. මළගෙවල්වල යන මන්ත්‍රීවරුන් වශයෙන් අපි දකිනවා,මේ කොළඹ දිස්ත්‍රික්කයේ සැහෙන මිනිස්සු පිරිසක් මැරෙන්නේ පිළිකාවෙන්. ලෝකයේ පිළිකාවෙන් මැරෙන අනුපාතය 8% යි. අද අපේ ගමේ ඒ ප්‍රතිශතය අපි ගණන් හදලා බැලුවාම,93% ක් තිබුණා. නමුත් මේ වාර්තාව නිකුත් කළේ එවකට කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,කර්මාන්ත, පරිසර අමාත්‍යාංශයේ ගම්මන්පිල ඇමැතිතුමා ඉන්න කොට මේකට කමිටුවක් දැම්මා. ඒ කමිටුව අනුව - මේක ඇත්තටම කියවන්න අවශ්‍ය නිසා මම කියවනවා. මගේ වෙලාව අපරාදේ. ඒ විනාඩිය මට දෙන්න පුළුවන් නම් දෙන්න.

"මහරගම පිළිකා රෝහලේ අසාද්මීක විකරණශීලී අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය නොකිරීමෙන් ඇතිවන පාරිසරික ගැටලු පිළිබඳව මේ අධ්‍යයනය කළේ. පරිසර විද්‍යා අංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. මේ විශ්ව විද්‍යාලයේ ඒ කරපු පරීක්ෂණයේදී තව කරුණු කාරණා ගණනාවක් හෙළි වුණා. මේ ග්‍රාමසේවා වසම් හතරක මරණ පිළිබඳව සමීක්ෂණය කළා. ඒ සමීක්ෂණ වාර්තාවේ, මෙම රෝහල අවට වාසය කරන ජනතාව වෙත පසුගිය වසර පහ තුළ වැළඳී ඇති රෝග පිළිබඳව අවධානය යොමු කර ඇත.
[ගරු සලෝචන ගමගේ]

එහි අධ්‍යයනයට ලක් කර ඇති නියැදි පසුගිය වර්ෂ පහ තුළ රෝගාබාධ වැළඳී 72 ක් මිය ගොස් ඇති අතර 33 ක් මිය ගොස් ඇත්තේ පිළිකා රෝගය වැළඳීමෙන් බව වාර්තා වී ඇත. මෙය ප්‍රතිශතයක් ලෙස බැලීමේදී 7.1% ක ප්‍රතිශතයකි. මෙලෙස මිය ගොස් ඇති තිස් තුන් දෙනා අතරින් දිගටම වාර්තා වී ඇත්තේ ගොඩිගමුව දකුණ බී ග්‍රාමසේවා නිලධාරි වසමේ වන අතර මෙම ග්‍රාම නිලධාරී සේවා වසම පිළිකා රෝහලේ අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රදේශයට ඉතා ආසන්නයෙන් පිහිටා ඇති ප්‍රදේශය බව ඉතා පැහැදිලි වේ.

ඉතින් මගේ ග්‍රාම සේවා වසම ඒ. මම පදිංචි වෙලා ඉන්නේ. එතැනින් එහා පැත්ත අපේ තිලකසිරි ඇමැතිතුමාගේ කොට්ඨාශය. මෙවැනි අනතුරුදායක තත්ත්වයක තිබෙන්නේ. ඉතින් මේකට පිළියම් නොයෙදීම

නිසා මම සෞඛ්‍ය අමාත්‍යාංශය ඉස්සරහා උපවාස කළා. මේකට වහාම විසඳුමක් දෙන්නය කියලා. එවකට හිටියා ජලසම්පාදන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමා ඒ විකරණශීලී ද්‍රව්‍ය මුහුදට බැහැර කරන්න ලක්ෂ 4000 ක් දීලා, ඒ ව්‍යාපෘති ජල සම්පාදනයෙන් අවසන් කරලා තිබුණා. මේ ආණ්ඩුව පෙරළිලා අවුරුදු දෙකක් එනවා. කනගාටුයි කියන්න. තවම ඇතුළේ තිබෙන නාලිකා පද්ධති ටික ඒ අපද්‍රව්‍ය වහනය කරන ටැංකියට එකතු කරන්න බැහැ. මම හැමදාම ගිහිල්ලා කෑ ගහනවා. අධ්‍යක්ෂතුමා කියනවා මම කියලා තිබෙන්නේ. මට කරන්න දෙයක් නැහැ. මම මේ පෙන්ෂන් යන්න ඉන්නේ කියලා. මේ අවුරුදු දෙකක් තිස්සේ ඇතුළේ තිබෙන බඩු ටික දාගන්න බැරි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පරිවර්තනය වෙලා තිබෙනවා. කනගාටුයි. අලි අරගෙන හෙන්ඩුව අරගන්න බැරි ආණ්ඩුවක් තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ. පරමානු බලශක්ති අධිකාරිය මහරගම පිළිකා රෝහල පිළිබඳව පරීක්ෂණයක් කරලා එතුමා නිර්දේශ වගයක් දුන්නා. කිව්වා, මේ විකිරණශීලී ප්‍රතිකාර ඒකකය හදලා තිබෙන ක්‍රමය වැරැදියි. මේක හදන්න ඕනෑ, පොළවෙන් යට කියලා නිර්දේශයක් දුන්නා. අපේ උපවාසයේ ප්‍රතිඵලයක් හැටියට. එවකට ආණ්ඩුවෙන් ලක්ෂ 17,000 ක් කෝටි 170 ක් දීලා මේක හදන්න පටන් ගත්තා. හිටපු සෞඛ්‍ය ඇමැතිතුමා, දැන් වත්මන් ජනාධිපතිතුමා ඇවිල්ලා මුල් ගල තිබ්බේ. පොළවෙන් යට හදන්න කෝටි 170 ක් අනුමත වුණා. දැන් පොළවෙන් උඩ හදලා තිබෙනවා. මම කිව්වා, මැෂින් හයි කරන්න එපා කියලා. පොළවෙන් උඩ හයි කරලා තිබෙනවා. පොළවෙන් යට හයි කරන්නයි සල්ලි අනුමත කළේ. සල්ලි කප්පාදු කරලා, මේ ආණ්ඩුව ආවාට පස්සෙ පොළවෙන් යට ගහන්න තිබුණු එක පොළවෙන් උඩ ගැහුවා. මේක ජාතික අපරාධයක්. මේ ප්‍රදේශයේ විශාල වශයෙන් පිළිකා අවධානම තිබෙද්දී, දීපු සල්ලි ටිකත් කපලා මේක පොළවෙන් උඩ ස්ථාපිත කරලා, මේ මැෂින් හයි කරන්න හදනවා. මේ පෙට් ස්කෑන් යන්ත්‍රවල ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ අයට ජනාධිපති වුණාම මතක නැහැ. එතුමාගේ කාලයේ පෙට් ස්කෑන් යන්ත්‍ර හයක් ගෙනෙන්න ටෙන්ඩර් කැඳවලා, ගෙනාවේ කල් පැනපුවා. හයම කල් පැනලා. ඒවාට වඩා අලුත් තාක්ෂණයෙන් යුතු දියුණු ඒවා තිබෙනවා. එතුමා කමිටුව පත් කරලා බලන කොට,ඒ කමිටුවේ ඉන්න තුන් දෙනාම පැන්ෂන් ගිහිල්ලා. එතකොට මෛත්‍රීපාල ජනාධිපතිතුමයි ඇමැති. හය දෙනාම පෙන්ෂන් ගිහිල්ලා. මේ පෙට් ස්කෑන් යන්ත්‍ර සල්ලි එකතු කරලා හිඟා කාලා ගන්න ඕනෑ නැහැ. ගෙනාපුවත් පරණ ඒවා. අවාසනාවකට කෙසේ හෝ දෙරණ නාලිකාව මැදිහත් වෙලා පෙට් ස්කෑන් යන්ත්‍රයක් ගන්න කියලා සල්ලි එකතු කළා. මම හිතන්නේ අර ඇපල් සුනිල් මහත්මයාත් කෝටි තුනක් දුන්නා. කෝටි 20 ක් එකතු වුණා. දැන් මාස හයයි. තවම ස්කෑන් යන්ත්‍රය නැහැ. මම එහා පැත්තේ ඉන්න නිසා ගිහින් බලනවා මැෂින් එක අවාද කියලා. තවම මැෂින් එක නැහැ. මුන්ට සල්ලි එකතු කරලා දීලත් මැෂින් එක ගන්න බැහැ. ඒකට කෝටි 20 එකතු කරලා දුන්නා. මැෂින් එක ගන්න බැහැ. මේ සල්ලි එකතු කරලා මැෂින් ගන්න ඕනෑ නැහැ. මේ දාන ඇඩ් ටික නැවැත්තුවා නම් - හැමදාම ඇඩ් දානවා. ලක්ෂ 45 ක්, 50 ක් දවසකට යන ඇඩ් ටිකට යනවා. තාත්තාට බැරි වුණ දේ පුතා කළා. සේනක බිබිලේ මහත්මයාට බැරි වුණ දේ මෙන්න රාජිත පුතා කළා කියලා එක ඇඩ් එකක් යනවා.

අර තව මල් විකුණන අම්මා කෙනෙක් කියනවා, අනේ ගාණ අඩු වුණා. ලොකු සහනයක් කියනවා. තව ඇඩ් එකක් යනවා, මුදල් දුන්නාම ආයේ ඉතුරුත් දෙනවා. මුදල් ඉතුරුයි. කියලා තමයි ඉතුරු ගන්නේ. ඒ මනුස්සයා පුදුම වෙනවා. ඔහොම ඇඩ් දානවා. ලක්ෂ 45 ක්, 50 ක් අතර ගණනක් ඇඩ්වලට යනවා. ටී.වී ඒකේ දාන්න. මේ බලු දොස්තර කෙනෙක් පුම්බන්න ලක්ෂ 50 ක් ඇඩ්වලට වියදම් කරන රටක් බවට පරිවර්තනය වෙනවා. දවස් 40 ක් මේ ඇඩ් ටික නැවැත්තුවාම කෝටි 20 ක් ඉතුරු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බලු නොවේ. දත් දොස්තර.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

දත් දොස්තර. දත්ම තමයි. කොන්දොස්තර වෙන්න ඇති. ඉස්සරහාට “කොන්” වෙන්න ඇති දාන්නේ. අපේ දත් දොස්තර මහත්මයාට හරි මොළයක් තිබුණා නම්, ස්කෑන් යන්ත්‍රයක් දවස් 40 න් ගන්න පුළුවන්. දවසකට ලක්ෂ 50 ක් එකතු කරනවා. දවස් 40 ක් යන කොට කෝටි 20 ක් ඉතුරුයි. ඉතින් තව ස්කෑන් යන්ත්‍රයක් ගෙනෙන්න තිබුණා. කෙසේ නමුත් මිනිස්සුන්ගේ මුදල් එකතු කරලා ගන්න හදපු ස්කෑන් යන්ත්‍රයවත් මේ ආණ්ඩුවට ගෙනත් දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. එවැනි තත්ත්වයක ආණ්ඩුව තිබෙන්නේ.

**41974198**

අද සෙලින්කෝ කියලා ආයතනයක් පිළිකා රෝහල අසළ තිබෙනවා. ඒවායේ විකිරණශීලි අපද්‍රව්‍ය එළියට දාන්න බැහැ. ඒක නීතියෙන් තහනම්. ඒවා දවස් 100 ක් ගබඩා කරන්න ඕනෑ. අද දැම්මා නම්, අද ගබඩා කරලා දවස් 100 කට පස්සේ තමයි මළ නාලිකා හරහා ඒවා එළියට දාන්න පුළුවන්. ඒවාටවත් දාන්න හොඳ නැහැ. අයඩීන් ප්‍රතිකාරය කළාම මිනිස් සිරුර තුළට ගමන් කරනවා. මම මේ පිළිබඳව අධ්‍යයනය කළාම දන්නේ. මිනිස් සිරුර තුළට ගමන් කරනවා. පරමානු බලශක්ති අධිකාරියෙන් කිව්වා වාහාම මහරගම පිළිකා රෝහලේ මේ ටැංකිය ඉදි කරන්න. ටැංකිය ඉදි කරලා තිබෙනවා. තවම මුහුදුට බටේ ගහගන්න බැරි වුණා. සෙලින්කෝ එකටත් ඒ නියෝගමය තිබෙනවා. අවාසනාවකට වෙලා තිබෙන්නේ සෙලින්කෝ ආයතනයට එහෙම කිසිම නියෝගයක් නැහැ. මේ අයඩීන් මිශ්‍රඅපද්‍රව්‍ය සියල්ලම මුදා හරිනවා. ඉතින් පිළිකා වැඩිවීමට හේතුවක් වන අයඩීන්, වහපු පොළවට, වාතයට යැවීම සුදුසු නැහැ. ඒකේ විෂ මැරෙන්න දවස් 100 ක් ගබඩා කරලා තිබෙන්න ඕනෑ. මම මේ ගැන පැමිණිලි කළාම පරමාණු බලශක්ති අධිකාරියෙන් එය - පැමිණිලි කළාම,ඒ පැමිණිල්ල යට යනවා. පරමාණු බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා, අබේරත්න කියලා. එතුමා සෙලින්කෝ එකෙත් අධ්‍යක්ෂ. හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක් නේ?මේ මධ්‍යම රජයෙන් පත් කිරීම් දීලා තිබෙන හැටි. සෙලින්කෝ එකේ අධ්‍යක්ෂ පරමානු බලශක්ති එකෙත් අධ්‍යක්ෂ. ඉතින් කොහොමද?පුතේ මේවා කරන්නේ. අර අහිංසක මිනිස්සුන්ට කියලා තිබෙන්නෙ මේවා මෙතැනින් එහාට සොයන්න එපා. වාර්තාවන් දෙන්න එපාය කියලා උඩින් නියෝග දීලා තිබෙන්නේ?ඒ අය ගිහින් විකිරණශීලි ඒවා තෝරනවා. වාර්තාව ගහනවා. බිම තියනවා. වාර්තාව ගහනවා, බිම තියනවා. ඒ අයට කර්තව්‍යය කරගන්න බැහැ. එතැනින් එහා ඉන්න අධ්‍යක්ෂවරු මේ ආණ්ඩුවත් සමඟ සම්බන්ධ වුණු අය.

තමුන්නාන්සේ දන්නවා, පන්නිපිටිය නර්සිං හෝම් එකේ ලොකු සම්මානයක් දෙනවා කියලා ගහලා තිබෙනවා. අපේ බස්නාහිර පළාත් සභාවේ සුභාශිංසන කියලා ගහලා තිබෙනවා. ඒ රෝහලේදී එක් අයකුගේ බඩේ ඔපරේෂන් එකක් කළා. ගැහුණු එක්කෙනා මළා. මැරෙන්න ඔන්න මෙන්න තිබියදී දොස්තර දැන ගත්තා, මෙයා මැරෙනවාමයි කියලා. ඊට පස්සේ හෝමගම රෝහලට අරගෙන ගියා. ඉතින් හෝමගම රෝහලේ තමයි මැරෙන්නේ. පන්නිපිටිය පෞද්ගලික රෝහලෙන් නිදහස් වෙනවා. ලෙඩා මැරෙන්නේ හෝමගම රෝහලේ. ඔපරේෂන් එක කරන්නේ පන්නිපිටිය රෝහලේ. මැරෙන්න ඔන්න මෙන්න තිබියදී හෝමගම රෝහලට ගිහිල්ලා, ඇඩ්මිඩ් කරනවා. අපේ රෝහලට අපකීර්තියක් තමයි ඇති වන්නේ. මේ පෞද්ගලික රෝහල් ගැන මීට වඩා සොයා බලන්න ඕනෑ.

අපේ ජනාධිපතිතුමා කියනවා, අනේ දොස්තරවරුන් එන්න. මම ඔබතුමාට එන්න කියලා ආරාධනා කරනවා. රට යන්න එපා. බුද්ධි ගලනයක් වෙන්නේ. ඒ නිසා ලංකාවට එන්නය කියලා. එන්නේ කොහෙද? ඒ මිනිස්සුන්ට තිබෙන පහසුකම් ටික ඔක්කොම කපනවා. ඒ මිනිස්සුන්ට අවුරුදු පහෙන් පහට වාහන බලපත්‍රයක් තිබුණා. රජයේ සේවකයන්ට අවුරුදු පහෙන් පහට බලපත්‍රයක් තිබුණා. දොස්තරවරුන්ටත්නැති කළා. රජයේ ඉන්න අනික් සේවකයින්ටත් නැති කළා. අවුරුදු පහෙන් දුන්න බලපත්‍රය නැති කළා. ඉතින් දොස්තරවරු ලංකාවට එයිද? ළමයින් දාන්න ගියාම අකිල විරාජ්ගේ කුණු බැණුම් අහලා එන්න ඕනෑ. දොස්තරවරු කොන්දොස්තරවරු වාගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වාඩි වෙලා ඉන්නවා. මම අපේ පිළිකා රෝහලේ දොස්තර මහත්මයෙකුගේ දරුවෙක් ගෙනැල්ලා ධර්මාශෝක කණිෂ්ටයට දැම්මා. දොස්තර මහත්මයා,

[ගරු සලෝචන ගමගේ]

ඔහොම රස්තියාදු වෙන එක. පුටුවේ ඔහොම වාඩි වෙලා ඉන්න එක ඔබතුමාට හොඳත් නැහැ. අනේ, අර නයා මැරුණු අහිකුණ්ඨකයෙක් වාගේ දොස්තර මහත්වරු ළමයින් දාන්න පෝළිමට ඉන්නවා. ඒ කාලයේ එහෙම තිබුණේ නැහැ. අපේ රජය කාලයේ දොස්තරවරුන්ට පිළිවෙලට, වැදගත්කමට සලකලා, ඇතුළේ වාඩි කරවලා ළමයින් දාන්න වැඩ පිළිවෙළක් තිබුණා. ඒ ලකුණු අනුව ළමයින් දැම්මා. අද දොස්තරවරුන්ගේ ළමයින් අනාථයෝ වෙලා තිබෙනවා. ළමයෙක් දා ගන්න බැරි නම්, තමන්ගේ පර්මිට් එක ලැබෙන්නේ නැත්නම්, දොස්තරවරුන්ට කොපමණ කථා කළත් දොස්තරවරු මේ ලංකාවේ සේවයට එන්නේ නැහැ. පිටරට යනවා හැරෙන්න වෙන විකල්පයක් ඒ අයට නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

**41954196**

ඇයි දොස්තරවරුන්ට විතරක්?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

විතරක් නොවෙයි. විශේෂ සේවයක්. අපි කියන්නේ අනික් සුදුසු අයටත් ඒවා දෙන්න ඕනෑ. විනිසුරුවරුන්ට දුන්නා. හැම කෙනාටම දුන්නා. ලකුණු පිළිවෙළට. දැන් ඒවා ඔක්කොම කඩා බිඳ දමලා යන නිසා තමයි දොස්තරවරු පාරට බහින්නේ. රට හැරලා යන්නේ ඒකයි. ඔබතුමන්ලා මැදිහත් වන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමා ජනාධිපති නීතිඥතුමෙක්. මැදිහත් වෙලා මේ ප්‍රශ්න විසඳන්න. අර මිනිස්සුන්ව රස්තියාදු කරන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අරකේ තුනයි. මේකෙ දහයයි. කලින් එකේ හතරයි. බොහොම ස්තුතියි කාලය ලබා දීම ගැන.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩියක් ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඊළඟට ප්‍රශ්නය වන්නේ එට්කා ආවාම. මේ එට්කා ආවාම ඊළඟට දොස්තරවරු සහ අපේ සේවකයන් - දොස්තරවරුන්ට තමයි පළමුවෙන්ම බලපාන්නේ. අඩු මුදලට වැඩ කරන ඉන්දියාවේ අය මෙහෙට ඇවිල්ලා සේවය කරන්න ගියාට පස්සේ,තව කොටසක් අපේ ලංකාව හැර යනවා. ඒක නවත්වන්න බැහැ. වෙළඳ සේවා ගිවිසුම ගැහුවාට පස්සේ බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. මේ රට මුහුණ දෙන ප්‍රශ්න මදිවට. මේ හැම ක්ෂේත්‍රයකට බලපානවා. අපි ඊයේ පෙරෙයිදා මේ මන්ත්‍රීවරයෙකුගේ මෙතැන තිබෙන රෙස්ටුරන්ට් එකට ගියා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් අවසන් කරන්න. බොහොම ස්තුතියි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ එට්කා සියල්ල නවත්වන්න. නැත්නම් අපි සියලු දෙනාම ලොකු අමාරුවකට වැටෙනවා. ඒ නිසා මේ අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගේ වැය ශීර්ෂයට පක්ෂ බව ප්‍රකාශ කරමින් අපි නිහඬ වෙනවා. වැඩිපුර කාලයක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 03.19]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කෙටි වෙලාවක් ඉල්ලා ගත්තේ, පසුගිය කාලයේ විවිධ ප්‍රශ්න පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කළා. විශේෂයෙන්ම මම ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ආසනයේ තලාහේන මධ්‍යම බෙහෙත් ශාලාව පිළිබඳව, නැත්නම් මාතෘ සායනය පිළිබඳව දැඩි අවධානයක් සභාව තුළ යොමු කළා. නමුත් මේ වනතුරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් හොඳම අවධානය යොමු වෙලා නැහැ. ගරු ඇමැතිතුමනි, මේ මධ්‍යම බෙහෙත් ශාලාවේ විශාල පිරිසක්, 5000 කට වැඩි පිරිසක් මේ බෙහෙත් ශාලාවෙන් සහන සලසා ගන්නවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ,මේ මධ්‍යම බෙහෙත් ශාලාවේ කෝටි ගණනක් වියදම් කරලා, ඔබතුමාට ඡායාරූප පෙන්වන්න පුළුවන්. මං සතුව ඡායාරූප තිබෙනවා. කෝටි ගණනක් වියදම් කරලා ගොඩනැගිල්ලක් ඉදි කළා. නමුත් මේ වනතුරු මේ ගොඩනැගිල්ල විවෘත කරන්න කටයුතු කරලා නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මම මේ පැත්තටත් විනාඩියක්, දෙකක් දුන්න නිසා ඔබතුමාටත් විනාඩි කිහිපයක් ලබා දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි. මේ තිබෙන්නේ එම ඡායාරූප. මේ වනකොට කෝටි ගණනක් වියදම් කරලා හදපු මෙම ගොඩනැගිල්ල විවෘත කරන්න කටයුතු කරලා නැහැ,ගරු ඇමැතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරනවා. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා. ඒ වාගේම මේ බෙහෙත් ශාලාවේ ඉන්න වෛද්‍යවරිය, මෙම බෙහෙත් ශාලාවේ දැන්වීමක් දාලා තිබෙනවා. මේ

41974198

දැන්වීමේ තිබෙනවා, සතියේ දිනවල පෙරවරු 08.00 සිට 12.00 දක්වාත් , පස්වරු 02.00 සිට 4.00 දක්වාත් මෙම වෛද්‍යවරිය රැඳී ඉන්නවා කියලා. ඒ වාගේම සෙනසුරාදා දිනවල පෙ.ව. 7.30 සිට මාතෘ සායනය පැවැත් වෙනවා. ඒ වාගේම ළදරු සායනය පැවැත්වෙනවා. ඒ ආදී වශයෙන් දැන්වීමක් දාලා තිබෙනවා. නමුත් මේ දැන්වීමට අනුව මේ බෙහෙත් ශාලාවේ කටයුතු සිදු වන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ එක උදාහරණයක් විතරයි, කිව්වේ.

විශේෂයෙන්ම රෝහල් තුළ පිරිසිදුකම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. පිරිසිදු කිරීම් නිවැරදිව සිදු වන්නේ නැහැ. ඒ වාගේම අපේ පළාතේ රෝහල්වල සේවක ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ කරුණු පිළිබඳව ගරු ඇමැතිතුමාගේත්, ඒ වාගේම මේ අමාත්‍යාංශයේත් අවධානය යොමු විය යුතුයි කියලා මම අවධාරණය කරනවා. අපි කවුරුත් දන්නවා.ප්‍රධාන රෝහල්වලින් බෙහෙත් ගන්නවා වාගේම, මේ ග්‍රාමීය රෝහල්වලින්, මධ්‍යම බෙහෙත් ශාලාවලින් විශාල පිරිසක් සේවාවන් ලබා ගන්නවා. විශේෂයෙන්ම දුෂ්කර, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අපේ පළාතේ ජනතාව සේවා සපයා ගන්නේ, මේ රෝහල්වලින්. එතකොට මේවා සම්බන්ධයෙන් අපේ දැඩි අවධානය යොමු විය යුතුව තිබෙනවා. බොහෝ විට අපි අවධානය යොමු කරන්නේ ප්‍රධාන රෝහල්වලට පමණයි. මේ වාගේ කුඩා කුඩා ස්ථානවලට අපි අවධානය යොමු කරන්නේ නැහැ. ඒ නිසාම ඒවායෙන් සේවාවන් ගන්නා පිරිස්වලට බරපතළ ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන් මම දැන් සඳහන් කරපු තලාහේන බෙහෙත් ශාලාවේ වැඩ දිනයක, මම එහි සහභාගි වුණා. මච්වරුන් ඉන්නවා. ඔවුන්ට ඉඳගන්න තැනක් නැහැ. ගොඩනැගිලි දිරාපත් වෙලා. කෝටි ගණනක් වියදම් කරලා ගොඩනැගිල්ලක් ඉදි කරලා, ඒක දිරාපත් වෙන්න ඉඩ හැරලා, ඒක විනාශ වෙන්න ඉඩ හැරලා අර ගොඩනැගිල්ලේ මේවා පවත්වාගෙන යනවා. ඒ නිසා එහි කිසිසේත්ම ඔවුන්ට සුදුසු පරිසරයක් නොවෙයි තිබෙන්නේ. ඒ නිසා මෙය එක උදාහරණයක් විධියට කිව්වේ. ඔබතුමාගේ පැත්තෙන් මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ප්‍රදේශය තුළ සංචාරය කරලා, ඔබතුමා කාල සටහනක් සකස් කරගෙන මේ වාගේ තැන්වල සංචාරය කරලා, පෞද්ගලිකව අධ්‍යයනය කරලා, මේ දේවල්වලට මැදිහත් වෙන්න පුළුවන් නම්, මම හිතනවා වඩා යහපත් කියලා. අපේ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යය සම්බන්ධයෙන් කටයුතු කරද්දී, ඒ අදහස යොමු කරමින් මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 03.21]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමන්ගේ වැය ශීර්ෂයන් පිළිබඳව අදහසක් දක්වන්න ලැබුණු අවස්ථාව, මම අගය කොට සලකනවා. අද උදෑසන සිට මේ සභාව ආමන්ත්‍රණය කරපු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කථා කළේ, රට තුළ පවතින ව්‍යසනයන් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ අපට ජාතික වශයෙන් පැවරෙන වගකීම පිළිබඳවයි. බස්නාහිර පළාත කියන්නේ, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් අති දැවන්ත ජනගහනයක් ජීවත්වන බලප්‍රදේශය. සමස්තයක් වශයෙන් මුළු රටටම වසංගත රෝග බෙදා හරින කේන්ද්‍රස්ථානය බවට පත් වන්නේ කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක තුන. මොකද, රටේ වැඩ කරන ශ්‍රමිකයන්, වැඩ කරන ජනතාව බහුතරයක් ගැවසෙන ප්‍රදේශයක් බවට මේ දිස්ත්‍රික්ක තුන හඳුනාගෙන තිබෙන නිසා. ඩෙංගු රෝගය පිළිබඳව අද බොහෝ දෙනෙක් කථා කළා. ඩෙංගු රෝගයෙන් සිදුවන ව්‍යසනය පිළිබඳව කථා කළා. මේ තත්ත්වය නිර්මාණය වීම
[ගරු ජගත් අංගගේ]

තුළින් කොපමණ නම් අවාසනාවන්ත තත්ත්වයකට අද පළාත පත් වෙලාද කියන එක පිළිබඳව මේ සමීක්ෂණ වාර්තාවලින් පැහැදිලි වෙනවා. ගරු සභාපතිතුමනි, 2010 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන්නේ රෝගීන් 5937 යි. 2016 මේ වන කොට 14,510 ක් රෝගීන් වාර්තා වෙනවා. මේක තමයි ඇත්ත කතන්දරය. 2010 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයෙන්5937 ක් රෝගීන් මුණගැසෙන කොට, මරණ 57 ක් වාර්තා වෙනවා. අද 14,510 ක් රෝගීන් සොයා ගත්තත් කොළඹ දිස්ත්‍රික්කයෙන් මරණ 18 යි වාර්තා වෙන්නේ. ඒ කියන්නේ වෛද්‍යකාර්යමණ්ඩලවල වගකීම ඔවුන් ඉතාමත් මැනවින් ඉෂ්ට කරමින්, අද මේ රෝගයෙන් මැරෙන සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා ඔවුන් දැවැන්ත මෙහෙවරක යෙදිලා ඉන්නවා. 2010 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් 3960 ක් රෝගීන් වාර්තා වන කොට 34 දෙනෙක් මරණයට පත් වෙනවා. අද ගම්පහ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 6042 ක් වාර්තාවන අතරතුර 13 දෙනෙක් පමණයි මරණයට පත් වෙන්නේ. විශේෂඥ වෛද්‍ය පඛා පළිහවඩන

**41954196**

වෛද්‍යතුමියට කථා කරලා තමයි මම මේ තොරතුරු ඉල්ලා ගත්තේ. කළුතර දිස්ත්‍රික්කයේ මට එච්චර පැහැදිලි වාර්තාවක් නැහැ. නමුත් මේ වන කොට කළුතර දිස්ත්‍රික්කයේ 2334 ක්.කොළඹ 11,413 ක්. මේ මටලැබිලා තිබෙන වාර්තා. කළුතර 2334 ක් වෙනවා. මරණයට පත් වුණු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු හතර දෙනෙක්, පස් දෙනෙක් පමණ කියලා තිබෙනවා. මට තවම නිශ්චිත වාර්තා නැහැ, ප්‍රකාශයට පත් කරන්න. මේක තමයි සත්‍ය තත්ත්වය. අපි දන්නවා, සෑම වර්ෂයකම මේ රෝගීන් පිළිබඳ වාර්තා වන ප්‍රමාණය වැඩි වන්නේ පැහැදිලිව ජූනි, ජූලි, අගෝස්තු මාසවල. ජූනි, ජූලි, අගෝස්තු මාසවල මේ දිස්ත්‍රික්කවල - මේ දීලා තිබෙන සංඛ්‍යාලේඛන, සමහරවිට කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත් කොළඹ මහ නගර සභා සීමාවේ පළාත් සභාවට අහු නොවන ප්‍රදේශ තිබෙනවා. ඒ වාගේම කළුතර NIHS aria එක අහු වන්නේ නැහැ. ඒවායේ සමීක්ෂණ තොරතුරු එකතු වන්නේ නැහැ. සමස්තයක් වශයෙන් බැලුවාම රෝහිය අමාත්‍යාංශය තුළ තමයි සමස්ත තොරතුරු ඒකරාශී වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ හැමෝම ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳව කථා කරනවා,මේ රටට ජාතික ප්‍රතිපත්තියක් නැති නිසා රටේ ජනතාව පීඩාවට පත් වෙනවාය කියලා. ඇත්ත වශයෙන්ම මේක තමයි සත්‍යය කාරණාව. පළාත් සභාවේ වෙන්න පුළුවන්. මධ්‍යම රජයේ වෙන්නපුළුවන්. සමස්තය මේ පාලන ව්‍යුහය සකස් කරලා තිබෙන්නේ, මධ්‍යම රජයේ හෝ පළාත් සභාව හෝ ව්‍යවස්ථාපිත කරලා තිබෙන්නේ, ජනතාවගේ ආරක්ෂාව, රැකවරණය සහ ඔවුන්ගේ අනාගතය නිර්මාණය කරන්නයි. දැන් මොකද කරන්නේ? ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන ආකාරය පිළිබඳවමම මෙතැන කථා කරන්නේ නැහැ . ඒක ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කළා. PSDG කොච්චරද?PDG කොච්චරද? උපමාන පාදක කොච්චරද? විශේෂ ව්‍යාපෘති, ලෝක බැංකු ආධාර, අමාත්‍යාංශවලට දෙන ප්‍රදාන මේ සියල්ලම බැලුවාම මිලියන 1400 ක් විතර ගරු ඇමැතිතුමනි, මෙතැන පෙන්නුම් කරනවා. නමුත් පසුගිය වර්ෂත් එක්ක සාපේක්ෂව බැලුවාම එන්න එන්න පළාත් සභා බල ප්‍රදේශයේ ජනගහනය වැඩි වෙනවා. අමාත්‍යාංශයට වෙන් වන මුදල් ප්‍රමාණය සෘණ පැත්තට යනවා. ඉතින් මේ අමාත්‍යාංශවල වැඩ කටයුතු මේ ආකාරයෙන් කරගෙන යන්නේකොහොමද? කොහොම වුණත් අපට ලැබිලා තිබෙන ප්‍රදානයන් පිළිබඳව සලකා බලලා ඉතාමත් අරපිරුමැසුම් දායකව, වැඩි ඵලදායිතාවයක් තබන්න පුළුවන් විධියට මේ මුදල් ආයෝජනය කරන්නේ කොහොමද කියන කාරණාය පිළිබඳව ගරු ඇමැතිතුමාට මහා දැවැන්ත වගකීමක් පැවරෙනවා. ඒක තමයි විශේෂ කාරණාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ඩෙංගු රෝගය පිළිබඳව, සමීක්ෂණ වාර්තාත් එක්කම පසුගිය දවස්වල බැලුවා. මේක පාලනය කරන්නේ කොහොමද? මම මේ අවස්ථාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා මේ කටයුත්තේ බැරෑරුම්කම තේරුම් ගත්තා. රෝහිය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ 12 ක් ඒකාබද්ධ කරලා ජනාධිපති කාර්ය සාධන බලකායක් නිර්මාණය කළා. මේක තනියෙන් කරන්න බැහැ. ඒ නිසා අනික් සියලු අමාත්‍යාංශ මේ කටයුත්තට ප්‍රමුඛතාවය දීලා, මේ සෞඛ්‍යඅමාත්‍යාංශයට උදව් කරන්න ඕනැය කියන මතයට එතුමා මේ ප්‍රශ්නය ගෙනාවා. ගෙනැල්ලා තමයි මේ පාලනය ඇති කළේ. දැන් මට මතකයි. ඒ දවස්වල මීගමුවේ අපට විසඳගන්න බැරි දැවැන්ත ප්‍රශ්නයක් සිදු වුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය, මෙහෙන් කොලොන්නාව, ඒ පැත්තෙන් බලන කොට මීගමුව. පාලනය කරගන්න බැරි තත්ත්වයකට ආවා. ඩෙංගු රෝගය සඳහා විශේෂ ඒකකයක් මීගමුව රෝහලේ අපි නිර්මාණය කළා. මේ මරණ සංඛ්‍යාව අඩු කරගන්න, දැවැන්ත වැඩ සටහනක් ක්‍රියාත්මක වුණා. අද දවස වන කොට කළුතරට එහෙම විශේෂ අවස්ථාවක් නැහැ. කොළඹ දිස්ත්‍රික්කයේ මහ රෝහල තිබෙන නිසා යම් යම් ව්‍යාපෘති තිබෙනවා. නමුත් කළුතර එහෙම දෙයක් හරියාකාරව ස්ථාපිත වුණේ නැහැ. හැම රෝහලකම පුංචි පුංචි ඒකක තිබෙනවා. නමුත් සමස්තයක් වශයෙන් මේකට විශේෂිත වූ ඒකකයක්. ඒ මදිවට පසුගිය දවස්වල සේවක කාර්ය මණ්ඩලවල සුළු සේවකයන් අඩුයි කියලා, විශේෂ පුහුණුවක් දීලා පාරට බස්සපු ඩෙංගු ක්ෂණික විහිදුම් බලකාය විසුරුවා හැරලා, ඒ අයට කැමැති කැමැති ඉස්පිරිතාලවලට යන්න කිව්වා. මම ළඟ වාර්තාවක් තිබෙනවා. ඉස්පිරිතාලවලට දෙන්නා තුන්දෙනා දාලා තිබෙනවා. කළුතර බැලුවොත් එහෙම මේ දාලා තිබෙන්නේ MOH Office වලට හතර දෙනයි. පස් දෙනයි. මේ හතර පස් දෙනා මොනවා කරන්නද? ඉස්සර හැම MOH Office එකක්ම ක්ෂණික විහිදුම් බලකායට සම්බන්ධ කරලා, කොළඹ අමාත්‍යාංශයෙන් පාලනය කරන වැඩ සටහනක් ක්‍රියාත්මක කළා. දිස්ත්‍රික්ක තුනේ කොතැනින් හදිසි

ඇමැතිතුමක් ලැබුණත්, Hotline No's දෙකක් දීලා තිබුණා. යම් කෙනෙක් මොකක් හරි ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් එහෙම, ක්ෂණිකව ඒක MOH Office එක හරහා ක්‍රියාත්මක වෙනවා. එවලේම ගිහිල්ලා, ඒ ස්ථානගතව පරීක්ෂණයක් කරලා වැරැද්දක් තිබෙනවා නම්, එය නිවැරැදි කරන්න අවශ්‍ය නෛතික බලය මේ සභාවේ ප්‍රඥප්තියක් අනුමත කරලා මේ නොසැළකිලිමත්කම නිසා මේ රෝගය සමාජයේ ප්‍රචලිත වීම වළක්වන්න අපි දැවැන්ත වැඩ පිළිවෙළකට යොමු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ බරවා රෝගය හැදුණා. බරවා රෝගය හැදුනාම ඒ රෝගියා ඉදිමෙනවා. ඒ රෝගියා මිය යන්නේ නැහැ. මොකද, ලංකාවටම ව්‍යාප්ත සේවාවක් බවට පත් වුණා. හැම MOHDivisionඑකකටම රුධිර පටල පරීක්ෂා කරන නිලධාරීන්ව දුන්නා. මහා දැවැන්ත නිලධාරීන් කොටසක් සිටියා. දැන් මේ ක්ෂණික විහිදුම් බලකාය, මෙකේ හිටපු සාමාජිකයන් විසුරුවා හරින්න හේතුව ඇහුවාම මට මොකක්ද කිව්වේ? ගිය පාර සභාවේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙනවා. මම මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. මෙය නිවැරැදි කරන්නය කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා. මේ මන්ත්‍රීවරු සියලු දෙනා මේ අයවැය විවාදවලදී කථා කරන්නේ, අඩුපාඩු හරිගස්සගෙන ඊළඟ තැනදී ඒක නිවැරැදි කරගන්නයි. මේ වර්ෂයේ අද දවස වනතුරුත් මේ විසුරුවා හැරපු ක්ෂණික විහිදුම් බලකාය ඒකරාශී කරගන්න බැරි වුණා. කළුතර දිස්ත්‍රික්කයේ 2014 වසර වන විට එක මරණයයි වාර්තා වන්නේ. අද වන කොට 06 දෙනෙක් විතර මරණයට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය පාලනය කරගන්න. අපි නිලධාරීන්ට බැණලා වැඩක් නැහැ. ඒ අයට අපි සහයෝගය දෙන්න ඕනෑ. ඒ අයට අවශ්‍ය කරන ශ්‍රම බලකාය අපි නිර්මාණය කරලා දෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හිටපු ගරු අමාත්‍යතුමා, නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ විනාඩි 05 ත් ඔබතුමාට එකතු වෙනවා. ඔබතුමා තව ඉතිරිව විනාඩි 03 ක කාලයකුත් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

බොහොම ස්තුතියි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේවා අපි ප්‍රමුඛතාවය දිය යුතු කාරණා හැටියට සලකන්න ඕනෑ. බරවා රෝගය මර්දනය කිරීම සඳහා එතරම් දැවැන්ත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ රට තුළ, ජීවිත විනාශයට පත් වන මේ ඩෙංගු රෝගය පාලනය කරන්න කිසිම විධිමත් වැඩ පිළිවෙළක් නැහැයි කියලා මම චෝදනා කරනවා. මධ්‍යම රජය මීට වැඩිය වගකීමකින් මීට වඩා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීලා, අවශ්‍ය ශ්‍රම බලකාය නිර්මාණය කරලා, මේක මර්දනය කරන්න මහා දැවැන්ත මෙහෙවරක් කළ යුතුව පවතිනවා. නමුත් ඒ පිළිබඳව කිසිම හැඟීමක්, දැනීමක් නැති ආකාරයෙන් ක්‍රියා කිරීම නිසා තමයි මේ ආකාරයෙන් විශාල වශයෙන් මෙම රෝගය වැළඳීමෙන් මරණවලට ගොදුරු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රෝගීන් සංඛ්‍යාත්මක වශයෙන් අපට පෙන්නුම් කරන විධියට, ලංකාවේම දැන් අපි කිව්වා, 47,000 ක් පමණ රෝගීන් මුණගැසිලා තිබෙනවා කියලා. මේ සමීක්ෂණ වාර්තා කොපමණ දුරට නිවැරැදියි ද කියලා කියන්න මම දන්නේ නැහැ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රෝගය වැළඳුනාට පස්සේ, ඒ මනුස්සයා ශාරීරික වශයෙන් දුබලතාවයට පත් වෙනවා. ශරීරයේ යම් යම් අවයවවල ආසාත්මිකතත්ත්වයන් ඇති වෙනවා. ඒ නිසා ඔහුට නැවත ක්ෂණිකව ප්‍රකෘති මනුස්සයෙක්හැටියට තමන්ගේ ශ්‍රම
[ගරු ජගත් අංගගේ]

බලකායට එකතු වෙලා රට වෙනුවෙන් වැඩ කරන්න බැරි වෙනවා. ඒක නිසා මේක මහා දැවැන්ත ව්‍යසනයක්. මේ තරම් භයානක තත්ත්වයක් තුළ මේ රටේ පුරවැසියන් ගැන සෞඛ්‍යය අමාත්‍යාංශය මෙපමණට හිතන්නේ නැතිවයි ක්‍රියාත්මක වන්නේ. මට මේ තොරතුරු සොයා ගන්න හරි අපහසු වුණා. නමුත් කොහොම වුණත් මම විශ්වාස කරන හැටියට ගරු ඇමැතිතුමා, අපි මධ්‍යම රජය එක්ක මේ පිළිබඳව යම්කිසි සංවාදයක් ඇති කරගන්න අවශ්‍යයි. මධ්‍යම රජය විශ්වාස කරනවා නම්, සියලු දේ කරන්න ඕනෑ මධ්යම රජය කියලා, පළාත් සභාව තිබෙන්නේ ඔවුන්ගෙන් හැලෙන කෑලි අහුලගෙන දුවන්න කියලා.ව්‍යවස්ථාපිත ආයතනයක් හැටියට අපට ඒ වගකීමෙන් නිදහස් වෙන්න බැහැ. එහෙම හිතනවා නම් විශාල වැරැද්දක්.

අනික් එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශය යටතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක කටයුතු, සභා කටයුතු

**41954196**

අමාත්‍යාංශ යටතේ මේ එක පවුලක සහෝදරයෝ ටිකක් වාගේ. දැන් සමාජ සේවා අමාත්‍යාංශය බලන්න. මේ පාර පට්ට පතුරු ගහලා දාලා. ඒකට නැහැ. සමාජ සේවා අමාත්‍යාංශය සහ ආයුර්වේද ආමාත්‍යාංශය යටතේ අපි රෝග නිවාරණ කටයුතු වාගේම පෝෂණ ව්‍යාපෘති ආදී වශයෙන් කරලා, එක දිගට සම්බන්ධ කර ගත්තා. දැන් මොනවක්වත් නැහැ. දැන් අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ මගෙන් ඇහුවා, පැවැදි පක්ෂයට ඒ දවස්වල කරපු ව්‍යාපෘතිය දැන් ක්‍රියාත්මක වෙන්නේ නැද්ද කියලා. අපි පැවැදි සුවපියස කියලා උන්වහන්සේලාත් එක්කත් ඒකාබද්ධ වෙලා, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළා. මොකද හේතුව, උන්වහන්සේලාගේ ආහාර රටාවේ වෙනසක් ඇති වෙන්න ඕනෑ. දියවැඩියා රෝගය පැතිරෙනවා. දැන් අර ඉස්සෙල්ලා කිව්වා වාගේ තුන් බිය පැතිරෙනවා. බුදුන්ගේ කාලයේ වාගේ. බුදුන් වහන්සේ දේශනා කළා, "ආරෝග්‍යාපරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" කියලා. මේ ධනය නැති රටක මිනිස්සු හිඟන්නෝ. හිඟන්නෝ කියන්නේ, සමහරවිට කෝටිපතියෙක් වෙන්න පුළුවන්. ඒ මනුස්සයා දිය වැඩියාවෙන් පෙළෙනවා නම්, කිසි දෙයක් කරගන්න බැරි නම් ඒ මනුස්සයා මානසික හා කායික වශයෙන් හිඟන්නෙක්. සල්ලි තිබුණාට, මිනිස්සු පොහොසත් වන්නේ නැහැ. ඒ නිසා රටක සමෘද්ධිමත් ජාතියක් බිහි කරන්න නම්, මේ රටේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ජීවත් වෙන්න ඕනෑ. එතකොට තමයි ඔවුන්ගේ මොළය හොඳට වර්ධනය වන්නේ. නිර්මාණශීලී භාවය ඇති වන්නේ. රට ගොඩනඟන්න දායක වන්නේ. රටේ ඉන්න එවුන් ටිකට, වාඩි වුණු තැන උදේ සිට සවස් වනතුරු නින්ද යනවා නම්, ඒ රට ගොඩනඟන්න බැහැ. දියවැඩියා රෝගයේ මූලික ලක්ෂණයක් ඒක. අද පැහැදිලිව ඇතිවෙලයි කිව්වේ, තුන් බිය ඇති වෙලයි කියලා කිව්වේ. දියවැඩියා රෝගය සීඝ්‍රයෙන් ඉහළ යනවා. ඒ වාගේම පිළිකා රෝගය ඉහළ යනවා. අපේ සලෝචන ගරු මන්ත්‍රීතුමා දැන් කරුණු පැහැදිලි කළා. දියවැඩියා රෝගය, පිළිකා රෝගය මේ වාගේ රෝගී තත්ත්වයන්ගෙන් අද අපට ගැලවෙන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් සුමිත්ලාල් මැන්දිස් අපේ ගරු ඇමැතිතුමාට කියනවා. ගරු ඇමැතිතුමනි, තමුන්නාන්සේට මේ මධ්‍යම රජය සලකන ආකාරය පිළිබඳව අපි සන්තෝෂ වෙන්නේ නැහැ. මධ්‍යම ආණ්ඩුව හිතනවා නම්, සල්ලි වියදම් කරන්නේ අපි. අපේ කුළී වැඩ කරන්න තමයි පළාත් සභාව ඉන්නේ කියලා. ඒක සාධාරණ නැහැ. පළාත් සභාව කියන්නේ, කුළී හේවායන්ගේ සංස්ථාවක් නොවෙයි. පළාත් සභාව කියන්නේ, ව්‍යවස්ථාපිත බලයක් සහිතව තමන්ගේ බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ වගකීම් භාරගත් ආයතනයක්. ඒ ආයතනය ක්‍රියාත්මක කරන කොට පුළුවන්තරම් ලැබෙන්න තිබෙන අයෝජන කප්පාදු කරලා - දැන් අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ලැයිස්තුවක් කියාගෙන කියාගෙන ගියා. පානදුරට මෙච්චරක් දෙනවා කිව්වා. අතනට මෙච්චරක් දෙනවා කිව්වා. මෙතැනට මෙච්චරක් දෙනවා කිව්වා. ඒවා කරන්න පළාත් සභාව තිබෙන්නේ. පළාත් සභාවට සල්ලි එව්වාම, පළාත් සභාවෙන් වැඩ කරනවා. ඒක තමයි සාධාරණ දේ. පළාත් සභාව තමයි, පළාත් සභාවේ තිබෙන රෝහල් පද්ධතිය පිළිබඳව හොඳට හඳුනාගෙන තිබෙන්නේ. ඒකට තමයි කාර්ය මණ්ඩලයක් පත් කරගෙන තිබෙන්නේ. ඒ කාර්ය මණ්ඩලය මෙතැනින් පත් කරලා තිබෙනවා. අරහෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. මේවා සර්ව සාධාරණ නැහැ. මේවා කරන්නේ මොන අරමුණක් ඇතිවද කියලා අපට නම් පැහැදිලි නැහැ.

දැන් බලන්න. මේ පාර සමාජ සේවා දෙපාර්තමේන්තුවට බකල් ගහලා යන්න වෙන්නේ. ගිය පාර PSDG 2015 වර්ෂයේ රුපියල් මිලියන 15 යි. 2016 වර්ෂයේ රුපියල් මිලියන16 යි. 2017 රුපියල් මිලියන 04 යි. කොහොමද මේක කරන්නේ? මේ තිබෙන තත්ත්වය තුළ. PDG 2015 රුපියල් මිලියන 25 යි. 2016 රුපියල් මිලියන 28 යි. 2017 ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. තවම මොකුත් නැහැ. ඊළඟට සුභසාධන වැය ශීර්ෂයේ,2015 මිලියන 277 ක් තිබෙනවා. 2016 මිලියන 270 ක් තිබෙනවා. දැන් මේ පාර ජනගහන අනුපාතයත් එක්ක මිලියන 280 කට යන්න අවශ්‍යතාවය තිබෙනවා. මේක යන්තම් ඉස්සරහාට තල්ලු කරගෙන යන්න අඩුම ගණනේ මිලියන 300 ක අවශ්‍යතාවයක් තිබෙනවා. මේ දෙපාර්තමේන්තුවට. මෙහෙම මේ දෙපාර්තමේන්තුව දුවන්නේ කොහොමද? මේ දෙපාර්තමේන්තුවල වැඩ කරන නිලධාරීන් ගෙදරින් අරන් ඇවිල්ලා සල්ලි බෙදන්නද? ඉතින් මේවායේ අප්‍රසාදය අවසානයේ ගරු ඇමැතිතුමාට එනවා. අඩු ගණනේ ඉස්සරහාට පළාත් සභාවට පිං පඩියක් දෙන්න විධියක් නැහැ. ඒ තත්ත්වයට පළාත් සභාව පත් වෙනවා. මේ තත්ත්වයන් පාලනය කරගන්නමොනවාද කරන්නේ කියලා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩලය ඒකරාශි වෙලා යම්කිසි කථිකාවතක් කරන්න

වේවි. එහෙම නැතිව අපි මේ ඉලක්කම් ටික කියවලා, මෙහෙම වෙලා තිබෙනවා කියලා සෑහීමකට පත්වෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනිඅනික් එක, අපි පළාත් සභාව විසින් මුදල් උත්පාදනය කර ගත්තේ -කොහොමත් මම දරන ස්වාධීන මතය තමයි BTT එක පළාත් සභාවට නැති වුණු එක ගැන මගේ හිතේ වේදනාවක් තිබෙනවා. ඒක සංසිඳවන්න බැරි වේදනාවක්. මම පළාත් සභාවට ආදරය කරනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු 25ක කාලයක් මේ පළාත් සභාවේ කටයුතු කරන කෙනෙක් හැටියට මගේ හිතේ වේදනාවක් තිබෙනවා. දැන් උදාහරණයක් හැටියට ගත්තොත් කිරිබත්ගොඩ පංචකර්ම මධ්‍යස්ථානය. කිරිබත්ගොඩ පංචකර්ම මධ්‍යස්ථානය කියන්නේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අතිවිශාල මුදලක් උත්පාදනය කරන ආයතනයක්. ඒකට සාපේක්ෂව අපි මොල්ලිගොඩ කරපු පංචකර්ම මධ්‍යස්ථානය. තනිකර සංචාරක කලාපයක් මැද තිබෙන පංචකර්ම මධ්‍යස්ථනය. ලක්ෂ ගණනාවක් මාසයකට මුදල් උත්පාදනය කරන්න ඕනෑ තැන. යම් යම් තීන්දු තීරණ ගන්න ප්‍රමාදයන් තිබෙනවා. ගරු ඇමැතිතුමාට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ආණ්ඩුකාරතුමාගේ මට්ටමින් කරන්න ඕනෑ . එක එක්කෙනාගේ වගකීම් පැවරිලා තිබෙන ඒවා ඉෂ්ට කරන්නේ නැහැ. ඒ ආදායම් උත්පාදනය කරන්න තිබෙන තැන් සේරම ඒවායේ හිර වෙලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විෂයය පද්ධතිය තුළ කථා කරනවා නම්, මට මේ කාලය පිළිබඳ ගැටලු මතු වෙනවා. මම ඔබතුමාට අවනත වෙනවා. මම දන්නවා. අවසාන වශයෙන් ඔබතුමා අපහසුතාවයට පත් වෙනවා කියලා. කොහොම වුණත්, මේ පවතින තත්ත්වයන් පිළිබඳව මම අතිශයින්ම කනගාටු වෙනවා. මේ ආකාරයෙන් රටේ මේ තත්ත්වය පාලනය කර ගන්නේ නැතිව, මේ විඳින දුක් කරදර වේදනා අතිශයින්ම කනගාටුදායකයි. අවසාන වශයෙන් මම ඔබතුමාට එකක් සිහිපත් කරනවා. පෞද්ගලික රෝහල්වලින් අලුතෙන් බදු අය කිරීමේ ක්‍රමවේදය ගැන. පෞද්ගලික රෝහල්වලින් බදු අය කරලා රටට ආදායම ගත්තාට කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික රෝහලට ගිහිල්ලා, තමන්ගේ මුදල් වියදම් කරලා සේවාව ලබන මේ රටේ පාරිභෝගිකයා, ඒ මනුස්සයා රටේ දුක් විඳින ජනතාවට ලොකු උදව්වක් කරන්නේ. දැන් මොකද වෙන්නේ? ඔපරේෂන් එකක් කරන්න ගියාම 15% ක වැට් බද්දක් ගහනවා. ඒ මනුස්සයා ආපසු ආණ්ඩුවේ රෝහලට යනවා. රටේ ජනතාවගේ සුභසාධන සේවාවක් හැටියට සෞඛ්‍යය පවත්වාගෙන යනවා නම් පෞද්ගලික රෝහල්වලට යවන්න පුළුවන් කට්ටිය උපරිම සහන දීලා,ඒ තැන්වලට යවන්න ඕනෑ. එතකොට ඒ මුදලත් ආණ්ඩුවට ඉතුරුයි. ආණ්ඩුව පෞද්ගලික රෝහල්වලට පුළුවන් තරම්, අවස්ථාව දෙන්න ඕනෑ. පුළුවන් තරම් රෝගීන් ඒ අංශයට යොමු කරන්න ඕනෑ. ඒ වෙනුවට මොකද කරන්නේ? ඒවාට බදු ගහනවා. ඒකෙන් තව කට්ටියක් ජීවත් කරවන්න හදනවා. මධ්‍යම ආණ්ඩුව ක්‍රියා කරන මේ ක්‍රමවේදය මොකක්ද කියලා කාටවත් පැහැදිලි නැහැ. මට තේරෙනවා. ඔබතුමා දැන් අපහසුවට පත් වෙලා තිබෙන්නේ. මට කථා කරන්න කොපමණ දේ තිබුණත් මම ඔබතුමාටත්, මගේ ගරු ඇමැතිතුමාටත්, සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙනවා.
[ගරු ජගත් අංගගේ]

අපි ලබන අවුරුද්දේ සාකච්ඡාවෙන්, සම්මුතියෙන් යහපත් අනාගතයක් නිර්මාණය කරන්න දායක වෙන්න කටයුතු කරමුයි කියලා යෝජනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගිය සිකුරාදා මම බීමත්ව ඇවිල්ලා මේ සභාවට කරදර කළා කියලා මේ පත්තරේ දාලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බිව්වේ නැද්ද?

**41954196**

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම සාමාන්‍යයෙන් අපේ ගම්වල කොටහලු ගේකටවත්, මඟුල් ගේකටවත්, මළ ගෙයකටවත්, එහෙම පාර දිගේවත්, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ වරප්‍රසාදය - පැහැදිලි කිරීමක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සභාවට ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට මම බීලා ඇවිල්ලා නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවට යොමු කරලා විශේෂ අවධානයක් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පත්තරේ දාලා තිබෙනවා නේ?නාවික හමුදාපති ගහපු එකට මම විරුද්ධයි. ඒ වාගේම මේක පත්තරේ ලියලා තිබෙන එකටත් මම විරුද්ධයි. මගේ නම දාලා ලියලා තිබෙනවා. ඒකේ අනික් පැත්ත මේ වරප්‍රසාද පොතේ කොහෙවත් තිබෙනවාද මේ සභාවට බීමත්ව එන්න බැහැයි කියලා. වරප්‍රසාද ප්‍රශ්නයක් අහන්න, එය රීති පොතේ තිබෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා බීලා ආවා නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොතේ නැති නිසාද ඔබතුමා බීලා ආවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බීලද කියලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

එදා හැසිරුණු විධිය කැතයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ වාඩි වෙන්න කෝ. මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා එක්ක නේ කථාව තිබෙන්නේ. තමුන්නාන්සේ වාඩි වෙන්න. තමුන්නාන්සේ අහගත්තා නේ ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අදත් බීලද කොහෙද ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පොඩ්ඩක් ඉන්න කෝ. එහෙමනම් ඇයි එවලේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ලක්ෂ 5000 ක නඩුවක් දානවා. (බාධා කිරීම්) මේ රීති පොතෙත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර මේ සභාවේ කාලය නාස්ති කරන්න එපා. මේ සභාවේ කාලය ප්‍රවේශම් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රීති පොතේ, මේක පෙන්වන්න.

41974198

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ පිළිබඳව අපි අවශ්‍ය කටයුතු කරනවා. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ආණ්ඩුවට මඩ ගහනවා කියලා, මට එහෙම මඩ ගහන්න බැහැ නේ?මටත් වරප්‍රසාදයක් තිබෙනවා නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා හැන්සාඩ් එක හරහා මේක මාධ්‍යයට නිවැරදි කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ පිළිබඳව මම අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම හොඳ ප්‍රසිද්ධ දේශපාලඥයෙක්. මම කිසි වැරැද්දකට අහු වෙලා නැහැ. මම ජීවිතයට මඩ ගහලා නැහැ. මම ජීවිතයට කොහෙවක්වත් බීලා හැසිරිලා නැහැ. මම හැසිරෙන්නෙත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න. ඔබතුමාගේ අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම අවුරුදු 29 ක් අපි මෙහි ඉන්නවා. ජොෂ්ඨයෝ වාගේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එක්කෝ ඔබතුමා මාධ්‍යයේ නිවැරදි කරලා දෙන්න. නැත්නම් හෙට මම මේකේ බුදියනවා. යහපාලනයෙන් රට කාපු හැත්ත. රට කාපු හැත්ත කථා කරන්නේ. රට කාලා කාලා කාලා බංකොලොත් කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැනුත් බීලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ ගරු සභාව හැල්ලුවට ලක් කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවට ඇතුළු වන විට අපිව අර අග පසහ හැම තැනම අතගාලා පරීක්ෂා කරලා [ගරු මහින්ද ජයසිංහ]

ගන්නවා වාගේ, මේ බැලුමක් පුම්බලා ගන්න කියන්න. මම විහිළුවක් නොවෙයි කළේ. ඇත්තට මේ බැලුම් පුම්බලා ගත්ත නම් මේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ. බීලා ඉන්නේ කවුද? නැද්ද කවුද? කියලා පේනවා. ප්‍රතික්ෂේප කරන්න බැහැ නේ. එතකොට කාටවත් ප්‍රතික්ෂේප කරන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

යෝජනාවක් ගෙනෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඉදිරියේදී අපි එවැනි තත්ත්වයක් ගැන සලකා බලමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යෝජනා ගෙනැල්ලා ස්ථිර කරගන්න. මේ වාගේ රට කාපු, ගිණි තියපු, විනාශ කරපු, බස් ගිණි තියපු, වෛද්‍ය කාර්යාල ගිණි තියපු හැත්ත මේ අය.

**41954196**

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රට අද දුක් විඳින්නේ ඇයි? මේ අය තමයි රට කෑවේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා,

[සභාවේ ඝෝෂා]

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, කරුණාකරලා ඔබතුමා මන්ත්‍රීතුමාව පාලනය කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මන්ත්‍රීතුමා බීලා ඇවිල්ලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අදත් බීලා ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාගේ කථාවෙන් මේ කාලය අඩු වෙනවා.

[අ.භා. 03.45]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කරන වෙලාවේ, මේ අමාත්‍යාංශයට බාහිර විෂයයක් වන මත්පැන් බීලා මේ සභාව අවඥාවට ලක් කිරීමට කටයුතු කිරීම ගැන මම කනගාටු වෙනවා.

අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා අලුත් අමාත්‍යවරයෙක් හැටියට පත් වෙලා, මේ අමාත්‍යාංශය භාර අරගෙන, බොහොම ටික කාලයයි වෙන්නේ. එතුමා වැඩ භාර අරගෙන බොහොම යුහුසුළුව කටයුතු කරන, අපේ දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක් හැටියට අපි සතුටු වෙනවා. ඒ වාගේම අපේ කථා කරපු හුඟක් මන්ත්‍රීවරු දිහා බැලුවාම,මේ අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය විද්‍යාව ගැන කථා කරනවා බොහොම අඩුයි. අපේ රටට ආවේණික වුණු, අපට උරුමයක් වුණු අපේ දේශීය වෙදකම අද අපට නැති වෙලා තිබෙනවා. අද මේ වාගේ සභාවකත් ඒ ගැන කථා කිරීම බොහොම දුර්වල වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි අද අපේ දේශීය වෛද්‍ය විද්‍යාව පසුබෑමකට ලක් වෙලා තිබෙන්නේ. නමුත් අද අපි දකිනවා. දේශීය වෛද්‍ය විද්‍යාව තුළ බටහිර වෛද්‍ය විද්‍යාවට වැඩිය රෝග නිවාරණය කිරීමේ බලයක්, ශක්තියක් තිබෙනවා. ඒ නිසා අතීතයේ තිබුණු අපේ ජාතිය ගැන බැලුවාම අතීතයේ හොඳ සෞඛ්‍ය සම්පන්න හොඳ ජවයක් තිබෙන ජාතියක් හැටියට ශ්‍රී ලාංකීය ජාතිය හඳුන්වන්න පුළුවන්. නමුත් අද බොහොම ලෙඩ රෝගවලින් පිරුණු, කායික ශක්තියෙන් අඩු ජනතාවක් බවට අපේ ජනතාව පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි මේ බටහිර වෛද්‍ය විද්‍යාවට හුරුවීම කියන එකයි මගේ මතය. අද අපේ දේශීය වෛද්‍ය විද්‍යාව ගණන් ගන්නේ නැහැ. ඉස්සර නම් ගමක හිටිය වෙද මහත්තයා තමයි ගමක සිටිය ප්‍රධානියා වුණේ. එතුමා තමයි නොමිලේ වෙද හෙදකම් කළේ. ශත පහක් ගත්තේ නැහැ. බුලත් හුරුල්ලක් දීලා විතරයිඑය කළේ. ඔහු පුද්ගලිකව වියදම් කරගෙන බෙහෙත් හදාගෙන ලෙඩ්ඩු ළඟට ගිහිල්ලා ඉතාම හොඳ, ආගමත් එක්ක බැඳුණු වෛද්‍ය විද්‍යාවක් අපට තිබුණේ. අද ඒ ක්‍රමය බැහැර වෙලා තිබෙනවා. ඒ ක්‍රමය අපට නැවත ඇති කරගන්න පුළුවන් නම්, එය නඟා සිටුවන්න, අපේ ඇමැතිතුමාට විශේෂයෙන්ම මම ආරාධනා කරනවා. මොකද අපේ ගරු ඇමැතිතුමා ග්‍රාමීත්වය තිබෙන, ගැමිකම හොඳට හඳුනන, ගම ගැන හොඳට දන්න කෙනෙක් හැටියට අපි බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය විද්‍යාව නගා සිටෙව්වොත් විදේශ විනිමය පවා අද ලබා ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන් විදේශ රටවල්වලට එන සංචාරකයන් අද මේ රටේ දේශීය වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ වෙන්න, දේශීය වෛද්‍ය විද්‍යාව ලබා ගන්න එනවා. දේශීය වෙදකම ලබාගන්න එනවා. එම

තත්ත්වය තවත් වැඩි දියුණු කළොත් - මෙතුමාගේ පොතේ විශේෂයෙන් සඳහන් කරලා තිබෙනවා, සෑම අංශයක්ම ඒ ගැන වර්ධනය කරන්න ඕනෑය කියලා. එය ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් බවට පත් කළ යුතුයි කියලා මම මතක් කරනවා.

විශේෂයෙන්ම අද දේශීය වෛද්‍ය විද්‍යාවේ බෙහෙත් හිඟයක් තිබෙනවා. ඉස්සර නම් වෙද මහත්මයාගෙන් කසාය සීට්ටුවක් ගෙනාවාම, අද වාගේ පෙරපු බෙහෙත් නැහැ, බොන්න. තම්බලා බොන්නේ. බෙහෙත් ටික ගමේ ගෙවල්වල තිබුණා. සෑම ගෙදරකම අවශ්‍ය බෙහෙත් වවාගෙන තිබුණා. බොහොම පොඩ්ඩයි කඩෙන් ගන්නේ. අද අපි බෙහෙත් සීට්ටුවක් අරගෙන කඩෙන් කිරුවොත් කසාය වඩියකට රුපියල් 700 ක්, 800 ක් යනවා. ඒ වාගේ ලොකු මුදලක් යනවා. හේතුව මොකද, බෙහෙත් හිඟකම නිසා. ගිය අවුරුද්දෙත් මිලියන 1.1 ක් ඔසු උයන් ඇති කිරීම සඳහා වියදම් කරලා තිබුණා. ඔසු උයන් ඇති කරනවා අපි බහුලව දකිනවා. ඒ වෙලාවට හිටවනවා. ඊට පස්සේ නඩත්තුවක් නැහැ. ඒ නිසා අපේ ඔසු උයන්වලට නියම පැවැත්මක් නැහැ. ඔසු උයන් එන්න එන්න අඩු වෙනවා. ඒ නිසා අපේ දේශීය වෛද්‍ය විද්‍යාවට ඉතාම වටිනාකමක් තිබෙන ඔසු විදේශ රටවලට හොරෙන් යනවා. කොතල හිඹුටු. ඊළඟට වෙනිවැල් වාගේ දේවල් ටොන් ගණන් මාසයකට කපනවා. හොරෙන් කපලා, හොරෙන් රටවලට යවනවා. මේවා විශාල වටිනාකමක් තිබෙන දේශීය ඖෂධ. මේවා වළක්වා ගැනීමට ක්‍රමවේදයක් මම හරියට දකින්නේ නැහැ. අපි සමහරවිට පොළවල්වල දකිනවා, ප්‍රසිද්ධියේ වෙනිවැල් ගෙනැල්ලා විකුණනවා. කොතල හිඹුටු ගෙනැල්ලා විකුණනවා. කැළෑවලින් ලොරි ගණන් කපාගෙන එනවා. එක අතකින් පරිසර විනාශයක් වෙනවා. වෙනිවැල් කැපීම තුළින් විශාල පරිසර විනාශයක් වෙනවා. සමහර අය ගස් කපලා වෙනිවැල් කපා ගන්නවා. මේවාට හොඳ සංරක්ෂණ ක්‍රමයක් ඇති කරන්න. මේවා ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. ඉස්සර නම් යම්තම් ඇඟ අමාරු වුණාම වෙනිවැල් ටිකක්, සුදු ළූණු ටිකක් තම්බලා බොන්නේ. දැන් පැනඩෝල් පෙත්තක් ගහන්නේ. අද එහෙම අපි වෙනස් වෙලා. නමුත් ඊට වැඩිය හොඳ ඖෂධීය ගුණයක් මේවායේ තිබෙනවා. සමාජය තුළ තිබෙන වෙනස මේක. සමාජය මේවාට හුරු කරලා, දේශීය වෙදකම ආරක්ෂා කර ගැනීමඅපේ යුතුකමක් වෙනවා. මම හිතන්නේ මේ යන විධියට ගියොත් එහෙම, තව අවුරුදු 20 ක්, 25 ක් යන කොට වෙනිවැල් පිටරටින් අපට ගෙනෙන්න වෙයි. ඒ තත්ත්වයක් ඇති වෙනවා. අද ලොකු රූස්ස කැළයකට ගියත් ලොකු වෙනිවැල් දකින්නවත් නැහැ. අපේ මිනිස්සු ආර්ථික ප්‍රශ්නය උඩ කීයක් හරි ගන්න පුළුවන් නම්, ඕනෑම දෙයක් කරනවා. පොඩි කෑලිවලට කපලා ලොරි ගණන් පටවනවා අපි දකිනවා. ඒවා විදේශ රටවලට යන්නේ. මේ වාගේ දේශීය වෛද්‍ය විද්‍යාව ආරක්ෂා කරන්න, දේශීය වෛද්‍යවරු ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ඒ අපේ පාරම්පරික වෙදකම. පාරම්පරික වෙදකම පරම්පරාවෙන් පරම්පරාවට යන්නේ. එහි රක්ෂණය කළ යුතු අත්‍යවශ්‍ය දේවල් තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ පොතේ සඳහන් වෙලා තිබෙනවා. ඒවා ගැන හොඳට සොයා බලලා කටයුතු කරන්න.

විශේෂයෙන්ම මුත්‍රා ගල්වලට අද ඔපරේෂන් කරනවා. විවිධ දේවල් කරනවා. නමුත් දේශීය වෙදකමේ බෙහෙත් බීලම හොඳ වෙනවා. නම්බපානේ හිටියා ජයසිංහ කියලා බොහොම දක්ෂ වෙදදුරු මහත්මයෙක්. එතුමා නැති වුණා. මමහිතන්නේ මැති ඇමැතිවරු පවා බෙහෙත් ගන්න එතැනට ආවා. මුත්‍රා ලෙඩට දක්ෂ වෛද්‍යවරයෙක්. ඒවාගේ අය නැති වීම අපේ දේශීය වෛද්‍ය විද්‍යාවට විශාල පාඩුවක් ලෙස මම දකිනවා.

[ගරු පී.ඩී. අබේරත්න]

ඒ වාගේම මම විශේෂයෙන්ම ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා, හොරණ අපේ රෝහල සම්බන්ධයෙන්. හොරණ රෝහලේ තට්ටු හයක වාට්ටුවකට සල්ලි අනුමත වෙලා තිබෙනවා. දැන් මුදලක් ඇවිල්ලත් තිබෙනවා. මේක පටන් ගන්නේ නැහැ. සල්ලි ටික තිබෙනවා. පටන් ගන්නේ නැහැ. ඒකට හේතුව තමයි හතේ වාට්ටුවයි, ICU එකයි, තව ගොඩනැගිල්ලකුයි ඉවත් කරන්න තිබෙනවා. මේවා ඉවත් කරන කොට ඒවායේ ඉන්න රෝගීන් නවත්වන්න වෙනම රෝහලක් හදන්න ඕනෑ. අපි ඒක මෘතශරීරාගාරයට පොඩ්ඩක් පහළින් සූදානම් කරලා තිබෙනවා. රාජ්‍ය නීතිගත සංස්ථාවෙන් ඇවිල්ලා දස ලක්ෂ 1000 කට ඇණවුම් භාරගෙන වැඩේ පටන් ගන්න හැදුවා. ඒ අය පෙබරවාරි මාසයේ ඉවර කරලා දෙනවා කියලා කිව්වා. නමුත් ඒ මුදල වැඩියි කියලා අපේ පළාත් ඉංජිනේරු මහත්මයා ඒ ඔක්කොම දත්තයන් ගෙනැත් තිබෙනවා, වෙන ක්‍රමවේදයකට හදන්න. මම ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා. මෙය ඉක්මණින් හදන්න ඕනෑ. එහෙම නොවුණොත් ඔබතුමා දන්නවා. හොරණ රෝහලේ විශාල ලෙඩ්ඩු ප්‍රමාණයක්

**41954196**

ඉන්න රෝහලක්. ගරු ඇමැතිතුමනි, වරදවා තේරුම් ගන්න එපා. ඒ හදන ගොඩනැගිල්ලත් තාවකාලික නොවෙයි. ඒක ඉක්මණින් හදලා දුන්නොත් අර ගොඩනැගිලි ටික කඩලා අපට පටන් ගන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම කම්කරු හිඟය. හොරණ රෝහලේ සාමාන්‍ය කම්කරුවන් 125 ක් අනුමත වෙලා තිබෙනවා. 96 දෙනයි ඉන්නේ. ඇටන්ඩන්ස්ලා 42 ක් අනුමත වෙලා තිබෙනවා. 30 යි ඉන්නේ. මේකෙනුත් 11 දෙනෙකුට සාමාන්‍ය කම්කරු උසස්වීම් දීලා ගත්තා. හත් දෙනයි ඒ වෙනුවට දාලා තිබෙන්නේ. තවත් හිඟ වෙලා තිබෙනවා. මේ අනුව රෝහල පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. විශාල රෝහලක්. මෙයට අවශ්‍යකම්කරුවන් සහ අවශ්‍ය දේවල් ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමැතිතුමාගේ මම අවධානයට යොමු කරනවා. මීගහතැන්න රෝහලේ මෘත ශරීරාගාරයක් නැහැ. දැන් ලෙඩෙක් මැරුණාම නාගොඩට ගෙනි යන්න ඕනෑ. ඒකඒ ප්‍රදේශයේ ජනතාවට විශාල හිරිහැරයක්. මිනියක් ගන්න ගියාම මීගහතැන්න ජනතාව නාගොඩට යන්න ඕනෑ. විශාල දුර ප්‍රමාණයක් යන්න ඕනෑ. ඒකට අවශ්‍ය වෛද්‍යවරු හම්බ වෙලා මිනිය ගන්න කොට දවස් ගණන් පහු වෙනවා. මේක ලොකු බාධකයක් වෙලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ කෙනෙක් හැටියට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඉතා ඉක්මණින් මෘත ශරීරාගාරයකට අවශ්‍ය කටයුතු සලසා දෙන්නය කියලා. මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ ගරු ඇමැතිතුමා මේ ගෙනියන වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට ගෙනි යන්නත්, යහපත් සමාජ සේවයක් එතුමාට කරන්නත් ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.55]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rav. Thebuwana Piyananda Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාගේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයීය මෙම වැය ශීර්ෂයන්ට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව සන්තෝෂයට පත් වෙනවා. දේශපාලනය කොහොම වුණත්, මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිකමත්, පළාත් සභාවේ සෞඛ්‍යඇමැතිකමත් කළුතරට ලැබීම පිළිබඳව දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෝ හැටියට - අපේ ගම්පහ ගරු මන්ත්‍රීවරු කොහොම කථා කළත් දිස්ත්‍රික්කයේ පදිංචි මන්ත්‍රීවරු හැටියට අපි අතිශයින් සන්තෝෂයට පත් වෙනවා, ඇමැති තනතුරු දෙකම කළුතරට ලැබීම පිළිබඳව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක හොඳයි හාමුදුරුවනේ. කිඹුල්වත් නුවරින් එන සුළඟත් සැපයි කියලා බුදුහාමුදුරුවොත් කිව්වා නේ.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rav. Thebuwana Piyananda Thero

සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා කෘතහස්ත දේශපාලඥයෙක්. දීර්ඝකාලයක් මේ පළාත් සභාවේ ඉඳලා, දේශපාලනය පිළිබඳ පරිණත අවබෝධයක් තිබෙන කෙනෙක්. ඉතින් ඒ නිසා එතුමා ඇහුම්කන් දෙන්න සූදානම් කෙනෙක්. ඒක තමයි අපි දකින්නේ. මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ විවිධ අවස්ථාවන්වලදි අපි එතුමාත් එක්ක කථා කළා. එතුමා පක්ෂ විපක්ෂ කතන්දරයක් නැතිව, ඕනෑම මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කරන යෝජනා හරි යෝජනාවක් හරි එය, නිවැරදි දෙයක් නම්, ඒකට හොඳට ඇහුම්කන් දීලා පිළි අරගෙන ඒක ක්‍රියාවට නඟන්න එතුමා බොහොම නම්‍යශීලීව කටයුතු කරන හොඳ ඇමැතිවරයෙක් වීම ඉතාම පැහැදිලි ලක්ෂණයක්. මම දන්නේ නැහැ, මේක කෙරෙනවාද කියලා. එතුමාගේ කාර්ය මණ්ඩලය හුඟක් දෙනෙක් ඉතාම හොඳින් කැපවීමෙන් කටයුතු කරනවා. එතුමා ඇමැති ධූරයට පත් වුණු සතිය ඇතුළේ එතුමාගේ පෞද්ගලික ලේකම්තුමාත් එක්ක මම සාකච්ඡා කරපු වෙලාවේ ලොකු උනන්දුවක් එතුමාගේ තිබුණා. මට කිව්වා, හාමුදුරුවනේ පළාත් සභාවේ ඉන්න හැම මන්ත්‍රීවරයෙක් වෙනුවෙන්ම අපි එක ෆයිල් එකක් open කරනවා. මම දන්නේ නැහැ, එහෙම පටන් අරගෙන තිබෙනවාද? එහෙම කරනවාද කියලා. එහෙම අරමුණක් තිබුණා. එක ෆයිල් එකක් open කරනවා. ඒ මන්ත්‍රීවරු ඉදිරිපත් කරන ප්‍රශ්න, ගැටලු, යෝජනා ඒ ෆයිල් එකේ ඇතුළත් කරලා ඒවා ගැන පෞද්ගලික අවධානය යොමු

කරමින් අපි මේ අමාත්‍යාංශයේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා කියලා මතක් කළා. ඉතින් බොහොම සතුටු වෙනවා. මම හිතනවා, ඒක ඒ විධියටම නැති වුණත්,මන්ත්‍රීවරුන්ගේ යෝජනාවන් පිළිබඳව යම් ප්‍රමාණයකට හරි කෙරෙනවා ඇති කියලා. ඉතින් ඒ නිසා අපි සන්තෝෂ වෙනවා, ඒ විධියට ඒ කටයුතු කිරීම පිළිබඳව.

ඊළඟට මේ අමාත්‍යාංශයට කියලා විශේෂ නැති වුණත්, දැන් හෙටින් මේ අයවැය විවාදය ඉවරයි නිසා පොදුවේ මතක් කරන්නට ඕනෑ, ගත වුණු කාලයේ මන්ත්‍රීවරු හුඟක් දෙනෙක් කථා කළා. ඒක මේ අමාත්‍යාංශවලටත් බලපානවා. අපට ස්වයං රැකියා සඳහාලබා දීපු මුදල් ක්‍රමය පිළිබඳව. ගිය අවුරුද්දේ නොතිබුණු ක්‍රමය. 50% ක් ප්‍රතිලාභියාගෙන් අය කර ගැනීම. දැන් මම හිතන්නේ,මේ අමාත්‍යාංශයේ කාන්තා කටයුතු අංශයෙන් කාන්තාවන්ට ස්වයං රැකියා ලබා දෙන්න ගියාම මේ ප්‍රශ්නය බලපානවා. අඩු තරමේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අපි ගොවි සංවිධානවලට උදළු තල ලබා දුන්නාම, රුපියල් 1100/- නම් උදලු තලයක් රුපියල් 550/- ක් ගොවියාගෙන් අය කර ගන්නවා. අපට හරි ලැජ්ජයි. උදළු තලයට ගොවියාගෙන් රුපියල් 550/- ක් ගන්නවා. ඉතින් මේ වාගේ ක්‍රමයක් තිබෙන්නේ. ඒ නිසා මෙය අමාත්‍යාංශවලින් ඉදිරියේදීවත් 2017 අවුරුද්දේවත් මේවා වෙනස් වෙලා මන්ත්‍රීවරු හැටියට හිරිකිතක් නැතිව මේ වැඩ කරන්න මිනිස්සුත් එක්ක සම්බන්ධ වන්න අපට අවශ්‍ය පසුබිම සකස් කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ගරු මහ ඇමැතිතුමාගේ අයවැය යෝජනාවේ තිබෙනවා. ලබන අවුරුද්දේ සිට යෝජනා ඉදිරිපත් වන පිළිවෙළට ඔක්කෝම යෝජනා එනතුරු ඉන්නේ නැතිව, යෝජනා ඉදිරිපත් වන පිළිවෙළට පළමුවැනි කාර්තුවේ සිටම මේවා ක්‍රියාවට නඟන්න කටයුතු කරනවා කියලා. ඒක බොහොම හොඳ තීරණයක්. මම හිතන්නේ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ඒ කටයුතු කරගන්න, ඒ විධියට අවශ්‍ය අවස්ථා සලසා දෙන්න ඕනෑ. ඒක හැම මන්ත්‍රීවරයෙක්ම බලාපොරොත්තු වන දෙයක්. මහජන සේවය සැලසීමේදී අපට මතුවන ගැටලුව. අමාත්‍යාංශයට සම්බන්ධ කාරණාවලදී මම Theory කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ අවබෝධය තිබෙන අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමන්ලා වාගේ, ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වාගේ අවබෝධය තිබෙන අය Theoryකථා කළා. මම සාමාන්‍ය කරුණු පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් අපේ පැත්තට අදාළ වන කාරණා මම ඉස්සෙල්ලා කථා කරන්න ඕනෑ. අපි ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාට යොමු කරනවා. ගරු ඇමැතිතුමනි, අපේ හාමුදුරුවන් වහන්සේලාගෙන් යම් ගැටලුවක් තිබෙනවා. රෝහල්වල භික්ෂු වාට්ටු තිබෙනවා. භික්ෂු වාට්ටුවට හාමුදුරුනමක් ඇතුළත් කළාම, ඒ ඇතුළත් කරන්නේ භික්ෂු වාට්ටුවට නොවෙයි නේ?භික්ෂු වාට්ටුව කියන්නේ, වෙනත් හැම වාට්ටුවකම හාමුදුරුවරු ඇතුළත් කරන තැනක්. එතකොට යම් වාට්ටුවක් භාරව වෛද්‍යවරයෙක් ඉන්නවා. එතැනට හාමුදුරුවන් ඇතුළත් කළාම, ඊට පස්සේ එතැනින් උන්වහන්සේව භික්ෂු වාට්ටුවට එවනවා. වෛද්‍යවරයා තමන්ගේ වාට්ටුව බලන්න එනවා. ඇවිල්ලා වාට්ටුව බලන්න යනවා.භික්ෂුවාට්ටුව ටිකක් දුර

[ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි]

නම් තියන්නේ, ටිකක් පයින් ගෙවා පැමිණිය යුතු නම් අමතර තනි ලෙඩෙක් සඳහා බොහෝ වෙලාවට ඒ භික්ෂු වාට්ටුවට එන්නේ නැහැ. ඒ නිසා හාමුදුරුවරුන්ගේ ලොකු ගැටලුවක් තිබෙනවා. භික්ෂු වාට්ටුවට දානවා කියලා කියන්නේ, වෛද්‍යවරයාගේ අවධානය යොමු වන්නේ නැහැයි කියන චෝදනාවක් හාමුදුරුවන්ගේ පැත්තෙන් තිබෙනවා. ඒකේ ඇත්තක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් මතක් කරනවා. ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා.

ඊළඟට මේ සිද්ධස්ථාන හා සම්බන්ධව. විවිධ විද්‍යුත් නාලිකාවල කථා බහ වලදී මම හුඟක් අහලා තිබෙනවා. දැන් ඩෙංගු පිළිබඳව කථා කරන්න ගියත්, ඒ වාගේම වෙන වෙනත් රෝග පිළිබඳව කථා කරන්න ගියාම ආගමික මධ්‍යස්ථාන ආශ්‍රිතව මේවා පැතිරීම වැඩියි කියන කාරණය. ඒක නිකන් පන්සලට නඟන චෝදනාවක් වාගේ කෙරෙන්නේ. ඒකේ ඇත්තක් තිබෙනවා. දැන් උදාහරණයකට ගත්තොත් එහෙම පසුගිය කාලයේ වස් කාලය තිබුණා. එතකොට දිනපතාම මිනිස්සු පන්සල් එනවා. මොනවා හරි පොලිතින් බෑග් එකක හරි, මොහොක හරි මල් අරගෙන එනවා. මොනවා හරි බෝතලයක

**41954196**

ගිලන්පස අරගෙන එනවා. සමහරවිට ඕවා තැන් තැන්වල දානවා. දැන් මෙහෙම දාලා ඉවර වෙලා ඒ චෝදනාව අන්තිමට එන්නේ ආගමික මධ්‍යස්ථාන ආශ්‍රිතව තමයි මේවා පැතිරීම වැඩියි කියලා. අර්ථයක් හැටියට ඒකේ තිබෙනවා. නමුත් මේ ගැන මම අපේ ගරු ඇමැතිතුමාගේ දැනුවත් කරන්නේ, මේ පිළිබඳව විශේෂයෙන්ම අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දැනුවත් කරලා, මේ ස්ථාන පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කටයුතු කරන්නය කියන කාරණය පිළිබඳව දැනුවත් කරනවා. ජල භීතිකා රෝගය පිළිබඳව ගත්තත් එහෙමයි. පන්සලට එන මිනිස්සු ගෙදර ඉන්න බැල්ලි පැටව් දැම්මාම ඒ බලු පැටව් ටික හරිබළල් පැටව් ටික පන්සලේ තමයි දාලා යන්නේ. ජල භීතිකා උවදුර පැතිරීම පිළිබඳව පන්සල තමයි මධ්‍යස්ථානය බවට පත් වෙන්නේ. ඉතින් ඒ නිසා ඒ වාගේ අවස්ථාවන් පිළිබඳව විශේෂයෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දැනුවත් කරලා කටයුතු කරන්නය කියන කාරණය අපි ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ගරු ඇමැතිතුමාට චෝදනා වශයෙන් කරුණු දෙකක් මතක් කරන්න තිබෙනවා. දැන් ඇමැතිතුමාගේ අවුරුද්දේ අවසාන කාලය, ඔක්තෝබර් අවසානය නොවැම්බර් වාගේ වන කොට අමාත්‍යාංශයෙන් ලබා දීපු දස ලක්ෂය හරහා විශේෂ ව්‍යාපෘති අපට ලබා දුන්නා. ඒකේදී මම තෙබුවන මාතෘ සායනයේ පුළුල් කිරීම සඳහා පුංචි ඉඩක් ගන්න රුපියල් ලක්ෂ දෙකක් වෙන් කෙරුවා. ඒ කියන්නේ, ඒ නියමිත දිනට එන අම්මලාට ඒ අයව පරීක්ෂාව සඳහා ඇතුළට ගන්න තුරු වාඩි වෙලා ඉන්න ඉඩකඩ හොඳටම මදී. ඉතින් ඒ නිසා බොහොම පුංචි ඉඩක් තිබෙනවා. පොඩි මුල්ලක්. ඒක ටිකක් පුළුල් කරලා හරි ගස්ස ගන්න පුළුවන්. අඩු ගණනේ අපට තව පුටු 20 ක්, 25 ක් දාගන්න පුළුවන්. ඒ නිසා මම ඒකට රුපියල් ලක්ෂ දෙකක් වෙන් කෙරුවා. මම දන්නවා, ඒ රුපියල් ලක්ෂ 02 න් ඒ වැඩේ හොඳටම කරන්න පුළුවන්. එතකොට මේක එන්න එන්න, එන්න එන්න ඇදි ඇදී යනවා. මේක කරන්න බැහැ. මේක අපි ලබන අවුරුද්දේ කරන්නම්. එහෙම එහෙම යනවා. මම ගරු ඇමැතිතුමාට පුද්ගලිකව මේ කාරණය මතක් කළා. ඉතින් කොහොම හරි කාලය නැති තත්ත්වයක් ආවා. ඊට පස්සේ මම දෙවැනි යෝජනාව හැටියට ඉදිරිපත් කළා. ඒ මාතෘ සායනය වටා කම්බි වැටක් ගහලා තිබෙනවා. ඒක වටේ ආරක්ෂිත දැලක් සවි කරන්න. ඉස්සරහා පැත්ත මම මගේ ප්‍රතිපාදන දාලා හරි ගැස්සුවා. අනිත් තුන් පැත්ත එහෙම හරි ගස්සන්න. දැන් ඒකට මේ මුදල හොඳටම ප්‍රමාණවත්. නමුත් ඒකටත් අපේ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා අදිමදි කරනවා. ඒ මහත්මයාට ඕනෑකම තිබෙන්නේම, සෙල්ලම් මිදුලක් හදන්නමයි. මේකට අවශ්‍ය කරන බඩු සවි කරන්නමයි එතුමාට ඕනෑකම තිබෙන්නේ. අපි කොපමණ අර යෝජනා කථා කළත්, ඒක තමයි කරන්න හදන්නේ. මම දන්නේ නැහැ, හේතුව මොකක්ද කියලා. එතුමාට මොන මොන ප්‍රතිලාභ තිබෙනවාද කියලා දන්නේ නැහැ. ඒ නිසා මන්ත්‍රීවරු හැටියට අපි ඉදිරිපත් කරන අදහස්, අපි මහජනතාවත් එක්ක ඉන්න ගමන් අපට දැහැට පෙනෙන දේ වැඩි අවශ්‍යතාවයක් තිබෙන කාරණයට තමයි අපි යෝජනාව ඉදිරිපත් කරන්නේ. නමුත් ඒක හුඟක් වෙලාවට එහෙම වෙන්නේ නැති තත්ත්වයක් තිබෙනවා.

ඒ වාගේම අනික් කාරණය තමයි, විශේෂ අවශ්‍යතා ඇති අයට යම් කටයුත්තක් කරන්න, රුපියල් හැට දාහක් ලබා දුන්නා. ඒකටත් අපි යෝජනාවක් ඉදිරිපත් කළා. මම හිතන්නේ ඒ අය ළඟ යම් ලැයිස්තුවක් තිබෙනවා. ඒ ලැයිස්තුව අපට එවන්නේ නැහැ, මේ මුදල්වලින් මෙන්න මේවයි ගන්න ඕනෑය කියලා. අපි ලැයිස්තු ඉදිරිපත් කළාම ඒක ප්‍රතික්ෂේප වෙනවා. ඉතින් ඒ විධියේ ගැටලු තිබෙනවා. අපි ඊළඟට වැඩිහිටි සංවිධාන ගැනත් වචනයක් මතක් කරන්න ඕනෑ. වැඩිහිටි සංවිධාන ඇත්තටම ඉතාම ඵලදායී ලෙස දැන් ක්‍රියාත්මක වේගෙන යනවා. ගරු ඇමැතිතුමනි, ඒ වැඩිහිටි සංවිධානවල ඉන්නේ අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් තිබුණු අය. ඒ නිසා මේ අය නිකම්ම රැස් වෙලා සාකච්ඡා කරනවා විතරක් නොවෙයි. මේ වැඩිහිටි සංවිධානවලට ගිය අවස්ථා වලදී, මම ඒ අයට බොහෝ අවස්ථාවල මතක් කරලා තිබෙනවා. ඒ අයගේ දැනුම ඊළඟ පරම්පරාවට ලබා ගන්න වැඩ සටහනක් අපි සකස් කරන්න ඕනෑ. වැඩිහිටි සංවිධානය පවත්වන දවසට තරුණ සංවිධානයකුත් එතැනට සම්බන්ධ කරලා සමහරවිට විවිධ දැනුම් තිබෙන අය, සමහරවිට සර්ප විෂ වෙදකම වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වෙනත් කිසියම් තාක්ෂණික දැනුමක් වෙන්න පුළුවන්. එහෙම තිබෙන අය වැඩිහිටි සංවිධානවල ඉන්නේ. ඒ අයගේ දැනුම ලබාගෙන, එය ඉදිරි පරපුරට යන්න වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නත් අවධානය යොමු කරන්නය කියන කාරණයත් විශේෂයෙන් මතක් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තූතිය පිරිනමනවා.හැමදෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

41974198

[අ.භා. 04.06]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අංක105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂ යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ මේ අවස්ථාවේමගේ දේශපාලන ජීවිතයේ කිසිම සද්දයක් නැතිව කථා කරන්න පුළුවන් අවස්ථාවක් කියලා හිතනවා. කවදාවක්වත් එහෙම අවස්ථාවක් ලැබිලා නැහැ. කෙසේ වෙතත් අපේ ස්වාමීන් වහන්සේ කථා කළාට පස්සේ මට කථා කරන්න ලැබීම සාදු සාදු කියලා කියනවා. බල්ලෝ පන්සල්වල දාලා යනවාලු. ජලභීතිකා රෝගය ඇති වෙනවා කියලා දැක්කා. අපි පත්තරවල නම් දැක්කා අලි පැටව් දාලා යනවා. ඒවා උසාවිවලත් අපි දැක්කා. කමක් නැහැ. දැන් ඒවත් වෙනවා නේ?කෙසේ වුණත්, මම ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

පළමුවෙන්ම සෞඛ්‍යය සම්බන්ධව කථා කරනවා නම්, මනා ශරීර සෞඛ්‍යයකට සමබර ආහාර වේලක් ගන්න ඕනෑ. දිනපතා ව්‍යායාම කරන්න ඕනෑ. දුම්පානයෙන් වැළකෙන්න ඕනෑ. මත්පැන් පානයෙන් වැළකෙන්න ඕනෑ. මම නම් දුම්පානයත්, මත්පැන් පානයත් කරන්නේ නැති පුද්ගලයෙක්. මේකට තමයි අද සෞඛ්‍ය අමාත්‍යාංශයක් ඇති වෙලා තිබෙන්නේ. ඉතින් මේක කරන්න තමයි,මේ පරිපාලනයක් දාගෙන අද අපි මේ ගමන යන්නේ. එම නිසා පළමුවෙන්ම මම කිරිබත්ගොඩ මූලික රෝහල ගැන කථා කරනවා. කොළඹට ආසන්නව තිබෙන රෝහල තමයි කිරිබත්ගොඩ මූලික රෝහල. හිටපු ප්‍රධාන අමාත්‍යතුමා, සෞඛ්‍ය අමාත්‍ය ධුරය දරන කාලයේ සිට තනාගෙන පැමිණි කිරිබත්ගොඩ හදිසි අනතුරු අංශය අද විවෘත කරන්න බැරි වෙලා තිබෙනවා. මම සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.ජනවාරි මාසය වන විට - එයටගරු ජනාධිපතිතුමාගේ පැමිණීමත් බලාපොරොත්තු වෙනවා. ඒ විවෘත කිරීමේ අවස්ථාව ඇති කරලා, ශක්තිමත් විධියට අනතුරු අංශයක් කොළඹට ආසන්නව ඇති කරන්න තිබෙන හොඳම අවස්ථාව පැහැර හරින්න එපාය කියලා. ඒ වාගේම කිරිබත්ගොඩ රෝහලේ අභ්‍යන්තර පාරවල් සම්බන්ධව ගරු ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය අපේ සංවිධායකතුමා සරත් ෆොන්සේකා මැතිතුමා, මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සමඟ සම්බන්ධ වෙලා දර්ශනීය කාපට් පද්ධතියක් ඇති කරලා තිබෙනවා. ඒ බලධාරීන්ට අපි ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෑතකදී කිරිබත්ගොඩ රෝහලට පැමිණි රෝහල් අධ්‍යක්ෂතුමා, රෝහල් ප්‍රධානියා ඉතාම ප්‍රායෝගික වෛද්‍යවරයෙක් වශයෙන් අද කිරිබත්ගොඩ රෝහල දියුණු කරන්න කටයුතු කිරීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මහර ආසනයේ මල්වතුහිරිපිටිය රෝහල, උඩුපිල රෝහල සම්බන්ධයෙන් කථා කරනවා. ඒවා ශක්තිමත් විධියට දියුණු කරන්න ඕනෑය කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම සමාජ සුභසාධනය සම්බන්ධයෙන් කථා කරනවා නම් අක්ෂි සායන, වෛද්‍ය සායන ඇති කරලා ප්‍රදේශය ශක්තිමත් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම රුදවුම් මධ්‍යස්ථාන හා ඉතා අලංකාර මට්ටමින් ගෙන එන්න කියන අදහස මම මේ වේලාවේ ප්‍රකාශ කරනවා. ගිණුම් කාරක සභාවේ මන්ත්‍රීවරු වශයෙන් අපි ගංගොඩවිල මධ්‍යස්ථානයකට ස්ථාන පරීක්ෂාවකට ගිය විට ආහාරපානවල තිබෙන තත්ත්වය අපි දැක්කා. ඒ වාගේම පිරිසිදුකම, පරිපාලනයේ දුර්වලතා අපි දැක්කා.
[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ඒ නිසා, ඒවා ශක්තිමත් කරන්න කටයුතු කරන්නය කියලා අවංක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපේ රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍යගරු අමාත්‍යතුමාත් පළාත් අමාත්‍යතුමාත් එකම දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ සිටින නිසා හිටපු අපේ සෞඛ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කළා, ඇත්තටම මුදල් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. අද මහ ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යතුමාත් කළුතර දිස්ත්රික්කයේ සිටින නිසා එහෙම ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. ඇත්තටම කළුතර දිස්ත්‍රික්කයට තමයි හොඳම සෞඛ්‍ය තත්ත්වයන් තිබෙන්නේ. ඒ වාගේම සෞඛ්‍යයට මුදල් වෙන් කිරීම වැඩි වශයෙන් තිබෙන්නේත්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ගරු අමාත්‍යතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයත් කොළඹ දිස්ත්‍රික්කයත් සමසේ සලකලා ඔබතුමා කටයුතු කරන්නය කියන එක සම්බන්ධයෙන් අවංක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම සභා කටයුතු අමාත්‍යාංශය සම්බන්ධයෙන් කවුරුත් කථා කළේ නැහැ. සභා කටයුතු අමාත්‍යාංශය කියන්නේ, අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ තිබෙන වරප්‍රසාද. අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කියන්නේ මොනවාද?

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අඩක් අපට දෙන්න ඕනෑ. මේක වෙන්නේ නැහැ. මම පක්ෂ භේදයෙන් තොරව, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීකෙනෙක් වශයෙන් කියන්නේ, මේක වෙන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඊයේ පෙරෙයිදා වැඩි වුණු දීමනා කවුරුත් දන්නවා. මම ඉල්ලීමක් කරනවා. මූලාසනය හොබවන්නේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. හිටපු නියෝජ්‍ය සභාපති කෙනෙක්. ඔබතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාට යොමු කරනවා. මේ ගැන කටයුතු කරන්න. පාර්ලිමේන්තුවේ ලේකම්තුමා සම්බන්ධ කරගෙන මේ කටයුතු ඇති කරන්න. මුද්දර වෙන්න පුළුවන්. ඒ වාගේම අනිකුත් දීමනා වෙන්න පුළුවන්. වැටුප වෙන්න පුළුවන්. ඒ සියලුම දේ අපට ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අපේ වාහන බලපත්‍රය ලබා දෙන්න ඔබතුමා කටයුතු කරන්න. ඒ සියලුම දේ ඔබතුමාගේ යටතේ තිබෙන්නේ. ඔබතුමා තමයි අමාත්‍යතුමා. ඔබතුමා තමයි අපේ පළාත් සභාවේ කැබිනට් අමාත්‍ය ධූරය දරලා කැබිනට් එකට ගිහිල්ලා කථා කරන්නේ. එහෙමනම් ඒ දේ කරන්න. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා හැම මාසයකම කැබිනට් මණ්ඩලය නියෝජනය කරනවා. එහෙමනම් ඔබතුමා ඒ මාර්ගයෙන් දීලා සඳහන් කරලා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියන එක අවංක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරු සමාන ලෙස පිළිගන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා. අපි සියලුමදෙනා භේදයෙන් තොරව තමුන්නාන්සේලා සියලුම දෙනාට එක වාගේ අපි කටයුතු කරන්නේ. එක වාගේ අපි වැය ශීර්ෂවලට උදව් කරන්නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 35 ක් දෙන කොට, සපත්තුවලට ප්‍රාදේශීය සභාවලට ලක්ෂ 50 ක් දෙන්න බලාපොරොත්තු වන කොට ඒ වාගේ කැත වැඩ කරන්නේ නැතිව එක සමානව 2017 වර්ෂයේ ජනවාරි මස සිට කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට එක සේ කටයුතු කරන කොට, අපි ඔක්කොම එකම මන්ත්‍රීවරු විධියට ඉදිරියේදී පළාත් සභා මැතිවරණයෙන් ඇවිල්ලා, අපිත් පළාත් සභාවේ ඉන්නවා දකින්න ඔබතුමන්ලා ආස නැද්ද? අර කිව්වා වාගේ තමයි. ආස නැද්ද? ඒ ශක්තිය අපට දෙන්න. අද යහපාලන රජයක් තිබෙන්නේ. මෛත්‍රීපාල ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යරනිල් වික්‍රමසිංහ මැතිතුමාත් අද අපට කියන්නේ ඒ දේ. මේ වැය ශීර්ෂවලට පෙර අග්‍රාමාත්‍යතුමා අපිව කැඳවලා දුන්න තීන්දුව මොකක්ද? මේ තීන්දුව ගන්නේ අපේ රජයක් එක්ක යන පළාත් සභාවක්. උදව් කරන්නය කියලා කිව්වා. ඒ උදව් කරන කොට ගිය සුමානේ ලක්ෂ 35 ක් ආණ්ඩු පක්ෂයේ අයට දීලා. අපි ළඟ කොළ තිබෙනවා. අපි විසර්ජනයේදී හෙට කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ දේවල් කරන්න එපාය කියලා අවංක ඉල්ලීමක් කරනවා. මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ වාගේම මම ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. සාධාරණව මේ යහපාලනයත් එක්ක කටයුතු කරනවා වාගේම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද වෙනුවෙන් ගරු සභා කටයුතු අමාත්‍යතුමා කටයුතු කරයි කියන විශ්වාසය තුළ අපි ඉන්නවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා. 04.13]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම සතුටු වෙනවා. අපේ පළාත් සභා ක්‍රමයට ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට ඔබතුමාගේ පවුලේ සහෝදරයෙක් ජනතා විමුක්ති පෙරමුණෙන් වෙඩි තියලා මරලා දාලා, මේ සභාවට ඇවිල්ලා මේ බලය විමධ්‍යගත කිරීම වෙනුවෙන් සටන් කරලා ඇමැතිකමක් ලැබීම පිළිබඳව ප්‍රථමයෙන් මම සතුට පුද කරනවා. එතුමායි මමයි සමකාලීන දේශපාලනඥයන්. එතුමාට මේ පළාත් සභාවේ තිබෙන විෂයයන් අතරින් ඉතාමත්ම හොඳම විෂයයන් තිබෙන්නේ. රටේ ඉන්න බුද්ධිමත්, උගත්, ඒ වාගේම රටට සේවය කරන්න, රටේ නිර්මාණශීලී දේවල් ඇති කරන්න, සෞඛ්‍ය සම්පන්න මනුෂ්‍යයක් ඇති කරන්න තිබෙන අමාත්‍යාංශයක්. ඒ අමාත්‍යාංශය යටතේ අංක105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂයන් ගැන කථා කරන්න ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා බොහොම සාමකාමී ඇහුම්කන් දෙන ඇමැතිවරයෙක්. මේ ඉන්න කැබිනට් මණ්ඩලයේ මට පෙනෙන දක්ෂම ඇමැතිවරයා සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා. මොකද, දක්ෂම අයත් එක්ක තමයි වැඩ කරන්න තිබෙන්නේ. වෛද්‍යවරු, සෞඛ්‍ය නිලධාරීන් ඒ වාගේම පළාත් පාලන ආයතනවල නිලධාරීන්, සභාපතිවරු සමඟ ඒකාබද්ධව යන අමාත්‍යාංශයක් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය. දැන් මෙහි කථා කළා. දැන් මෙතුමාට මොකුත් කරන්න බැහැ. කරන්න බැරි ඇයි? දැන් මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමැතිවරයායි මෙතුමයි එකම දිස්ත්‍රික්කයේ ඉන්නේ. මහ ආණ්ඩුවේ ඉන්න

41974198

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී ]***
*[Expunged on the order of the chair]*

පිස්සු බලු රෝගය හැදිලා නේ තිබෙන්නේ. මහ ආණ්ඩුවේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී ]***
*[Expunged on the order of the chair*

පිස්සු බලු රෝගය හැදිලා ඉන්න කෙනෙක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

කැබිනට් එකේ ඉන්න ඇමැතිවරයෙක්. ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පිස්සු බලු රෝගයට බෙහෙත් විදින්න වෙන්නේ (බාධා කිරීමක්) –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතුමා යහපාලන ආණ්ඩුවෙන් බෙහෙත් වර්ග 84 ක් අඩු කරනවා කිව්වා. දැන් බෙහෙත් වර්ග 84 ක් අඩු කරන්න දාලා තිබෙනවා. දැන් මේ බෙහෙත් වර්ග 84 අඩු කරන්න වෛද්‍ය සභාව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ අනවශ්‍ය වචනය කපා හරින්න කියලා මා නියෝග කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෛද්‍ය සභාව කියනවා. මේ බෙහෙත් වර්ග නිෂ්පාදනය කරන ආයතන කියනවා. මේ ගණනට මේ බෙහෙත් ටික දෙනවා නම්, ලෙඩා මැරෙනවා. දොස්තරට බෙහෙත් ලියන්න බැහැ. දොස්තර නලාව අල්ලලා මේක ගොඩගන්න ක්‍රමවේදයක් නැහැයි කියලා.ඒකට හේතුව මොකක්ද? බෙහෙත් නිෂ්පාදනය කරන්න. එක එක රෝගවලට විවිධ අංශවල ටෙස්ටින් තිබෙනවා. එහෙම බෙහෙත් හදන්න බැහැ. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට, අපේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාට, අපේ ප්‍රවාහන ගරු අමාත්‍යතුමාට එහෙම බෙහෙත් හදන්න පුළුවන් වන්නේ නැහැ. ඒ වාගේම ජේවීපී මන්ත්‍රීවරුන්ට එහෙම බෙහෙත් හදන්න බැහැ. බෙහෙත් හදන්න පුළුවන් දක්ෂ, බුද්ධිමත්, උගත් ඒ ගැන පරීක්ෂණ දැනුමක් තිබෙන අයට විතරයි කරන්න පුළුවන්. ඒ අය කියනවා, මෙහෙම බෙහෙත් දුන්නොත් ඉක්මණට අපේ රටේ ජන සංඛ්‍යාව අඩු වෙනවා. අඩු වුණාම අපේ රටේ අනාගතයක් ඇති වන්නේ නැහැ. ඒ නිසා තමයි, අපි ඉන්දියාවත් එක්ක එක්වා ගිවිසුම ගහන්නේ. මොකද හේතුව, ඉන්දියාවේ වෛද්‍යවරු, ඉන්දියාවේ කම්කරුවෝ, ඉන්දියාවේ කක්කුස්සි හෝදන මිනිස්සු ගේන කොට එතකොට මේ ප්‍රශ්නය ඉවර වෙනවා කියලා. ජේවීපී එක ඒකට විරුද්ධයි. එතකොට ජේවීපී එක ඉන්නේ අපිත් එක්ක.

[ගරු උපාලි කොඩිකාර]

දැන් එතකොට බලන්න. ඉන්දියාව වාගේ රටක් ගන්න. අපේ රටේ ජනගහනය ඉන්දියාවේ එක ප්‍රාන්තයක ඉන්නවා. දැන් ඉන්දියාවේ මේ වෛද්‍ය ක්‍රමය ගත්තාම - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් සමඟ මම කියුබාවට ගියා. ලෝකයේ දක්ෂම වෛද්‍යවරු සහ විශ්ව විද්‍යාලවල, වෛද්‍යවරු පුහුණු කරන ආයතන තිබෙනවා. මම නිකම්ම සංචාරයක් ගියා. අපේ සණස ආයතනයත් එක්ක ලෝකයේ සංචාරය කරන වේලාවේදී, නිවාස ගැන බලන්න ගිය වෙලාවේ මම මැලේසියාවේ තිබෙන බෙහෙත් නිෂ්පාදනය කරන ප්‍රාන්තයකට ගියා. ඒ ප්‍රාන්තයේදී බෙහෙත් නිෂ්පාදනය කරන ආකාරය කොපමණ ලස්සන ද කිව්වොත් - අපේ රටේ ඉස්සර අපේ සීයා, ආච්චී, අම්මා, අපේ මුතුන් මිත්තෝ ඉන්න කොට අපේ රාජ්‍ය සමය ගන්න. රාජ්‍ය සමයේ මොනවද අපේ රටේ තිබුණේ? කොපමණ හොඳ පළා වර්ග ටිකක්ද තිබුණේ. අද උදේ කිව්වා, කැඳ හෙට උදේටත් දෙනවා කියලා. එතකොට මේ කැඳ වර්ග මොනවාද? මුස්ලිම් ජාතික රටවල් බලන්න. ඒ අයගේ බෙහෙත් ගෙඩි වර්ග වෙළඳ කලාප තිබෙනවා. ඒ මුස්ලිම් කාන්තාවන් පාවිච්චි කරනවා. ලෙඩ රෝග ඔක්කොම අඩු වෙනවා. අපේ ගන්නවාද සියඹලා ටිකක්. අපේ ගන්නවාද ගොරකා ටිකක්. අපේ කුරුඳු ටිකක් ගන්නවාද? පපුවේ අමාරුවට, ජෝර්ජ්ලා වාගේ අයට, පිස්සු බලු රෝගයෙන්

ආණ්ඩුව කරන කට්ටියට දෙන්න ඕනෑ බෙහෙත් හදලා තිබෙනවාද? අපි හදලා නැහැ. අපට හදන්න පුළුවන්. ඒක පළාත් මට්ටමින් ප්‍රඥප්තියක් ගෙනෙන්න. මම විශ්වාස කරනවා. අපේ සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා එය ප්‍රඥප්තියකින් අනුමත කරලා පොඩි විධියට පටන්ගනිමු.

ඊළඟට නාවින්න ආයුර්වේදය බලමු. අපේ ආසනයේ තමයි ලංකාවේ ලොකුම ජයවර්ධනපුර රෝහල,පිළිකා රෝහල, නාවින්න ආයුර්වේද රෝහලමහරගම අපි වාගේ මිනිස්සු ඉන්න, බුද්ධිමත් දේශපාලඥයන් ඉන්න ආසනයක තමයි ලොකුම ආයුර්වේද රෝහල තිබෙන්නේ. බණ්ඩාරනායක මහත්මයා ඒක දැකලා තමයි එදා ආයුර්වේදය මහරගමට ගෙනාවේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එදා ජයවර්ධනපුරට ගෙනාවේ. එතකොට ගම්වලට විශ්ව විද්‍යාලය ගෙනාවා. අපේ මුළු පවුලම විශ්ව විද්‍යාලයේ කට්ටිය. උපාධිධාරීන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පත්තර පහක් ගෙනාවා. මේ පත්තර පහේ මොකක්ද තිබෙන්නේ? මේ පත්තරේ තිබෙනවා, හොර අරක්කු නැව් පිටින්. රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ මේ අය පතුරු ගැහුවා. දැන් මේ පත්තරේ බලන්න.මේකේ තිබෙනවා, සීනි නැවේ එන්නේ මොනවාද? සීනි නැව බ්‍රසීලයෙන් එනවා. දැන් එන්නේ මොනවාද? සීනි නොවෙයි එන්නේ. මොනවාද එන්නේ? දැන් යාපනය නිදහස් කරලා, ජනාධිපතිතුමා උතුරු නැගෙනහිර යුද්ධය ඔක්කොම අවසන් කරලා, සාමය ඇති කරලා මුහුදු ටික හැදුවාම, දැන් නැව් පිටින් කේරළ ගංජා එනවා. කොහේද මේවාට නීති. කෝ දැන් නීති? දැන් මේවාට නීති නැහැ. එතකොට දැන් අපේ සෞඛ්‍යඇමතිතුමාට, අපේ වෛද්‍යවරුන්ට විශාල වගකීමක් පැවරිලා තිබෙනවා. ඇයි හොර අරක්කු ගන්නවා. කොකේන් බොනවා. කොරෙක්ස් කියලා ඇවිල්ලා තිබෙනවා. ළමයින් ඒවා බීලා මත් වෙනවා. තොල් පැලෙනවා. දැන් මේවා ගැන හැම දෙනාම බලන්න ඕනෑ. මෙතැන අයවැය පොතේ ලියලා තිබෙන ඉලක්කම් ටික බලනවා. ආ.. මේකට වැඩ ටිකක් දීපන්. දෙන්නේ කොහෙන්ද? දෙන්න බැහැ මේවාට. නිකම් බොරුවට කෑ ගහන්නේ. මේවාට අපේ ඇමතිතුමන්ලා ප්‍රායෝගිකව වැඩ කරන්න ඕනෑ. බලන්න පොල්පලා ටික ගන්න. පොල් පලා ටික හදලා ඉස්කෝලවල, මම අර දාපු කිරි කඩ වාගේ. මම දාපු කොළ කැඳ කඩ වාගේ. උදේට බර කිරලා බලනවා. එතකොට රස්සාවක් දෙන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තවත් කියන්න බොහෝ දේවල් තිබෙනවා. කාලය අවසන් නිසා මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා[සුමිත් විජයමුණි ද සොයිසා මහතා ]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sumith Wijayamuni de Soysa M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.22]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, සමහර වෙලාවට ගරු ඇමතිතුමා හිතන්න පුළුවන්, අපි මේ හැම දෙයක්ම විවේචනය කරනවාය කියලා. ගරු සභාපතිතුමනි, අපේ කටයුතු වැඩි දියුණු කර ගන්න නම්, විවේචනය භාර ගන්න ඕනෑ. ඒවා ධනාත්මකව ගන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපි මේ අමාත්‍යාංශ හැම එකකටම පක්ෂව ඡන්දය දුන්නා. ඒකෙන් අදහස් වෙන්නේ, අපි හැම එකකටම විරුද්ධ වෙනවා කියන එක නොවෙයි. අපි පක්ෂව ඡන්දය දෙන ගමන් අපි යම් යම් යෝජනා, චෝදනා ගෙන එනවා,ඒවා නිවැරදි කර ගන්න. ඒකයි අපේ බලාපොරොත්තුව. ඒ නිසයි අපි මෙහෙම විවේචන ගෙන එන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය ගෙවී යන වසරේ 16% යි. ඔබතුමාට ලැබෙන මුදල අඩකටත්

**41974198**

වඩා අඩු වෙලා තිබෙනවාය කියලා අපි දන්නවා. මම ගණන් මිනුම් කියන්න යන්නේ නැහැ. මොකද, අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා වාගේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් අංක ගණිතය ගැන කථා කළා. හැබැයි, අපට මේකෙන් පාඩමක් තිබෙනවා. ඒ පාඩම තමයි, අපට ලැබෙන මුදල් ටික ඉතාම සාධාරණ විධියට බස්නාහිර පළාතේ මේ දිස්ත්‍රික්ක තුන අතරේ බෙදිලා යන්න සලස්වන එක. ඒකෙන් ගම්‍යවෙන්නේ, හැඟෙන්නේ සෑම පළාත් සභා මන්ත්‍රීවරයෙකුම මේ මුදල්වල කොටස්කාරයෝ වෙන්න ඕනෑ. වැය කිරීමේදී. හැබැයි, ඒක වෙන්නේ නැහැයි කියන එකයි මගේ විශ්වාසය. අපි කියන්නේ, එළඹෙන වසරේදීවත් ඒක කරන්න කටයුතු කරන්නය කියලා. කාරණා කිහිපයක් විස්තරාත්මක කථා කරන්න වෙලාව මදි නිසා මම ඔබතුමාට කාරණා කිහිපයක් ගෙනහැර දක්වන්නම්. ඔබතුමා සමහර වෙලාවට කියයි, මේ ඉංජිනේරු කාර්යාංශය නිසයි මේ වැඩ ප්‍රමාද වුණේ කියලා. මූල්‍ය ප්‍රගතිය අඩු වුණාම එහෙම චෝදනාවක් ශේනවා. හැබැයි, ඒකට වග කියන්නේ,මේ පළාත් සභාවේ ඉන්න වෙනත් ඇමතිවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් නොවෙයි. මේක ඔබතුමා යටතේ තිබෙන ආයතනයක්. ඔබතුමා යටතේයි මේ නිලධාරීන් ඉන්නේ. ඒ නිසා වඩා හොඳින් ඒ කටයුතු ඉටු කිරීම සඳහා නිලධාරීන්ව නිවැරැදි තැනට තල්ලු කරන එක, ඔබතුමාගේ වගකීමක්. ඒ නිසා කරුණාකර මේ මූල්‍ය ප්‍රගතිය ප්‍රමාණවත් තරම් අත් කර ගැනීමේ වැඩ සටහනක්, නිලධාරීන් හරහා කරවා ගැනීමේ වැඩ සටහනක් වහාම ක්‍රියාත්මක කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඩෙංගු ගැන අපි හැමෝම කථා කළා. ඇත්ත වශයෙන්ම ගත්තොත් අද රට තුළ ඩෙංගු හදිසි තත්ත්වයක්. ගරු සභාපතිතුමනි, හදිසි තත්ත්වයක් ක්‍රියාත්මක කළ යුතුයි. ඇයි එහෙම කියන්නේ? රට පුරා 47,900 ක් ඩෙංගු රෝගීන් වාර්තා වෙලා තිබෙනවා. ඒකෙන් 23,671 ක් බස්නාහිර පළාතේ. ඔබතුමාගේ පළාතේ 3119 ක්. ඒ වාගේම කොළඹ 14,516 ක්. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. දැන් අපට ජාතික ප්‍රතිපත්තියක් නැහැ. දැන් ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපට ජාතික ප්‍රතිපත්තියක් නැහැ. අපට පළාතේ ප්‍රතිපත්තියකුත් නැහැ. මේ හදිසි තත්ත්වයට මුහුණ දෙන්න ඔබතුමා අපට දුන්න වැඩ සටහන මොකක්ද? ඔබතුමා මේ හදිසි තත්ත්වයට වැඩ සටහනක් හැදුවා නම්, මන්ත්‍රීවරුන් වන අප වෙතට කාන්දු වෙන්න එපැයි ගරු සභාපතිතුමනි. එහෙම තත්ත්වයක් නැහැ නේ? සභාපතිතුමාගේ පළාතෙත් 6042 ක් ඩෙංගු රෝගීන් ඉන්නවා. ඒ නිසා මේ වාගේ තත්ත්වයන් ගැන මීට වඩා බරපතළ ලෙස සිතන්න ඕනෑ කියන එකයි මම විශ්වාස කරන්නේ. ඩෙංගුවලට තිත තියනවා කිව්වාට, තිත තියන්න කිසි දෙයක් ඔබතුමා කරලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දඩ ගහනවා විතරයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දඩ ගහන්න කියලා අපිව භය කරනවා. දඩ ගහනවා කියලා භය කරනවා. කිසිම දෙයක් වෙන්නේ නැහැ. ඒ නිසා අපට මේක දැනෙනවා. මොකද, මේ ඩෙංගු රෝගය නිසා අපේ හිතවත් අය, සහෝදරයෝ, ඥාතීන් මිය ගිහිල්ලා තිබෙනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. මේ ඩෙංගු රෝගයට හොඳ විසඳුමක් හැටියට හොඳ වැඩ සටහනක් ගෙනාවා අර හිටපු අධ්‍යක්ෂවරිය. කවුද? දොස්තර දීප්ති පෙරේරා මහත්මිය. කසළ වෙන් කිරීමේ වැඩ සටහනක්
[ගරු සුසිල් කිඳෙල්පිටිය]

යෝජනා කළා. අපිටත් ඉදිරිපත් කළා. දැන් ඒකට මොකද වුණේ? එතුමිය විශ්‍රාම ගිහිල්ලා. හැබැයි, එතුමිය ගෙනාපු වැඩ සටහන ඉස්සරහාට ගෙනියනවාය කියලා මන්ත්‍රීවරුන් වන අපට තවමත් දැන ගන්නට ලැබුණේ නැහැ. එතුමිය ගිහිල්ලා මේ වන කොට මාස ගණනක් වෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්නගරු ඇමතිතුමනි.

ඒ වාගේම ආයුර්වේදය. දැන් බලන්න. අපි ගිණුම් කාරක සභාවට අවාම - ආයුර්වේද රෝහලක් තිබෙනවා, කළුතර දිස්ත්‍රික්කයේ. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේමයි. මොකද වෙලා තිබෙන්නේ? මේකෙන් තවම ලාභ ලබන වැඩ සටහනක් නැහැ. අඩුම ගණනේ වැයක් කළාම ඒකට ආපහු පෙරළා ලාභයක් ලැබෙන්න එපැයි. ඇයි මේ ලාභ ලබන වැඩ සටහනක් බවට, රෝහලක් බවට මේක පරිවර්තනය කරන්න බැරි. හරිම සරළයි කාරණය. බලන්න මේ වෙරළ තීරය. කාටද අයිති? කළුතර සිට ගම්පහට වෙනකල්, මීගමුවට වෙනකල් වෙරළ තීරය තිබෙන්නේ බස්නාහිර පළාතට. විශාල ප්‍රදේශයක්. රට දිහා බැලුවාම ගරු සභාපතිතුමනි. සංචාරක ව්‍යාපාරය හා බැඳුනු ආයුර්වේද රෝහල් වැඩ සටහනක් අපට තිබෙනවාද?

**41954196**

එහෙම වැඩ සටහන්වලින් අපට කොයි තරම් මුදලක් උත්පාදනය කරන්න පුළුවන්ද? ආදායමක් උපයනන්න පුළුවන්ද? එහෙම වැඩ පිළිවෙළක්වත් අපට ක්‍රියාත්මක කරන්න බැහැ. ඔබතුමාගේ එහෙම උත්සාහයක් නැති බවයි පේන්නේ. ඒ නිසා එවැනි වැඩ සටහනක් වහාම ක්‍රියාත්මක කළ යුතුයි.

ඊළඟට ග්‍රාමීය රෝහල්. දැන් රෝහල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ මූලික පහසුකම් නැහැ. ඇත්ත කතන්දරය මේකයි. අපි රෝහල් කමිටු පිහිටුවනවා. සමහර වෙලාවට රෝහල් කමිටුවට ගියාම රෝහල් කමිටුවලට යන අපේ නියෝජිතයෝ කියනවා. අනේ, අද රෝහල් කමිටුව අවංලගු වුණා නේ? මගෙන් යවපු රෝහල් කමිටු නියෝජිතයාට මම කියලා තිබෙනවා. ඔබ ගිය බවට මට සහතිකයක් ඕනෑ. ඔබ එතැනදී සාකච්ඡා කළ කරුණු පිළිබඳ වාර්තාවක් මට ඕනෑ. එතකොට ඒ නියෝජිතයා ඇවිල්ල කියනවා අද තිබුණේ නැහැ නේ රෝහල් කමිටුව. අරයා ආවේ නැහැ. මෙයා ආවේ නැහැ. ඒ නිසා කල් ගියා. කෝල් එකක් දීලා කිව්වා නේ අද රෝහල් කමිටුව තියන්නේ නැහැයි කියලා. එහෙම නැත්නම් විශේෂ කාරණාවක් කථා කළේ නැහැ. නැහැ නිකම් ඇවිල්ලා කථා කළා, පොඩි පොඩි දේවල් ටිකක්. අපට රෝහල් කමිටුවලින් තොරතුරු එන්න ඕනෑ. ඊට පස්සේ අපි ඒවාට විසඳුම් යෝජනා කරන්න ඕනෑ. දැන් අපේ ඉන්නවා මොහොමඩ් අක්‍රම් මන්ත්‍රීතුමා. ඔබතුමාට ගෙනාවා යෝජනා. අර විශාල සේවයක් සපයපු රෝහලක්, මාලිගාවත්ත රෝහල. මට මතකයි අපි පුංචි කාලේ බස් එකේ යන කොට - ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ ඒක හැදුවේ. යට කල වගුරු බිමකි. එහි නැග එන මහ නුවරකි කියලා. මෙතැන තිබුණා රෝහලක්. මේකේ කොටසක් මධ්‍යම ආණ්ඩුව පවරා ගත්තා. ඒකට කමක් නැහැ. වකුගඩු රෝහල හදන්න කොටසක් පවරා ගත්තා. හැබැයි, එතැන තිබුණු මාතෘ සායනය වහලා දැම්මා. ඔබතුමාට මෙතුමා යෝජනාවක් ගෙනවා. අඩුම ගණනේ මාතෘ සායනය - එතැන ෆැලැට් එකේ විතරක් පවුල් 3000 කට වැඩිය ඉන්නවා. හැබැයි ඒ මාතෘ සායනය වහලා. මේවා හරි බරපතළ තැන්. මේවා ගැන අවධානය යොමු කරන්න ඕනෑ. එතකොට පිරිමි වාට්ටුව හැදුවේ අපේ අක්‍රම් මන්ත්‍රීතුමාගේ සල්ලි වියදම් කරලා. ඒ නිසා ඒ වාගේ කුඩා රෝහල් ගැන අවධානය යොමු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට රෝහල් ගැන කථා කරන කොට ගරු සභාපතිතුමනි, තවත් වැදගත් දෙයක් තිබෙනවා. මේ කුඩා රෝහල් කාර්යක්ෂම නැහැ. කුඩා රෝහලකට රෝගියා යනකොට, දොස්තර කෙනෙක් ඉන්න ඕනෑ. සමහර වෙලාවට රෝගියා එනකොට දොස්තර නැහැ. දොස්තර රෝගියාව බැලුවාට පස්සේ, මූලික පරීක්ෂණ ටික කරන්න පරීක්ෂණාගාරයක් තිබෙන්න ඕනෑ. ඒ පරීක්ෂණාගාරය තිබෙනවා. තාක්ෂණික නිලධාරියෙක් නැහැ. ඊට පස්සේ ඒ පරීක්ෂණය කළාට පස්සේ බෙහෙත් ටික දෙන්න ඕනෑ. ඖෂධ ටික තියෙන්න ඕනෑ. මේ මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරු මහ ලොකුවට ඖෂධ ගැන ගිරිය පැලෙන්න කෑ ගහනවා. අච්චර අඩු කළා, මෙච්චර අඩු කළාය කියලා. හැබැයි, ඉස්පිරිතාලෙට ගියාම දොස්තර ලියලා දෙනවා,ඉස්සරහා බෙහෙත් සාප්පුවෙන්, ෆාමසියෙන් බෙහෙත් ටික අරන් දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මේක තමයි කුඩා රෝහල්වල තත්ත්වය. මේ මහා දුර යන්න ඕනෑ නැහැ. මම රෝහල් දෙකක් දෙපැත්තේ තියාගෙන ජීවත් වන කෙනෙක්. එක පැත්තකින් මුල්ලේරියාව රෝහල. අනික් පැත්තෙන් කොස්වත්ත රෝහල. මේවායේ තත්ත්වය ඒකයි. මිනිස්සු අපට ඇවිල්ලා කියනවා, මේවායේ මූලික පහසුකම් නැහැයි කියලා. ඒ නිසා මේ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට තවත් වැදගත් කාරණයක් තිබෙනවා,ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න. ගරු ඇමතිතුමා මුදල් වෙන් කළා මන්ත්‍රීවරුන්ට. අපි දන්න විදියට, තවම මට සහතික නැහැ. හැබැයි, ඔබතුමා ලක්ෂ හතහමාර ගණනේ වෙන් කළාය කියලා කියනවා. ඇයි අපට ඔබතුමා මොනවාද දුන්නේ? එහෙම කරන්න එපා. ඔබතුමා රැකියා දීලා තිබෙනවා. රැකියා දුන්නේ නැහැයි කියන්න එපා. අපි ඔබතුමාගෙන් ඇහුවාම කියනවා, නැහැ තවම දුන්නේ නැහැ, මන්ත්‍රීතුමා. එකක්වත් දුන්නේ නැහැ. රාජිත සේනාරත්න - දැන් මෙතැනදීම කියවුණා. එහෙම කරන්න එපා. රැකියා ටික බෙදා ගන්න. අඩුම ගණනේ ඔබතුමාගේ පැත්තේ මන්ත්‍රීවරුන්ටත් දීලා තිබෙනවාද කියලා අහන්න කෝ. ඒක තමයි ලැදියාව කියන්නේ. ඒ නිසා ඔබතුමා ලැදියාවට වැඩ කරන්න එපා. එහෙම වැඩ කරනවා නම් ඉතා අසාධාරණයි. අපි ඔබතුමන්ලාට මේ පැත්තේ ඉඳලා උදව් කරනවා. ඒ

නිසා තමයි මේවා ධනාත්මකව ගන්නය කියලා කියන්නේ. මට විතරක් දෙන්න කියලා - දැන් අනික් දවසේ, කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා තර්ජනයක් ගෙනාවා. මේ යකාගෙන් ආයිත් බේරෙන්න හම්බ වෙන්නේ නැහැයි කියලා රස්සාවක් දික් කරන්න එපා කැරට් අලයක් වාගේ. එහෙම භාර ගන්නේ නැහැ මම. පවතින තත්ත්වයන් එකක් තමයි අපි ඒවා තීරණය කරන්නේ. එහෙම භාර ගන්නේ නැහැ. ඒ නිසා රැකියාවන් බෙදන කොට ඒවා සාධාරණ ලෙස - අනික් එක ඔබතුමා මුල් ගල් තියාගෙන යනවා. අපේ මධ්‍යම ආණ්ඩුවේ ඇමතිතුමාත් එක්ක එක එක රෝහල්වල උත්සව තියනවා. අනේ පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් - අපේ පැත්තේ එපා. ඔබතුමන්ලාගේ පැත්තේ මන්ත්‍රීවරු ඔක්කෝටම කථා කරන්න කෝ. එහෙම කථා කරලා මේක සාමූහික වැඩක් බවට පත් කර ගන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ගැන අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කළා. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සොයා ගන්න නැහැ. ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අල්ලස් ගන්නවා. වගකීමෙන් කියන්නේ. එවන්න පරීක්ෂණ කණ්ඩායමක්. මම අල්ලලා දෙන්නම්. ඒ වාගේම මේ සියලු දෙනා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දේශපාලනීකරණය වෙලා. වැඩක් ගන්න බැහැ. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. මේ ඔබතුමාට අයත් විෂයයන්. ඊළඟට ඔබතුමන්ලා කාන්තාවන් ගැන කථා කරනවා. මේ පුහුණු වැඩ සටහන් කරනවා. ස්වයං රැකියා කරන්න පටන් ගන්නය කියනවා. නමුත් ඒ අය කරන නිෂ්පාදනවලට වෙළඳ පොළක් සපයලා දෙන්න මොකක්ද කළේ? ඔබතුමන්ලාට තිබෙන උපාය මාර්ගික වැඩ සටහන මොකක්ද? එහෙම වැඩ සටහනක් නැහැ.

ගරු සභාපතිතුමනි, මෙවැනි කාරණා ගණනාවක් කථා කරන්න තිබෙනවා. නමුත් අවාසනාවට අපට මේක කථා කරන්න වෙලාව මදී. අවසාන වශයෙන් එක කාරණයක් - ඔබතුමා කළුතර ජීවත් වන නිසා, රටේHIV, ඒඩ්ස් ආසාදිතයින් සංඛ්‍යාව ඉහළ යනවා. වැඩිපුරම වාර්තා වෙන්නේ ඔබතුමා ජීවත් වන මුහුදු ප්‍රදේශයේ. වෙරළ ප්‍රදේශයේ. පිරිමි ළමා ගණිකා වෘත්තිය නිසා. ඒ නිසා මේ ළමයි අල්ලන්න විධියක් නැහැ. HIV, ඒඩ්ස්. අවුරුදු 15 ට අඩු 75 ක් පිළිබඳව මේ වන කොට වාර්තා වෙලා තිබෙනවා. මේවාට වැඩ සටහන් ඕනෑ ඔබතුමාගෙන්. ගම් මට්ටමේ ඉන්න අපේ මන්ත්‍රීවරු ඉන්නවා. මේ වෙරළ තීරයේ අපේ මන්ත්‍රීවරු ඉන්නවා. මේ වාගේ දේවල් වළක්වන්නයි ගම් මට්ටමේ දේශපාලඥයන් යොදා ගන්න ඕනෑ. ඒ නිසා මේවා සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

ඒ වාගේම ගිලන් රථ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වුණා. මගේ මව ගුවන් තොටුපලේ ඉඳලා කොළඹට ගේන්න මට ගිලන් රථයක් අරන් දෙන්න ඔබතුමාට බැරි වුණා. මම රුපියල් 15,000 ක් දීලා ගිලන් රථයක් ගෙනාවේ. මගේ ගැන හිතනවා නොවෙයි. මෙහෙම කර ගන්න බැරි, ඕනෑ තරම් මේ පළාතේ අහිංසක මිනිස්සු ඉන්නවා. ඒ අය වෙනුවෙන් ගිලන් රථ සේවයක් ගැනත් අවධානය යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාව ලබා දීම ගැන.

[අ.භා. 04.34]

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, මම සන්තෝෂ වෙනවා අපේ සෞඛ්‍ය අමාත්‍ය සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ වචන කිහිපයක්, යෝජනා කිහිපයක් දක්වන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධව. විශේෂයෙන්ම ඔබ අමාත්‍යාංශයෙන් අපට එව්වා, 2017 වසර සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා එවන්නය කියලා. ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් මම ප්‍රධාන යෝජනා තුනක් ඔබතුමාට ඉදිරිපත් කළා. එයින් පළමුවැනි යෝජනාව තමයි ගරු සභාපතිතුමනි, වතුපිටිවල ප්‍රදේශයට රාජ්‍ය ඔසුසලක් ලබා ගැනීම සම්බන්ධව. ප්‍රධාන නගර දෙකක්. ඒ වාගේම වතුපිටිවල මූලික රෝහල. ඒ ප්‍රදේශයේ දිනකට බාහිර රෝගීන් 1000 කට අධික සංඛ්‍යාවක් ඉන්නවා. ඒ වාගේම මේ සම්බන්ධව හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත් එක්කත් මම සාකච්ඡා කරලා ගරු සභාපතිතුමනි, රෝහල් පරිශ්‍රයේම පර්චස් 15 ක භූමි ප්‍රමාණයක් වෙන් කර ගත්තා. ඒ සම්බන්ධව වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමා ගිය අවස්ථාවේදීත් මම මේක පෙන්නුවා. පෙන්වලා එතකොට අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා එවකට හිටියේ අපේ ගම්පහ ප්‍රදේශයේ. එතුමාත් මේ ගැන දැනුවත්. ඒ හරහා

**41954196**

මම රාජ්‍ය ඔසුසල් නීතිගත සංස්ථාවේ ගරු සභාපතිතුමාට ලිපියක් ඉදිරිපත් කළා. නමුත් ඒගොල්ලෝ ඒ සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂණයක් කරලා තමයි අපට භාර දෙන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ප්‍රධාන නගර දෙකක්, අනික් නගර අටක් විතර යා වෙන වතුපිටිවල මූලික රෝහල් භූමියේ, ප්‍රධාන මාර්ගයට මුහුණලා රාජ්‍ය ඔසුසලක් පිහිටුවීමට 2017 වසරේදී ඔබතුමාගේ සහයෝගය මම බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම දෙවනුව වතුපිටිවල මූලික රෝහලේ හෙදි විවේකාගාරය ඉතාමත්ම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. විශේෂයෙන්ම වර්ෂා කාලයට ඒ හෙදියන්ට ඉන්න පවා බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඔබතුමාගේ සංචාරය තුළත් මේක ඔබතුමාට පෙන්නුවා. ඒ නිසා මේ සඳහාත් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

තුන්වැනි කරුණ ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාට යොමු කරනවා. ඉතාමත්ම වැදගත් කරුණක්. පස්යාල මධ්‍යම බෙහෙත් ශාලාවේ හදිසි ප්‍රතිකාර ඒකකයක් සහ දන්ත ශල්‍යාගාරයක් ආරම්භ කිරීම. මේක මේ දක්වා තිබුණේ ගරු අමාත්‍යතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරව අක්කර දෙකකට අධික භූමි සංඛ්‍යාවක. නමුත් මේකට මම ඇත්ත වශයෙන්ම උනන්දු වෙලා,මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන්නා වූ ඒ ඔප්පුව අපේ බස්නාහිර පළාත් සභාවට මම අරන් දීලා තිබෙනවා. ඒ සම්බන්ධව පිටපත් ගම්පහ ප්‍රදේශයට එවලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පස්යාල කියලා කියන්නේ ඉතාමත්ම ජනාකීර්ණ ප්‍රදේශයක්. ලෙඩ්ඩු මැරෙනවා. විශාල වශයෙන් ආබාධයන්ට පත් වෙනවා. ඒ නිසා වතුපිටිවල රෝහලට යන්න කාලයක් ගත වෙනවා. ඇම්බියුලන්ස් එකක් ගේන්න තවත් කාලයක් ගත වෙනවා. මේ ස්ථානය ඔබතුමාත් දැක්කා. පරණ ලොකු ගොඩනැගිල්ලක් තිබෙනවා. අපට මේක ප්‍රයෝජනයට ගන්න පුළුවන්. අක්කර දෙකකට ආසන්න අධික වටිනාකමකින් යුත් ප්‍රදේශයක්. ඒ නිසා ඒකේ හදිසි ETU එකක් දාන්නත්, ඒ වාගේම විශේෂයෙන්ම වතුපිටිවල රෝහලේ දන්ත වෛද්‍ය අංශයට ඉතාමත්ම අධික සෙනඟ සංඛ්‍යාවක් එනවා. ඒ නිසා අනික් පැත්තෙන් ඉන්න සෙනඟට, පස්යාල පැත්තේ ඉන්න සෙනඟට මෙතැන දන්ත වෛද්‍ය සායනයක් හැදුවොත්, දන්ත ශල්‍යාගාරයක් හැදුවොත් වතුපිටිවල රෝහලට එන රෝගීන්ගේ විශාල අඩුකමක් දකිනවා. ඒ නිසා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය මම මේ ලිපිය එව්වා. මෙය අවධානයට ලක් කරන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධව. ඇත්ත වශයෙන්ම මේකේ මෙහෙවර තිබෙන්නේ අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට ලක් වූ දරුවන්ගේ කායික, මානසික හා සෞඛ්‍ය වර්ධනය සමඟ අනික් අයිතීන් ආරක්ෂා කර ගැනීම. අපි දන්නා අන්දමට දැන් දරුවෝ 4000 ක් විතර අපේ ළමා නිවාසවල ඉන්නවා. ළමා නිවාස 120 ක් පමණ බස්නාහිර පළාත් සභාව තුළ තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඒ දරුවන්ගේ නඩත්තුවට දිනකට දෙන්නේ රුපියල් 20 ක මුදලක්. ඉතින් අද ඒ වාගේ මුදලකින්, මේ රටේ පවතින තත්ත්වය තුළ ගරු සභාපතිතුමනි, ඒ එක් දරුවෙකුට රුපියල් විස්ස බැගින් වියදම් කරලා ඒ කර්තව්‍යය ඒ ළමා නිවාසවල භාර අයට කරන්න පුළුවන්ද? ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, අඩුම වශයෙන් ඒ දරුවෙකු උදෙසා දෙන රුපියල් විස්සේ දීමනාව රුපියල් පනහක් දක්වා හෝ වැඩි කරන ලෙසට.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනවා. පරිවාස හා ළමා රක්ෂක කොමසාරිස්තුමිය ඉතාමත්ම කැපවීමෙන් ඒ අයාලේ ගිය දරුවන්, නොයෙක් ආබාධයන්ට පත් වූ දරුවන් එක්තැන් කරලා මානසික සුවය සහ ඒගොල්ලන්ගේ ආධ්‍යාත්මිකභාවය වැඩි දියුණු කරන්න විශාල වෙහෙසක් දරනවා. එතුමිය මට ආරාධනා කරන හැම අවස්ථාවකදීම ඒ දරුවන්ගේ විවිධ උත්සවවලට මම සහභාගී වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපට හරි සන්තෝෂයි. දෙමව්පියන්ට එපා වුණු, දෙමව්පියන් අත්හැරපු, නොයෙක් නොයෙක් අතවරයට ලක් වුණු දරුවෝ තමයි අද ඒකරාශී කරලා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම අපි මේ ක්ෂේත්‍රය තුළ අයාලේ යන මේ දරුවෝ එක්තැන් කරලා කරන්නා වූ ඒ වැඩ කොටසට අපි සම්පූර්ණ සහයෝගය දිය යුතුයි. ඒ නිසා විශේෂයෙන්ම මේ දරුවන්ගේ ඒ ආයතනවලත් - සමහර තැන්වල බොහෝ අඩුපාඩුකම් තිබෙනවා. ඒ නිසා ඒ අඩුපාඩුකම් සපුරන්න ඒ කොමසාරිස්තුමියගේ ආධාර ඇතිව ඔබතුමා ඒවා දැනුවත් වෙලා ඒවා කරන ලෙසට මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඒ අමාත්‍යාංශයේම සිසුමිණ ශිෂ්‍යාධාර ක්‍රමයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සිසුමිණ ශිෂ්‍යාධාර ක්‍රමය තිබෙන්නේ, දෙමව්පියන් හැර ගිය, තාත්තා හැර ගිය, තාත්තා මිය ගිය, නැත්නම් අම්මා තාත්තාගේ විරසක ඇති පළාතේ දරුවන්ගේ දියුණුව සඳහා තමයි මේ මුදල දෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ මුදල ලෙස දැන් රුපියල් පන්සියයයි දෙන්නේ. ඒකත් මම තමුන්නාන්සේට යෝජනා කළා. අපි ත්‍රිකුණාමලයේදීත් යෝජනා කළා. අපේ ගරු ප්‍රධාන ලේකම්තුමාගේත් අවධානයට මේක යොමු වුණා. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සිසුමිණ ශිෂ්‍යාධාර රුපියල් පන්සියය දාහක් කරන්න පුළුවන් නම් මම හිතන්නේ, ඒ අසරණ දෙමව්පියන්ට - මම මේ වසරේම සෑහෙන ශිෂ්‍යත්ව ප්‍රමාණයක් දරුවන්ට දුන්නා. මගේ අත්තනගල්ල ආසනයේ. ඒකේදී මට තේරුණා, ඒ දෙමව්පියෝ කොයි තරම් සන්තෝෂ වුණාද කියලා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ සිසුමිණ ශිෂ්‍යාධාර ලබන වසරේ සිට රුපියල් දාහ බැගින් යෝජනා කරන්නය කියලා.

අවසන් වරට ආයුර්වේද සම්බන්ධවත් මම වචනයක් කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම අද බටහිර ප්‍රතිකාරවලට වැඩිය ගරු සභාපතිතුමනි, සෑම දෙනෙකුගේම අවධානය යොමු වෙලා තිබෙන්නේ, දේශීය වෛද්‍ය ක්‍රමයට. විශේෂයෙන්ම අපි දියවැඩියාව ගත්තොත් බටහිර වෛද්‍යක්‍රමයෙන් නොයෙකුත් අතුරු ආබාධ එනවාය කියලා අද මතයක් තිබෙනවා. ඒ නිසා සිංහල වෛද්‍ය ක්‍රමයට හුඟක් අය අද නැඹුරු වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මම දන්නවා. මීට පෙර අදහස් දැක් වූ අපේ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානයක් කිරිබත්ගොඩ ප්‍රදේශයේ තිබෙනවාය කියලා. කළුතර ප්‍රදේශයේත් ඇති. නමුත් ගරු අමාත්‍යතුමනි, අපේ ගරු සභාපතිතුමාගේ ආසනයත් ගම්පහ. අපේ දිස්ත්‍රික්කය. අපේ දිස්ත්‍රික්කයටත් මේ පංචකර්ම මධ්‍යස්ථානයක් පිහිටුවලා දෙන්න පුළුවන් නම් මම හිතනවා ඒක ඉතාමත්ම හොඳයි. අනික් එක ඒ ක්‍රමය තුළ මම අහලා තිබෙනවා. මම ඒ අංශය භාර අධ්‍යක්ෂතුමියත් එක්ක පෞද්ගලිකව කථා කළා. විශේෂයෙන්ම රෝග නිට්ටාවටම සුව කළ හැකි ස්ථානයක් තමයි ඒ පංචකර්ම ආයුර්වේද මධ්‍යස්ථාන. විශේෂයෙන්ම මේ තුළ ඔබතුමා විශාල කැප වීමක් කරනවා. ඒක මම පෞද්ගලිකවම දන්නවා. අපි වර්ණනා කරන්න යන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයට අපි ගියාම ඔබතුමා නොහිටියත්, ඇත්ත වශයෙන්ම ලේකම්තුමිය, පෞද්ගලික ලේකම්තුමා, ඒ සම්බන්ධීකරණ ලේකම්තුමිය, විශේෂයෙන්ම සැලසුම් අංශය ඇතුළු හැම අංශයකින්ම ඒ සහයෝගය අපේ ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙනවා. ඒ නිසා තමයි අපි අද ඉතාමත්ම සන්තෝෂයෙන් කථා කරන්නේ.

ඒ වාගේම තමයි අපි තමුන්නාන්සේට මේ වාගේ යෝජනා කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම තමුන්නාන්සේ අපහසුතාවයට පත් කරනවා නොවෙයි. 2016 ට වැඩිය 2017 මම හිතන්නේ, මුල්‍යාතත්ත්වයත් අඩු බව කථා වලින් තේරුණා. ලැබිලා අඩු ඇති. කෙසේ වෙතත් මේ යෝජනාවලට ගරු ඇමතිතුමාගේ සම්පූර්ණ අවධානය යොමු කරලා, ඒ කාර්ය මණ්ඩලය තුළින් විශේෂයෙන්ම මේ පරිවාස හා ළමා රක්ෂක අංශය වෙනුවෙන් විශේෂ කාර්යභාරයක් ඉෂ්ට කරන හැටියට ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි. [අ.භා. 04.44]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මට අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය වෙලාවේදී කියන්න අමතක වුණු පොඩි කාරණයක් තිබෙනවා. ඒ තමයි මේ සෞඛ්‍ය හා සම්බන්ධ වුණු කාරණයකුත් එතැන තිබෙනවා. අපේ පළාතේ ඉන්නවා මහෝපාද්‍යා ආනන්ද පන්නිල කියලා හාමුදුරුවන් කෙනෙක්. මේ හාමුදුරුවෝ වතුපිටිවල රෝහලේ භික්ෂු වාට්ටුව සම්පූර්ණයෙන්ම නිර්මාණය කළා. ළමා වාට්ටුව සම්පූර්ණයෙන්ම නිර්මාණය කළා. ආපහු ගැබිනි මාතාවන් වෙනුවෙන් වාට්ටු හදන්න ප්ලෑන් එකක් ඉල්ලලා තිබෙනවා. මේක තව වෙනකල් ලැබිලා නැහැ. ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය වෙනුවෙන් උන්වහන්සේ මහා සේවයක් කරනවා. නුවර මහ රෝහලේ බුදු මැදුර හදන්න, ලක්ෂ 80 ක මුදලක් ඊයේ පෙරෙයිදා දවසක ගිහිල්ලා භාර දුන්නා. ඒ ප්‍රදේශයේ තිබෙන රෝහලේ තිබෙන ඕනෑම වැඩ සටහනකට උන්වහන්සේ ආධාර කරනවා. නමුත් උන්වහන්සේව එතැන ගණන් ගන්නේ නැහැ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඇම්බියුලන්ස් රථයක් ලැබුණා. ඒක වෛද්‍ය අධිකාරීවරයා භාර ගත්තේ නැහැ. ඒක අන්තිමට සමූපකාර රෝහලට උන්වහන්සේ භාර දුන්නා.

**41954196**

ඒ වාගේම වෙළඳ ව්‍යාපාරිකයෙකු මට කථා කරලා තිබෙනවා, අපි වාට්ටුවක සම්පූර්ණ වැඩ ඉවර කරලා දෙමු. ඇඳන් ටික පවා දෙමු. මේකට කටයුතු කරන්නය කියලා. එතකොට නිකම්ම සම්පත් ටික ලැබෙන මේ රෝහල ඒවා ලබා ගන්නේ නැහැ. අපේ හාමුදුරුවෝ තට්ටු තුනේ ගොඩනැගිලි, ලක්ෂ 180 ගණනේ ගොඩනැගිලි අටක් හදලා දුන්නා ප්‍රදේශයේ පාසල්වලට. අධ්‍යාපන අමාත්‍යාංශයත් කළේ නැති දේවල්. ඒ වාගේම බුද්ධ මන්දිර. පෙර පාසල්. ඒ ප්‍රදේශයට ඒ වාගේ ගණනාවක් කරපු මහා බුද්ධ පුත්‍රයන් වහන්සේ කෙනෙක්. ඒ නිසා මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙලාවේ උන්වහන්සේට ගෞරවය පුද කරන්න ඕනෑ. උන්වහන්සේ ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය වෙනුවෙන් විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වාගේම හැම කෙනෙකු වෙනුවෙන්ම විශාල සේවයක් කරනවා. ඒක අගය කරන්න ඕනෑ. ඒ වාගේම උන්වහන්සේට ලැබුණු නිල රථය. ඒක ලක්ෂ 120 කට මුදල් කරලා තමයි උන්වහන්සේ අවසාන පාසල හදන්න මේ වන කොට මුල්ගල තියලා ආරම්භ කළේ.

**ගරු අශෝක දයාරත්න**
Hon.Ashoka Dayarathne

ගරු මන්ත්‍රීතුමා, කවුද ඒ හාමුදුරුවෝ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

පන්නිල ආනන්ද හාමුදුරුවෝ. අත්තනගල්ල රජමහා විහාරාධිපති හාමුදුරුවෝ. ඉතින් උන්වහන්සේට ලොකු වුවමනාවක් තිබෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාට, එතුමාගේ ආසනයේ රෝහලක් හදන්න ඕනෑ නම්, අපේ හාමුදුරුවන්ට කිව්වා නම්, ඒකට මුල්ගල තියලා කටයුතු කරනවා. උන්වහනසේට එපමණ හැකියාවක් තිබෙනවා. ඊයේ පෙරෙයිදා දවසක මම ලක්ෂ තුනක් දීලා පන්සලක හාමුදුරුවෝ කෙනෙකුට ගොඩනැගිල්ලක් හදන්නය කිව්වාම, අපේ ආනන්ද හාමුදුරුවෝ ඇවිල්ලා ලක්ෂ පහක් දීලා ගියා. ඒ වෙලාවේ අතට සල්ලි දීලා ගියා. ඒ වාගේ ගරු කරන්නට ඕනෑ. මේ ජන සමාජයේ ගෞරවයට පාත්‍රවෙන්න ඕනෑ. මේ බස්නාහිර පළාත අගය කරන්නට ඕනෑ. හැම ක්ෂේත්‍රයකින්ම හොඳ හාමුදුරුවෝ කෙනෙක් තමයි අපේ ප්‍රදේශයේ ඉන්න ඒ පන්නිල ආනන්ද හාමුදුරුවෝ කියන එක මම කියන්නට ඕනෑ.

ඒ වාගේම ගරු ඇමතිතුමා, මම පෙර දවසකත් කිව්වා. ඕනෑම ඇමතිවරයෙකුට කාලයක් තිබෙන්නට ඕනෑ. අවුරුදු පහක නිල කාලයක් අපට ලැබිලා තිබෙන්නේ. ඒ නිල කාලය තුළ පත් වෙන්නට ඕනෑ. අවුරුදු හතරකටවත් සැලසුම් හදන්නට ඕනෑ. ඒවා පසු විපරම් කරන්නට ඕනෑ. ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සොයා ගන්නට ඕනෑ. ගියවර අපි සෞඛ්‍යඅමාත්‍යාංශ වැය ශීර්ෂය පරාජය කළා. ඒ නිසාමගරු ඇමතිතුමාට සෞඛ්‍ය අමාත්‍යාංශය ලැබිලා තියෙනවා. මේ සියලු දේවල්වලට වගකීමක් එතුමාට ගන්න පුළුවන්කමක් නැහැ. එතුමාට උනන්දුවක් තිබෙනවා. එතුමාට පළපුරුද්ද තිබෙනවා. නමුත් එතුමාට කාලයක් අවශ්‍ය වෙනවා. මෙන්න මේ කාර්යය කර ගන්න. ඒකට අපි සහයෝගය ලබා දෙන්නට ඕනෑ. ඒක අපේ වගකීම වෙන්නට ඕනෑ.

අපි සභාවට ඇවිල්ලා, සමහර විට විවේචන තිබෙන්න පුළුවන්. ඒවා අපි සාධාරණව කරන්නට ඕනෑ. නමුත් අපි මන්ත්‍රීවරු වශයෙන් ගමේ ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්න ටික සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙනැල්ලා, එතුමාට කියලාලේකම්තුමියට කියලා අපේ ප්‍රදේශයේ සෞඛ්‍ය ප්‍රශ්න විසඳීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්න පාලමක් බවට පත් වෙන්නට ඕනෑ. ඒ අනුව තමයි අපට මේ කාර්යය කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඇමතිතුමාට හැම රෝහලකටම ගිහිල්ලා, සොයලා බලලා කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. කාර්ය මණ්ඩලයට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. අපේ වගකීම අපි ඉටු කරන්නට ඕනෑ. මම මේ බස්නාහිර පළාතේ අවබෝධ කර ගත් දේ. මම මීට පෙරත් මේක කිව්වා. මේ අමාත්‍යවරු තනි තනියෙන් ක්‍රියා කරන්න ගියාම තමයි මේ ගැටළුව ඇති වෙන්නේ.

අපි පාසල ගත් විට අධ්‍යාපන විෂයයට අදාළ දෙයක්. අපේ දරුවන්ගේ තිබෙන විවිධ රෝග තත්ත්වයන් තිබෙනවා. මේක සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ දෙයක්. එතකොට මේ අමාත්‍යාංශ දෙක කථා කර ගන්නට ඕනෑ. අවසානයේ අපි කිව්වොත් එහෙම. දේශීය ආහාර නිෂ්පාදනය යන කොට, අපේ කෘෂිකර්ම ඇමතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා, සෞඛ්‍යඇමතිතුමා එකතු වුණොත් අපේ පාසල් යන දරුවාට හොඳ කැඳ වීදුරුවක් දෙන්න පුළුවන් වට පිටාව ගොඩ නගන්න පුළුවන් වෙනවා. හොඳ ආහාර වේලක් දෙන වටපිටාව ගොඩ නගන්න පුළුවන් වෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යතුමා කථා කළා නම්, පළාත් පාලන ආයතනයට. පළාත් සභා අමාත්‍යාංශයට. අපට පුළුවන්, සම්බාහන ආයතන නැතිව අර සිංහල ආයුර්වේද ක්‍රමය තුළ සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කරන්න පුළුවන්. ඒ සංචාරකයෝ

**41974198**

එන කොට දේශීය වෛද්‍ය ක්‍රමය හරහා අපි කොහොමද කටයුතු කරන්නේ. එහෙම නම් මේ වාගේ කරුණු ගණනාවක් අපි අධ්‍යයනය කරන්නට ඕනෑ. මේ පළාත් සභාව එක මිටක් වාගේ වැඩ කළොත් විතරයි ප්‍රධාන ලේකම්ගේ සිට ඊළඟ ලේකම් දක්වා එකට කාර්ය මණ්ඩලය සමඟින් මහ ඇමතිතුමා, අනික් ඇමතිවරු දක්වා ජාලයක් වශයෙන් එකට ගියොත් විතරයි මේ බස්නාහිර පළාතට වැඩක් කරන්න පුළුවන් ආයතනයක් බවට මෙය පත් වෙන්නේ. ඒ නිසා අපේ කාන්තා කටයුතු අමාත්‍යාංශය ගත්තත්, කාන්තාවන්ගේ විවිධ වූ දස්කම් තිබෙනවා. විශ්මිත නිර්මාණ තිබෙනවා. එතකොට මේ සෞඛ්‍ය අමාත්‍යාංශය කාන්තා කටයුතු නියාමනය කළත්, අවසානයේ අපේ බස්නාහිර පළාතේ කර්මාන්ත අමාත්‍යාංශය හරහා තමයි අපට ඒවාට යම් යම් පහසුකම් දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. පළාත් සභා අමාත්‍යාංශයට තමයි වෙළඳ පොල සඳහා භූමිය ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්කම ලැබෙන්නේ. එතකොට මෙන්න මේ වාගේ ජාල ගතව එකට ගියොත් මේ අමාත්‍යාංශයට වඩා වැඩි වටිනාකමක් ලැබෙයි. තනි තනිව වැඩ කරන්න ගියොත් අපි නිකම් රුපියල් දහ පහළොස් දාහේ ව්‍යාපෘති දෙනවා. පුහුණුවීම් ලබා දෙනවා. ඒවායේ වෙළඳපොලක් නැහැ. කර්මාන්ත කර ගෙන යන්න විධියක් නැහැ. ව්‍යාපාර ලියාපදිංචියක් කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ පළාත් සභා පිළිබඳ හොඳ අධ්‍යයනයක් කරලා, මේ ජාලය ඇති කරන්නට ඕනෑ. ඇති කළොත් මම හිතන්නේ, ලොකු ගමනක් යන්න පුළුවන් කියන විශ්වාසය මට තිබෙනවා.

ඒ වාගේම තමයි අපේ ප්‍රජා සෞඛ්‍ය කියලා අංශයක් තිබෙනවා. අපේ බස්නාහිර පළාතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, අපි ආදරය කරන දේශීය වෛද්‍ය ක්‍රමය. මේ වෛද්‍ය ක්‍රමයේ සිටිනවා ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන්. ඒ නිලධාරීන් ජංගම ආකාරයට සෞඛ්‍ය පහසුකම් සපයනවා. ජන සමාජය මේක අගය කරන්නේ නැහැ. ඒ අයට නිසි පහසුකමක් නැහැ. මම උපදේශක කාරක සභාවට ඇවිල්ලා නිතර කියන දෙයක් තමයි වැසිකිළි පහසුකමක් නැහැ. ගොඩනැගිලි පහසුකමක් නැහැ. ඉන්න පුටුවක් නැහැ. නමුත් ඒ ප්‍රදේශයේ ජනතාව වෙතට ඇවිල්ලා, ඒ අය නිරන්තරයෙන් තමන්ගේ තිබෙන දැනුමත්, තමන්ගේ තිබෙන වුවමනාවත් පාවිච්චි කරලා මිනිස්සු සුවපත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඒ අයට ඒ පහසුකම් දෙන්නට ඕනෑ. මේ භූමිය අයිති ප්‍රාදේශීය සභාවටද? ගොඩනැගිල්ල අයිති ප්‍රාදේශීය ලේකම්ටද? අපේ වෛද්‍යවරයා ගිහිල්ලා බෙහෙත් දෙනවාද? ප්‍රදේශයේ ජනතාවට දෙන අපේ මේ පහසුකම් කොහොමද අපි ගලපා ගන්නේ කියන එක,අපි හොඳින් ගලපාගන්න ඕනෑ, ඒ වාගේම තමයි වඩා අවධාරණය කරන්න ඕනෑ. සමාජ සේවා දෙපාර්තමේන්තුව. ඒ සමාජ සේවා දෙපාර්තමේන්තුව එතුමිය හරහා විශාල කාර්යභාරයක් කරනවා. ඒ කාර්යභාරය හරහා වැඩිහිටි සංවිධාන වෙන්න පුළුවන්. ඒ වාගේම විවිධ ආබාධිත දරුවෝ වෙනුවෙන් වෙන්න පුළුවන්. මේවාගේ කාර්යයන් කරන කොට අපි අවබෝධ කර ගන්න ඕනෑ. අපි අත්තනගල්ල කියලා ගත්තොත්, අත්තනගල්ලේ 38 දෙනාට තමයි මෙන්න මේ ආබාධිත දරුවන්ට ආබාධිත පුද්ගලයන්ට යම් යම් ආධාර දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මේවා යෝජනා කරලා, ස්ථිර කරලා මේවාට මුදල් ප්‍රතිපාදන වැඩි කරන්න කටයුතු කරන්න ඕනෑ. එතකොට තමයි අපට නිලධාරීන්ටත්, ඇමතිතුමාටත් ගෞරවයක් වෙන විධියට කටයුතුකරන්න

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

පුළුවන්කම ලැබෙන්නේ. ඒ වාගේම මේ දරුවෝ ගැන බලන කොට නොවිධිමත් අධ්‍යාපන ඒකකය. සමාජ සේවා ආයතනය. ඒ වාගේම පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව එකතු වුණා නම්, ලොකු වැඩ කොටසක් කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලයේ ඇමතිතුමාගේ යම් යම් සබඳතා අනුව මේවා සංවිධානය කරලා, කථා කරලා අපට පුළුවන් මේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යන්නේ කොහොමද කියලා තීරණයක් කරන්න. ඒ විධියට අපිට කටයුතු කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය මම මේ සභාවට තහවුරු කරනවා.

ඒ වාගේම තමයි වැඩ කරන්න ගියාම ගැටළු. අපේ අත්තනගල්ල ආසනයේ වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ වෛද්‍යවරයා තමන්ගේ කාලය - වෛද්‍යවරුන්ගේ සේවය මුදලට විකුණන යුගයක සමන් පාලිත වෛද්‍යවරයාඒ ප්‍රදේශයේ ඉන්න තරබාරු පුද්ගලයන් සියලු දෙනා ඒකරාශී කරලා, තරබාරු විතරක් නොවෙයි. දියවැඩියා රෝගීන්, කොලොස්ටරෝල් වැනි විවිධ රෝගවලින් පෙළෙන අය ගෙනැල්ලා එතුමා උදේ 6.00 ඉඳලා 9.00, 10.00 දක්වා තමන්ම මහන්සි වෙලා ව්‍යායාම කරනවා. ගම්වලට ගිහිල්ලා මිනිස්සු දැනුවත් කරනවා. දේශන පවත්වනවා. කිරි බොන එක නවත්වන්න මිනිස්සුන්ව දැනුවත් කරනවා. දේශීය ආහාර රටාවන්ට මිනිස්සු හුරු කරලා, තමන්ගේ බර

අඩු කරන මට්ටමට අඩු කර ගන්නා විට බැජ් එකක් පළන්දවලා ඒ අයට ගෞරවයක් ලබා දීලා මහ විශාල කාර්යයක් කරනවා. අද රෝහලේ පාලන අධිකාරිය හරහා එතුමාව රෝහලෙන් නෙරපන තත්ත්වයට කටයුතු සිදු වෙමින් යනවා. එතුමාට ඒ සේවය කරගන්න දෙන්නේ නැහැ. අපි මංතීරුවක් හදලා දෙන්න උත්සාහ කළා. ඒක කරන්න ඉඩක් දුන්නේ නැහැ. අද එතුමාට ගැටළු රාශියක් ඇති කරනවා. මෙවන් වෛද්‍යවරු දෙවිවරු වශයෙන් සලකන්න ඕනෑ යුගයක්. තමන්ගේ සේවය, තමන්ගේ ප්‍රජාව වෙනුවෙන් කටයුතු කරන වෛද්‍යවරු. අපේ ඇමැතිතුමාගේ පොතේත් ඒක දාලා තිබෙනවා. ටී ෂර්ට් එකක් අන්දලා ලස්සන වැඩ සටහන් කරන වෛද්‍යවරයෙක්. එතුමාව අපි අගය කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි අපේ වතුපිටිවල රෝහල ගැන ප්‍රශ්නයක් කිව්වා. වතුපිටිවල රෝහලේ හරකෙක් ඉඳලා වාහනයකට පොඩි තුවාලයක් කළා කියලා අද කිලෝ මීටරයක් විතර ඈතින් වාහන ටික පාර්ක් කරනවා. කර්මාන්ත 30 කින් සවස 05.00 වනකොට බස් ආරම්භ කරනවා. අද වතුපිටිවල නගරය හරහා හවසට මිනිහෙකුටවත් යන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ ප්‍රශ්නය දිගින් දිගට ගෙනාවත් වෛද්‍යවරයාගේ හිතුවක්කාරකමට වාහන ඇතුල් කරන්න දෙන්නේ නැහැ. කථා කළ යුතු දේවල් ගණනාවක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අපට, අපේ ප්‍රදේශයට ලොකු සේවයකුත් වුණා කියන එක අපි කියන්න ඕනෑ. මම ගරු ඇමැතිතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා, මම එතුමාට නිරන්තර යමක් කියනවා. ඒ තමයි අපේ ප්‍රදේශයේ ඉතාමත් දුප්පත් ගම්මාන ගණනාවකට මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කරලා දෙන්න. ඉතාමත් අහිංසක මිනිස්සු පිරිසක් ඉන්න ප්‍රදේශයක්. මම දැනුත් සොයා බැලුවාම අපේ ගම්පහ රෝහලේ, යම් යම් රෝහල්වල ඔපරේෂන් කරන ස්ථාන නවීකරණය කරන්න ඕනෑ. මුදල්වලින් කරගන්න බැරි වෙලා, මේ අවුරුද්දේ ඉවත් වන කථාවකුයි මට දැනගන්න ලැබුණේ. පුළුවන් නම් අපේ මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට දාලා, ඒ මුදලින් අපේ ප්‍රදේශයේ සායනය ඉදි කරලා දෙන්න. ඒ වාගේම ඔබතුමාගේ කාර්ය භාරයත්, කාර්ය මණ්ඩලයේ කාර්ය භාරයත් අගය කරමින් ඔබතුමාට සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, එතුමාගේ කථාවේදී වෛද්‍යවරයෙක් නෙරපන තත්ත්වයට පත් කරලා තිබෙනවා කියලා පැහැදිලි කළා. ඒක මොකක්ද කියලා දැනගන්න කැමැතියි මගේ වරප්‍රසාදයක් හැටියට. මොකද, එතුමා හොඳ වෛද්‍යවරයෙක්. ගිය අවුරුද්දේ අයවැය විවාදයේදීත් ඔබතුමාට මතක ඇති අපේ සන්ධ්‍යා මන්ත්‍රීතුමිය, මේ වෛද්‍යතුමා ගැන හොඳ වර්ණනාවක් කරලා, එතුමාගේ සේවය ඇගයීමක් කළා. මේ අවුරුද්දේත් එතුමා ගැන කථා කරනවා. හැබැයි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගත්තු වැඩ පිළිවෙළ මොකක්ද? එතුමා නෙරපා හරින තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒක සම්පූර්ණ වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා එම වෛද්‍යවරයාගේ නම කිව්වත් කමක් නැහැ. අපේ ඇමැතිතුමා ඉන්නවා. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඉන්නවා. අදාළ නිලධාරීන් ඉන්නවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

එතුමාගේ කාර්ය භාරය අගය කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෛද්‍යවරයාගේ නම කිව්වත් ප්‍රශ්නයක් නැහැ. එතුමාට ලොකු ඇගයීමක් නේ?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

එතුමා මේ කරන කාර්යයට කාර්ය මණ්ඩලවල තමයි ගැටළුව තිබෙන්නේ. අනෙක් වෛද්‍යවරුන්ගේ. එතුමා ස්වෙච්ඡාවෙන් මේ කාර්යය කරනවා නේ? දැන් අවස්ථා කිහිපයක් මාරු කළා. ඇමැතිතුමා තමයි මෙතැන තාවකාලිකව ස්ථාපිත කරලා තිබෙන්නේ. හැම ගමකම එතුමාගේ ශාඛා හැට හැත්තෑවක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගෞරවනීය ආනන්ද හාමුදරුවන්ගේ නම කිව්වා වාගේ එතුමාගේ නමත් කිව්වොත් එතුමාට කරන ගෞරවයක්.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

සමන් පාලිත වෛද්‍යතුමා. මම කලින් කිව්වා. එතුමා පොත් ලියන කෙනෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි. ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. සමාවෙන්න, ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තමයි දීලා තිබෙන්නේ.

[අ.භා. 04.55]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, මම සෞඛ්‍ය උපදේශක කාරක සභාවේ ඉන්නවා. මට විනාඩි 10 ක් අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මොකද කරන්නේ? එහෙම නම් හෙට උදේට විපක්ෂයේ සංවිධායකතුමාගෙන් ඉල්ලා ගන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මට සුපුරුදු කථාව කරන්න හම්බ වෙන්නේ නැහැ. නමුත් මම කෙටියෙන් හෝ විනාඩි 03 ක් තුළ බොහොම වේගයෙන්, මම හිතන්නේ රුහුණු කුමාරි දුම්රිය යනවා වාගේ තමයි කථා කරන්න වෙන්නේ. පළමුවෙන්ම මට කියන්න වෙන්නේ අපේ පළාත් සභාව තුළ අමාත්‍යාංශ හතරයි. මහ ඇමැතිතුමාගේ මිත්‍රශිලීභාවය මෙතැනට ආවාම පේනවා. අමාත්‍යාංශවල වැඩ බලද්දී කිසිම සම්බන්ධතාවයක් නැහැ. සෞඛ්‍ය ඇමැතිතුමා පළතුරුවලට බෙහෙත් නොගහා කන්න කියනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම නිලධාරී කියනවා බෙහෙත් ගහලා විකුණන්න. ඉක්මණින් විකුණා ගන්න පුළුවන් කියලා. ඒ නිසා මේ වාගේ පටලැවිලි මතු වෙමින් තමයි අපේ ගොඩක් දේවල් සිද්ධ වෙන්නේ. ඒ නිසා සියලුම අමාත්‍යාංශ එකතු වෙලා, මේ වැඩ පිළිවෙළ යන්නට ඕනැ. ඒ නිසා මගේ කථාව මම කරන්න යන්නේ. මේ අමාත්‍යාංශ එක්ක පූට්ටු ඇති කරන්න වෙනවා. මම ඇමැතිවරුන්ට කිව්වාට තරහා වෙන්න එපා. මොන පූට්ටුවෙන් හරි, බලු පූට්ටුවෙන් හරි මේක එකතු කරලා දෙන්න වෙනවා, එක එක කාරණා හැටියට ගත්තාම. යහපාලන රජය බෙහෙත් වට්ටෝරු ගණනාවක මිල අඩු කරලා දීම පිළිබඳව ඇත්තටම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මම සෞඛ්‍ය ඇමැතිතුමාට මතක් කරනවා. මගේ පූට්ටුව ගැන මතක් කරපු එක කාරණාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහෙන්නේ නැහැ. පූට්ටුවද මොකක්ද කියන්නේ? මට තේරෙන්නේ නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පොහොට්ටුව නොවෙයි. එකතු කිරීමක් කරන්න වෙනවා කියන එක. ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා.
[ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්]

අනිවාර්යෙන්ම බස්නාහිර පළාතේවත්, මුළු රටේම තවම ඒක කරලා නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය තුළින් සියලුම පාසල් දරුවන්ව ශිෂ්‍යත්ව විභාගයට පෙර හරි ඇස් පරීක්ෂාවක්, කන් පරීක්ෂාවක් කළ යුතුමයි කියන යෝජනාව. සියලුම පාසල් දරුවන්ට ඒක ලබා දිය යුතුයි. උදාහරණයක් විධියට, අධ්‍යාපනයෙන් අසමත් 10 දෙනෙක්ව මම ගිය මාසේ රියදුරු බලපත්‍රය ලබා ගන්න යැව්වාම, දෙදෙනෙකුගේ පෙනීම දුර්වලයි කියලා ප්‍රතික්ෂේප වුණා. එක්කෙනෙක්ගේ කන ඇහෙන්නේ නැහැ කියලා Rejectවුණා. හැබැයි සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට අසමත් වුණු දරුවෝ. මම හිතන්නේ, ඒ අසමත් වීමට නොහැකියාව උප්පත්තියෙන් ඇසට ලැබුණු දුර්වලතාවය කියලා ඒ අය දන්නේ නැහැ. ඒ නිසා අනිවාර්ය කළ යුතුයි ගරු සභාපතිතුමනි. ඇසේ පෙනීම. ඒ වාගේම කන ඇහෙනවාද කියලා පරීක්ෂා කිරීම. ENT වෛද්‍යවරයෙක් හරහා. මේ වෛද්‍ය පරීක්ෂාවට තුන වසරේදී නැත්නම් හතර වසරේදී කළ යුතුව පවතිනවා. ඒ වාගේම සිගරට් මත්ද්‍රව්‍ය සඳහා අපේ රජය තුළ බදු වැඩි කිරීම නිසා, බාලම අරක්කු හදන්නට නීත්‍යානුකූල ආයතනත් සමත් වෙලා තිබෙනවා. රුපියල් 200 ට 300 ට බෝතල් භාගය විකුණන්න පුළුවන් තත්ත්වයකට බාල අරක්කු හදන්න අද සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම සිගරට් අරගෙන බැලුවාම බොහොම නරක ජාතියේ සිගරට් රට තුළ අලෙවි වෙනවා. මේවා ගැන පරීක්ෂණයක් පවත්වලා තහනම් කරන්න වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි -

**41954196**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

තප්පරයක් දෙන්න. ඒ වාගේම යූනානි වෛද්‍ය ක්‍රමයත්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයත් මේ රටට හඳුන්වා දීලා නැහැ. බෝ නොවන රෝග ගත්තාම ඒඩ්ස්. දියවැඩියා.අනෙකුත් රෝග.තුන්බිය. මේවා ගත්තාම තව අවුරුදු 10 ක්, 20 ක් යනකොට ගරු සභාපතිතුමනි, ලංකාව මහ රෝහලක් වාගේ. දූපතම මහ රෝහලක් වන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. එක ගෙයක හය දෙනෙක් හිටියා නම්, තුන් දෙනෙක් බෙහෙත් ගන්නවා. පොඩි දරුවෝ බෙහෙත් ගන්නවා. බෙහෙත් ගන්නේ නැත්තේ එක්කෙනයි. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා ඔබතුමා කථාව අවසන් කරලා, වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ නිසා මේ බිය තුරන් කරන්න, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වඩා පුළුල් විධියට සංවර්ධනය වෙලා ජනතාව දැනුවත් විය යුතුයි කියන එකත් ඉල්ලමින්, කාලය අවසන් වීම ගැන කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට අනුව අද දවසට නියමිත වැඩ කටයුතු අවසන් වෙනවා. අපේ සෞඛ්‍ය ලේකම්තුමියගෙන් විශේෂ නිවේදනයකුත් තිබෙනවා.

හෙට උදෑසන 08.00 ට ආයුර්වේද සහ බටහිර වෛද්‍ය සායනයක් මෙම ගොඩනැගිලි පරිශ්‍රය තුළ පැවැත් වෙනවා. උදේ 08.00 ට සහභාගී වන ලෙස ආරාධනා කරනවා. පැය 12 ක් නිරාහාරව සිට පැමිණියොත් රුධිරගත සීනි පරීක්ෂාවක් සහ කොලෙස්ටරරෝල් පරීක්ෂාවක් කර ගන්න පුළුවන් කියලා දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා පැය 12 ක් නිරාහාරව සිට උදේ 08.00 වන විට පැමිණෙන ලෙස මම ගෞරවයෙන් ආරාධනා කර සිටිනවා.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දිනයේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා දැන් පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වෙනවා.

***ඊට අනුකූලව ප.ව. 04.59 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 04.59 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*
**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016.12.09 වන දින ආරම්භ වූ මාර්ග, ප්‍රවාහන, සමූපකාර වැය ශීර්ෂය පිළිබඳ විවාදය ආරම්භ වූ අතර, එදින අවසන් නොවූ විවාද යළිත් අද දින පෙරවරුවේ ආරම්භ වී අද දින මධ්‍යාහ්න 12.00 ට අවසන් විය. අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසානයේ බෙදීමක් ඇති නොවූ බැවින් මාර්ග, ප්‍රවාහන, සමූපකාර අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයන් ඒකච්ඡන්දයෙන් සභා සම්මත වුණා. එත් එක්කම සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ අංක 105, 113, 114, 115, 116 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ආරම්භ වී අද දින පස්වරු 05.00 දක්වා පැවැති අතර, හෙට දිනයේදී

**41974198**

පෙ.ව. 09.00 ට එම විවාදය නැවත ආරම්භ වන බවත් මම මේ අවස්ථාවේදී දිනයේ ප්‍රගතිය ලෙස සඳහන් කරනවා.

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු සුමිත් ලාල් මැන්දිස්-**අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"*යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.00 ට, 2016 දෙසැම්බර් මස 15 වන දින පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 05.00 p.m till 9.00 a.m. on 15.12.2016*